
මහ රහතුන් වැඩි මඟ ඔස්සේ

# පින් සිත් වඩන
# පන්සිල් මළුව




ධර්ම සාකච්ඡා අංක 1



# මහ රහතුන් වැඩි මඟ ඔස්සේ

# පින් සිත් වඩන පන්සිල් මළුව

## ධර්ම සාකච්ඡා අංක 1

සිරස ගුවන් විදුලියේ ප්‍රචාරය වූ ''පන්සිල් මළුව'' වැඩ සටහනේ දී පින්වත් ශාලිකා රණසිංහ මහත්මිය විසින් විමසනු ලැබූ ප්‍රශ්නවලට අතිපූජනීය රාජගිරියේ අරියඥාණ ස්වාමීන් වහන්සේ විසින් කරනු ලැබූ දහම් කරුණු පැහැදිලි කිරීම්, අන්තර්ජාලයෙන් උපුටාගෙන හසිත චන්දන වීරසිංහ මහතා විසින් සකස් කළ මෙම දහම් පොත ඔබ සැමගේ ධර්මාවබෝධය සඳහා පිළිගන්වමු.

ඉදිරිපත් කිරීම

**මහ රහතුන් වැඩි මඟ ඔස්සේ**

© සමන් ප්‍රනාන්දු

පළමුවන මුද්‍රණය - 2017 ජූනි

**වෙබ් පිටුව:**

**www.maharahathunwedimagaosse.com**
**www.mrwo.lk**

ISBN - 978 - 955-7887-19-7

**පොත ලබාගත හැකි ස්ථාන :**

**දිවයින පුරා පොත් අලෙවිසැල්**
**තැපැල් මගින් ඔබට ආසන්නම තැපැල් කාර්යාලය වෙතට**

මෙතෙක් පළ වී ඇති පොත් පිළිබඳ සම්පූර්ණ විස්තරය සඳහා
පසුපස කවරයේ ඇතුල් පැත්ත බලන්න.

**විමසීම් -**
දුරකථනː 0712199900
0112755768 (සතියේ දිනයන්හිදී පෙ.ව. 9.30 සිට ප.ව. 4.30 දක්වා)

කවරයේ චිත්‍රය
**අරුණ නවීන්ද්‍ර**

මුද්‍රණය සහ බෙදාහැරීම

ස්මාර්ට් ප්‍රින්ට් සොලියුෂනස් සෙන්ටර්
444/3B, පිටිපන දකුණ, හෝමාගම

(සෝයා තෙල් භාවිතයෙන් නිපදවනු ලැබූ, විෂ රහිත, පරිසර හිතකාමී තීන්ත භාවිතයෙන් මුද්‍රිත යි.)

මේ ඝෝර කටුක භයානක සංසාරයේ
කියදෙනා, මේ අත්තභාවයේදීම
සසර දුකින් එතෙර වීමට
අධිෂ්ඨානය කරමින් වීර්ය වඩමින්
වෙමින් ඔබ ගෙ ප්‍රඥා "දක්ෂ"
නිසි ලෙස උත්සාහය වඩමින්
මේ අනිත්‍ය ජීවිතයේය
උපාසකයෙක් වේවා, භික්ෂුවක් වේවා
ආර්යයෙක්ම වේවා
තම තමාට එළඹෙන සුමාර්ගයට
තම තමන්ගේ ජීවිත එළිය ලබා ගනිත්වා.
දුරුව හෝ ව්‍යාකූල වුවද් අහිතෙන්
ඔබ නොකළ වරදකට
ඔබ නොගැළපේ,
සුනරුද අනුකම්පා කෙරේවා
වරද නැතත් නොවරද් වෙය
නොවරද ලොව දකිත්වා.
වෛර සතුරන් හැම අප්‍රමත්ත ලොවා
ඔබ සැමට සහනතාව වේවා,
තමා තමාටම පිහිට කොට ගනිත්වා.

(පින්වත් ඔබ වෙනුවෙන් මෙම දහම් කරුණු ඉදි%පත් කරනු ලැබූ භික්ෂූන් වහන්සේ විසින් ලියූවකි.)

# විශේෂ ස්තූතිය

පන්සිල් මළුව වැඩසටහන නිෂ්පාදන කටයුතු සිදු කරන පින්වත් සාරද නානායක්කාර මහතාටත්, එම වැඩසටහන ඉදිරිපත් කරනු ලබන පින්වත් ශාලිකා රණසිංහ මහත්මියටත් මෙම ධර්ම දානමය පින අනුමෝදනා වෙත්වා!

# පටුන


1. තෙරුවන් සරණ යාම තුළින් ඔබ ශ්‍රේෂ්ඨ මරණ පහෙන් එකකින් ජීවිතය කෙළවරකර ගන්න 1

2. සම්මා දිට්ඨිය තුළ පිහිටීම සහ මිථ්‍යාදෘෂ්ටික භාවය 12

3. සතර අපායෙන් මිදීම සඳහා සිල්පද පහ පරිපූර්ණ කරගන්න 17

4. පන්සිල් නොරැකීමේ විපාක මොනවාද? 20

5. සිල්පද බිඳගත් අයගේ නිවහන සතර අපායයි 29

6. ද්වේශය වැඩීමේ ආදීනවයන් දකිමින් ද්වේශයෙන් මිදෙන්න 35

7. මෛත්‍රිය වැඩීමේ ආනිශංසය 42

8. ගිහිවත 45

9. ගිය ජීවිතයේ නතර කළ තැනින් පටන් ගන්න 48

10. කුසල් සහ අකුසල් සිත් දෙකටම බැඳෙන්න එපා. සිත දමනය කරගන්න 51

11. බුදුරජාණන් වහන්සේ උදෙසා කළහැකි ශ්‍රේෂ්ඨතම පූජාව 54

12. ශාරීරික, පාරිභෝගික උද්දේශික වස්තූන් සතු අනන්ත ශක්තිය 62

13. ආයුෂය, වර්ණය, සැපය, බලය ලැබීමට නම් ..... 63

14. කරදර එන්නේ ඔබේ අකුසල් විපාකයක් නිසාමයි 69

15. ශක්තිමත් කුසලයකින් ඔබේ අතීත අකුසල් යටපත් කරගන්න 71

16. මාරයා 74

17. මිථ්‍යා ආජීවයෙන් ජීවත්වන අයට උදව් කරන්නේ කවුද? 84

18. මියගිය ඥාතීන් දැන් ඔබට අයිති නැහැ. ඔවුන්ට පින් දෙන්න 87

19. මියගිය ඥාතියාට පින් ගන්න පුලුවන්ද? 90

20. මළගිය ඇත්තන්ට නිවසේදී ම පින් දෙන්න 95

21. සතර අපායවල දුක දකින්න 97

22. අතහැරීම 103

23. ශීලය රැකගෙන කර්මඵල විශ්වාසයෙන් දන් දීමේ ආනිශංස 107

24. බෞද්ධ ද? අබෞද්ධ ද? කියන කාරණය සංස්කාර වලට අදාල නැහැ 113

25. තමාගේ රූපය වැරදි ආකාරයට පරිහරණය කළොත්... 116

26. දේවතානුස්සතිය වඩන්න. මාර්ගඵල ලාභී දෙවියෙක් දිව්‍යාංගනාවක් වන්න 122

27. ලෝකය පාලනය කරන්නේ දෙවියෙක්ද? බ්‍රහ්මයෙක්ද? 125

28. රතිශ්‍රද්ධා දැල්වීමෙන් අකුසලයක් සිදුවේද? 130

29. "වැරදි කරන අය හොඳින් ඉන්නවා. හොඳ වැඩ කරන අය දුකට පත්වෙනවා" ද? 142

30. මේ ජීවිතයේ මා ලැබූ බිරිඳ/සැමියා මේ භව ගමනේ දී ලබන අවසාන බිරිඳයි/සැමියයි කියන තැනට එන්න 139

31. ගිහියකුගේ නිත්‍ය ශීලය පංච ශීලයයි. එක් සිල් පදයක් බිඳුනොත්... 144

32. සෝවාන් වීම අතිශය අසීරුද? 148

33. තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන් හා ශීලයෙන් පරිපූර්ණ වූ ජීවිතය අතිශයින් ආරක්ෂිතයි 149

34. බුදුරජාණන් වහන්සේට දක්වන උතුම් ම උපහාරය වෙසක් දිනයේ දී සිදුකරන්න 153

35. සශ්‍රීක දෙවියන්ගේ ආශ්චර්යවත් ක්‍රියාකාරකම් 172

36. වර්ෂාව ඇතිකරවන්නේ දෙවියන් විසින් ද? 180

37. මේ ජීවිතයේ චතුරාර්ය සත්‍යය දැකීම සඳහා කාරණා තුනක් වඩන්න 183

38. ඔබේ සංස්කාරයන්ට ගැලපෙන කෙනා ඔබට ලැබී ඇති බැවින් ඒ ගැන ගැටෙන්න එපා 187

39. බෝධිසත්ත්වයන් වහන්සේ සය අවුරුද්දක් දුෂ්කර ක්‍රියා සිදු කරද්දී දෙවියන් දිව්‍ය ඕජාව ලබා නොදුන්නාද? 191

40. සප්ත සූරියුග්ගමන සූත්‍රය සහ අග්ගඤ්ඤ සූත්‍රය අනුව ලෝක විනාශය සිදුවන අයුරු 194

41. මනුෂ්‍යයා බිහිවීම සහ තෘෂ්ණාව විසින් ලෝකයත් මනුෂ්‍යයාත් විනාශයට පත්වීම සිදුවන ආකාරය 200

42. අධර්මිෂ්ඨ වන දෙවියන් අධර්මිෂ්ඨ මනුෂ්‍යයන්ට උදව් කරනවාද? 206

43. සහස්සී, දසසහස්සී ලෝක ධාතුවල වෙසෙන ජීවීන් සම්‍යක් දෘෂ්ඨිකද? 213

44. ඔබත් මෛත්‍රී බුදුරජාණන් වහන්සේ ගෙන් බණ අහන්නට ප්‍රාර්ථනා කරනවාද? 217

45. අප කාටත් කොතනකවත් අසාධාරණයක් සිදුවී නැහැ 220

46. ලෝකයේ සිදුවන මේ ව්‍යසනය දකිමින් ලෝකයට ලෝකයේ ස්වභාවයෙන් යන්න ඇරලා ඔබ නවතින්න 226

47. ඊළඟ තත්ත්පරයේදී විනාශයක් වෙන්න පුළුවන්. දැන්ම ධර්මය තුළ ශක්තිමත් වෙන්න 229

48. ගන්ධබ්බ අවධිය සහ අන්තර්භවය පිළිබඳව 233

## තෙරුවන් සරණ යාම තුළින් ඔබ ශ්‍රේෂ්ඨ මරණ පහෙන් එකකින් ජීවිතය කෙළවර කර ගන්න...

**පළමුවන ප්‍රශ්නය :**

**ගෞරවණීය ස්වාමීන් වහන්ස, තෙරුවන් සරණ යාම කියල කියන්නේ මොකක්ද? අපට මේ ගැන පැහැදිලි කරල දෙන්න.**

**පිළිතුර :**

තෙරුවන් සරණ ගියා කියලා කියන්නේ, ලොව්තුරා බුදුරජාණන් වහන්සේ, ධර්ම රත්නය, සංඝ රත්නය යමෙක් සරණ යනවා නම්, ඒ තුන් සරණේ පිහිටියා නම්, එයා තෙරුවන් සරණ ගිය පුද්ගලයෙක්ය කියන කාරණය ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

තෙරුවන් සරණ යෑම තුළින් අපි බලාපොරොත්තු වෙන්නා වූ දෙයක් තියෙනවා. තෙරුවන් සරණ යෑම තුළින් අපි බලාපොරොත්තු විය යුත්තේ, මේ ජීවිතයේ යහපත්ව ජීවත් වෙලා, හොඳින් කාලාබීලා, හොඳින් ඇඳලා, හොඳින් රැකියාවක් කරලා, හොඳින් දුවාදරුවෝ පෝෂණය කරලා, හොඳින් මැරිලා යනවා කියන කාරණය දකින්න නම් නෙවෙයි. තේරුණාද? එතකොට තෙරුවන් සරණ ගියා කියන්නේ, එයා බුදුරජාණන් වහන්සේ දේශනා කළා වූ යම් ධර්මයක් තියෙනවා නම්, ඒ ධර්මයේ

අර්ථය ජීවිතේට එකතු කරගත්ත කෙනෙක් බවටයි පත්වෙන්නේ. එතකොට බුදුරජාණන් වහන්සේ දේශනා කළා වූ ධර්මයේ සැබෑ ම අර්ථය බුදුරජාණන් වහන්සේ යොමු කරන්නේ, අපිට මේ සංසාර භයත් එක්ක. බුදුරජාණන් වහන්සේ පිරිනිවන් මංචකයේ සැතපිලා අවසාන වචන හැටියට දේශනා කරන්නේ, "මහණෙනි, මේ සියලු සංස්කාරයෝ අනිත්‍යයි" කියලා. සියලු සංස්කාරයෝ කියන්නේ, කුසල් සහ අකුසල් වර්ග දෙක ම. කුසල් සංස්කාරයනුත් විපාක දීලා අනිත්‍ය වෙනවා, අකුසල් සංස්කාරයනුත් විපාක දීලා අනිත්‍ය වෙනවා කියන කාරණයයි. බුදුරජාණන් වහන්සේ අපිට දේශනා කරන්නේ. ඒ නිසා "හිස ගිනිගත්තෙක් ඒ ගිනි නිවන්නේ යම් සේ ද, මේ භව ගින්දර නිවාගන්න" කියලයි බුදුරජාණන් වහන්සේ අපට දේශනා කරන්නේ.

එහෙනම්, යමෙක් තෙරුවන් සරණ යාම තුළින් එයාගේ මූලික ම අරමුණ විය යුත්තේ, මේ භවයේ තියෙන භයංකාර බව දැකලා, භව නිරෝධය කරා යනවා කියන කාරණය. එතනින් මුලින් ම අපි සකස් කරගන්න ඕන, ශ්‍රද්ධාව කියන කාරණය. මොකද, ශ්‍රද්ධාව සකස් වුණේ නැත්නම් අපට මේ ගමනේ එක දශමයක්වත් ඉස්සරහට යන්න බැහැ. ශ්‍රද්ධාවයි මූලික වෙන්නේ. එතකොට, ශ්‍රද්ධාව සකස් වෙන්නේ කොහොමද කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

ශ්‍රද්ධාව සකස් වෙන්න නම් මුලින් ම කල්‍යාණ මිත්‍ර ආශ්‍රය ලබන්න ඕන. කල්‍යාණ මිත්‍ර ආශ්‍රය ලැබුණහම අනිවාර්යයෙන්ම අපිට ඇහෙන්නේ මොකක්ද? සද්ධර්මය. එතකොට, **කල්‍යාණ මිත්‍ර ආශ්‍රය ලබනවා, සද්ධර්මය ශ්‍රවණය කරනවා. ශ්‍රවණය කළා වූ සද්ධර්මය නුවණින් මෙනෙහි කරනවා.** එහෙම කරද්දි තමයි, ශ්‍රද්ධාව කියන කාරණය සකස් වෙන්නේ. එතකොට, ශ්‍රද්ධාව කියන කාරණය සකස් කරගත්තොත් තමයි, මේ ධර්ම මාර්ගයේ අපට දශමයක් හෝ ඉස්සරහට යන්න පුළුවන්. මොකද, මේ ධර්ම මාර්ගයේ බුදුරජාණන් වහන්සේ අපිට දේශනා කරන්නේ, ආර්ය අෂ්ටාංගික මාර්ගයක්.

එතකොට ආර්ය අෂ්ටාංගික මාර්ගයේ මුල් ම මාර්ග අංගය තමයි, සම්මා දිට්ඨිය. සම්මා දිට්ඨිය කියන්නේ මොකක්ද? තෙරුවන් කෙරෙහි වූ ශ්‍රද්ධාව. ලෞකික සම්මා දිට්ඨිය කියන්නේ එහෙනම් මුල් වෙන්නේ තෙරුවන් කෙරෙහි වූ ශ්‍රද්ධාවමයි.

එතකොට, තෙරුවන් සරණ ගිහිල්ලා, තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව සකස් කරගත්ත කෙනා ඊළඟට කොතෙන්ට ද යන්නේ? ශීලයට. තේරුණාද? තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව සකස් කරගත්ත කෙනා, ශීලයටයි යන්නේ. එතකොට, ඊළඟට එයා අනිවාර්යයෙන්ම ශීලයෙන් පරිපූර්ණ කෙනෙක් බවට පත්වෙනවා; සිල්පද පහ ආරක්ෂා කරගන්නා වූ කෙනෙක් බවට පත්වෙනවා. මොකද, බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා ***"ඔබට නැවත දෙවියෙක් වෙන්න අවශ්‍ය නම්, ඔබට නැවත මනුෂ්‍යයෙක් වෙන්න අවශ්‍ය නම්, ඔබව දෙවියෙක්, මනුෂ්‍යයෙක් බවට පත් කරන්නේ, මේ සිල්පද පහ විසින්"*** කියලා. වෙන දෙයක් නෙවෙයි. අපි කොච්චර බලාපොරොත්තු තියාගෙන දේපළ රැස් කළත්, ඉඩකඩම්, මුදල් දේපළ, එහෙම නැත්නම් තාන්න මාන්න, කීර්ති ප්‍රශංසා, නම්බුනාම මේ මොනවා රැස් කළත් මේවා දුකටමයි හේතුවෙන්නේ. මොකද, මැරෙන වෙලාවෙදි මේවා සිහිපත් වුණොත් අපි සතර අපායන්ටමයි වැටෙන්නේ.

මේ සියල්ල අපිව සතර අපායට අරගෙන යද්දි අපිව සුගතියට අරන් යන්නේ, ඒ කියන්නේ දෙවියෙක්, මනුෂ්‍යයෙක් බවට පත් කරන්නේ කවුද? තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවත් මුල්වෙලා, දෙවනුව සිල්පද පහයි. එහෙනම් මේ සිල්පද පහ විසින්මයි, අනිවාර්යයෙන්ම අපිව නැවත දෙවියෙක්, මනුෂ්‍යයෙක් බවට පත් කරන්නේ.

ඒ නිසා මේ වෙලාවේ අපි තෙරුවන් සරණේ පිහිටිය යුත්තේ එක අරමුණකින්. යහපත් ජීවිතයක් ගත කරනවාය කියන කාරණය නෙවෙයි. තේරුණාද? මොකද, ක්‍රිස්තියානි ආගමේ මහත්මයෙකුත්

යහපත් ජීවිතයක් ගත කරලා යහපත් විදියට මැරෙනවා. මුස්ලිම් ආගමේ මහත්මයෙකුත් යහපත් ජීවිතයක් ගත කරලා යහපත් විදියට මැරෙනවා.

නමුත් බෞද්ධයා කියන්නේ යහපත් මරණයක් කරා යනවා කියන කාරණය නෙවෙයි. බුදුරජාණන් වහන්සේ බෞද්ධයා හැටියට කියන්නේ, අවම වශයෙන් මේ ලෝකයේ තියෙන ශ්‍රේෂ්ඨ මරණ පහෙන් එකක් අත් කර ගන්න කෙනාට. එයා තමයි ධර්මයෙන් ප්‍රයෝජනය ගත්තා කියලා කියන්නේ.

මේ ලෝකයේ ශ්‍රේෂ්ඨ මරණ පහක් තියෙනවා෴

- පළමුවෙනි මරණය තමයි රහතන් වහන්සේගේ මරණය. ඒකට අපි කියන්නේ පිරිනිවීම කියලා෴
- එතකොට දෙවෙනි ශ්‍රේෂ්ඨ මරණය තමයි අනාගාමී ඵලයට පත්වුණු කෙනාගේ මරණය.
- තුන්වෙනි ශ්‍රේෂ්ඨ මරණය තමයි සකෘදාගාමී ඵලයට පත්වුණු කෙනාගේ මරණය෴
- හතරවෙනි ශ්‍රේෂ්ඨ මරණය තමයි සෝවාන් ඵලයට පත්වුණු කෙනාගේ මරණය෴
- පස්වෙනි ශ්‍රේෂ්ඨ මරණය තමයි ශ්‍රද්ධානුසාරී, ධම්මානුසාරී කියන දෙදෙනාගේ මරණය.

ඒ නිසා අපි මේ ලබාගත්තා වූ ජීවිතය තෙරුවන් කෙරෙහි සරණ යාම තුළින් අපි බලාපොරොත්තු වෙන්නේ මොකක්ද? මෙන්න මේ ශ්‍රේෂ්ඨ මරණ පහෙන් එකකින් අපේ ජීවිතය කෙලවර කරන එක. එහෙම නැතුව අපි හොඳින් කාලාබීලා, හොඳින් ඇඳලා පැළඳලා, හොඳින් ජීවත් වෙලා, හොඳින් මැරුණාය කියන කාරණය අර්ථයක් වෙන්නේ නැහැ. තේරුණාද?

මොකද, බුදුරජාණන් වහන්සේ කොතැනකවත් අපිට දේශනා කරන්නේ නැහැ, 'පින් කළාය කියලා සුගතියට යනවා'

කියලා. බුදුරජාණන් වහන්සේ අපිට දේශනා කරන්නේ නැහැ, 'පව් කළාය කියලා දුගතියට යනවා' කියලා. බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ, ***"උපාදාන පච්චයා භවෝ"***. උපාදානයයි භවය සකස් කරන්නේ. උපාදානය සකස් කරන්නේ කවුද? ***"තෘෂ්ණා පච්චයා උපාදානං"***. තෘෂ්ණාවයි උපාදානය සකස් කරගන්නේ.

දැන් එක මහත්තයෙක් හිටියා. ඒ මහත්තයා කෝටිපති මහත්තයෙක්. එයා කවදාක්වත් ජීවිතයේ සිල්පදයක් බිඳගත්තේ නැහැ. පන්සල් හදලා දුන්නා. හැම පෝයට ම දන් දුන්නා. සුදු ඇඳුමක් ඇන්දේ. පාට ඇඳුමක් එයා ඇන්දේ නැහැ. මත් වතුර ටිකක්, සිගරට් එකක් එයා බිව්වේ නැහැ. මෙහෙම මෙයා ජීවත් වෙලා මෙයා මැරෙනවා. මැරුණු වෙලාවේ, දැන් පාංශුකූල වෙලාව. පාංශුකූලෙ වෙලාවෙදි ගමේ පන්සලේ නායක ස්වාමීන් වහන්සේලා ඇවිල්ල අනුශාසනා කරනවා, "මේ මහත්තයාට පින් අවශ්‍ය නැහැ. මෙයා ඒ තරමට ම ජීවිතයේ පින් කරගත්තා. මෙයා දෙවියෙක් මිසක් වෙන කෙනෙක් වෙන්නේ නැහැ" කියලා. නමුත් එහෙම කිව්වහම අපිත් සාධුකාර දුන්නා. එදා මමත් ගිහි කෙනෙක්.

ඒ ගමේ හිටිය ප්‍රභූ ගිහි මහත්තයා මොකක්ද කිව්වේ? "බිමින් යන කුඹියෙක්ගෙන් ඇහුවොත් මේ මහත්තයාගෙන් වරදක් වෙලා තියෙනවද කියලා, කුඹියා කියයි කිව්වා වරදක් වෙලා නැහැ"යි කියලා. ඒ කියන්නේ කුඹියෙකුටවත් වරදක් කරලා නැහැ. එහෙනම් දැන් මෙයා කොහෙද ගිහිල්ලා උපදින්න ඕන? සුගතියෙමයි. මොකද? වර්තමානේ ඕනෑ ම පාංශුකූල පොළක මරණය විග්‍රහ වෙන්නේ මෙහෙමයි.

නමුත් අපි දන්න ස්වාමීන් වහන්සේ කෙනෙක් මේ මහත්තයා මැරුණට පස්සේ උතුම් සමාධියෙන් අරමුණු කරලා බලද්දි මේ මහත්තයා කොහෙද ඉපදිලා ඉන්නේ කියලා, ඒ මහත්තයාට අයිති කෝටි ගාණක් වටින ඉඩමක, හිස් ඉඩමක, කම්මුලට අත තියාගත්ත පරදත්තරූප ජීවී ප්‍රේතයෙක් හැටියට උත්පත්තිය ලබලා.

එතකොට මොකක්ද එයාට උපාදානය වෙලා තියෙන්නේ මැරෙන වෙලාවෙ? පින උපාදානය වුණා ද? පින උපාදානය වුණේ නැහැ. පින උපාදානය වුණා නම් එයා දිව්‍ය තලයක. නමුත් එයා මැරෙන වෙලාවේ උපාදානය වුණේ මොකක්ද? තෘෂ්ණාව සකස් වුණේ ඉඩකඩම් කෙරෙහියි. ඉතින් ඊට අදාළව අතන ප්‍රතිසන්ධිය ලැබුවා.

එහෙමනම් දැන් මෙතන තියෙන මෙන්න මේ භයානක භාවය දකිමිනුයි අපි තෙරුවන් සරණ යන්න ඕන. වෙන දෙයක් හේතුවෙන් නෙමෙයි. තෙරුවන් සරණ යාම තුළ අනිවාර්යයෙන්ම යහපත් ජීවිතයක් සකස් වෙනවා. එයා ශීලයෙන් පරිපූර්ණ කෙනෙක් බවට පත්වෙනවා. ඉතින් මෙතනින් නතර වෙනවා කියන කාරණය හරියන්නේ නැහැ. තේරුණාද? සිල් ගත්තා ය කියන කාරණයෙන් මේ ප්‍රශ්නය විසඳෙන්නේ නැහැ. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, සම්මා සම්බුද්ධ ශාසන ලක්ෂ ගාණක් ගෙවාගෙන පහුකරලා අපි ඇවිල්ලා තියෙන්නේ. ඒ ලක්ෂ ගාණක් පහුකරලා ආවා වූ ගමනෙදි, අපි සිල් සමාදන් වෙන්න ඇන්ද සුදු රෙදි එක ගොඩක් ගැහුවොත් ඒක ගිජ්ඣකූට පර්වතයට වඩා විශාලයි කියනවා.

ගෙවාගෙන ආපු සම්මා සම්බුද්ධ ශාසන... සමහර සම්බුද්ධ ශාසන තිබ්බා, ඒවා අවුරුදු 40,000ක් දිගයි; 60,000ක් දිගයි; 30,000ක් දිගයි; 20,000ක් දිගයි. දීර්ඝ සම්මා සම්බුද්ධ ශාසන. ඒ සම්මා සම්බුද්ධ ශාසනවල අපි බෞද්ධයෝ හැටියට ඉපදිලා, සිල් සමාදන් වෙන්න පෙරවපු සුදු සිල් රෙදි එක ගොඩක් ගැහුවොත් ගිජ්ඣකූට පර්වතයට වඩා විශාලයි කියනවා. එහෙනම් ඒ සා සිල් රෙදි අපි මේ කය දවටලා තියෙනවා.

එහෙනම් මේ ජීවිතෙත් අපි බලාපොරොත්තු වෙන්නේ සිල් සමාදන් වෙලා, නැත්නම් ශ්‍රද්ධාව තුළ නවතින්න නම්, අපි සංසාරයේ කරපු දේ ම තමයි අදත් කරන්නේ. ඒ නිසයි බුදුරජාණන්

වහන්සේ මේ සීල, සමාධි, ප්‍රඥා කියන මේ මාර්ගය දේශනා කරන්නේ.

එතකොට, අපි ශීලය තුළින් මොකක්ද බලාපොරොත්තු වෙන්න ඕන? සමාධියට පාර සකස් කරගන්න. ශීලය තුළින් අපි සමාධියටයි පාර සකස් කරගන්නේ. ශීලය තුළින් අපි පරිපූර්ණ වෙද්දි අපි තුළ චිත්ත සමාධිය සකස් වෙනවා, ඉන්ද්‍රිය සංවරය සකස් වෙනවා. මේවා තුළින් සමාධිමත් හිතක් සකස් වෙනවා. මෙන්න මේ සමාධිමත් හිත ප්‍රයෝජනයට අරගෙන ප්‍රඥාව කියන කාරණය ඇතිකර ගන්න.

ඒ නිසා අපි තෙරුවන් සරණ යනවා නම්, කෙනෙක් තෙරුවන් සරණ යාමේ සැබෑ ම අර්ථය අනිවාර්යයෙන් ම මේ සීල, සමාධි, ප්‍රඥා මාර්ගය තුළ ශක්තිමත් වීම යි. ඒ කියන්නේ ආර්ය අෂ්ටාංගික මාර්ගය තුළ ශක්තිමත් වෙන්න. නමුත් අපිට එතෙන්ට යන්න ශක්තියක් නැත්නම්, අපි තෙරුවන් සරණ යෑම තුළින් බලාපොරොත්තු වෙන්න ඕන, අඩු වශයෙන් සිල්පද පහවත් ආරක්ෂා කරගෙන, මේ දුගතිය කියන කාරණයෙන් මිදෙන්න. මොකද, බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, ප්‍රේත ලෝකය, තිරිසන් ලෝකය, අසුර ලෝකය, නිරය කියන්නා වූ භයානක සතර අපායක් තියෙනවා කියලා. තේරුණාද?

මේ සතර අපායෙන් අපේ මස් ඇහැට තිරිසන් ලෝකය පේනවා. මේ තිරිසන් ලෝකයේ සත්ත්වයා හැමවෙලාවෙ ම ලෝභ, ද්වේශ, මෝහයන් තුළමයි ගත කරන්නේ. එයා අම්මා තාත්තාගේ ගුණයන් හඳුනන්නේ නැහැ. කර්මය, කර්මඵල විශ්වාසයක් හඳුනන්නේ නැහැ. ඒ නිසා නිරතුරුව ම අකුසල් මූලයන් තුළ ඉඳිමින්, දිගින් දිගට ම තිරිසන් ලෝකයෙන් තිරිසන් ලෝකයට වැටිලා අවසානෙදි නිරයන්ට වැටිලා කල්ප ගණන් දුක් විඳිනවා කියනවා. තේරුණාද?

ඊට පස්සේ, භයානක වූ ප්‍රේත ලෝකයක් අප ඉදිරියේ තියෙනවා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, එක ප්‍රේතයෙක් ඉන්නවා, එයාගෙ ඇස් දෙක ගිනි ගන්නවා කියලා. එයා ප්‍රේත ලෝකයේ උපදිනකොට ම එයාගෙ ඇස් දෙක ගිනි ගන්නවා කියනවා. එයාට ඒ ගින්න නිවාගන්න බෑ. ඒක අකුසලය විසින් ඇවිළුවා වූ ගින්නක්. මොකද, පෙර ජීවිතයේ මනුෂ්‍යයෙක් හැටියට ඉපදිලා ද්වේශය වැඩුවා. අනුන්ගේ දියුණුවට එයා කැමති වුණේ නැහැ. අනුන්ගේ දියුණුව දකින්න අකමැති වුණා වූ ඒ ඇස් දෙක ගිනි ගනිමින් ම තමයි ප්‍රේත ලෝකයේ උත්පත්තිය ලබන්නේ.

තව ප්‍රේතයෙක් ඉන්නවා කියනවා, එයාගෙ මේ මුළු කට ම කුණු වෙලා; වණ වෙලා. එයාට කතා කරන්න බැහැ. එයා අනික් ප්‍රේතයො ළඟට ගිහිල්ලා වචන හුවමාරු කරන්න උත්සාහ ගන්නවා. වචන පිටවෙන්නේ නැහැ. වචන පිට නො වීමේ දුකත්, කට කුණු වීමේ දුකත් දරාගෙන එයා කල්ප ගණන් ප්‍රේත ලෝකවල දුක් විඳිනවා කියනවා.

ඒ වගේ ම කාමයේ වරදවා හැසිරීම නිසා ප්‍රේත ලෝකයන්ට වැටුණොත් මේ මුළු ශරීරෙ ම කුණු වෙලා, වණ වෙලා තමයි ප්‍රේත ලෝකයේ උත්පත්තිය ලබන්නේ. හරි අපුලයි. කුණු වෙලා, වණ වෙලායි උත්පත්තිය ලබන්නේ.

**අතුරු ප්‍රශ්නය :**

**සමාවෙන්න ස්වාමීන් වහන්ස, කාමයේ වරදවා හැසිරීම කියලා කියන්නේ මොකක් ද? එය අකුසල කර්මයක් හැටියට සත්ත්වයාට විඳින්නට වෙන්නේ කොහොම ද? මේ ගැන මට පැහැදිලි කරලා දෙන්න, ස්වාමීන් වහන්ස.**

**පිළිතුර :**

කාමයේ වරදවා හැසිරීම කියන්නේ, අපිට තියෙන්නා වූ ශීලාචාර සමාජ ධර්මයන් ඉක්මවා යනවා නම්. දැන් ශීලාචාර සමාජ ධර්මය තුළ කියන්නේ... විනයානුකූල කාරණයත් තියෙනවානේ විවාහය කියන කාරණය. ඉතින් විවාහයෙන් බැහැරව කාමයේ වරදවා හැසිරීම කියන කාරණයට අපි යොමු වුණොත්, ඒ කාමයේ වරදවා හැසිරීම නිසා ප්‍රේත ලෝකයට වැටුණොත්, අර වගේ මහා දුර්වල, කුණු වෙච්ච, තුවාල වෙච්ච ශරීර සහිතව තමයි උත්පත්තිය ලබන්නේ.

ප්‍රේත ලෝකයට වැටිලා බේරුණොත් හොඳයි. මොකද, දරුණු ම තැන, නිරය කියන කාරණයට තිරිසන් සත්තු වැටෙනවා. ඔය කාමයන්ගෙන් වැඩි සත්තු ඉන්නවනේ, ඌරො, ඊරියෝ වගේ සත්තු. ඔය රිළව්, වඳුරො... ඔය ඉන්නේ පෙර කාමයෙහි වරදවා හැසිරිලා ගත කරපු අය. එතකොට, ඒගොල්ලෝ කාම ලෝකයන් තුළම හැමදා ම පැටියෙක් බඩේ එල්ලගෙන, නැත්නම් පැටව් 10ක් 15ක් එල්ලගෙන. එහෙම තමයි ඒගොල්ලෝ ජීවත් වෙන්නේ. තිරිසන් ලෝකෙට වැටුණොත් එවැනි තැනකට යනවා. ප්‍රේත ලෝකයේට වැටුණොත්, අර වගේ තැනකට වැටිලා අප්‍රමාණ දුකට පත්වෙනවා.

ඒ නිසා ඒ වගේ ම අසුර ලෝකයක් තියෙනවා. අසුර ලෝකයේ එක කොටසක් මේ මුහුද ආශ්‍රිතව ජීවත් වෙනවා. ඒ මුහුද ආශ්‍රිතව ජීවත්වන අසුරයා කියන්නේ, මේ මුහුද උපාදානය

කරගෙන මැරෙන කෙනා. දැන් අපි කියමු, විශාල ධීවර ජනතාවක් ඉන්නවානේ. ඒ ධීවර ජනතාව හැම වෙලාවෙ ම මුහුද උපාදානය කරගෙන ඉන්නේ. තේරුණාද?

මුහුද උපාදානය කරගැනීම නිසා ඒගොල්ලන්ට මැරෙන වෙලාවේ මුහුදු උපාදානය සකස් වුණොත් අසුරයෙක් බවට පත්වෙලා උත්පත්තිය ලබනවා. මොකද, මුහුදයි, ලවණ රසයයි ඒගොල්ලෝ උපාදානය කරගත්තේ.

එතකොට, සංචාරක පිරිස් ඉන්නවා. මේ සංචාරක පිරිස් මුහුද උපාදානය කරගෙන ජීවත් වෙච්ච අය. මාලදිවයිනට, ශ්‍රී ලංකාවට වගේ ලක්ෂ ගාණක් සංචාරකයෝ සමහරවිට එනවා. ඇයි මේ? මුහුදු රසය, ලවණ රසය උපාදානය කරගෙන. එතකොට, මේ උපාදානය මැරෙන වෙලාවේ ඒගොල්ලන්ට සකස් වුණොත්, ඒගොල්ලෝ අසුරයෝ හැටියට උත්පත්තිය ලබනවා.

ඒ වගේ ම නිරයත්... ගින්දර, ලෝදිය, ගිනි අඟුරුවලින් ගහණ වෙච්ච, ගිනියම් වෙච්ච, කෝටි ගණන් සත්ත්වයා දුක් විඳින නිරයක් තියෙනවා කියලා, බුදුරජාණන් වහන්සේ දේශනා කරලා තියෙනවා.

එහෙනම් අවම වශයෙන් තෙරුවන් සරණ යෑම තුළින් අපි බලාපොරොත්තු වෙන්න ඕන, මෙන්න මේ සතර අපායටවත් නොවැටී බේරෙනවා කියන කාරණය. ඒ නිසා තෙරුවන් සරණ යෑමෙන් අපි බලාපොරොත්තු වෙනවා නම්, හොඳ යහපත් විදියට ජීවත්වෙලා, දුවාදරුවන් හදලා, යහපත් විදියට මැරෙනවා කියන කාරණය, මම නම් අනුමත කරන්නේ නැහැ. ඒක ලේසියෙන් සිද්ධ වෙන්නේ නෑ.

මොකද, බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ, මේ අතට ගන්නා වූ පස් අහුරෙන්... අතට නෙවෙයි බුදුරජාණන් වහන්සේ අරන් පෙන්වන්නේ, නියසිලට. නමුත් මම නම් කියන්නෙ අතට

කියල. මොකද, නියසිලට කිව්වොත් මිනිස්සු විශ්වාස කරන්නේ නැහැ. බුදුරජාණන් වහන්සේ නියසිලට පස් ටිකක් අරන් කියන්නේ, මැරෙන සත්ත්වයින්ගෙන් සුගතිගාමී වෙන්නේ මෙච්චරයි කියන කාරණය.

එහෙනම්, අපි තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව තුළ නවතින්නේ නැතුව, **තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව තුළින්, ශීලය පරිපූර්ණභාවයට පත් කරගෙන, ඒ පරිපූර්ණ වූ ශීලය තුළින්, පරිපූර්ණ වූ සමාධියක් සකස් කරගෙන, මේ රූපයේ අනිත්‍ය, දුක්ඛ, අනාත්මභාවය දකින ප්‍රඥාව ඇති කරන්න කියන එකයි, මම නම් මතක් කරන්නේ.**

# සම්මා දිට්ඨිය තුළ පිහිටීම සහ මිථ්‍යාදෘෂ්ටික භාවය

**දෙවන ප්‍රශ්නය :**

**ගෞරවණීය ස්වාමීන් වහන්ස, අනිකුත් ආගමිකයන්ට සුගතිගාමී වීමට ඉඩක් නැද්ද?**

**පිළිතුර :**

නෑ, අනිවාර්යයෙන් ම තියෙනවා. දිව්‍යතලවල මිථ්‍යාදෘෂ්ටික, සම්‍යක්දෘෂ්ටික දෙවිවරු කියලා කොට්ඨාශ 2ක් ඉන්නවා. දැන් මිථ්‍යාදෘෂ්ටික කියන්නේ වැරදි වචනයක් නෙවෙයි. මිථ්‍යාදෘෂ්ටික කිව්වහම සමහරු ඒක වැරදි හැටියට තේරුම් ගන්නවා, අපි කෙනෙකුට චෝදනාවක් කරනවා කියලා.

සම්මා දිට්ඨිය කියන්නේ මොකක්ද?

1. තෙරුවන් කෙරෙහි වූ ශ්‍රද්ධාව
2. කර්මය, කර්මඵල කෙරෙහි විශ්වාසය
3. මැරිලා හේතුඵල ධර්මයන් අනුව උපදිනවාය කියන විශ්වාසය
4. සිල් රැක්කොත්, දන් දුන්නොත් ආනිශංස තියෙනවාය කියන විශ්වාසය,
5. අම්මා තාත්තාගේ ගුණයන් තියෙනවාය කියන විශ්වාසය

6. මේ ශාසනයේ සන්දිට්ඨික ගුණය තියෙන තාක්කල් ආර්යයන් වහන්සේලා ඉන්නවාය කියන විශ්වාසය
7. ඕපපාතිකව සත්ත්වයන් උපදිනවාය කියන විශ්වාසය

යමෙකුට ඔය විශ්වාසයන් තියෙනවා නම් එයාට කියනවා, එයා සම්මාදිට්ඨිය තුළ පිහිටිච්ච කෙනෙක් කියලා.

එතකොට, යමෙක් තුළ මේ විශ්වාසය නැත්නම් එයා මිථ්‍යාදෘෂ්ටිය තුළ පිහිටපු කෙනෙක්. එහෙනම් මිථ්‍යාදෘෂ්ටිය කියන්නේ, කෙනෙකුට වරදක් කියනවා, චෝදනා කරනවා නෙවෙයි. සම්මා දිට්ඨියේ විරුද්ධ පැත්ත. මිථ්‍යාදෘෂ්ටික කෙනාට තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවක් නැහැ. එයාට කර්මය, කර්මඵල විශ්වාසයක් නැහැ. මැරිලා ඉපදෙනවා කියලා විශ්වාසයක් නැහැ. අම්මා තාත්තාගේ ගුණයන් තියෙනවාය කියලා විශ්වාසයක් නැහැ. සිල් රැක්කොත්, දන් දුන්නොත් ඒවායේ ආනිශංස තියෙනවාය කියලා විශ්වාසයක් නැහැ. එතකොට, එතන තමයි මිථ්‍යාදෘෂ්ටිය කියන්නේ. තේරුණාද? මෙතන සම්මාදෘෂ්ටිය. මෙතන මිථ්‍යාදෘෂ්ටිය.

එතකොට සම්මාදෘෂ්ටියට පත්වෙච්ච මනුස්සයොත් මේ මනුස්ස ලෝකය තුළ ඉන්නවා. මිථ්‍යාදෘෂ්ටියට පත්වෙච්ච මනුස්සයොත් මේ මනුස්ස ලෝකයේ ඉන්නවා. ඒ වගේමයි, දිව්‍ය තලවල. සම්මාදිට්ඨියට පත්වෙච්ච දෙවිවරුත් ඉන්නවා; මිථ්‍යාදෘෂ්ටියට පත්වෙච්ච දෙවිවරුත් ඉන්නවා. දැන් ලෝකයේ ඉන්න ලොකු ම සල්ලිකාරයො ඉන්නේ කොහෙද කියලා ඇහුවොත්, ලංකාවෙද ඉන්නේ? නැහැ. විදේශවල. එක්කො ක්‍රිස්තියානි ආගමේ. එක්කො මුස්ලිම් ආගමේ. එක්කො හින්දු ආගමේ. තේරුණාද?

එතකොට, කෙනෙක් අහන්න පුළුවන් වැඩියෙන් ම දන් දෙන්නේ ලංකාවෙ අය. කර්මය, කර්මඵල විශ්වාසයෙන් දන් දෙන්නේ ලංකාවෙ අය. ඇයි ලංකාවේ මේ කෝටිපතියෝ නැත්තේ කියලා, අර වගේ ධනවත් අය නැත්තේ කියලා. දානය

කියන කාරණය, බුදුදහමට විතරක් අයිති දෙයක් නෙවෙයි. දානයේ ආනිශංස මොකක්ද? ආයුෂය, වර්ණය, සැපය, බලය. තේරුණා ද?

දැන් අපේ ලොව්තුරා බුදුරජාණන් වහන්සේ බෝධිසත්ත්වයෝ හැටියට, සිදුහත් කුමාරයා වෙලා අර සා කෝටිපති පවුලක ඉපදෙන්නෙ. ධර්මයක් ලෝකයේ තිබ්බේ නැහැ. බුදුදහමක් ලෝකයේ තිබ්බේ නැහැනේ. එහෙනම් මේ ආයුෂය, වර්ණය, සැපය, බලය කියන කාරණය දානයට අයිති ආනිශංස. ක්‍රිස්තියානි මහත්තයෙක් දන් දුන්නොත්, මුස්ලිම් මහත්තයෙක් දන් දුන්නොත්, හින්දු මහත්තයෙක් දන් දුන්නොත් ඒ දානයේ ප්‍රමාණය අනුව මැරෙන වෙලාවේ එයා දානය සිහිපත් වුණොත්, සශ්‍රීක දෙවියෙක්, සශ්‍රීක මනුස්සයෙක් වෙලා උත්පත්තිය ලබනවා.

දැන් ලංකාවෙත් තියෙන්නේ රාජ්‍ය නොවන සංවිධාන කියලා. මේවට කෝටි ප්‍රකෝටි ගණන් ධනය එවන්නේ කවුද? පිට රටවල ඉන්න කෝටිපති මනුස්සයෝ. ඒගොල්ලෝ ඒක සමාජ සේවය උදෙසා, මනුස්සයාගේ යහපත උදෙසා තමයි වෙන් කරන්නේ. එතකොට, මැරෙන වෙලාවේ මේවා සිහිපත් වුණොත් සුගතියේ සශ්‍රීක උපතක් හිමිකර ගන්නවා.

දැන් එක මහත්තයෙක් මට මතකයි, සිංගප්පූරුවේ මහත්තයෙක් ඇවිල්ලා පන්සිය නමකට එකපාර දානයක් පූජා කළා. ඒකට මම හිතන්නේ ලක්ෂ 25ක් වත් යන්න ඇති. එක මොහොතක කරපු දෙයක්. එක දවසක කරපු දෙයක්. ලක්ෂ 25ක් වත් යන්න ඇති. එතකොට, මෙවැනි දාන සිහිපත් වුණොත්, එයාට බෞද්ධයෙක් කියලා වැඩක් නැහැ. බෞද්ධයෙක් වෙන්න ඕනෙ නෑ. එයා මුස්ලිම් ආගමේ, ක්‍රිස්තියානි ආගමේ වේවා එයා සශ්‍රීක දෙවියෙක් වෙලා, මනුස්සයෙක් වෙලා ඉපදෙනවා. හැබැයි මිථ්‍යාදෘෂ්ටික පවුලක.

ඒ නිසා පින් කරන එකෙන් ඕනෑ ම කෙනෙකුට ඒ වාසිය ලැබෙනවා. බෞද්ධයාට කියලා නෙවෙයි. පින් කළොත්, කවුරු හරි දන් දුන්නොත්, ඒවා කළොත් අනිවාර්යයෙන් ම මැරෙන වෙලාවේ ඒක උපාදානය වුණොත් එයා කෝටිපති පවුලක, නැත්නම් සශ්‍රීක දෙවියෙක් වෙනවා. හැබැයි, ඒගොල්ලන් මිථ්‍යාදෘෂ්ඨික භාවයට පත්වෙලයි ඉපදෙන්නේ.

දැන් දිව්‍යතලවල මිථ්‍යාදෘෂ්ටික දෙවිවරු ඉන්නවා. ඒ මිථ්‍යාදෘෂ්ටික දෙවිවරු අපේ දෙවිවරු තරම් ප්‍රභාශ්වර නැහැ. දැන් අපේ දෙවිවරු ප්‍රභාශ්වරයි. ඒගොල්ලෝ ඔටුනු පැළඳගෙන, මැණික් ගල් ඔබ්බවපු ඔටුනු පැළඳගෙන මහා ආලෝකවත් දෙවිවරු. නමුත් මිථ්‍යාදෘෂ්ටික දෙවිවරුන්ගේ එවැනි ආලෝකමත් භාවයක් නැහැ. ඒගොල්ලෝ හරියට... අපේ දෙවිවරු අර ගලිවර්ලා වගේ නම් ඒගොල්ලෝ ලිලිපුට්ලා වගේ පොඩියි. ඇයි ඒ? ඒගොල්ලෝ කර්මය, කර්මඵල විශ්වාසයෙන් දන් දීලා නැහැ. ඒගොල්ලෝ දන් දෙනවා. නමුත් කර්මය, කර්මඵල විශ්වාසයක් ඒගොල්ලන්ට නැහැ.

**අතුරු ප්‍රශ්නය :**

**ඒ අයට නිවන සමීප නැද්ද ස්වාමීන් වහන්ස?**

**පිළිතුර :**

ඒගොල්ලන්ට කොහොමත් නැහැ. තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව තියෙන කෙනයි, චතුරාර්ය සත්‍ය අවබෝධය කරා යන්නේ. තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව නැති කිසි ම කෙනෙකුට ඒ මාර්ගය තුළට යන්න බැහැ.

දැන් කොච්චර හිමාලයේ ඉන්නවාද මුළු ජීවිත කාලය ම භාවනා කරන අය. ඒගොල්ලෝ ආහාරයක් ගන්නේ නැහැ. සමාධිය ආහාරය කරගෙන තමයි ජීවත් වෙන්නේ. සමහරු මාසයක් ආහාර ගන්නේ නැතුව, සුමානයක් ආහාර ගන්නේ නැතුව ඉන්න අය

ඉන්නවා. නමුත් කවදාක්වත් ඒගොල්ලෝ ආර්ය මාර්ගයට වැටිලා නැහැ. මොකද, ඒගොල්ලෝ තුළ සම්මාදිට්ඨිය නැහැ.

සම්මාදිට්ඨිය නැත්නම් කවදාකවත් එයාට ශ්‍රද්ධානුසාරී, ධම්මානුසාරී, සෝවාන්, සකෘදාගාමී, අනාගාමී, අරිහත් යන ඵලයන්ට එන්න බැහැ. මේ මාර්ගයට වැටෙන්නේ සම්මාදිට්ඨියට පත්වුණු කෙනා විතරක්මයි.

# සතර අපායෙන් මිදීම සඳහා සිල්පද පහ පරිපූර්ණ කරගන්න

**තුන්වන ප්‍රශ්නය :**

**ගෞරවණීය ස්වාමීන් වහන්ස, සංසාරේ බියකරු බවින් ගැලවෙන්න අඩු ම තරමින් පංචශීල ප්‍රතිපදාව වත් සුරැකිය යුතුයි නේද ස්වාමීන් වහන්ස?**

**පිළිතුර :**

අනිවාර්යයෙන් ම, මොකද, බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, දවසින් දවස, අනාගතයට යන්න යන්න දුශ්ශීලභාවය වැඩිවෙනවා කියලා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, මේ දුශ්ශීලභාවය නිසා ම මේ මනුස්සයාගේ පරමායුෂ අවුරුදු දහය කියන තැනට පත්වෙනවා කියලා. පරමායුෂ අවුරුදු දහයයි කියන තැනේදි එයා අවුරුදු පහෙන් කසාද බඳිනවා, අවුරුදු හයෙන් දරුවෝ ලබනවා. අවුරුදු හත අට වෙනකොට මැරිලා යනවා. මොකද, පරමායුෂ අවුරුදු දහයයි.

දැන් ඔබ හිතන්නෙ පරමායුෂ අවුරුදු දහයකට එන්න තව කොච්චර කල් යයි කියලද? දැන් බුදුරජාණන් වහන්සේ පහළවෙලා අවුරුදු 2600 ක් ගිහිල්ලා. බුදුරජාණන් වහන්සේගේ කාලයේ පරමායුෂ අවුරුදු 120 යි. එතකොට, ඒ 120 මේ වෙනකොට අවුරුදු 70 කට වගේ බැහැලා තියෙනවා. එහෙනම් අවුරුදු 2600 ක් තුළ අවුරුදු 50 කින් ආයුෂය අඩුවෙලා තියෙනවා.

නමුත් මේ 2600 කියන්නේ මේ ස්වාභාවිකත්වය තුළ ගලාගෙන ආපු දෙයක්. මේ කෘමිනාශක, රසකාරක, පරමාණුක බෝම්බ, ඕවා මොකුත් තිබ්බේ නැහැ. එහෙනම් අදින් පසු බිහිවන ලෝකය මේ සියල්ලෙන් ම විකෘති වූ ලෝකයක්. එහෙනම්, මේ ගෙවී ගිය නිදහස් අවුරුදු 2600 තුළ අවුරුදු 50 කින් ආයුෂ අඩු වුණා නම්, ඉතුරු අවුරුදු 60 අඩුවෙන්න තව අවුරුදු 1500 ක් යන්න අවශ්‍යතාවයක් නැහැ.

එහෙනම්, තව අවුරුදු 1500 ක් යනකොට පරමායුෂ අවුරුදු දහයයි කියන තැනට එනවා. අවුරුදු පහෙන් ළමයා කසාද බඳින තැනට එනවා. මොකද, වර්තමානයේ දීත් සමහර වෙලාවට අවුරුදු අටෙන් නවයෙන් ගෑනු ළමයෙක් වැඩිවියට පත්වෙනවා. අවුරුදු අටෙන්, අවුරුදු නවයෙන් ගෑනු දරුවෙක් වැඩිවියට පත්වෙනවා කියන්නේ, එයාට දරු ගැබක් දරාගන්න පුළුවන්. දරු ගැබක් දරාග න්න පුළුවන් වුණත් තාම සමාජය එතෙන්ට යන්නේ නැහැ. ඇයි? තාම සමාජය තුළ ශීලය තියෙනවා.

නමුත් මේ ශීලයෙන් පිරිහෙන කොට සමාජය එතෙන්ට යනවා... මේ විනාශය සකස් කරන්නේ කවුද? දුශ්ශීලභාවය විසින්මයි. එහෙනම් මනුස්සයා විකෘති වෙන්න, විකෘති වෙන්න, ශීලයෙන් ඈත් වෙන්න, ඈත් වෙන්න, විකෘති වූ සමාජයක් ඉස්සරහදි බිහිවෙන්නේ. ඒ නිසා, මේ විකෘති වූ සමාජය තුළින් ගැලවෙන්න අපිට අත්වැල් බැඳගෙන යන්න නම් බැහැ. අත්වැල් බැඳගෙන මේකෙන් ගැලවෙන්න බැහැ.

ඒ නිසා තම තමන් මේ ව්‍යසනය නුවණින් දකින්න ඕන. තම තමන් මේ ව්‍යසනය නුවණින් දැකලා, අපි මේ අත්විඳින්නේ දුශ්ශීලභාවයේ විපාකයක් කියලා දැනගෙන, තමන් සිල්වත්භාවයට පත්වෙන්න දක්ෂ වෙන්න ඕන. අත්වැල් බැඳගෙන මේකෙ කොතැනකවත් යන්න බැහැ. මොකද, ලෝකය යන්නේ දුක කරා. ලෝකය කියන්නේ මාරයා.

ඒ නිසා දුක කරා යන ලෝකය නවත්වන්න අපිට කවදාක්වත් බැහැ. ලෝකය පවතින්න ඕන. ලෝකය ගලාගෙන යන්න ඕන. සතර අපායන් පිරෙන්න ඕන. ඒක තමයි ලෝකයේ ස්වභාවය. ඒ නිසා ලෝකයේ ස්වභාවයෙන් ලෝකය යනවා. නමුත් අපිට තියෙන්නේ, මේ ලෝකය යන ස්වභාවය හඳුනගෙන ධර්මයේ ස්වභාවයට එන්න.

ධර්මයේ ස්වභාවයට එනවා කියන්නේ **මුලින් ම අපි තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව සකස් කර ගන්නවා. සිල්පද පහෙන් පරිපූර්ණ භාවයට පත්වෙනවා.** එතන තමයි අපිට ලබන්න තියෙන අවම තැන. අපි ලෑස්ති නැත්නම් සිල්පද පහ පරිපූර්ණ කරගන්න, ඒ කියන්නේ මරණින් පස්සේ සතර අපායට වැටෙන්න අපි දක්ෂ වෙන්න ඕන.

# පන්සිල් නොරැකීමේ විපාක මොනවාද?

**හතරවන ප්‍රශ්නය :**

**ගෞරවණීය ස්වාමීන් වහන්ස, අද සමාජයේ ජීවත්වන බොහෝ දෙනාගේ ප්‍රශ්නය තමයි මා ඔබ වහන්සේගෙන් විමසන්නේ. පන්සිල් සුරකින්නට ප්‍රතිඥා දුන්නත් පන්සිල් ඛණ්ඩනය වන වාර ගණන වැඩියි, අද ජීවිතයේ බොහෝ දෙනෙක්ගේ. මේ පන්සිල් ඛණ්ඩනය වීම හරහා මොන වගේ විපාක ද මිනිස්සුන්ට විඳින්නට සිද්ධ වෙන්නේ ස්වාමීන් වහන්ස?**

**පිළිතුර :**

පංච ශීලය කියන්නේ, මුලින් ම අපි *"පාණාතිපාතා වේරමණී සික්ඛාපදං සමාදියාමි"* කියලානේ පන්සිල් ගන්නේ. ඒ කියන්නේ, පර පණ නැසීමෙන් වළකිනවා. තේරුණාද? සත්ත්ව හිංසාවෙන් වළකිනවා. එතකොට, පර පණ නැසීමෙන් වැළකීමෙන්, සත්ත්ව හිංසාවෙන් වැළකෙනවා කියන්නේ සත්ත්ව හිංසාව කියන කාරණය අප්‍රමාණව සමාජය තුළ සිද්ධවෙනවා... තේරුණාද?

දැන් බල්ලෙක් ගත්තත්, අර ලොකු සල්ලිකාර බල්ලො ඉන්නවා. ඒ බල්ලන්ගේ පුංචි කාලේ ඉපදුණු ගමන් ම වලිගෙ කපලා දානවා. ඒවත් සත්ත්ව හිංසාව. සමහර සත්ත්ව ගොවිපළවල් වල පොඩිකාලෙ ම අර කුකුළාගේ හොට කපලා දානවා. පුංචි කාලෙ ම ඌරු පැටියා ගේ දත් ටික ගලවලා දානවා. මොකද ඒ? තන් බුරුලු ආසාදනය වෙනවා කියලා මහ ඊරිගේ. ඒවා ඔක්කොම කපනවා.

ඒ වගේ සත්ත්ව ඝාතනය කියන දේ අප්‍රමාණ ආකාරයෙන් සමාජය තුළ සිද්ධ වෙනවා. සත්ත්ව හිංසාව කියන කාරණයත් අප්‍රමාණ ආකාරයෙන් සමාජය තුළ සිද්ධ වෙනවා. එතකොට සත්ත්ව ඝාතනය, සත්ත්ව හිංසාව කිව්වහම මනුස්සයෙක්, මනුස්සයෙකුට කරන හිංසාවනුත් ඒකට අයිති වෙනවා. තේරුණාද?

අපි රාජකාරියට ගිහිල්ලා රාජකාරි පැය අටේදි අපේ ළඟට එන සේවා අපේක්ෂකයාව අපි රස්තියාදු කරනවා නම්, එහෙම නැත්නම් අපි එයාට, "හෙට එන්න", "අනිද්දා එන්න", "ලබන සුමානෙ එන්න", කියලා එයාව රස්තියාදු කරනවා නම් ඒ වෙලාවෙ ම අපි හිංසාවකට ලක්කරනවා. ඒ වෙලාවෙ ම අපි සත්ත්ව හිංසාව කියන එක, තව කෙනෙකුට හිංසා කිරීමේ වරදට, අපි අහුවෙනවා. ඒ නිසා එවැනි සියුම් තැන්වලිනුත් මේක සිද්ධ වෙන්න පුළුවන්. තේරුණාද? ඒ නිසා සත්ත්ව ඝාතනය සහ සත්ත්ව හිංසාව කියන කාරණයෙන් අපි අනිවාර්යයෙන් ම වැළකෙන්න ඕන.

සත්ත්ව ඝාතනය කියන්නේ බරපතළ වූ අකුසල් සකස් වෙන තැනක්. මොකද, අපි දන්න එක්තරා ස්වාමීන් වහන්සේ කෙනෙක් උතුම් සමාධියෙන් දැකලා තියෙනවා, මේ හරක් ඝාතනය කරපු මනුස්සයෙක්. තේරුණාද? නැවත ගිහිල්ලා නිරයක උත්පත්තිය සකස් කරගන්නවා. ඒක නිරයක් ද නැත්නම් ප්‍රේත ලෝකයේ ම තැනක් ද කියන්න උන්වහන්සේ දන්නේ නැහැ. උන්වහන්සේට සමාධියෙන් එකපාරට පෙනිලා තියෙන්නේ අඩි අටක් විතර උස කණුවක්. වෙන මුකුත් නැහැ. මේ කණුවේ තමයි අර මේ ජීවිතයේ හරක් මරපු මනුස්සයා එකපාරට ගිහිල්ලා උත්පත්තිය ලබන්නේ. එයා කණුව බදාගෙන කණුව මුදුනක උත්පත්තිය ලබනවා කියනවා. මේ නිරිසතා කණුව බදාගෙන ඉන්නවා.

ඒ බදාගෙන ඉන්නකොට, ඒ කණුවෙම අඩි අටක් අඩි දහයක් විතර දිග ලණුවකින් පෘෂ්ඨීමත් හරකෙක් බැඳලා ඉන්නවා. මේ කර්මය විපාක දෙන හැටි. තේරුණාද? අර නිරිසතා මේ

ජීවිතයේ දී හරක් මරපු කෙනෙක්; හරක් කෙරෙහි දැඩි තෘෂ්ණාව ඇති කරගත්ත කෙනෙක්. නිරිසතා අතන උත්පත්තිය ලබනකොට ම එයා දකින්නේ කවුද? හරකව. පෘෂ්ඨීමත් හරකව දකිද්දි ම නිරිසතා හිනාවෙනවා කියනවා. මොකද, එයාගෙ සතුටට. මොකද, එයාගෙ සංසාර පුරුද්ද; හරක් මරපු පුරුද්ද. ඒ හිනාවෙන කොට ම ඒ හිනාව නැතුව යන්න ඉඩ දෙන්නේ නැහැ.

ඒ මොහොතෙ ම අර හරකා ඉස්සරහා ගාත් දෙකෙන් කෙළින් වෙනවා කියනවා. ඉස්සරහා ගාත් දෙකෙන් කෙළින් වෙනවා. කෙළින් වෙද්දි යමපල්ලෙක් බවට පත්වෙලා. දැන් හරකා යමපල්ලෙක්. හරකා දැන් ඉස්සරහා ගාත් දෙකෙන් කෙළින් වුණා ම හරකා දැන් යමපල්ලෙක් බවට පත්වෙලා. ඒ යමපල්ලාගේ අතේ තියුණු ත්‍රිශූල දෙකක් තියෙනවා කියනවා. ඒවා හරි තියුණුයි. දැන් මේ ත්‍රිශූල දෙක මෙහෙම අල්ලගෙන ඉන්නවා පමණයි, යමපල්ලා සිද්ධ කරන්නේ. අර නිරිසතා එල්ලිලා ඉන්න කණුව මේ ත්‍රිශූල දෙක දෙසට පහළට ම ඇලවෙනවා. ඇලවෙලා මේ ත්‍රිශූල දෙකේ ඇනිලා ම කුඩුවෙලා ම, හරකෙක් යම් සේ ද බොකු බඩවැල්, මස් හැටියට වෙන් කරලා, වෙන් කරලා ගොඩ ගහන්නේ, අර නිරිසතාත් අර විදියට ම මස් ගොඩක් හැටියට කණුවෙන් බිමට වැටෙනවා.

ඒ කියන්නේ, හරකා යම් සේ ද මස් කළේ, ඒ විදියට ම වැටෙනවා. වැටිලා නිරිසතා දැන් මැරෙනවා. මැරිලා ආයෙමත් අර කණුව තියෙනවා. ආයෙමත් අර කණුවේ නිරිසතා පහළ වෙනවා. ඒ කණුවෙ ම ආයෙමත් අර හරකා බැඳලා ඉන්නවා. ආයෙමත් ඒ හරකා යමපල්ලෙක් වෙනවා. යමපල්ලෙක් වෙලා ආයෙමත් අර විපාක විඳිමින් ඒ විදියට ම, සමහර විට කල්ප ගාණක් ඒක දික් වෙන්න පුළුවන්.

ඒ සත්ත්ව ඝාතනයේ අප්‍රමාණ විපාක. තේරුණාද? ඒ වගේමයි කුකුළෙක්, හරකෙක්, එළුවෙක්, ඌරෙක් කියන්නේ මොකෙක්ද? පෙර ජීවිතයේ සත්ත්ව ඝාතකයෙක්. සමහර අය

ඉන්නවා මේ ජීවිතයේ කුකුල්ලු 100, 200, 300, 500, 1000 මරනවා. කුකුල් මස් කඩේක කෙනෙක් කුකුල්ලු කී දාහක් මරනවද? නේද? එතකොට, එයා මැරිලා ගිහිල්ලා දිව්‍ය තලයක ඉපදෙයි ද? මනුස්සයෙක් වෙයි ද? නැහැ. එයා මැරිලා ගිහිල්ලා කුකුළෙක්මයි වෙන්නේ; ඌරෙක්මයි වෙන්නේ; හරකෙක්මයි වෙන්නේ. ඇයි මොකට ද? එයා මැරුම් කන්න. එයා මැරෙන්න.

දැන් ඉස්සර කුකුළෙක් මාස හයක් ජීවත් වුණා. මාස හයක් ජීවත්වෙලා තමයි එයා මරනයට ගත්තේ. දැන් මාස හයක් ජීවත් වෙච්ච කුකුළා තාක්ෂණය විසින් මාස හතරෙන් මරන තැනට ගෙනාවා. ඊට පස්සේ මාස තුනෙන් මරන තැනට ගෙනාවා. දැන් දවස් 45 න් මරනවා. දැන් මේ තාක්ෂණය තව දියුණු කරනවා, කොහොමද? මේ කුකුළා දවස් 20 න් මරන්නෙ කියලා. එතකොට, දැන් මොකක්ද මේ වෙන්නේ?

එදා මාස හයක් ජීවත් වෙච්ච කුකුළා දැන් මාස හයට හතර පාරක් මැරුම් කනවා. ඒ කියන්නේ, අකුසල් විපාක දීමේ වේගය වැඩියි. අකුසල් විපාක දීමේ වේගය වැඩිවෙන්න, වැඩිවෙන්න සත්ත්වයාගේ ආයුෂයන් හීනභාවයට පත්වෙනවා. එහෙනම්, අකුසල් විපාකදීමට අදාළ ලෝකයක් තමයි අද අප ඉදිරියේ බිහිවෙන්නේ. ඉස්සර හරකෙක් මැරුවේ අවුරුදු 10 ක් 15 ක් ජීවත්වෙලා. දැන් හරකා මාස හයේ දී ම අර යූරියා ගහලා තණකොළ දීලා මහත් කරලා අවුරුද්දෙන් මසට ගන්නවා. ඉස්සර ඌරෙක් මැරුවේ අවුරුදු පහක් ගිහිල්ලා. දැන් ඌරාට එන්සයිම් දීලා මාස හයෙන් ඌරව මරන්න ගන්නවා.

මොකක්ද අපි මේ දකින්නේ? අකුසල් විපාක දීමේ වේගය වැඩියි. අකුසල් විපාක දීමේ වේගය සත්ත්වයා තුළ මේ විදියට වැඩිවෙන්නේ කුමක් නිසා ද? මනුස්සයා සත්ත්ව ඝාතනය දැඩි ආකාරයෙන්, සත්ත්ව හිංසාව දැඩි ආකාරයෙන් සිද්ධ කරනවා. ඒ නිසයි සත්ත්ව ඝාතනයෙන්, සත්ත්ව හිංසනයෙන් වැළකෙන්න

කියලා, පළමුවෙනි සිල්පදයෙන් "වැලකෙන්න" කියලා කියන්නේ. ඒක තමයි පාණාතිපාතා වේරමණී, කියල කියන්නේ.

එතකොට, *"අදින්නාදානා වේරමණී...."* අන් සතු දේ සොරා ගන්නවා කියනවා. එතකොට, අන් සතු දේ සොරා ගන්නවා කියන එකේ පාප කර්මය මහා බලවත් පාප කර්මයක්. අන් සතු දේ සොරාගත්ත ප්‍රේතයෝ ඉන්නවා. මේ ජීවිතයේ අන් සතු දේ සොරකම් කරලා, අනුන්ගෙ දේ හොරකම් කරල ප්‍රේත ලෝකයට වැටෙනවා. ප්‍රේත ලෝකයට වැටුණට පස්සේ, දැන් එයා යනවා කෑමක් සොයාගෙන. එයාට පේනවා හොඳ බත් පිඟානක් තියෙනවා. නමුත් මේ කෑම එක ළඟට යනකොට ම කෑම එක අතුරුදහන් වෙලා යනවා. තේරුණාද? එතකොට, එයා දකිනවා දිය කඩිත්තක් තියෙනවා. එයාට පේනවා ලස්සනට වතුර ටික තියෙනවා. නමුත් එතෙන්ට ගියාම දිය කඩිත්ත අතුරුදහන් වෙලා යනවා. ඇයි? අනුන්ගේ දේ සොරකම් කළා.

ඒ නිසා, අනුන්ගේ දේ සොරකම් කිරීම නිසා ප්‍රේත ලෝකයේට වැටුණොත් අපි පෙනි පෙනී බත් පිඟාන තිබුණත්, පෙනි පෙනී සෙම් සොටු ටිකක් තිබ්බත්, ඒක කන්න යනකොට ඒක අතුරුදහන් වෙලා යනවා. පෙනි පෙනී වතුර තටාකයක් තිබ්බත්, වතුර ටික බොන්න යනකොට වතුර ටික අතුරුදහන් වෙලා යනවා. ඒ කර්ම විපාකය.

ඒ වගේ ම මනුස්ස ලෝකයේ උත්පත්තියක් ලැබුවත් අන්ත දුප්පත් වෙලා හැමදේකින් ම අඩුපාඩු සහිත ජීවිතයක් එයා ලබනවා. මොකද, පෙර ජීවිතයේ දී එයා අනුන්ගේ දේ සොරාගත්තා. අනුන්ට අයිති දේ එයා පැහැර ගත්තා. ඒ නිසා අන් සතු දේ සොරාගැනීම කියන්නේ, අපි සතර අපායට වැටුණත් අපිට පෙනි පෙනී තියෙන ආහාරය අතුරුදහන් වෙනවා; පෙනි පෙනී තියෙන ජල බඳුන අපිට අතුරුදහන් වෙනවා. ඉතින් ඒකෙන් වළකින්න කියලයි බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ.

ඊට පස්සේ, *"කාමේසු මිච්චාචාරා වේරමණී සික්ඛාපදං සමාදියාමි."* ඒ කියන්නේ, කාමයෙහි හැසිරීම නිසා... ඒකයි මම මුලින් කිව්වේ, කාමයේ හැසිරීම නිසා, වැරදි හැසිරීම් නිසා ගොඩාක් අය ඉන්නවා, නිරයන්ට වැටිලා. ඒගොල්ලෝ ප්‍රේත ලෝකවලට වැටුණාට පස්සේ හරි අපුලයි. අපුලයි කියන්නේ, ඒගොල්ලන්ගේ ශරීර හැම තැන ම කුණුවෙලා, වණ වෙලා තියෙන්නේ. ඒ කුණු වෙලා, වණ වෙලා තියෙන ශරීර දරාගෙන ඒගොල්ලෝ ජීවත් වෙනවා. ඒගොල්ලෝ අනිත් ප්‍රේතයින් ළඟට කාමය ඉල්ලගෙන යනවා. නමුත් කිසි ම කෙනෙක් ඒගොල්ලෝ ළඟට එන්නේ නැහැ.

එතකොට කාමය නො ලැබීමේ දුක එක පැත්තකින් දරාගෙන, අනිත් එක, මේ ශරීරයේ මේ තුවාලවල දුක තව පැත්තකින් දරාගෙන, ප්‍රේත ලෝකයේ ඒගොල්ලෝ කල්ප ගණන් දුක් විඳිනවා. ඉතින් ඒ නිසා කාමයේ වරදවා හැසිරීම කියන එකට, කාම වස්තුව වැරදි ආකාරයෙන් අපි පරිහරණය කරන්න නරකයි. දැන් මේ ශරීරය කියන්නේ කාම වස්තුවක්. තේරුණා ද? අපි මේ ශරීරය ඇඳුමෙන් පැළඳුමෙන් හරි අපි ලෝකයාට ප්‍රදර්ශනය කරනවා නම්... අපේ ශරීරය ඇඳුමෙන් පැළඳුමෙන් හරි ලෝකයාට ප්‍රදර්ශනය කරනවා නම්, එය නිරයගාමී අකුසලයක් කියල බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. මේ ශරීරය අනුන්ගේ කාමච්ඡන්දයන් උදෙසා අපි යොමු කරනවා නම්, ඒක නිරය ගාමී අකුසලයක් කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

එතකොට, එහෙම ජීවත්වෙලා ප්‍රේත ලෝකයට වැටිච්ච ප්‍රේතියක් ඉන්නවා. ප්‍රේතියක් එයා. නමුත් එයාගෙ කිසි ම කාන්තා ලක්ෂණයක් නැහැ. එයාගෙ හිසකෙසුත් නැහැ. හිස මුඩුයි. කිසි ම කාන්තා ලක්ෂණයක් එයාගෙ නැහැ. එයා කාන්තා ලක්ෂණයක් නැතුව ප්‍රේත ලෝකයේ දුක් විඳිනවා. ඇයි කාන්තා ලක්ෂණයක් නැත්තේ? එයා පෙර ජීවිතයේ මේ ශරීරයේ ලැබුණා වූ අඟපසඟ

ලෝකයාගේ කාමාස්වාදය උදෙසා යොමු කළා. ඒ නිසා එයාට ඒ ජීවිතයේදි කාන්තාවකට අදාළ වූ අඟපසඟ ලැබිලා නැහැ. නමුත් ප්‍රේතියක්. ඒ නො ලැබීමේ දුක දරාගෙන එයා ප්‍රේත ලෝකයේ ජීවත්වෙනවා.

ඉතින් කාමයෙහි වරදවා හැසිරීම කියන්නේ, අපි ඕනෑ ම කාම වස්තුවක් වැරදි ආකාරයෙන් පරිහරණය කරනවා නම්, ඒක කාමයේ වරදවා හැසිරීමක් බවට පත්වෙනවා. නමුත් එතනදි බුදුරජාණන් වහන්සේ ගිහි පින්වතුන්ලාට දේශනා කරන්නේ, විවාහය තුළින් සතුටුවෙන්න, ඉන් එහාට යන්න එපා කියන කාරණයයි. එතන තමයි බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ. ඉන් එහාට යන්න එපා කියන කාරණය බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

*"මුසාවාදා..."* ඒකෙන් මම කිව්වා අනිවාර්යයෙන් ම මැරිලා ප්‍රේත ලෝකයේට වැටුණොත් කට කුණුවෙලා තමයි ඉපදෙන්නේ. මේ මුළු කට ම කුණුවෙලා; වණ වෙලා; මේ දිවවල් වණ වෙලා. එයා කතා කරන්න උත්සාහ කරනවා; කතා කරන්න කැමතියි. වචන පිටවෙන්නේ නැහැ එයාට. ඒ වචන පිට නො වීමේ දුක දරාගෙන එහෙම ප්‍රේතයො ජීවත් වෙනවා.

එතකොට, ***"මත්පැන් පානය කිරීම"*** නිසා මැරෙන වෙලාවේ මත්පැන් උපාදානය සකස් කරගත්තොත් ඒත් අපි අනිවාර්යයෙන්ම ප්‍රේත තලයන්ට වැටෙනවා. දැන් අපි කියමු, ඕගොල්ලෝ ගෙදර පාටියක් දානවා කියලා. දූන් ගෙදර උපන්දින උත්සවයක්. ගෙදර උපන්දින උත්සවේට විශාල පාටියක් දාලා. දූන් වත්තේ මේස තියලා අරක්කු බොනවා; කටගැස්මවල් කනවා; ඔක්කොම කරනවා. මෙතෙන්ට මුළු ගමේ ම ඉන්න බේබදු ප්‍රේතයෝ එනවා. තේරුණාද? දූන් මේ ප්‍රේතයෝ, ඔය වයින් ස්ටෝර්ස් ආශ්‍රිතව, ඔය බාර් ආශ්‍රිතව අප්‍රමාණ ප්‍රේතයෝ ඉන්නවා. ඒගොල්ලෝ මේ මත්පැනට ඇබ්බැහි වෙච්ච ප්‍රේතයො. මතින් මත්වෙලා වගේ ඉන්න ප්‍රේතයොත් ඉන්නවා.

ඒ නිසා ඔබලා දන් පාටියක් දානකොට, දරුවෙකුගේ උපන් දිනයක් උදෙසා හෝ මොකක් හෝ, මේ ප්‍රදේශයේ ම ඉන්න මත්පැන් වලට කැමති ප්‍රේතයෝ ටික තමයි මෙතෙන්ට එන්නේ. ඇවිල්ලා ඒගොල්ලෝ මේ මත්පැන් ඉව කරනවා; සුවඳ කරනවා. ඔබලා ඒවා දන්නේ නැහැ. ඉතින් ඒ වගේ ප්‍රේත ලෝකයේ ඉපදිලා එහෙම වැටුණොත් අපි අනිවාර්යයෙන් ම එතෙන්ට යනවා. ඒ වගේ ම මත්පැන් වෙළඳාම නිසා, අපි කියමු, රටේ අප්‍රමාණ මත්පැන් වෙළඳාම් කරනවානේ. නේද? ඒ අප්‍රමාණ වෙළඳාම් කරන අය කෝටිපති ප්‍රකෝටිපති ජීවිතනේ ගත කරන්නේ.

නමුත් ඒගොල්ලෝ මැරෙන වෙලාවට මොකක් හරි කළා වූ පිනුත් තියෙනවනේ. පිනක් උපාදානය වෙලා මනුස්සයෙක් වෙනවා. එහෙම මනුස්සයෙක් වුණොත් එයා ඉස්කෝලේ යන කාලෙ ම බොන්න පුරුදු වෙනවා. අපි කියන්නේ, "අවුරුදු 15 දී ම මෙයා බේබද්දෙක් වුණා" කියලා. එතකොට මොකක්ද ඒ වෙන්නේ? එයා පෙර ජීවිතයේ අනිවාර්යයෙන්මම කළේ මත්පැන් විකුණන එකයි, අනුන්ට මත්පැන් පොවන එකයි. එතකොට එයා තරුණ කාලෙ ම බේබද්දෙක් වෙනවා. තරුණ කාලෙ ම බේබද්දෙක් වෙලා එයා දූන් බඳිනවා. බැන්දට පස්සේ ඒ නෝනාත් ජීවිතයේ අප්‍රමාණව දුක් විඳිනවා. නේද? ඇයි අර බේබදු කෙනෙක්නේ බැන්දේ. ගහනවා; ගුටි කනවා; සල්ලි නෑ.

එතකොට ඒ නෝනා කවුද? ඒ නෝනත් ඇවිල්ලා ගිය ජීවිතයේ මත්පැන් විකුණන කෙනෙක්ගේ නෝනා කෙනෙක්මයි. දැන් මේ ජීවිතයේ කෝටිපති බවට පත්වෙච්ච මත්පැන් විකුණන මහත්තයෙක්ගේ නෝනා අප්‍රමාණ සැප විඳිනවානෙ. නමුත් එයා සැප විඳින්නේ පවුල් කීයක් විනාශ කරල ද? පවුල් කීයක් අසනීප, ලෙඩරෝග කරල ද? එතකොට එයා මැරිලා ඉපදුණහම අර වගේ බේබදු මහත්තයෙකුගේ බිරිඳ වෙලා තමයි ඉපදෙන්නේ.

**අතුරු ප්‍රශ්නය :**

**නමුත් සැමියාගේ ක්‍රියාවට විරුද්ධ වුණු කාන්තාවක් නම් ස්වාමීන් වහන්ස?**

**පිළිතුර :**

විරුද්ධ වෙච්ච බිරිඳක් නම් වෙනස් වෙන්න පුළුවන්. නමුත් එවැනි විරුද්ධතාවයක් ලේසියෙන් මතුවෙන්නේ නැහැ. මොකද, අතන සම්පත් වැඩිවෙන්න, වැඩිවෙන්න එයා මේකට ග්‍රහණය වෙලයි තියෙන්නේ. එහෙම වෙන්නෙ නැහැ. එහෙම විරුද්ධතාවයක් තියෙනවා නම් ඔච්චර දුරදිග යන්නේ නෑ. නමුත් ඒවාට අනුබල දෙමින්, ඒවායින් පෝෂණය වෙමින්, ඒවායින් සැප විඳිනවා නම්; එහෙම කෙනෙක් තමයි අර මනුස්සයාට බිරිඳක් වෙන්නේ.

දැන් මේ ජීවිතයේ එක තරුණ මහත්තයෙක් ඉන්නවා. එයා තරුණ කාලෙ ම, ඉස්කෝලෙ යන වයසෙ ම බොන්න පටන් ගන්නවා. ලක්ෂ ගාණක් වියදම් කරලා බොනවා. අවසානෙදි සේසත ම නැතිවෙලා මිය පරලොව යනවා. මෙයා පෙර ජීවිතයේ වයින් ස්ටෝර්ස් මුදලාලි කෙනෙක්. මොකද, එයාගෙ ජීවිතයේ ම එයා කරලා තියෙන්නේ අනුන්ට මත්පැන් විකුණන එක. ඒ නිසා අප්‍රමාණ මිනිස්සු පීඩාවට පත්වෙලා.

ඉතින් ඒ නිසා මේවා, සිල්පද පහ කියන කාරණයෙන් මෙලොව වශයෙනුත් අපි පිරිහීමට පත්වෙනවා. මොකද, අපේ කීර්තිය නැතිවෙලා යනවා. සීලයට අදාළ වූ ආනිශංසයන්ගෙන් අපි දුර්වල වෙනවා. මේ ජීවිතයේ අපි පිරිහෙනවා වගේ ම පරලොව ජීවිතයට වැටුණට පස්සේ අප්‍රමාණ දුකට පත්වෙනවා.

# සිල්පද බිඳගත් අයගේ නිවහන සතර අපායයි

**පස්වන ප්‍රශ්නය :**

**ගෞරවණීය ස්වාමීන් වහන්ස, ඔබ වහන්සේ මේ පැහැදිලි කරන කාරණාත් එක්ක මට දැන ගැනීමට අවශ්‍ය තවත් කාරණයක් තියෙනවා. බුද්ධියෙන් හීනවීම, එහෙම නැතිනම් මන්ද බුද්ධික භාවයට පත්වීම පිළිබඳව මේ ප්‍රශ්නය. කොහොමද ස්වාමීන් වහන්ස, පුද්ගලයින් මන්දබුද්ධික භාවයට පත්වන්නේ?**

**පිළිතුර :**

මන්දබුද්ධික භාවයට පත්වෙන්නේ, ගිහි ජීවිතයේ ජ්‍යොතිෂය, යන්ත්‍රමන්ත්‍ර, ගුරුකම් කරන අය. තේරුණාද? යන්ත්‍රමන්ත්‍ර, ගුරුකම් ජ්‍යෝතිෂයේ කරනවා කියන්නේ මෝහයයි උගන්වන්නේ. හේතුඵල ධර්මයන් දකින්නේ නැහැ; සංස්කාරයන්ගේ ස්වභාවය දකින්නේ නැහැ. දැන් වර්තමානයේ යමෙක් යන්ත්‍රමන්ත්‍ර, ගුරුකම්, හදි හූනියම්, ජ්‍යොතිෂය වගේ ඔය දේවල් කරනවා නම්, එයා අනිවාර්යයෙන් ම ඊළඟ ජීවිතයේ මන්ද බුද්ධික මනුස්සයෙක් වෙන්න බලාපොරොත්තු වෙන්න ඕන.

දැන් අනාගතයේ දී මන්ද බුද්ධික උපත් ලෝකයේ වේගයෙන් වැඩි වෙනවා. වෛද්‍ය තාක්ෂණය කොච්චර දියුණු වුණත්, ලෝකයේ වෛද්‍ය විද්‍යාව කොච්චර දියුණු වුණත්, ඒ වෛද්‍ය විද්‍යාවෙන් කොච්චර ලෝකයේ වටිනා බෙහෙත් හොයා ගත්තත්,

කවදාක්වත් මේ සංස්කාර යට කරන්න වෛද්‍ය විද්‍යාවට බැහැ. තේරුණාද? මේ ලෝකය නිරෝගී කරන්න වෛද්‍ය විද්‍යාවට බැහැ. ඒගොල්ලෝ කොච්චර දියුණු වුණත් බැහැ.

මොකද, ඒ ගොල්ලෝ කොච්චර දියුණු බෙහෙත් නිපදෙව්වත්, ඊට වඩා භයානක විෂබීජයක් මනුස්සයා තුළින් සකස් වෙනවා. මනුස්සයා තුළින් මේ භයානක විෂබීජය සකස් කරන්නේ කවුද? දුශ්ශීල භාවය විසින්. ඒඩ්ස් කියන රෝගය සකස් කළේ කවුද? දුශ්ශීල භාවයමයි. ඔය අනිත් කොලෙස්ටරෝල් වේවා, දියවැඩියාව වේවා, ඔය වකුගඩු රෝග වේවා ඔය සියල්ල ම දුශ්ශීල භාවය තුළින් ම සකස් කරගන්නා වූ රෝග. කාමයන් කෙරෙහි තියෙන කැමැත්ත නිසා ම.

ඒ නිසා කවදාක්වත් වෛද්‍ය විද්‍යාව දියුණු වුණා කියලා මේවාට ප්‍රතිකාර සොයන්න බැහැ. මොකද, ඊට වඩා ශක්තිමත් විෂබීජයක් මනුස්සයා තුළින් මතුවෙනවා. මනුස්සයා තුළින් මතුකරල දෙන්නේ කවුද? දුශ්ශීල භාවය විසින්.

ඒ නිසා ලෝකය නිරෝගී කරන්න ඕන නම්, බෙහෙත් හොයලා වැඩක් නැහැ. ලෝකයා නිරෝගී කරන්න ඕන නම්, පන්සිල් පද පහ තුළ ජනතාව ශක්තිමත් කරන්න ඕන. එතනින් තමයි ලෝකයා නිරෝගී වෙන්නේ. තේරුණාද? ඉතින් ඒ නිසා අනිවාර්යයෙන් ම පන්සිල් පද පහ දුර්වල වුණොත් අපි දකින අර විෂමකාරී ලෝකය, ඒ කියන්නේ විකෘති වූ, තව අවුරුදු 1500 ක් යද්දි මෘග සංඥාව සකස් වෙන ලෝකයක් සකස් වෙනවා. මෘග සංඥාව කියන්නේ, මනුස්සයා මෘගයෙක් වෙනවා. කෙනෙක් තව කෙනෙක්ව දකින්නේ ගෝනෙක්, මුවෙක් හැටියට. මරාගන්න හිතෙනවා කියනවා. මේ මුළු පෘථිවිය ම ලේ විලක් වෙනවා කියනවා. දැන් අපි මේ දකින, මේ සමාජයේ විකෘති භාවය මේ මෘග සමාජයේ මුල් අදියර තමයි; බීජ අවස්ථාව තමයි, අපි මේ සමාජයේ දකින්නේ. මොකක්ද බීජ අවස්ථාව? ඒ සා මනුස්සයා ශීලයෙන් දුර්වල භාවයට පත්වෙනවා.

ඒ නිසා අනිවාර්යයෙන් ම දකින්න, සතර අපාය කියන්නේ සිල්පද බිඳගත්ත අයගේ ලෝකයයි. සිල්පද බිඳගත් අයගේ ලෝකයයි. මේ ජීවිතයේ යමෙක් සිල්පද බිඳගන්නවා නම් එයා අනිවාර්යයෙන් ම සතර අපායේ දුකට කැමති වෙන්න ඕන කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

**අතුරු ප්‍රශ්නය :**

**ස්වාමීන් වහන්ස, ඔබ වහන්සේ අපිට සඳහන් කළා ජ්‍යොතිෂ්‍යය වැනි විද්‍යාවන් තුළින් මිනිසා මුළා වෙනවා කියලා. සිද්ධාර්ථ කුමරුවන් අනිවාර්යයෙන් ම බුදු වන බවට කොණ්ඩඤ්ඤ වැනි බමුණන් ප්‍රකාශ කළා. එහෙම වෙන්නේ කොහොමද ස්වාමීන් වහන්ස, ජ්‍යොතිෂ්‍යය මිථ්‍යාවක් නම්?**

**පිළිතුර :**

මෙහෙමයි, කොණ්ඩඤ්ඤ බමුණා තමයි කියන්නේ, අනිවාර්යයෙන් ම බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයට පත්වෙනවා කියලා. නමුත් එහෙම කිව්ව කොණ්ඩඤ්ඤ බමුණා ම, බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයට පත්වෙලා පස්වග මහණුන් හොයාගෙන ආපු වෙලාවේ බුදුරජාණන් වහන්සේව ප්‍රතික්ෂේප කරනවා.

"මේ මෙයා එන්නේ බුදුවෙලා නෙවෙයි. මෙයා මේ, හොරයක් වංචාවක් කරලා එන්නේ. මෙයාගෙ පා දෝවනය කරන්න එපා. මෙයාව පිළිගන්න එපා. මෙයාට ආසන පනවන්න එපා.." කියලා කවුද ප්‍රතික්ෂේප කරන්නේ? කොණ්ඩඤ්ඤ බමුණාමයි.

ඒ නිසා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, මේකේ ඇත්තක් ඇත්තෙත් නැහැ. ඇත්තක් නැත්තෙත් නැහැ. මේක බොරුමත් නොවෙයි. ඇත්තමත් නොවෙයි. ඒ නිසා බුදුරජාණන් වහන්සේ අපිට කියන්නේ, ජ්‍යොතිෂ්‍යයේ යන්ත්‍රමන්ත්‍ර, ගුරුකම් කියන්නේ තිරශ්චීන ධර්ම. තිරශ්චීන ධර්ම කියන්නේ තිරිසන්

ධර්ම. හාමුදුරු කෙනෙක් හැටියට, ප්‍රාතිමෝක්ෂය රකින උපසම්පදා භික්ෂුවක් හැටියට අපිට කාටවත් තෙල් ටිකක් මතුරලා දෙන්න බැහැ. තේරුණාද? මතුරලා නූලක් බඳින්න බැහැ. පිරිත් නූලක් බඳින්න පුළුවන්. තෙල් ටිකක් මතුරලා දෙන්න, කෙනෙකුට බෙහෙතක් කියන්නත් අපිට බැහැ.

ඒ කියන්නේ, ඒවා තිරශ්චීන ධර්මයන් හැටියට බුදුරජාණන් වහන්සේ බැහැර කරලා තියෙනවා. මොකද, යන්ත්‍රමන්ත්‍ර, ගුරුකම් තුළින් මොකද කරන්නේ, සංස්කාරයන්ගේ ස්වභාවය බැහැර කරනවා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, අපිට ජීවිතයේ යම් ප්‍රශ්නයක් මතුවෙලා තියෙනවා නම්, ඒ ප්‍රශ්නය අපි කළා වූ දේ තුළින්මයි මතුවෙලා තියෙන්නේ. අපි කළා වූ දෙයක් තුළින්මයි මතුවෙලා තියෙන්නේ. එහෙනම් අපි කළා වූ දෙයක් මතුවෙලා තිබෙනවා නම් අපේ මේ ජීවිතයේට දුකක් සකස් වෙනවා නම්, ප්‍රශ්නයක් සකස් වෙනවා නම් ඒ කියන්නේ අකුසලයක් විපාකෙට එනවා.

අකුසලයක් විපාකෙට එනවා නම් අපි මොකක්ද කරන්න ඕන? කුසලය තුළින් ඒ අකුසලය යටපත් කරනවා. එහෙනම් අපි කරන්න ඕන මොකක්ද? බෝධි පූජා තියමින්, පින්කම් කරමින්, දන් දෙමින් අපේ අකුසල් තියෙනවා නම් යටකර ගන්න එකයි කළ යුත්තේ. එහෙම නැතුව ජ්‍යොතිෂ්‍යය, යන්ත්‍රමන්ත්‍ර, ගුරුකම් කරා අපි ගියොත් අනිවාර්යයෙන් ම අපි මන්ද බුද්ධික ජීවිතයක් බලාපොරොත්තු වෙන්න අපිට සිද්ධ වෙනවා. මේ බුදුරජාණන් වහන්සේගේ ධර්මය.

මොකද, අපි දන්න එක්තරා ස්වාමීන් වහන්සේ කෙනෙක් ජීවිත කාලය ම යන්ත්‍රමන්ත්‍ර, ගුරුකම් කළේ. එයා ඇත කැලේක හිටියේ. කැලේක හිටියත් එයා ඒක තමයි කළේ. ඒ ස්වාමීන් වහන්සේ අපවත් වෙනවා, දීර්ඝ කාලයක් වැඩ හිඳලා. අපවත් වුණාට පස්සේ උන්වහන්සේ ගිහිල්ලා උත්පත්තිය ලබලා තියෙන්නේ මේ

රෞද්‍ර ප්‍රේතයෙක් වෙලා. රෞද්‍ර ප්‍රේතයෙක්... ඒ රෞද්‍ර ප්‍රේතයාගේ ස්වභාවය, ස්වාමීන් වහන්සේ නමක් උතුම් සමාධියෙන් දැකලා තියෙනවා, උල් නිකටක් තියෙන, වඳුරු මුහුණක් තියෙන ප්‍රේතයෙක්. එයාගෙ මේ දතක් මහපට ඇඟිල්ලක් විතර දිගයි කියනවා. තියුණු දත්. තේරුණාද? ඒ ස්වාමීන් වහන්සේ සමාධියෙන් පසුවෙනකොට එයා ඒ ස්වාමීන් වහන්සේගේ ඉදිරියට ඇවිල්ලා කටකට ගාලා දත්මිටි කාලා තියෙනවා. මොකද, ඒ තරම් වෛරයෙන් ඒ ප්‍රේතයා ඉන්නේ. ඒ තරම් වෛරයෙන්. මොකද එයාගෙ ස්ථානෙනෙ ඒක.

ඒ ස්ථානයට තමයි අර හාමුදුරුවෝ ගිහිල්ලා තියෙන්නේ. දැඩි වෛරෙන් එයා කටකට ගාලා දත්මිටි කනවා, ස්වාමීන් වහන්සේට සමාධියෙන් ඇහෙනවා. ඒ වෙලාවේ ස්වාමීන් වහන්සේ කියලා තියෙනවා "ඔබ කරගත්තා වූ පව්කම් මදිවට ද ඔය තව පව්කර ගන්නේ?" කියලා. ස්වාමීන් වහන්සේට සැක හිතිලා තියෙනවා, මේ නම් අර අපවත් වෙච්ච හාමුදුරුවොමයි කියලා.

ඒ නිසා උන්වහන්සේ පින් දීලා තියෙනවා දිගින් දිගට ම. සතියක් දෙකක් යනකොට උන්වහන්සේට ආයෙමත් අර ප්‍රේතයා දර්ශනය වෙලා තියෙනවා. එදා පෙනුණ ප්‍රේතයාගේ අර තද ගතිය නෑ. එයා දත්මිටි කන්නේ නෑ. නිකන් සෞම්‍ය ස්වභාවයෙන් ඇවිල්ලා පෙනී හිටලා තියෙන්නේ. මේ ස්වාමීන් වහන්සේ තවතව එයාට පින් දීලා තියෙනවා. ඊට පස්සේ එයා දර්ශනය වෙලා තියෙනවා, පරදත්තරූප ජීවී ප්‍රේතයෙක් හැටියට. ඒ කියන්නේ, අලුත් සුදු සරමක්, සුදු නැෂනල් එකක් ඇඳපු ප්‍රේතයෙක්. නමුත් කළුයි; සද්දන්තයි. නමුත් මේ ප්‍රේතයා ස්වාමීන් වහන්සේ ඉස්සරහා පෙනී හිටලා, එයා මේ ඇස් කරකවනව ලු; ඔළුව උස්සනව ලු; අත ගස්සනව ලු.

මෙහෙම, බලන කොට දූන් ස්වාමීන් වහන්සේ බලලා තියෙනවා, මොකක්ද මේ වෙන්නේ කියලා. එතකොට, බලනකොට මන්ද බුද්ධික ප්‍රේතයෙක්. ඇයි මන්ද බුද්ධික භාවයට ප්‍රේතයා

වැටුණේ? අර ජීවිතයේ යන්ත්‍ර මන්ත්‍ර, ගුරුකම් ඔක්කොම කරපු නිසා. ඒකයි කියන්නේ. ඇයි මන්ද බුද්ධික වුණේ? එයා ලෝකයාට මෝහයයි ඉගැන්නුවේ. සංස්කාරයන්ට අදාළ වූ ධර්මය කියලා දුන්නේ නැහැ. ශ්‍රද්ධාවට අදාළව ධර්මයක් කියලා දුන්නේ නැහැ. මෝහයයි එයා ඉගැන්නුවේ.

**අතුරු ප්‍රශ්නය :**

**එතකොට, එවැනි තිරශ්චීන ධර්මයක් පිළිබඳව විශ්වාස කරන අයට කුමක්ද වෙන්නේ ස්වාමීන් වහන්ස?**

**පිළිතුර :**

ඒ පිළිබඳ විශ්වාසය තිබෙන තාක් කල් ශ්‍රද්ධාව සකස් වෙන්නේ නැහැ. මොකද, කෙනෙක් තුළ ශ්‍රද්ධාව සකස් වෙන්න නම් අන්‍ය ශීල ව්‍රතවලින් බැහැර වෙන්න ඕන. අන්‍ය ශීල ව්‍රත කියන්නේ, ඔය යන්ත්‍ර මන්ත්‍ර, ගුරුකම්. ඒවා තමයි අපේ රටේ අන්‍ය ශීල ව්‍රතවලට ගැනෙන්නේ.

# ද්වේශය වැඩීමේ ආදීනවයන් දකිමින් ද්වේශයෙන් මිදෙන්න

**භයවන ප්‍රශ්නය :**

**ගෞරවණීය ස්වාමීන් වහන්ස, අපි හැමෝට ම තරහා යනවා. මේ තරහා යාම පාලනය කරගන්න ක්‍රමයක් නැද්ද?**

**පිළිතුර :**

මෙහෙමයි. තරහව කියන කාරණය, ද්වේශය කියන කාරණය, ව්‍යාපාදය කියන කාරණය අපිව දුකට දාන බොහො ම බලවත් ම අකුසල මූලයක්. තේරුණාද? ඒ බලවත් ම අකුසල් මූලය බව අපි නිරතුරුව ම දකින්න ඕන.... මම ඒකයි කිව්වේ, ලෝකයේ අපිට යමක් ලැබිලා තියෙනවා නම්, ඒ ලැබිලා තියෙන්නේ ඒ අපිට ලැබෙන්න තියෙන දේ.

ඒ නිසා කොතැනකවත් අපිට අසාධාරණයක් සිද්ධ වෙලා නැහැ. ඒ නිසා ඔබට ස්වාමි පුරුෂයෙක් ලැබුණා නම් ඒ ලැබුණේ ඔබේ සංස්කාරයන්ට ගැළපෙන ස්වාමි පුරුෂයෙක්. ඔබට දරුවන් ලැබුණා නම් ඔබට ලැබුණේ ඔබේ සංස්කාරයන්ට ගැළපෙන දරුවෝ. ඔබට අම්මා, තාත්තා කෙනෙක් ලැබුණා නම්, ඒ අම්මා තාත්තා ඔබට ලැබුණේ ඔබේ සංස්කාරයන්ට ගැළපෙන අම්මා, තාත්තා කෙනෙක්. ඔබට රැකියාවක් ලැබිලා තියෙනවා නම්, ඔබට ඒ රැකියාව ලැබිලා තියෙන්නේ ඔබේ සංස්කාරයන්ට ගැළපෙන

රැකියාවක්. ඔබට යම් සමාජ තත්ත්වයක් ලැබිලා තිබෙනවා නම් ඒ සමාජ තත්ත්වය ඔබේ සංස්කාරයන්ට ගැළපෙන සමාජ තත්වයක්.

එහෙනම් කොතැනක වත් මෙතන වරදක් නැහැ. කොතැනකින් වත් අපිට වරදක් වෙලා නැත්නම් සංස්කාරයන්ට අනුව සියල්ල ලැබිලා තියෙන්නේ. අපි කොතෙන්ට වත් ගැටෙන්න යන්න අවශ්‍යතාවයක් නැහැ. අපි දකින්න ඕන, අපිට යමෙක් ඔරවනවා නම්, අපි සංසාරයේ කාට හරි ඔරවලා ඇති. අපිට යමෙක් බනිනවා නම්, අපි සංසාරයේ කාට හරි බැනලා ඇති. එහෙම කියලා අපි ඒක ගළපගන්න දක්ෂ වෙන්න ඕන. මොකද, ඒකේ ඵලය තමයි අපිට මේ ජීවිතයේදි ලැබෙන්නේ.

සමහරු ඉන්නවා, එයා යන යන තැන බැනුම් අහනවා. ඒ එයා පෙර ජීවිතයේ වඩලා තියෙන දෙයක්. සමහරු ඉන්නවා, යන යන තැන එයාට ප්‍රසාදය ලැබෙනවා. ඒ පෙර ජීවිතයේ එයා මෛත්‍රියෙන් යුතුව කටයුතු කරලා තියෙනවා. දැන් අපිට පේනවා, මේ සමාජයේ කොච්චර නම්, ද්වේශයෙන්, කේන්තියෙන් කටයුතු කරන අය ඉන්නවද කියලා අපිට පේනවානේ. සමහර විට එයාගෙ රැකියාවෙදි වෙන්න පුළුවන්; ව්‍යාපාරයෙදි වෙන්න පුළුවන්. එයා ඉස්සරහට එන කෙනෙක්ව සතුටු කරන්න එයා කැමති නැහැ. ඕන තරම් හිනාවකින් හරි සතුටු කරන්න පුළුවන්. නමුත් එයා හිනාවකින් වත් තව කෙනෙක් සතුටු කරන්න කැමති නැහැ.

ඉතින් එහෙම අය කීදාහක් සමාජයේ ඉන්නවද? ඉතින් එහෙම අය ඊළඟ ජීවිතයේ මනුස්සයෙක් වුණොත් එයාට හැම තැනින් ම පීඩාවන්මයි සකස් වෙන්නේ. දකින දකින කෙනා එයාට ඔරවනවා මිසක් කවදාක්වත් හිනාවෙන්නේ නැහැ. ඒ එයාගෙ අකුසල් විපාකය.

ඒ නිසා ද්වේශය කියන්නේ ඵස්සය. ඵස්සය කියන්නේ කාරණා තුනක එකතුව. කාරණා තුන මොකක්ද? අධ්‍යාත්මික

රූපයත්, බාහිර රූපයත්, විඤ්ඤාණයත්. ඒ කියන්නේ, ඇසත්, අකමැති රූපයත්, විඤ්ඤාණයත් එකතු වෙනවා; ඵස්සය කණත්, අකමැති ශබ්දයත්, විඤ්ඤාණයත් එකතු වෙනවා. ඵස්සය මනසත්, අකමැති සිතිවිල්ලත්, විඤ්ඤාණයත් එකතු වෙනවා, ඵස්සය. මේ ඵස්සය නිත්‍ය වශයෙන් ගත්තු තැනදි කේන්තිය සකස් වෙනවා.

ඒ නිසා බුදුරජාණන් වහන්සේ කියනවා, "දැක්කා ය කියන තැන නවතින්න. ඇසුණා ය කියන නවතින්න. දැනුණා ය කියන තැන නවතින්න." මට දැන් මෙතන ඉන්න කොට ඇහෙනවා, මට පිටිපස්සෙන් මට කවුරුහරි බනිනවා. බනින කෙනාත් මට දැනෙනවා. බනින වචනත් මට ඇහෙනවා. මම ඇසුණා කියන තැන නවතිනවා. ප්‍රශ්නයක් වෙනවද? නැහැ. ඇසුණා කියන තැන නැවතුණා. මම රූපයක් දකිනවා. එය අකමැති රූපයක්. මම දැක්කා කියන තැන නැවතුණා. ප්‍රශ්නයක් වෙනවද? නැහැ. සිතිවිල්ලක් දැනෙනවා. ඒ සිතිවිල්ල තරහාකාරයෙක් පිළිබඳව. නමුත් දැනුණා කියන තැනින් නවතිනවා. ප්‍රශ්නයක් වෙනවද? තෘෂ්ණාවෙන් තෙත් කරන්නේ නැහැ. තෘෂ්ණාවෙන් තෙත් කළොත් තමයි ඇලීම්, ගැටීම්, උපේක්ෂාවන් කරා යන්නේ.

ඒ නිසා කේන්තියක් එන වෙලාවෙදි, අපි දැක්කා කියන තැනින් ඒක නවත්ත ගන්න; දැනුණා කියන තැනින් නවත්තගන්න; ඇසුණා කියන තැනින් නවත්තගන්න. දැන් ඊයේ ඔබ තුමියට කේන්තියක් ආවා නම්, දැන් ඒ කේන්තිය තියෙනවා ද? නැහැ. දැන් ඒ කේන්තිය ගැන කල්පනා කරද්දි ඔබ හිතන්නේ, "අනේ! අපරාදෙ මම කේන්ති ගත්තා" කියලා. එහෙනම් ඊයේ කේන්තිය ඔබට අයිති නැහැ. නමුත් කේන්තිය ඔබට අයිති නැති වුණත් කේන්තිය නිසා සකස් වුණා වූ අකුසලය විපාකය පිණිස ඔබ පිටුපස්සේ තියෙනවා.

එහෙනම් ඔබේ මුළු ජීවිත කාලයේ ම ඔබ මේ දක්වා කොච්චර කේන්තිගන්න ඇත්ද කියලා ඔබ මොහොතක් සිතන්න.

ඒ කිසි ම කේන්තියක් දැන් ඔබට අයිති ද? නැහැ. කිසි ම කේන්තියක් ඔබට අයිති නැති වුණත්, ඔබ ගත්තා වූ කේන්තිය නිසා සකස් වුණා වූ අකුසලය විපාකය පිණිස ඔබට තියෙනවා. ඒ නිසා කේන්තිය අපිට අයිති නැහැ. ඒ නිසා කේන්තිය කියන්නේ ඵස්සය. ඔබට අයිති නැත්නම්, ආවා වූ කේන්තියට ආපු විදියට ම යන්න දෙන්න. එච්චරයි.

එහෙම නැත්නම්, ඔබට කේන්තිය එනවා නම් එක මොහොතක ම ඔබ තනියම හිනාවෙන්න, මොහොතක්. ඒ වගේ උපක්‍රමශීලීව ඔබ මේක යටපත් කරගන්න දක්ෂ වෙන්න ඕන. ඉතින් එහෙම නො දැක්කොත් අනිවාර්යයෙන් ම කේන්තිය නිසා, ද්වේශය නිසා අපි අවසානෙ මැරෙන මොහොතේ කේන්තිය හුරු කළොත්... වතුර බිංදුව, බිංදුව එකතු වෙලයි වතුර කළයක් පිරෙන්නේ. ඒ වගේ දරුවා උදෙසා කේන්ති ගත්තත් ඒ කේන්තිය අපිට තව තව ශක්තිමත් වෙලා ඉස්සරහට යන්න පුළුවන්.

ඒ නිසා බුදුරජාණන් වහන්සේ කියන්නේ, රූපය මාරයා හැටියට දකින්න කියලා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, රූපය මාරයා හැටියට දකින්න; හිත මාරයා හැටියට දකින්න.

එක්තරා ස්වාමීන් වහන්සේ නමක් ටිකට් පොතක් විකුණන්න ගෙදරකට ආවා, ළමා නිවාසෙකට ආධාරෙකට. එතකොට, ගෙදර හිටිය මහත්තයා ඒ ස්වාමීන් වහන්සේට හොඳට ම දොස් කියලා එළවගත්තා. ඔබ වහන්සේට මේවා අයිති නැහැ, මේවා වැඩක් නැහැ, සල්ලි අල්ලන්න බැහැ කියලා එළවගත්තා. එළවගෙන එතනින් නතර වුණෙත් නෑ. එයා දැන් හැම කෙනාට ම මේක කිය කිය සතුටු වෙනවා. නමුත් බලන්න එයා කියන මොහොතක් පාසා කොයි සා අකුසලයක් ද සිද්ධ කරගන්නෙ කියලා.

නමුත් ස්වාමීන් වහන්සේ වැරැද්දක් කරන්න පුළුවන්. ඒක අපිට අදාළ නැහැ. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, කාසාය

කණ්ඨක කියන කෙනාටත් සාංඝික කරලා දන් දෙන්න කියලා. එහෙනම් වර්තමානයේ අපේ ස්වාමීන් වහන්සේ කෙනෙක් වැරදි කළා කියලා අපි ඒක අදාළ කරගත යුතු නැහැ. ඒ කරන වැරදි ඒගොල්ලෝ අරගෙන යයි. තේරුණාද?

එතකොට, අර මහත්තයා දැන් මේක කිය කිය බනිනවා. නමුත් ඇයි එයා ඒ බැනලා අකුසල් සිද්ධ කරගන්නේ? එයා ඒ රූපය මාරයා හැටියට දැක්කද? නැහැ. එයා රූපය මාරයා හැටියට දැක්කා නම් එයා මොකද කරන්නේ? "හොඳයි හාමුදුරුවනේ, මෙන්න ටිකට් එකක් මට දෙන්න" කියලා ටිකට් එකක් ගන්නවා. ටිකට් එකක් ගන්න සල්ලි නැත්නම්, "අනේ හාමුදුරුවනේ, මගෙ ළඟ සල්ලි නැහැ. මේ වෙලාවේ කරන්න බෑ." නැත්නම්, රුපියල් 10 නම් තියෙන්නේ රුපියල් 10 දෙනවා. ප්‍රශ්නයක් වෙනවද? නැහැ. ඇයි දැන් වුණේ මොකද, එයා රූපය මාරයා හැටියට දැක්කේ නැහැ.

ඒ නිසා බුදුරජාණන් වහන්සේ කියනවා, රූපය මාරයා හැටියට දකින්න. ඔබ ඉදිරියට කවුරු ආවත් ඒ එන්නේ මාරයා කියලා දකින්න. ඒ එන්නේ මාරයා කියලා දැක්කා නම් එයා නිසා ඔබ අකුසල් කරගන්නේ නැහැ. මොකද, ඔබ දන්නවා, මේ එන්නේ මට අකුසලයක් සිද්ධ කරන්න කියලා. සිතිවිල්ලක් සකස් වෙනකොට ඒ සිත මාරයා හැටියට දකින්න. මොකද, ඒක ලෝභ, ද්වේශ, මෝහ සිතිවිල්ලක් වෙන්න පුළුවන්. ඔබ ලෝභ, ද්වේශ, මෝහ සිතිවිල්ල මාරයා හැටියට දැක්කොත් ඔබ තුළින් ඒ අකුසල් මූලයන් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒ නිසා ද්වේශය සකස්වෙන කොට ම ඒක මාරයා හැටියට දකින්න. මොකද, ඔබව අකුසලය කරායි අරන් යන්නේ.

ද්වේශය අයිති යක්ෂ ලෝකයට. අපේ හාමුදුරුවෝ නමක් දකිනවා, එක් යක්ෂණියක් ගසක ඉන්නවා. ඒ යක්ෂණියගේ මුහුණ රතු ම රතු පාටයි; ලේරතු පාටයි; ලේ පාටයි. මේ ඇස් එළියට පැනලා, ගොබ වගේ රතු පාටයි. මේ ඉස්සරහා දත් දෙක ම දළක්

වෙලා තියෙනවා. දත් දෙක ම දළක් බවට පත්වෙලා. දළ දෙකක් තියෙනවා දෙපැත්තෙන්. මේ යක්ෂණිය දැක්කහම පුපුරනවා එයා. ඒ ස්වාමීන් වහන්සේට ඒ වෙලාවේ හිතුණේ මේ මූණ පුපුරලා යයි කියලා. ඇයි ඒ තරම් ද්වේශය? ඇයි? පෙර ජීවිතයේ ද්වේශයෙන් මැරිලා.

ඒ නිසා ද්වේශය සකස් කරගෙන අපි මැරෙන වෙලාවේ හරි අපට ද්වේශයක් සකස් වෙන්න පුලුවන්. දැන් අශෝක අධිරාජ්‍යයාට එකපාරට ද්වේශයක් සකස් වෙනවා. ද්වේශයක් සකස් වෙලා, එයා පල්ලෙහා තැනක උත්පත්තිය ලබන්නේ. ඒ නිසා කොච්චර පින් කළත් අපි සෝවාන් ඵලයට පත්වෙලා නැත්නම්, මැරෙන වෙලාවේ අවසානයේ සකස් වෙන්නා වූ පරිසරය මත අපිට ද්වේශය සකස් වෙන්න පුළුවන්.

දැන් අපි ඉස්පිරිතාලෙ ලෙඩ ඇඳේ ඉන්නවා. හොඳට ම අසාධ්‍යයි. දැන් මැරෙන්න යන්නේ. නමුත් දොස්තර මහත්තයා දන්නෙ නැහැ. දොස්තර මහත්තයා ඉන්ජෙක්ෂන් එකක් ගහනවා. නමුත් වේදනාව නිසා ම එකපාරට දොස්තර මහත්තයා කෙරෙහි කේන්තිය සකස් කරගන්න කොට ම මැරෙනවා. අපරාදෙ සතර අපායෙ.

මැරෙන වෙලාවේ කවුරු හරි උපස්ථානය කරනවා. උපස්ථාන කරනකොට, එහාට මෙහාට පෙරළන කොට ඔන්න කේන්තියක් එනවා. මොකද, කේන්තිය පුහුණු කළානේ. කේන්තියත් එක්ක ම මැරුණොත් සතර අපායේ.

ඒ නිසා ද්වේශය කියන දේ භයානක දෙයක්. පුංචි පුංචි වතුර බිංදුවෙන් බිංදුව එකතු වෙලා තමයි කළයක් පිරෙන්නේ කියනවා. ඒ නිසා දරුවා උදෙසාවත්, බිරිඳ, මහත්තයා උදෙසාවත් කේන්ති ගන්න එපා කියලයි බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ. මොකද, ඒ කේන්තිය ශක්තිමත් වෙලා අපිව ඉස්සරහට අරන් යනවා.

ඒ නිසා ද්වේශය අනිවාර්යයෙන් ම යක්ෂයාට, තිරිසන් සතාට, විශේෂයෙන් ම ඔය ඉන්න සර්ප කුලයන්ට අයිති දෙයක්. සර්පයෝ කියන්නේ, පෙර ජීවිතයේ ද්වේශය වඩපු අය. ඔය සර්පයාගේ විෂ කියන්නේ මොකක්ද? ද්වේශය. වෙන දෙයක් නෙමෙයි.

එක්තරා මහත්තයෙක් මැරෙන වෙලාවේ, එයා ක්ෂණයෙන් මැරෙන්නේ; මරාගෙන මැරෙන අනතුරකින් මැරෙන්නේ. නමුත් එයා මැරිලා ගිහිල්ලා සර්ප කුලයක තමයි උත්පත්තිය ලබන්නේ. මොකද, එයාට මැරෙන වෙලාවේ සකස් වුණා වූ ද්වේශය.

සර්පයා කියන්නේ ද්වේශයේ ඵලයක්. ඒ ද්වේශයේ විෂ තමයි ඒ සර්පයාගේ විෂ කියන්නේ. මෙහෙම ගහද්දී නයෙකුට පුළුවන් මනුස්සයෙක්ව මරලා දාන්න. ඒක මොකක්ද? පෙර ජීවිතයේ වැඩුවා වූ ද්වේශය. ඒ නිසා ද්වේශය අයිති සර්පයින්ටමයි, ද්වේශය අයිති යක්ෂයාටමයි, තිරිසන් ලෝකයටමයි, කියන කාරණය දකිමින් ද්වේශයෙන් මිදෙන්න අපි දක්ෂ වෙන්න ඕන.

# මෛත්‍රිය වැඩීමේ ආනිශංස

**හත්වන ප්‍රශ්නය :**

**ස්වාමීන් වහන්ස, අපි කොහොමද මෛත්‍රිය පුහුණු කරන්නේ?**

**පිළිතුර :**

මෙහෙමයි. මෛත්‍රිය කියන කාරණය බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ... දැන් අපි මේ ජීවිතයේ ප්‍රසන්න සිරුරක්, ශරීරයක් ලබලා තිබෙනවා නම්, ඒ ප්‍රසන්න ශරීරය ලබන්න අපිට හේතු වුණේ ගිය ජීවිතයේ අපි වඩපු මෛත්‍රී චිත්තයන්මයි. තේරුණාද?

දැන් කාටහරි මේ ජීවිතයේ ලස්සන, ප්‍රසන්න පිරිමි හෝ වේවා කාන්තා හෝ වේවා රූපයක් ලබලා තියෙනවා නම් ඒ රූපය ලැබුණේ අම්මා, තාත්තා නිසා නෙවෙයි. අම්මා සුදු වුණා, තාත්තා සුදු වුණා, ඒ නිසා දරුවා සුදු වෙනවා කියලා කාරණයක් ධර්මයේ නැහැ. අම්මා කළු නිසා, තාත්තා කළු නිසා දරුවා කළු වෙනවායි කියලා ධර්මයක් නැහැ. තේරුණාද?

එතකොට, දැන් එක දරුවෙක් ඉන්නවා. එයා කළුයි. නමුත් එයා ඉස්කෝලෙ යනකොට ළමයි එයාට විහිළු කරනවා. එතකොට, ඒ දරුවා ගෙදර ඇවිල්ලා අම්මාට බනිනවා, "අම්මේ, ඔයා කළු තාත්තා කෙනෙක් බැඳපු හින්දා තමයි මම කළු වුණේ" කියලා. කළු වුණායි කියලා දැන් එයා දුක් විඳිනවා. නමුත් කළු තාත්තා කෙනෙක්

බැන්ද නිසා නෙමෙයි දරුවා කළු වුණේ. ඒ දරුවා ගිය ජීවිතයේ ද්වේශය වඩලා ඊට අදාළ අම්මා කෙනෙක්ගේ මව් කුසකටයි එයා බැස්සේ.

දැන් සුදු අම්මා කෙනෙකුට සුදු දරුවෙක් ඉපදෙනවා. ඒ අම්මා සුදු නිසා නෙමෙයි, දරුවා සුදු වෙන්නේ. ඒ දරුවා පෙර ජීවිතයේ මල් පූජා කරලා, මෛත්‍රිය වඩලා, සුදු වෙන්න තිබ්බ සංස්කාරයන් සකස් කරගත්තා. ඒ නිසයි, සුදු අම්මා කෙනෙක්ගේ මව් කුසකට බැස්සේ. එහෙම නැතුව මේ කළුයි, සුදුයි කියන්නේ අම්මා, තාත්තා සුදු, කලු නිසා නෙවෙයි.

ඒ නිසා මේ ජීවිතයේ අපි ප්‍රසන්න සිරුරක් ලබලා තියෙනවා නම්, ඒක ලබන්න අපි ගිය ජීවිතයේ මල් වට්ටි දහස් ගාණක් පූජා කරලා තියෙනවා; අපි පෙර ජීවිතයේ බෝමළු දසදහස් ගාණක් ඇමදලා තියෙනවා; අපි ගිය ජීවිතයේ මෛත්‍රී චිත්තයන් දසදහස් ගාණක් වඩලා තියෙනවා. එහි ඵලය තමයි අපි මේ ජීවිතයේ ලබන්නා වූ ප්‍රසන්න භාවය. ඒ නිසා මෛත්‍රිය තුළින් බුදුරජාණන් වහන්සේ ආනිශංස එකොළහක් ලැබෙනවා කියලා දේශනා කරනවා.

ඒවා අංගුත්තර නිකායේ මෛත්‍රිය සූත්‍රයේ මෙන්න මේ විදිහට දක්වලා තියෙනවා.

1. සුවසේ නින්ද යනවා.
2. නපුරු සිහින පෙනෙන්නේ නෑ.
3. සුවසේ නින්දෙන් පිබිදෙනවා.
4. සෑම මනුෂ්‍යයෙකුටම ප්‍රියවෙනවා.
5. දෙවියන්ට ප්‍රිය වෙනවා.
6. දෙවියන් විසින් ආරක්ෂා කරනු ලබනවා.
7. ගින්නෙන්, විෂෙන් ආයුධවලින් අනතුරු වෙන්නේ නෑ.
8. ඉක්මණින් සිත සමාධියට පත්වෙනවා.
9. මුහුණේ පැහැය බබලනවා.
10. සිහි මුළා නොවී මැරෙනවා.

11. ඒ ජාතියේදී ම රහත් වීමට නොහැකි නම් මරණින් මතු බඹ ලොවට යාමට හැකි වෙනවා.

එතකොට එහෙනම් මෛත්‍රිය වැඩුවහම අපිට ලැබෙන ආනිශංස මොනවද? මේ කිව්වා වූ ආනිශංස. තේරුණාද? එතකොට, ද්වේශය නිසා අපිව අර වගේ සතර අපායන්ට වැටෙනවා වගේ ම, මෛත්‍රිය කියන කාරණය දිව්‍ය, මනුෂ්‍ය, බ්‍රහ්ම සුගතීන්හි උපදින්න අපිට මාර්ගය සකස් කරලා දෙනවා. ඒක තමයි මෛත්‍රියේ ආනිශංස.

# ගිහිවත

**අටවන ප්‍රශ්නය :**

**ගෞරවණීය ස්වාමීන් වහන්ස, ඔබ වහන්සේ අපිත් එක්ක කරපු සාකච්ඡාවේ දී, ගිහිවත පිළිබඳව විශේෂ අවධානයක් යොමු කළා. එතකොට, ගිහිවත කියලා කියන්නේ මොකක් ද?**

**පිළිතුර :**

දැන් පැවිදි වතක් තියෙනවානේ. අපි යම් දවසක පැවිදි වන මොහොතේ පටන් අපට කරන්න පැවිදි වතක් තියෙනවා. එහි මූලික දේ තමයි, අපේ ගුරුවරයන්ට, අපේ උපාධ්‍යයන් වහන්සේලාට අපි ගරු කරනවා, සලකනවා කියන කාරණය.

ඒ වගේ ම, තව ආරණ්‍යයක් වුණොත් ඒකෙ තියෙනවා වැසිකිළි වත. දානශාලා වත තියෙනවා. බෝමළු වත තියෙනවා. පාරවල් අතුගාන... ඒ වතවල් තියෙනවා. ගිලන් ස්වාමීන් වහන්සේලාට උපස්ථාන වත තියෙනවා. නායක ස්වාමීන් වහන්සේලාට උපස්ථාන කරන වත තියෙනවා. සහෝදර ස්වාමීන් වහන්සේලාට උපස්ථාන... මේ වගේ වතක් තියෙනවා අපිට කරන්න.

මේ වතෙන් තමයි අපේ කෙලෙස් ප්‍රහීණ කරලා දාන්නේ. කෙලෙසුන් ප්‍රහීණ කිරීමේ එක මාර්ගයක් තමයි මේ වත කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ. අපි කවදක්වත් වැසිකිළියක් සෝදන්න කැමති නැත්නම්, කවදාක්වත් අපි නිවන් මාර්ගයේ යන්න කලබල වෙන්න ඕනෙ නැහැ. අපිට කවදාක්වත්

පඩික්කමක් සෝදන්න බැරි නම්, අපි නිවන් මාර්ගයේ යන්න කලබල වෙන්න අවශ්‍යතාවයක් නැහැ. අපි වැඩිහිටි ස්වාමීන් වහන්සේට ගරු කරන්න සලකන්න කැමති නැත්නම්, නිවන් මාර්ග යේ යන්න කලබල වෙන්න අවශ්‍යතාවයක් නැහැ.

මොකද, වත තමයි අපේ කෙලෙස් පිරිසිදු කරලා දාන්නේ. මොකද, වැසිකිළියක් සෝදද්දි අපි ඒ වැසිකිළිය සෝදන්න ඕන, වැසිකිළිය හෝදනවා කියලා නෙමෙයි, තමන්ගේ හිතේ තියෙන කහට, කුණු හෝදනවා කියලයි. වැසිකිළියක් හෝදන මොහොතක් පාසා අපේ හිතේ තියෙන කහට, කුණුයි හෝදලා දාන්නේ; කෙලෙසුයි හෝදලා දාන්නේ. තේරුණාද?

එතකොට ගිහිවත කියන්නේ ගිහි කාලයේ කළ යුතු දේ. මම ඔය ගිහිවත කියන කාරණය පොතේ සඳහන් කරලා තියෙනවා. මම ගිහිකාලේ... මම පැවිදි වෙන්න ඉස්සෙල්ලා, මම අවුරුදු 24 දි මේ තපෝවනයේ නායක ස්වාමීන් වහන්සේ ළඟට මම පැවිදි වෙන්න ආවේ. නමුත් පැවිදි වෙන්න ඇවිල්ලා මම දවස් 10 ක් දසසිල් වෙලා ඉඳලා මම හැරිලා යනවා.

මොකද, ඒ. මට තේරුම් ගියා, මම ළඟ තියන ඒ කාමරාග, පටිසයන් භාවනාවෙන් මට යටපත් කරන්න බැහැ කියලා. ඒ ටික මම ම තේරුම් ගත්තා. මම කවුද කියලා මම ම අවුස්සලා එළියට ගත්තා. එතකොට මම දැනගත්තා, "මගේ ළඟ තිබුණු කාමරාග පටිසයන් මට භාවනාවෙන් යටපත් කරන්න බැහැ" කියලා. ඒ නිසා මම දවස් 10 න් අවසර අරන් ගෙදර යනවා කියලා ගෙදර ගියා. ඒ ගිහිල්ලා, මට පැවිදි වෙන්න තව අවුරුදු 20 ක් ගියා. තේරුණාද? මම පැවිදි වෙන්නේ අවුරුදු 44 දි. ඒ කියන්නේ, මට අවුරුදු 20 ක් ගියා එදා ඉඳන් දූන් පැවිද්දට සුදුසුයි කියන තැනට එන්න.

ඒ අවුරුදු 20 තුළ මම ඔය ගිහිවත කියන කාරණය තමයි සිද්ධ කරගත්තේ. ඒ ගිහිවත තුළින් මම විශේෂයෙන් ම පන්සල් ආශ්‍රිතව, ස්වාමීන් වහන්සේලා ආශ්‍රිතව අප්‍රමාණ පින්කම් සිද්ධ කරගත්තා.

තේරුණාද? දානමය පින්කම්, සීලමය පින්කම්, කඨිනමය පින්කම්... අප්‍රමාණ පින්කම් සිද්ධ කරගත්තා. අනුන්ව පින්කම්වල යෙදෙව්වා. ඒ වගේ ම රෝගී උපස්ථානයේ දී මම අප්‍රමාණ මට අයිති නැති රෝගීන් උදෙසා, මට ඥාතිත්වයක් නැති රෝගීන් උදෙසා මම උපස්ථානය කරලා තියෙනවා.

මගෙ අම්මා අංශභාගය හැදිලා අවුරුදු අටක් ජීවත් වුණා. ඒ අවුරුදු අටේ ම මම තනියම ඒ අම්මට උපස්ථානයන් සිද්ධ කළා. ඒ වගේ ම හැම වෙලාවෙ ම මම මගේ සතුට අනුන් උදෙසා යොමු කළා. ඒක තමයි මම පුරුදු කරපු දේ. මම එදා දැනගෙන හිටියේ නෑ, මේකටයි අත්හැරීම කියන්නේ කියලා. නමුත් දැන් බලනකොට මොකක්ද සිද්ධ වෙලා තියෙන්නේ? මගේ සතුට මම අනුන් උදෙසා යොමු කළා.

මම බස් එකකට නැග්ගා නම් කොළඹින්, කතරගමට යන්න, මොරටුවෙන් කෙනෙක් නැග්ගත් මම කවදාකවත් සීට් එක නොදී හිටියේ නැහැ. මොරටුවෙන් නැගිටලා මම ඉස්සරහට ගිහිල්ලා තියෙනවා. එතනින් යනකොට, ඔන්න ගාල්ලෙදි සීට් එක හම්බවෙනවා. ආයිමත් කාටහරි දෙනවා. මම එක බස් එකේදි සීට් එක හතර වතාවක් කතරගමට එනකොට පූජා කරලා තියෙනවා. නමුත් ඒ වෙලාවේ බලන් ඉන්න මනුස්සයා හිතනවා, මේකා පිස්සෙක් කියලා. පිස්සෙක් කියලා හිතන්නේ. නමුත් ඒවායේ ඵලය තමයි අපි අවසානෙදි ලබාගත්තේ.

ඒ නිසා මම හැම වෙලාවෙ ම මගේ සතුට අනුන් උදෙසා දෙන්න කැමති වුණා. තේරුණාද? ඕන වෙලාවක මම කැමති වුණේ තව කෙනෙක් සතුටු කරන්න. ඒක අත්හැරීම කියලා එදා මම දැනගෙන හිටියේ නැහැ. ගිහිවත කියලා කියන්නේ මම ඔන්න ඕකට තමයි. පන්සල ආශ්‍රය කරගෙන, සමාජය ආශ්‍රය කරගෙන, මනුෂ්‍යයින් ආශ්‍රය කරගෙන ඒ අය පින්කම්වලට යොදවමින් ඒ අය සතුටු කිරීම තමයි ගිහිවත කියලා මම කියන්නේ. මොකද, ඒක මම අප්‍රමාණව කළා.

# ගිය ජීවිතයේ නතර කළ තැනින් පටන් ගන්න

**නවවන ප්‍රශ්නය :**

**ස්වාමීන් වහන්ස, මේ සමාජයේ බොහෝ දෙනා ජීවත් වන ස්වභාවය අනුව ඔබ වහන්සේට බුදුරජාණන් වහන්සේගේ දේශනාව ඇසුරෙන් කුමක්ද කියන්නට පුළුවන්?**

**පිළිතුර :**

බුදුරජාණන් වහන්සේ මේ නියසිලට පස් ටිකක් අරන් කියනවා, *"මැරෙන සත්ත්වයින්ගෙන් මෙන්න මෙපමණයි සුගතිගාමී වෙන්නේ"* කියලා. එහෙනම් දරුවෝ එතන තමයි අපි හිතන්න ඕන. මැරෙන සත්ත්වයින්ගෙන් මෙපමණයි සුගති ගාමී වෙන්නේ කියලා. ඒ නිසා ඒ පස් සිල, අපිට බුදුරජාණන් වහන්සේ මේ ඇඟිල්ල දික්කරලා පෙන්නන පස් සිල, අපිට කරන අනතුරු ඇඟවීමක්;

බුදුරජාණන් වහන්සේ මේ මොහොතේ ජීවත්වන සෑම බෞද්ධයෙකුට ම කරන අනතුරු ඇඟවීමක්. එහෙනම් අපි දක්ෂ වෙන්න ඕන, ධර්මය උපයෝගී කරගෙන බුදුරජාණන් වහන්සේගේ මේ නියසිලේ තියෙන පස් අහුරෙන් පස් කැටයක් වෙන්න. නමුත් අපි සියලු දෙනා ම ගිය ජීවිතයේ දි ඒ දක්ෂ භාවය ලැබුවා. ඒකයි මේ සුගතියේ ඉපදුණේ. ගිය ජීවිතයේ දි දක්ෂ භාවය ලැබුණා. ඒ නිසා අපි මොකක්ද කරන්න ඕන? නැවතිච්ච තැනින් අපි පටන් ගන්න ඕන... නැවතිච්ච තැනින් පටන් ගන්න ඕන...

නැවතුණු තැන මොකක්ද? ගිය ජීවිතයේ නැවතිච්ච තැන. දැන් ඔබතුමිය ගිය ජීවිතයේ ඔබ නැවතිච්ච තැනක් තියෙනවා. තේරුණාද? ඒ ගිය ජීවිතයේ නැවතිච්ච තැන මොකක්ද? ඔබ අවුරුදු 80 ක්, 70 ක්, 90 ක් තරම් ජීවත් වෙච්ච වයෝවෘද්ධ වෙච්ච උපාසකම්මා කෙනෙක් ගිය ජීවිතයේ. එතනනේ අපි නවත්තන්නේ.

එතකොට, පන්සල් ආශ්‍රය කරගෙන බණ මඩු ආශ්‍රය කරගෙන, සිල් සමාදන් වෙලා, දන් දීලා, පන්සලේ ම හිටපු අය තමයි, අපි ගිය ජීවිතයේ අවසානෙදි. දැන් එතනින් මැරිලා තමයි අපි මෙතන ඉපදුණේ. තේරුණාද? එහෙනම් ඒ ගිය ජීවිතයේ නතර කරපු තැනින් පටන් ගන්න දක්ෂ වෙන්න ඕන.

දැන් අපි සිල් සමාදන් වෙන්න පටන් ගන්නේ කවදද? අවුරුදු 60 පැන්නට පස්සේ, 50 පැන්නට පස්සේ. නමුත් ගිය ජීවිතයේ අපි අතනින් නතර කළා. නේද? එතනින් නතර කළා නම් අපි දැනගන්න ඕන, තරුණ කාලෙවත් අඩු වශයෙන් නතර කරගත්ත තැනින් පටන් ගන්න. ඒ නතර කරගත්ත තැනින් පටන් ගත්තා නම් අපිට ප්‍රශ්නයක් මතු වෙන්නේ නැහැ.

නමුත් අපි අලුත් තැනින් පටන් ගන්න ගියොත් හැමදා ම කරපු දේ අපි ආයෙමත් සිද්ධ කරනවා; මේ ජීවිතෙත් අපිට කාලය මදි වෙනවා. මොකද, ගිය ජීවිතෙත් අපිට කාලය මදි වුණා. මොකද, අවසානයෙයි පටන් ගත්තේ. නමුත් මේ ජීවිතෙත් දැන් අපි ඉන්නවා, අවසානෙ පටන් ගන්න. ඇයි අපි අවසානෙදි පටන් ගනිද්දි, අපි නවතින තැන දැක්කේ නැහැ. තේරුණාද?

එහෙනම් නැවතිච්ච තැනින් අපි පටන් ගන්න ඕන. මොකද, අපේ සංසාරෙ ආපු ගමනෙදි අපි නවත්තපු තැන් තියෙනවා, මහා සශ්‍රීක තැන්. මොකද, බුදුරජාණන් වහන්සේලා ලක්ෂ ගාණක් අතීත සංසාරෙ බුදුවෙලා තියෙනවා. මේ ඔබතුමිය මගෙන් බණ අහනවා වගේ ඔබ බුදුරජාණන් වහන්සේලාගෙනුත් බණ අහලා තියෙනවා.

එහෙම තැනකින් අපි පටන් ගන්න ඕන. සමහර වෙලාවට බුදුරජාණන් වහන්සේ ධර්මය දේශනා කරද්දි, ඔබ බණ පද තුනක් කියද්දි නැගිටලා ගිය අවස්ථා තියෙනවා. හතරවෙනි බණ පදය ඇහුවා නම් ඔබ සෝවාන් ඵලයට පත්වෙනවා. "නෑ මට දැන් වැඩ වැඩියි" කියලා ඔබ නැගිටලා ගිහිල්ලා තියෙනවා.

එහෙනම් ඔබ එවැනි ශක්තිමත් තැනකින් පටන් ගන්න ඕන. ඒ වගේ ම අතීත සම්මා සම්බුද්ධ ශාසනවල ඔබ අවුරුදු දසදහස් ගණන් පැවිදි උපසම්පදාව ලබලා තියෙනවා භික්ෂු ශාසනයේ, භික්ෂුණී ශාසනයේ. එහෙනම් එවැනි තැනකින් පටන් ගන්න අපි දක්ෂ වෙන්න ඕන. එවැනි තැනකින් පටන් ගන්න දක්ෂ වුණාම ශක්තිමත් ආරම්භයක් අපි ඇති කර ගන්නවා.

නමුත් අපි දැන් පටන් ගන්නේ මොකෙන්ද? අපි ඉරිදා ඉස්කෝලෙ ගියා. නැත්නම් ඔතනින් පටන් ගත්තා. ඔහොම තමයි පටන් ගන්නේ. ඒවා ශක්තිමත් නෑ. ඒවායින් පටන් ගත්තොත් කවදාක්වත් මේ ගමන ඉවර කරන්න බැහැ. එහෙනම් ඔබ පටන් ගන්න ඕන කොතනින්ද? අර අසංඛ්‍ය කල්ප ලක්ෂයක් ආවා වූ ගමනේ දී "මම බුදුරජාණන් වහන්සේලා ලක්ෂ ගාණකින් බණ අහලා තියෙනවා" කියන තැනින්. මම සංසාරෙ බණ පද තුනක් අහලා, සෝවාන් වෙන්න ඉඩ තියෙද්දි මම නැගිටලා ගිය තැනින් ඔබ පටන් ගන්න ඕන.

"මම සංසාරෙ අවුරුදු දසදහස් ගණන් පැවිදි උපසම්පදා වෙලා හිටියා"ය කියන තැනින් පටන් ගන්න ඕන. එහෙම පටන් ගත්තොත් මේ ගමන ශක්තිමත්ව ඉස්සරහට යන්න පුළුවන්.

# කුසල් සහ අකුසල් සිත් දෙකටම බැඳෙන්න එපා. සිත දමනය කරගන්න

**දහවන ප්‍රශ්නය :**

**ගෞරවණීය ස්වාමීන් වහන්ස,**
***"සබ්බ පාපස්ස අකරණං - කුසලස්ස උපසම්පදා***
***සචිත්ත පරියෝදපනං - ඒතං බුද්ධාන සාසනං"***
**සියලු බුදුවරයන් වහන්සේලාගේ දේශනාවන් කැටිවුණු මේ ගාථාවේ තිබෙන බලය කුමක් ද? මේ ගාථාව ශ්‍රවණය කිරීමෙන්, මෙනෙහි කිරීමෙන් කෙනෙකුට එහි ගැබ්වුණු ශක්තිය ලැබෙනවා ද?**

**පිළිතුර :**

එහෙයි. ලැබෙනවා. දැන් බුදුරජාණන් වහන්සේ *"සබ්බ පාපස්ස අකරණං"* කියන්නේ, සියලු පාපයන්ගෙන් මිදෙන්න; *"කුසලස්ස උපසම්පදා"* කුසල් දහම් වඩන්න; *"සචිත්ත පරියෝදපනං"* සිත දමනය කරගන්න, ඒකයි බුදුරජාණන් වහන්සේගේ අනුශාසනය. එතකොට, සිත දමනය කරගන්න කියලා බුදුරජාණන් වහන්සේ මොකක්ද කියන්නේ? මොන සිත ද දමනය කර ගන්න කියන්නේ? මේ කුසල් සහ අකුසල් සිත් දෙකමයි දමනය කර ගන්න කියන්නේ. ඉතින් ඒක හොඳට තේරුම් ගන්න ඕන.

මුලින් ම කියනවා, "සබ්බ පාපස්ස අකරණං...." සියළු පාපයන්ගෙන් මිදෙන්න. ඊට පස්සේ කියනවා, කුසලයේ යෙදෙන්න.

ඊට පස්සේ කියනවා, සිත දමනය කරගන්න. මොන හිත ද මේ දමනය කරගන්න කියන්නේ? කුසලය සහ අකුසලය කියන දෙකමයි. මොකද, කුසලයත් අපිව අරන් යන්නේ භවයටයි. අකුසලයත් අපිව අරන් යන්නේ භවයටයි. අකුසලය දුගතියට අරන් යනවා. කුසලය සුගතියට අරන් යනවා. නමුත් සුගතියට අරන් ගියත් කවදාහරි අනාගතයේ දී පහළ වන දීර්ඝ අබුද්ධෝත්පාද කාලවල්වල අපි ආයෙමත් සතර අපායන්ට වැටෙනවා.

එහෙනම් බුදුරජාණන් වහන්සේ එතනදි අනුමත කරන දේ... බොහොම ගැඹුරින් අපි දකින්න ඕන. බුදුරජාණන් වහන්සේ එතන දේශනා කරන්නේ මොකක්ද? අකුසලයෙන් මිදෙන්න. කුසල් වඩන්න. කුසල් වඩලා ඊළඟට කුසලයේත්, අකුසලයේත් අනිත්‍යය දකින්න. ඒ කියන්නේ, භව නිරෝධය ම සකස් කරගන්න. එතනයි බුදුරජාණන් වහන්සේ ඒකෙන් අදහස් කරන්නේ.

ඉස්සෙල්ලා ම අකුසලයෙන් මිදෙනවා. මොකද, දූන් මාරයාට ඔබලාව අකුසලය තුළ කොටු කරන්න බැහැ. ඔබලාව අකුසලයෙන් කොටු කරන්න බැහැ. ඔබලා දූන් අකුසලය හඳුනනවා. එහෙනම් දූන් මාරයා ඔබලාව කොටු කරන්නේ කොතෙන්ට ද? කුසලයට. කුසලයෙන් දූන් මාරයා ඔබව කොටු කරන්නේ.

කුසලය කියන්නේ මොකක්ද, පින්කම්, දානය, සීලය, මෛත්‍රිය, සමාධිය. මේවා කුසල්. මේ තැන් තුළින් තමයි ඔබව දූන් කොටු කරන්නේ. මොකද, මාරයා දන්නවා, මේ සම්මා සම්බුද්ධ ශාසනයේ දීප්තිමත් ම අවස්ථාව මේකයි කියලා. මේක සම්මා සම්බුද්ධ ශාසනයේ දීප්තිමත් අවස්ථාව. නමුත් මේ දීප්තිය කියන්නේ, නිවෙන්න ආසන්න පහනක තියෙන දීප්තිය. **නිවෙන්න ආසන්න පහනක තියෙන දීප්තිය.** නමුත්, මේක වඩාත් වැඩි කාලයක් තියෙන දීප්තියක් නෙවෙයි.

නමුත් මේ සම්මා සම්බුද්ධ ශාසනයේ අවසාන අධිගමලාභීන් පහළ වෙන යුගය තමයි මේක. ඔබතුමියට මේ ජීවිතයේ සෝවාන්

වෙන්න තියෙනවා නම් ඒ තියෙන කාලය තමයි මේක. ආයෙමත් අපිට කාලයක් එන්නේ නැහැ.

මාරයා දන්නවා, මේක තමයි සම්මා සම්බුද්ධ ශාසනේ තියෙන සශ්‍රීක ම අවස්ථාව කියලා, මේ මොහොතේ. ඒ නිසා මාරයා මේ වෙලාවේ හදන්නේ මොකක් කරන්නද? ඔබලාව කුසලය තුළ කොටු කරන්න. කුසලය තුළ කොටුකරල තිබ්බා නම් ඔබලා දිව්‍ය, මනුෂ්‍ය සැප ලබමින් එතන ඉන්න තමයි බලන්නේ. එහෙම වෙලා තව අවුරුදු දෙතුන්සීයක් ගියාට පස්සේ සම්මා සම්බුද්ධ ශාසනය අතුරුදහන් වෙලා යනවා. අතුරුදහන් වෙලා ගියාට පස්සේ ලෝකය අයිති කාටද? මාරයාට.

ඊට පස්සේ අනිවාර්යයෙන් ම ඕගොල්ලන් මාරයාගේ ග්‍රහණයේ. ඒ කියන්නේ සංසාරේ මෙච්චර කාලයක් අපි කුසලයට කොටුවුණා. අකුසලය හඳුනාගෙන කුසලයට කොටුවුණා. එහෙනම් මේ මොහොතෙත් අපි ලෑස්ති වෙන්නේ කුසලයට කොටුවෙන්න නම් ඒ කියන්නේ, අපි මාරයාගේ ග්‍රහණයට එතනත් අහුවෙලා තියෙන්නේ. මොකද, නැවත සුගතියේ උපතක්. ඒ සුගතියේ උපතින් අපි ආයිමත් සතර අපායට වැටෙනවා.

ඒ නිසා බුදුරජාණන් වහන්සේ "සබ්බ පාපස්ස අකරණං...." ගාථාවෙදි ඒකයි කියන්නේ, මුලින් ම පාපයන්ගෙන් මිදෙන්න. ඊට පස්සේ කුසල් දහම් වඩන්න. ඊට පස්සේ බුදුරජාණන් වහන්සේ කියනවා, සිත දමනය කරගන්න. මොන සිත ද? මේ කුසල් සහ අකුසල් කියන්නා වූ සිත් දෙක ම දමනය කරගන්න. ඒකට බැඳෙන්න එපා. ඇයි? බැඳුණොත් භවය කරායි අරන් යන්නේ කියන කාරණය.

**ඉතින් ඒ නිසා මේ ගාථාව ජීවිතයට දරාගත්තොත් ඒ දරාගැනීම තුළින්, සෝවාන් ඵලයට පත්වීමට අවශ්‍ය වූ සාධක අපි ජීවිතයට එකතු කර ගන්නවා.**

# බුදුරජාණන් වහන්සේ උදෙසා කළහැකි ශ්‍රේෂ්ඨතම පූජාව

**එකොළොස්වන ප්‍රශ්නය :**

**ගෞරවණීය ස්වාමීන් වහන්ස, බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑ යුගයක බෞද්ධයෙක් හැටියට කළ හැකි ශ්‍රේෂ්ඨතම පූජාව කුමක් ද?**

**පිළිතුර :**

දැන් බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, මේ ලෝකයේ කරන්න තියෙන ශ්‍රේෂ්ඨ ම, උතුම් ම පූජාව, සංඝයා අරමුණු කරගෙන දෙන්නා වූ දානයයි කියලා. තේරුණාද?

- එතකොට, මේ ලෝකයේ යමෙකුට කරන්න තියෙන උතුම් ම පූජාව තමයි... බුදුරජාණන් වහන්සේත් වැඩ ඉන්නවා, මහ රහතන් වහන්සේලාත් වැඩ ඉන්නවා, සංඝයා අරමුණු කරගෙන දන් දෙනවා. එතකොට, ඒ පින තමයි මේ ලෝකයේ තියෙන ශ්‍රේෂ්ඨම කුසලය. ඊට වඩා ශ්‍රේෂ්ඨ කුසලයක් මේ ලෝකයේ නැහැ.
- දෙවෙනි එක තමයි, බුදුරජාණන් වහන්සේ දැන් ජීවමානව නැහැ. නමුත් රහතන් වහන්සේලා වැඩ ඉන්නවා. රහතන් වහන්සේලාට, මහා සංඝයා අරමුණු කරගෙන දන්දෙනවා. ඒක තමයි දෙවෙනි ශ්‍රේෂ්ඨ ම කුසලය මේ ලෝකයේ තියෙන.

- එතකොට, තුන්වෙනි ශ්‍රේෂ්ඨ කුසලය තමයි, එතන අනාගාමී ඵලයට පත්වෙච්ච ස්වාමීන් වහන්සේ කෙනෙක් ඉන්නවා, ඒ ස්වාමීන් වහන්සේට, මහා සංඝයා අරමුණු කරගෙන දන්දෙනවා. අනිත් ස්වාමීන් වහන්සේලාත් එතන ඉන්නවා. ඒක තමයි තුන්වෙනි ශ්‍රේෂ්ඨ දානය.
- එතකොට, හතරවෙනි ශ්‍රේෂ්ඨ දානය තමයි, ස්වාමීන් වහන්සේලා වඩම්මනවා. එතන සකෘදාගාමී ස්වාමීන් වහන්සේ නමකුත් ඉන්නවා. ඒ සියලු දෙනාට ම, සංඝයා අරමුණු කරගෙන දන්දෙනවා. ඒක තමයි හතරවෙනි ශ්‍රේෂ්ඨ දානය.
- පස්වෙනි ශ්‍රේෂ්ඨ දානය තමයි, එතන සෝවාන් ඵලයට පත්වෙච්ච ස්වාමීන් වහන්සේ නමකුත් ඉන්නවා, සංඝයා අරමුණු කරගෙන දන්දෙනවා. එතකොට, ඒක තමයි පස්වන ශ්‍රේෂ්ඨ දානය.
- ඒ විදිහට මෙහෙම මෙහෙම පල්ලෙහාට ගිහිල්ලා සාමණේර ස්වාමීන් වහන්සේට දෙන්නා වූ දානය. සාමණේර ස්වාමීන් වහන්සේට දෙන්නා වූ දානය.
- ඉනුත් පල්ලෙහාට ගිහිල්ලා තමයි, අපි හිතමු... උපෝසථ දසසිල් සමාදන් වූ උපාසක උපාසිකාවන් ඉන්නවනේ. ඒ අයට දෙන දානය.
- ඊට පස්සේ උපෝසථ අෂ්ටාංග ශීලය සමාදන් වූ අයට දෙන දානය.
- ඊට පස්සේ ආජීව අට්ඨමක ශීලය සමාදන් වූ අයට දෙන දානය.
- ඊට පස්සේ පංච ශීලය සමාදන් වූ අයට දෙන දානය.
- ඊට පස්සේ තෙරුවන් සරණ ගිය කෙනාට දෙන දානය.

- ඉන්පස්සේ තමයි, ළමා නිවාසවලට, රෝහල්වලට දෙන දානය තියෙනවනේ. ඒගොල්ලොන්ට දෙන දානය අයිති වෙන්නේ ඊටත් වඩා පල්ලෙහාට.
- ඉනුත් පල්ලෙහාට තමයි ඔය බලු කපුටන් උදෙසා දෙන දානයන්.

නමුත් අපි රෝහලට ගිහිල්ලා, ළමා නිවාසෙට ගිහිල්ලා දන් දෙද්දි ඒගොල්ලෝ පංචශීලය සමාදන් වෙලා ඉන්න පිරිසක් නම්, ඒගොල්ලන්ට පංචශීලය සමාදන් වෙච්ච කෙනාට අදාළව දෙන්නා වූ දානයේ ආනිශංස තියෙනවා.

ඒ නිසා දානයේ ආනිශංස පක්ෂය වැඩිවෙන්නේ ඒ අය සමාදන් වෙලා ඉන්නා වූ ශීලයේ ගුණාත්මක භාවය තුළ යි. තේරුණාද? ඒ නිසා මේ ලෝකයේ තියෙන ශ්‍රේෂ්ඨ ම දානය තමයි, බුදුරජාණන් වහන්සේත් මහා සංඝයාත් අරමුණු කරගෙන දෙන්නා වූ දානය.

බුදුරජාණන් වහන්සේට මහා ප්‍රජාපතී ගෝතමිය එක්තරා අවස්ථාවක චීවරයක් ගෙනල්ලා පූජා කරන්න හදන වෙලාවේ බුදුරජාණන් වහන්සේ කියනවා, **"ගෝතමිය, මේක සංඝයා අරමුණු කරගෙන පූජා කරන්න. බුදුරජාණන් වහන්සේ අරමුණු කරගන්න එපා." "සංඝයා අරමුණු කරගෙන පූජා කරගන්න"** කියලා. නමුත් පළවෙනි, දෙවෙනි, තුන්වෙනි තුන් අවස්ථාවෙ ම මහා ප්‍රජාපතී ගෝතමිය ඒක කරන්නේ නැහැ.

ඊට පස්සේ ආනන්ද ස්වාමීන් වහන්සේගේ පැහැදිලි කිරීම මත තමයි ප්‍රජාපතී ගෝතමිය තේරුම් ගන්නේ, මහා සංඝයාට පූජා කරපු දේයි ආනිශංස වැඩි කියලා. ඒ නිසා මේ මොහොතේ බුදුරජාණන් වහන්සේ අරමුණු කරගෙන යමෙක් මලකින් හරි පූජා කරනවා නම්, ඒ පූජා කරන මලෙන් ලැබෙන්නා වූ කුසලය කවදාක්වත් අපිට විපාක නොදී අවසන් වෙන්නේ නැහැ.

එක මහත්තයෙක් කිව්වා, "ස්වාමීන් වහන්ස, බුදුරජාණන් වහන්සේට සියලු ම සිව්පසයන් ලැබෙනවා." අපි කියමු පාරෙ ඉන්න දුගියෙකුට මොකුත් නෑ, බඩගින්නේ ඉන්නෙ කියලා. එතකොට, අපි කියමු, අපි බත් පාර්සලයක් අරගෙන යනවා. බත් පාර්සලයක් අරගෙන යනකොට දැන් අපිට පේනවා, යාචක මහත්තයෙක් ඉන්නවා. මෙයා සුමානෙකින් වත් කාලා නැහැ. නමුත් ඒ යාචක මහත්තයාට ඉස්සරහ තව මීටර් 500ක් ගියහම බුදුරජාණන් වහන්සේ වැඩ ඉන්නවා.

දැන් කෙනෙක් එනවා. කෙනෙක් බත් පාර්සලය අරන් ඇවිල්ලා කල්පනා කරනවා, "බුදුරජාණන් වහන්සේට ඕන තරම් දාන තියෙනවා. මේ යාචක මහත්තයා දැන් මෙතන මැරෙන්නයි යන්නේ. මම මෙයාට බත් පාර්සලය දෙනවා" කියලා. එයා අර යාචක මහත්තයාට බත් පාර්සලය පූජා කරලා, එයා යනවා.

තව මහත්තයෙක් එනවා, බත් පාර්සලයක් අරගෙන. එයත් දකිනවා, අතන නිරාහාරව ඉන්න යාචක කෙනාව. නමුත් එයාව දැකලා බුදුරජාණන් වහන්සේත් දකිනවා. එතකොට, එයා කල්පනා කරනවා, බුදුරජාණන් වහන්සේට දෙන දානයේ මහත්ඵල මහානිශංසයි කියලා. එයා යාචක මහත්තයාව පසුකරගෙන ගිහිල්ලා, එයා අර බත් පාර්සලය බුදුරජාණන් වහන්සේට පූජා කරනවා.

එතකොට, දැන් මේ දෙකෙන් ආනිශංස වැඩි කුමක්ද? බුදුරජාණන් වහන්සේට පූජා කළා වූ දානය යි. එතකොට, ඒ යාචක මහත්තයා අතන කුසගින්නෙන්, ආහාරයෙන් නිරාහාරව ඉන්නේ එයා කළා වූ අකුසල් විපාකයක් නිසා. එයා පෙර ජීවිතයේ දන් දුන්නේ නෑ. දන් දෙන දේවල් වැළැක්වුවා. වැළැක්වීම නිසා එයාට බඩගින්නේ තමයි මැරෙන්න හරි, ජීවත් වෙන්න හරි තියෙන්නේ. ඒ නිසා එතනදි මහත්ඵල මහානිශංස භාවයට පත්වෙන්නේ, බුදුරජාණන් වහන්සේ උදෙසා දෙන දානය ම යි.

දැන් සමහර වෙලාවට සමහරු කියනවා, අපේ ගිහි පින්වතුන්ලා ගිහිල්ලා බෝධීන් වහන්සේව කිරි කළවලින් නාවනවා කියලා. කිරි කළ දහයක් බෝධීන් වහන්සේ නැව්වහම කෙනෙක් චෝදනා කරනවා, "අනේ මේ කිරි කළ දහය අර දුප්පත් ළමයි පිරිසකට දුන්නා නම් කොතරම් පිනක් ද?" කියලා. නමුත් ඒක සාමාන්‍ය ව්‍යවහාරයේ දී අපිට මේක සාධාරණයි කියලා දකින්න පුළුවන් ඒ ප්‍රකාශය.

නමුත් කර්මය, කර්මඵල තුළදි, බුදුරජාණන් වහන්සේ අරමුණු කරගෙන, බුදුරජාණන් වහන්සේගේ සම්මා සම්බුද්ධ වූ බෝධිය අවබෝධ කරගෙන යමෙක් කිරි කළවලින් බෝධීන් වහන්සේ නැව්වා නම්, මෙතන දාහක පිරිසකට දන් දුන්නාට වඩා වූ ශ්‍රේෂ්ඨ පිනක් අතනින් රැස්වෙනවා.

ඒ නිසා බුදුරජාණන් වහන්සේ උදෙසා දෙන දානයයි අග්‍ර වෙන්නේ, ඒ වගේ ම මහා සංඝ රත්නය උදෙසා දෙන දානයයි මුල් වෙන්නේ කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. මේ වෙලාවේ අපිට මේ මාර්ගයේ දශමයක් හරි අපි මේ ධර්ම මාර්ග යේ ගමන් කරනවා නම්, ඒ දශමයක් හෝ ධර්ම මාර්ගය අපිට පහදලා දුන්නේ බුදුරජාණන් වහන්සේමයි. ඒ නිසා අපි ශාස්තෘන් වහන්සේ මුල්කොට ගෙනයි මේ ගමන යන්න ඕන.

ඒ නිසා ශාස්තෘන් වහන්සේ මුල්කොට ගෙන යන ගමනේ දී අපි යන්නේ කොහාට ද? ආර්ය අෂ්ටාංගික මාර්ගය තුළ. ආර්ය අෂ්ටාංගික මාර්ගය තුළයි මේ ගමන යන්නේ.

එහෙනම් ආර්ය අෂ්ටාංගික මාර්ගයේ මුල් ම මාර්ග අංගය මොකක්ද? සම්මා දිට්ඨිය. සම්මා දිට්ඨිය ලෞකික සම්මා දිට්ඨිය, ලෝකයෝත්තර සම්මා දිට්ඨිය කියලා දෙකකට බෙදනවා. නමුත් අපි මුලින් ම ඉන්නේ ලෞකික සම්මා දිට්ඨිය තුළ. එතකොට, ලෞකික සම්මා දිට්ඨිය කියලා කියන්නේ මොකක්ද? තෙරුවන් කෙරෙහි වූ ශ්‍රද්ධාව යි, මුල් කාරණය. එහෙනම් තෙරුවන්

කෙරෙහි වූ ශ්‍රද්ධාව කියලා කියන්නේ, බුදුරජාණන් වහන්සේත්, ධම්ම රත්නයත්, සංඝ රත්නයත් කෙරෙහි ඇති කරගන්නා වූ ශ්‍රද්ධාව. එහෙනම් බුදුරජාණන් වහන්සේමයි මුල්වෙන්නේ. ඒ නිසා බුදුරජාණන් වහන්සේ මුල් කරගෙන මේ යන ගමනෙදි, අපි මුලින් ම බුදුරජාණන් වහන්සේට කරන්නා වූ පුද පූජා, ඒ වත් පිළිවෙත් අපිට මේ ගමන යන්න ශක්තියක් වෙනවා. නමුත් අපි එතන නතර වෙන්න, පල්වෙන්න අවශ්‍යතාවයක් නැහැ.

ඒ නිසා කැමති කෙනා ආමිසය පසුකරගෙන ප්‍රතිපත්තියට යනවා. නමුත් හැම කෙනාට ම අපිට කියන්න බැහැ, ප්‍රතිපත්තියට යන්න කියලා. හැම කෙනෙකුට ම අපිට කියන්න බැහැ බුදුරජාණන් වහන්සේට මේ පූජාවන් කරන්න එපා, ඔබලා භාවනා කරන්න කියලා හැමෝට ම කියන්න බැහැ. මොකද, හැම කෙනෙක් ම මේ මාර්ගය තුළ දාන, ශීල, භාවනා කියන මාර්ගය තුළ තමයි මුලින් ම ඉස්සරහට යන්නේ.

ඒ නිසා මුලින් ම අනිවාර්යයෙන්මම බුදුරජාණන් වහන්සේ උදෙසා ඒ කරන වත්පිළිවෙත් කරන්න ඕන. ඒවායින් බැහැරව අපිට ගමන ඉස්සරහට යන්න බැහැ. ඉස්සරහට යන කෙනා මේක පසුකරලා ඉස්සරහට යාවි. එයාට ආමිසය අතහැරලා ප්‍රතිපත්තියට යන්න පුළුවන්. නමුත් හැමෝට ම අපිට ප්‍රතිපත්තියට යන්න කියන්න බැහැ, ආමිසයෙන් බැහැර වෙලා. තේරුණාද? මොකද, ඉන්න අයගේ ඉන්ද්‍රිය ධර්මයන් එක එක ස්වභාවයෙන් තමයි තියෙන්නේ.

ඉන්ද්‍රිය ධර්මයන් කියන්නේ ශ්‍රද්ධා, වීර්ය, සති, සමාධි, ප්‍රඥා. මේ ඉන්ද්‍රියන් වැඩීමේ ස්වභාවය මත තමයි එයා ඉස්සරහට යන්නේ. එතකොට ඉන්ද්‍රිය ධර්මයන් වැඩීමේ අඩු ස්වභාවයන් තියෙන අයට, අරයා යන මාර්ගයේ යන්න කියලා අපිට කියන්න බැහැ. එයා අතන නවතිනවා. එතනින් හරි එයා සතුටු වෙනවා.

දැන් කවදාකවත් අපිට කියන්න බැහැ, වෙසක් එකට පෙන්නන්නා වූ තොරණ වැරදියි කියලා; වෙසක් එකට මේ තියෙන්නා වූ මේ උත්සව වැරදියි කියලා. මොකද, මුළු ජීවිතයේට ම පන්සලට නො ගිය මනුස්සයෙක් ඉන්න පුළුවන්. ඒ පන්සලට නො ගිය මනුස්සයා වෙසක් දවසට වෙසක් තොරන් බලන්න යනවා. දැන් තොරණ බලලා අර බුදුරජාණන් වහන්සේගේ රූප කාය, අර රශ්මි ධාරාවන්, අර ලයිට් දැකලා ඒ ගැන හිතමින් එයා ගෙදර එනවා. නමුත් කවදාකවත් පන්සලකට ගිහිල්ලා සිල් සමාදන් වෙලා නැහැ. නමුත් හිතමින් ගෙදර ඇවිල්ලා රෑ නිදාගන්න කොට එකපාරට මැරෙනවා. මැරෙන වෙලාවේ සිහිපත් වෙන්නේ අර තොරණ. එයා ගිහිල්ලා සශ්‍රීක දෙවියෙක් වෙලා උපදිනවා.

එහෙනම් තොරණ කියන දේත් වැරදියි කියලා අපිට කියන්න බැහැ. මොකද, ඊට අදාළ අය ඒකෙන් ප්‍රයෝජනය ගන්නවා. ඉතින් අපි එතනින් ඉස්සරහට ගියා නම් අපි දැනගන්න ඕන ප්‍රතිපත්ති මාර්ගයේ ඉස්සරහට යන්න. නමුත් ප්‍රතිපත්ති මාර්ග යේ ඉස්සරහට ගියත්, කවදා හරි අපි මේ මාර්ගයේ ගිහිල්ලා රහත් භාවයට පත්වෙන්න තමයි අපි මේ යන්නේ. නේද?

නමුත් රහතන් වහන්සේ වුණත් තමන්ගේ ශාස්තෘන් වහන්සේ හැටියට බුදුරජාණන් වහන්සේ වන්දනා කරනවා; බුදුරජාණන් වහන්සේට මලින්, සුවඳින් පූජා කරනවා. නමුත් උන් වහන්සේට සංස්කාරයන් පිළිබඳ ගැටලුවක් නෑ. උන් වහන්සේට කුසල් සිත්, අකුසල් සිත් සකස් වෙන්නේ නැහැ. නමුත් මාර්ගය පෙන්වූවා වූ බුදුරජාණන් වහන්සේ කියන ගරුත්වය එයාට තියෙනවා. එතකොට, කවදා හරි දවසක අපි රහත් භාවයට පත්වුවත් ඒ රහතන් වහන්සේ කියන්නේ පරමාදර්ශී චරිතයක්. පරමාදර්ශී චරිතයක් කියන්නේ රහතන් වහන්සේ මුළු ලෝකයට ම ආදර්ශවත්ව තමයි ජීවත් වෙන්නෙ.

රහතන් වහන්සේට බුදුරජාණන් වහන්සේට මල් පූජා කිරීමට අවශ්‍යතාවයක් නැහැ. මොකද, උන්වහන්සේ තුළ කුසල්, අකුසල් රැස්වෙන්නේ නැහැ. නමුත් උන්වහන්සේ ලෝකයේට පරමාදර්ශයක් වෙන්න ඕන. ලෝකයේට පරමාදර්ශයක් වුණු තැනදි රහතන් වහන්සේත් බුදුරජාණන් වහන්සේ උදෙසා මලින්, සුවඳින් පූජා කරනවා. මොකද, එහෙම නො කළොත් රහතන් වහන්සේ අනුගමනය කරලා අනිත් අයත් ඒක නො කරන්න පුළුවන්.

ඒ නිසා බුදුරජාණන් වහන්සේ කියන්නේ අපේ ශාස්තෘන් වහන්සේයි. උන් වහන්සේයි මේ මාර්ගය අපිට මතුකරලා දෙන්නේ. ඒ නිසා උන්වහන්සේ උදෙසා තමයි අපි මුලින් ම පූජාවන් සිද්ධ කරන්න ඕන.

# ශාරීරික, පාරිභෝගික උද්දේශික වස්තූන් සතු අනන්ත ශක්තිය

**දොළොස්වන ප්‍රශ්නය :**

**ගෞරවනීය ස්වාමීන් වහන්ස, බෞද්ධයෙක් ලෙස අප වඳිනපුදන වස්තූන්, විශේෂයෙන් බුදුරජාණන් වහන්සේ ජීවමාන වන අයුරින් අපට හැඟෙන තරමට ම ශ්‍රී මහා බෝධීන් වහන්සේ, ශ්‍රී දන්ත ධාතූන් වහන්සේ මේ ලංකාවේ වැඩ වෙසෙනවා. උන්වහන්සේලා සතු වූ අනන්ත වූ ශක්තිය කුමක්ද ස්වාමීන් වහන්ස?**

**පිළිතුරු :**

බුදුරජාණන් වහන්සේගේ ඒ වන්දනීය ඒ ධාතූන් වහන්සේලා, ඒ පාරිභෝගික වස්තූන්වල තියෙන්නා වූ ගුණය, බලය පිළිබඳ අපට කොතැනකදීවත් සැකයක් ඇතිකර ගන්න අවශ්‍යතාවයක් නැහැ. තේරුණාද?

අපි ඒ ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ, රුවන්වැලි මහ සෑ සමිඳුන් වහන්සේ, දන්ත ධාතූන් වහන්සේ දකින්න ඕන ජීවමාන බුදුරජාණන් වහන්සේ හැටියට. දැන් බෝධිය කියලා කියන්නේ සම්මා සම්බෝධියට. බුදුරජාණන් වහන්සේගේ සම්මා සම්බුද්ධ ඥානය තමයි බෝධීන් වහන්සේ තුළින් අර්ථවත් වෙන්නේ. එතකොට අපි එතන තමයි දකින්න ඕන. දැකලා ජීවමාන බුදුරජාණන් වහන්සේ හැටියට මේවාට අපි වත්පිළිවෙත් සිද්ධ කරනවා.

ඉතින් ඒ වත්පිළිවෙත් සිද්ධ කිරීම නිසා, ඒ වන්දනීය වස්තූන් නිසා අප ඇතිකර ගන්නා වූ සෑම සිතිවිල්ලක දී ම අපිට සුගතිගාමී කුසල් චිත්තයන් සකස් වෙනවා.

# ආයුෂය, වර්ණය, සැපය, බලය ලැබීමට නම් .....

**දහතුන්වන ප්‍රශ්නය :**

**ගෞරවණීය ස්වාමීන් වහන්ස, පුද්ගලයෙකුට නිරෝගී කයක්, මනසක් හිමිවන්නේ කොහොමද ස්වාමීන් වහන්ස?**

**පිළිතුර :**

මෙහෙමයි. ඒක ආයුෂය, වර්ණය, සැපය, බලය. දැන් ආයුෂය, වර්ණය, සැපය, බලය කියන්නේ, පෙර ජීවිතයේ අපි පූජා කළා වූ දානයන්ගේ ආනිශංසමයි. බුදුරජාණන් වහන්සේ ශීලයේ ආනිශංසයන් දේශනා කරනවා; දානයේ ආනිශංසයන් දේශනා කරනවා.

බුදුරජාණන් වහන්සේ දානයේ ආනිශංසයන් පිළිබඳව දේශනා කරන කොට, දානයේ ආනිශංස හැටියට මොකද කියන්නේ? ආයුෂ, වර්ණය, සැපය, බලය. ඒ කියන්නේ මේ ජීවිතයේ යම් කෙනෙක් ආයුෂය, වර්ණය, සැපය, බලය අත්විඳිනවා නම්, ඒ අත්විඳින්නේ දානයේ ආනිශංසය නිසා ම යි. දැන් අපේ රටේ කොච්චර ප්‍රභූ මහේශාක්‍ය මහත්තුරු නෝනල ජීවත් වෙනවා ද? ඒ ප්‍රභූභාවය, මහේශාක්‍ය භාවය කියන්නේ මොකක්ද? බුදුරජාණන් වහන්සේ මේ සමාජ අසාධාරණයක් ගැන අපිට කියන්නේ නැහැ. බුදුරජාණන් වහන්සේ කියන්නේ, ඒගොල්ලෝ පෙර ජීවිතයේ රැස් කළා වූ පින ම යි ඒ.

ඒ නිසා පෙර ජීවිතයේ අපි ආයුෂය, වර්ණය, සැපය, බලය අත්විඳින කොට මේ ජීවිතයේ අපිට මහේශාක්‍ය ජීවිතයක් ලැබෙනවා. එතකොට, මේ ජීවිතයේ මහේශාක්‍ය භාවය කියලා කියන්නේ මොකක්ද? පෙර ජීවිතයේ සංස්කාර. තේරුණාද? එතකොට. මේ සංස්කාර අපි ගෙවන්න ගෙවන්න, අපි අලුතින් කුසල් සංස්කාර රැස්කරන්න ඕන.

අපි අලුතින් කුසල් සංස්කාර රැස් කළේ නැත්නම්, අපේ මේ සංස්කාර ඉවර වෙච්චි තැනදී අපි අප්‍රමාණ දුකට අනාගතයේ දී පත්වෙනවා. ඒ නිසායි යමෙකුට මේ ජීවිතයේ ආයුෂය, වර්ණය, සැපය, බලය හීනයි කියන්නේ, ඒ කියන්නෙ අනිවාර්යයෙන්මම එයා පිනෙන් හීනයි කියන කාරණයයි.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, 'පින' කියන වචනයේ අර්ථය තමයි සැපය. යමෙක් සැපෙන් ජීවත් වෙනවා නම්, ඒ පින නිසා. මොකද, එයා පෙර ජීවිතයේ කළා වූ, සංසයා අරමුණු කරගෙන, කර්මය කර්මඵල විශ්වාසයෙන් දුන්නා වූ දානයන්, කළා වූ පූජාවන්, පින්කම් තමයි මේකට හේතුව.

ඒ නිසා යමෙක් මේ ජීවිතයේ ආයුෂය, වර්ණය, සැපය, බලයෙන් හීන වෙනවා නම්, ඒ කියන්නේ අනිවාර්යයෙන් ම එයා පෙර ජීවිතයේ පිනෙන් දුර්වලයි. එතකොට, එහෙම ආයුෂයෙන්, වර්ණයෙන්, සැපයෙන්, බලයෙන් හීනවනවා නම්, අපි ආයෙමත් දේවාල පස්සේ ගිහිල්ලා, යන්ත්‍රමන්ත්‍ර, ගුරුකම් පස්සේ ගිහිල්ලා හරි යන්නේ නැහැ. ඒවා තුළින් අපි තවත් දුකට ම යි යන්නේ.

එහෙනම් මේක කවුරුත් දෙවියෙක්, බ්‍රහ්මයෙක් කරපු දෙයක් නෙමෙයි. තමා විසින් කරපු දෙයක් ම යි. ඒ නිසා තමාගේ ජීවිතයට ආයුෂය, වර්ණය, සැපය, බලය හීන වෙලා, ලෙඩදුක් හැදිලා මේවා වෙනවා නම් අපි කවදාකවත් ගිහිල්ලා බෝධීන් වහන්සේගේ පඬුරක් බැඳලා තේරුමක් නැහැ; දේවාලෙක ත්‍රිශූලයක ගිහිල්ලා පඬුරක් බැඳලා තේරුමක් නැහැ.

එහෙම පඬුරක් බඳිනවා නම්, බඳින්න තියෙන හොඳ ම තැන තමයි තමාගේ මේ අතේ පඬුර බැඳගන්න එක. මොකද, පඬුර අතේ තියෙන කොට තමන්ට හැම වෙලාවෙ ම තේරෙනවා, අකුසලය නිසයි මට මේ දේ වුණේ කියලා. අකුසලය නිසයි මේ දේ වුණේ කියලා දැකලා මොකක්ද කරන්න ඕන? අපි කුසල් දහම් තුළ ශක්තිමත් වෙන්න.

ඒ නිසා මේ ජීවිතයේ, යමෙක් මේ මනුස්ස ජීවිතය ලබලා දන් දෙන්නේ නැත්නම්... දැන් අපිට පේනවා, සමාජයේ හුඟ ක් අය ඉන්නවා, දන් දෙන්නේ නැහැ. ඒගොල්ලෝ දන් දෙන්න කැමති නැහැ. රැස් කරනවා, හම්බ කරනවා. ඒගොල්ලෝ කාලා බීලා හොඳින්, සතුටින් ජීවත් වෙනවා. ඉන් එහාට දන් දෙන්න කැමැත්තක් නැහැ. එවැනි අයට, ආයුෂය, වර්ණය, සැපය, බලය එන්න එන්න ම හීන වෙනවා.

යමෙක් තමන් හම්බකරන දෙයින් දන් දෙන්නේ නැත්නම්, ඒ දන් නො දෙන්න, වියදම් කරන්නා වූ හැම සතයක් ම ඒගොල්ලන්ට රෝගාබාධ උදෙසා වියදම් කරන්න වෙනවා; බෙහෙත්වලට, ෆාමසි වලට වියදම් කරන්න වෙනවා. මොකද, ඒගොල්ලෝ මෙතනින් ආයුෂය, වර්ණය, සැපය, බලය රැස් කරන්නේ නැහැ.

ආයුෂය, වර්ණය, සැපය, බලය රැස්වෙන්නේ කුමක් තුළින් ද? දානය තුළින්, පින්කම් තුළින්. එතකොට පින්කම් නො කර, දානය නො කර ඒවායින් ආයුෂය, වර්ණය, සැපය, බලය රැස්වෙන්නේ නැති වෙනකොට ආයුෂය, වර්ණය, සැපය, බලය හීන භාවය නිසා අනිවාර්යයෙන් ම රැස්කරන මුදල් ෆාමසි වලටයි, වෛද්‍ය ක්ෂේත්‍ර උදෙසායි ඒගොල්ලෝ යොමුකරන්න ඕන. මොකද, ඒගොල්ලෝ මෙතන ආයුෂය, වර්ණය, සැපය, බලය රැස් කරන්නේ නැහැ.

ඒ නිසා මේ ජීවිතයේ යමෙකුට රෝගාබාධ තියෙනවා නම්, යමෙකුට එවැනි ආයුෂය, වර්ණය, සැපය, බලය දුර්වලතාවයන් තියෙනවා නම්, ඒගොල්ලෝ තව තව ශක්තිමත් ආකාරයෙන් දානය තුළ ස්ථාපිත වෙන්න ඕන. මොකද, දානය නිසයි ආයුෂය, වර්ණය, සැපය, බලය ලැබෙන්නේ.

දැන් අපේ රටේ සාමාන්‍යයෙන් ආදායම අඩු ජනතාව ඉන්නවා. ඒ ආදායම අඩු ජනතාව හුඟක් වෙලාවකට දන් දෙන්න කැමැත්තක් නැහැ. ඒගොල්ලෝ කැමති අනුන්ගේ දේ ලබන්න. මොකද, ඒගොල්ලන්ට මොකුත් ලැබිලා නැහැ කියලා අනුන්ගේ දේ ලබන්න. එතන හරි භයානක තැනක් තියෙනවා. ඒගොල්ලෝ තේරුම් ගන්න ඕන,"අපිට මේ දුප්පත් භාවය ලැබුණේ අපි සංසාරයේ දන් දීලා නැහැ" කියන කාරණය හිතන්න.

ඒ නිසා අනුන්ගෙන් ලබනවාය කියන තැන විතරක් නෙවෙයි, මේ මොහොතේ හරි, අපේ දුප්පත් භාවය තුළ ඉඳන් හරි අපි දක්ෂ වෙන්න ඕන, අපි දවසට රුපියල් 100 ක් නම් හම්බ කරන්නේ, රුපියල් 10 ක් හරි දන් දෙන්න. රුපියල් 1000 ක් හම්බ කරන කෙනා රුපියල් 100 ක් දන් දෙනවා. නමුත් රුපියල් 100 ක් හම්බ කරන කෙනා රුපියල් 10 ක් දන්දෙන්න දන්නේ නෑ.

එතකොට, දුප්පත් මනුස්සයෙක් ඉන්නවා නම්, ඒ මනුස්සයා අනුන්ගෙන් බත් පාර්සලයක් කාලා නම් ජීවත් වෙන්නේ, ඒ අනුන්ගෙ න් කන බත් පාර්සලය තුළින් වුවත් බත් කටක් දන් දෙන්න එයා දක්ෂ වෙන්න ඕන. එහෙම වුණොත් තමයි එයාට මේ දුගීභාවයෙන් අනාගතයේදි මිදෙන්න පුළුවන්. ඒ නිසා මේ ආයුෂය, වර්ණය, සැපය, බලය හීනවෙනවා කියන්නේ, අනිවාර්යයෙන් ම පෙර සංසාරයේ අපේ පිනේ මඳභාවය ම යි. ඒ නිසා පිනේ මඳභාවය නිසා ආයුෂය, වර්ණය, සැපය, බලය හීන වෙනවා නම් අපි දක්ෂ වෙන්න ඕන, හැම වෙලාවෙ ම පින් කිරීම තුළින් ආයුෂය, වර්ණය, සැපය, බලය වැඩි කරගන්න.

දැන් අපි කියමු, කෙනෙක් රාජකාරි කරනවා. එයා මාසෙකට රුපියල් දහදාහක් පඩිය ගන්නවා. නමුත් දහදාහක් පඩිය අතට ගන්න වෙලාවේ එයා තුළ අවංකව ම තෘප්තියක් ඇතිවෙනවා, "මම රුපියල් එකොළොස්දාහක වැඩ කළා" කියලා. එයා එකොළොස්දාහක වැඩ කරලයි දහදාහක පඩිය අතට ගන්නේ. ඒ වෙලාවට එයාට අවංකව ම සතුටක් ඇතිවෙනවා, පඩිය අතට ගන්නකොට. ඒ සතුට කියන්නේ මොකක්ද? ආයුෂය, වර්ණය, සැපය, බලය. වෙන දෙයක් නෙවෙයි. එතකොට, එයා ඒ පඩිය ගන්න මොහොතෙ ම එයාගෙ ජීවිතයට ආයුෂය, වර්ණය, සැපය, බලය එකතු වෙලා. තේරුණාද?

එතකොට, තව කෙනෙක් ඉන්නවා. එයාත් රුපියල් දහදාහක් පඩිය ගන්නවා. නමුත් පඩිය ගන්න කොට එයාට ම හිතෙනවා, " අනේ මම රුපියල් පන්දාහකවත් වැඩ කළේ නෑ" කියලා. එහෙනම් එයාට සතුටක් ඇති වෙනවද? එයාට ආයුෂය, වර්ණය, සැපයක්, බලයක් එකතු වෙනවද? නැහැ.

එහෙම නම් කොතැනදී වුණත්, අපි හැම ක්ෂේත්‍රයකදී ම සතුටු වෙන ආකාරයෙන් ඒ කටයුත්ත කරන්න ඕන, අපිට අවංකව ම හිතට සතුටක් දැනෙන ආකාරයට. අම්මා, තාත්තාට සැලකුවා නම්, අනේ මම අවංකව ම අම්මා තාත්තට සැලකුවා. මගේ බිරිඳට යුතුකම් ඉටු කරනවා නම්, මම අවංකව බිරිඳට යුතුකම් ඉටු කළා. මගේ ස්වාමිපුරුෂයාට යුතුකම් ඉටු කරනවා නම්, මම අවංකව ඒවා ඉටු කළා. සමාජයට, මහණ බමුණන්ට වෙන්න තියෙන යුතුකම් ඉටු කළා නම් මම ඒවා අවංකව ම කළා. ඒ අවංක භාවය හිතෙන මොහොතෙ ම එයාගේ ජීවිතයට ආයුෂය, වර්ණය, සැපය, බලය ලැබෙනවා. ඒ මොහොතෙ ම එයාට ආයුෂය, වර්ණය, සැපය, බලය ලැබෙනවා.

ඒ නිසා අපි හැම වෙලාවෙ ම දක්ෂ වෙන්න ඕන, තමා සතුටින් ඉන්න; අනුන්ව සතුටු කරලා තමා සතුටින් ඉන්න. ඒක තමයි අපිට ලබන්න තියෙන ලොකු ම ශක්තිය. මොකද, අපේ

හිනාවකින් කෙනෙක් සතුටු කරන්න බැරිකමක් නැහැ. නේද? හිනාවකට අපිට වියදමක් යන්නේ නැහැ. නමුත් අපි ඒ හිනාවෙනුත් සමහර වෙලාවට තව කෙනෙක් සතුටු කරන්න කැමති නැහැ. ඇයි කියන්නේ, අපේ ළඟ ආයුෂය, වර්ණය, සැපය, බලය ලබන්න අපි ම කැමති නැහැ.

ඒ නිසා දන් දීමෙන් අපි දක්ෂ වෙන්න ඕන, ආයුෂය, වර්ණය, සැපය, බලය ලබාගන්න. එහෙමත් නැත්නම් අවම වශයෙන් අනුන්ව සතුටු කරලාවත්. හිනාවකින් සතුටු කළත්, වචනෙකින් සතුටු කළත් ඒ සතුටු කරන මොහොතෙ ම අපේ ජීවිතයේට ආයුෂය, වර්ණය, සැපය, බලයයි ලැබෙන්නේ.

මේක හැම කෙනෙක් ම තේරුම් ගන්න ඕන. මොකද, ආයුෂය, වර්ණය, සැපය, බලය අපේ ජීවිතයට අත්‍යවශ්‍ය යි. ඉතින් ආයුෂය, වර්ණය, සැපය, බලය අත්‍යවශ්‍ය නම්, අපි දක්ෂ වෙන්න ඕන, එක පැත්තකින් පින්කම් කරලා ආයුෂය, වර්ණය, සැපය, බලය එකතු කරගන්න.

එහෙමත් අදක්ෂ නම්, අඩු වශයෙන් අනුන්ව සතුටු කරලා හරි හිනාවකින්, කතාවකින්, වචනෙකින්, ඉරියව්වකින් හරි අනුන්ව සතුටු කළා නම් ඒ සතුටු කරන මොහොතෙ ම අපේ ජීවිතයේට ආයුෂය, වර්ණය, සැපය, බලය එකතු වෙනවා.

# කරදර එන්නේ ඔබේ අකුසල් විපාකයන් නිසාමයි

**දහහතරවන ප්‍රශ්නය :**

**ගෞරවණීය ස්වාමීන් වහන්ස, කෙනෙක්ගේ හිතට දුක දෙන, මානසිකව කරදර කරන කෙනෙක්ට අත්වන ඉරණම කුමක් ද ස්වාමීන් වහන්ස?**

**පිළිතුර :**

මෙහෙමයි. ඒ කරදර කරන කෙනාත් හේතුඵල ධර්මයක්. දූන් සමහරු ඇවිල්ලා කියනවා, "අනේ ස්වාමීන් වහන්ස, මම දූන් රස්සා දහයක් කළා. නමුත් මේ දහ තැනදි ම මට කොතැනකවත් ගැළපුණේ නැහැ. එයා මෙහෙම කියනවා, මෙයා මෙහෙම කියනවා, මෙයා මෙහෙම කියනවා කියලා රස්සා දහයෙන් ම අයින් වෙලා දූන් මේ එකොළොස් වෙනි රස්සාව හොයනවා.

මෙය හේතුඵල ධර්මයක්. තේරුණාද? ඒ හේතුඵල ධර්මයන් කියන්නේ, එයා පෙර ජීවිතයේ, එයා ආයතනයක විධායකයෙක් වෙලා, වැඩිහිටියෙක් වෙලා ඉඳලා අනික් අය නිරතුරුව ම පීඩාවන්ට පත්කරලා. එතකොට, එහෙම අනිත් අය නිතර ම පීඩාවන්ට පත් කරන කොට එහි ආනිශංස නිසා, මේ ජීවිතයේ අපිට මේ ආකාරයෙන් අපිව පීඩාවට පත්වෙනවා. එය හේතුඵල ධර්මයේ ප්‍රතිඵලයක්.

එතකොට, ඒ හේතුඵල ධර්මයන් දකිමින් අපි දක්ෂ වෙන්න ඕන, අපිට ලැබුණු තැන අපි යහපත් ආකාරයෙන් ඉන්න. මොකද, තමන්ට දැන් මෙහෙම පීඩනයන් එනවා නම් යම්කිසි රාජකාරි ස්ථානයක, අපි දකින්න ඕන මේ මගේ අකුසල් විපාකයක්. ඒ අකුසල් විපාකය තුළ අපි දක්ෂ වෙන්න ඕන ඒ පීඩනය දරාගෙන ජීවත් වෙන්න. මොකද, මේ ලෝකයේ නිවැරදි තැන් කොතැනකවත් හොයන්න බැහැ. තේරුණාද? නිවැරදි තැනක් කියලා දෙයක් මේ ලෝකයේ නැහැ. ඒ නිසා නිවැරදි තැන් හොයාගෙන ගිහිල්ලා අපිට ගැළපෙන තැන් හොයාගෙන යනවා කියන කාරණය කවදාකවත් සිද්ධ වෙන්නේ නැහැ.

ඒ නිසා අපි දක්ෂ වෙන්න ඕන, අපිට ලැබුණු තැන අපි නිවැරදි ආකාරයෙන් ජීවත් වෙන්න. අපි ගැටෙනවා කියන්නේ... ඒ කියන්නේ අපි නිවැරදි වෙලා නැහැ. මොකද, අපි ගැටෙනවා. ඒ කියන්නේ අපි නො ගැටී, අපි නිවැරදි ආකාරයෙන් ජීවත් වෙන්න දක්ෂ වෙන්න ඕන.

නිවැරදි තැන් හොයාගෙන යන එක නෙවෙයි කරන්න ඕන. මන්ද, යම් වැරැද්දක් සිද්ධ වෙනවා නම්, ඒ අපේ අකුසල් විපාකයක් ම යි... අකුසල් විපාකයක් ම යි...

# ශක්තිමත් කුසලයකින් ඔබේ අතීත අකුසල් යටපත් කරගන්න

**පහළොස්වන ප්‍රශ්නය :**

**ගෞරවණීය ස්වාමීන් වහන්ස, ඉතාමත් ප්‍රබල කර්මයක් කෙනෙක්ට බලපානවා නම්, ඒ කර්ම ඵලය දුර්වල කිරීමට දිගින් දිගට ම කුසල්හි නිරතවීම ද කරන්න ඕන?**

**පිළිතුර :**

එහෙමයි. කර්මයක් නැතිකර ගන්න නම් හේතුන් කිහිපයක් තිබෙනවා. එකක් තමයි වඩාත් ශක්තිමත් කුසලයකින් අකුසලය යටපත් කරනවා.

දැන් එක නෝනා කෙනෙකුයි, මහත්තයෙකුයි ආවා. ඒගොල්ලෝ දැන් ජීවිතයේ මැදි වයසත් පහුවෙලා, වයෝවෘද්ධයි. ඇවිල්ලා කිව්වා, "ස්වාමීන් වහන්ස, අපේ හිතට බලවත් ප්‍රශ්නයක් තියෙනවා. මේ ප්‍රශ්නෙ තමයි, තරුණ කාලෙ අපි ධර්මය තුළ හිටියේ නැහැ. තරුණ කාලේ ධර්මය තුළ හිටියේ නැති නිසා අපි විවාහ වෙච්ච අලුත අපි ගබ්සාවක් සිද්ධ කළා. එදා මේ ගබ්සාව, වැරදියි කියලා අපි දැනගෙන සිටියේ නැහැ. නමුත් දැන් මේ ධර්මය තුළ ශක්තිමත් වෙනකොට, දැන් ස්වාමීන් වහන්ස, මේක අපිට හරි ම පීඩාවක්." මම ඇහුවා, "පුතේ, ඔබට මේක නිරතුරුව ම මතක්

වෙනව ද?" කියලා. එතකොට ඒ මහත්මයා කිව්වා, "ඔව්, මට මතක් වෙනවා" කියලා. මම කිව්වා, "එහෙනම් මෙය බරපතළ ප්‍රශ්නයක්."

මොකද, හිත කියන්නේ මාරයා. මොකද, අපි කවදා හරි මැරෙන මොහොතක බලවත් වූ අකුසලයක් අපිට මතුකරලා දෙනවා. එතකොට, බලවත් අකුසලය මැරෙන වෙලාවට ගබ්සාව මතක් වුණොත් ප්‍රාණඝාතයට අදාළව ඊළඟ ප්‍රතිසන්ධිය යනවා. ඒ නිසා මම කිව්වා, "එහෙම මතක් වෙනවා නම් මේක දැන් බරපතළයි."

එහෙනම් ඔබ මොකක්ද කරන්න ඕන? "ඔබ ළමා රෝහලට යන්න. ළමා රෝහලේ දැඩි සත්කාර ඒකකයේ ඉන්නවා, ජීවිතයත් මරණයත් අතර සටන් කරන දරුවෝ. ඒගොල්ලන්ට බෙහෙත් ගන්න අම්මා තාත්තට වත් වත්කම් නෑ. එවැනි දරුවො දෙතුන් දෙනෙක් තෝරාගෙන ඒගොල්ලෝ ජීවත් වෙනකම් අවශ්‍ය සියලු ම දේ කරන්න; බෙහෙත් හේත් අරන් දෙන්න; සියලු ම දේ කරන්න. කරලා ඒ දරුවෝ දෙන්නා ජීවත් වෙනවා දකිනකොට, "මම කළා වූ, මගේ අතින් නැති වුණා වූ දරුවාට මම ජීවිත දෙකක් දුන්නා"ය කියා යටපත් කරන්න."

මේ ශක්තිමත් කුසලයෙන් අර අකුසලය යටපත් කරන්න. එහෙම කළොත් ඒක යටපත් වෙනවා. නමුත් එහෙමත් කරලා එයා ආයෙමත් අර ගබ්සාව ගැන හිතන්න ගියොත් කවදාකවත් ඒක යටපත් වන්නේ නැහැ. තමන්ගේ දක්ෂ භාවය තියෙන්න ඕන.

හිත කියන්නේ මාරයා. ඒක තේරුම් ගන්න ඕන. මේ අකුසලය අර වගේ ශක්තිමත් කුසලයකින් යටපත් කරලා ඒක එතනින් අමතක කරලා දාන්න ඕන. මතකයට ගන්න බෑ. මොකද, එයා දැන් හිතෙන් චේතනාව සකස් කරන් ඉන්නේ, "මම ඒක යටපත් කළා" කියලා. එහෙම කරලා නෝනා, ශක්තිමත් අකුසල්, ශක්තිමත් කුසල් තුළින් යටපත් කරන්න පුළුවන්.

දැන් අපි කියමු, කෙනෙක්ගේ අතින් බල්ලෙක් මැරිලා තියෙනවා. නමුත් මේ බල්ලා මැරිච්ච එක හැම වෙලාවෙ ම එයාට සිහිපත් වෙනවා. තේරුණාද? එහෙම සිහිපත් වෙනකොට එයාට මොකක්ද කරන්න තියෙන්නේ? කන්න බොන්න නැති බළල් පැටියෙක් හරි ගෙනල්ලා, එයාට කන්න බොන්න දීලා, ලොකු මහත් වෙනකම් කන්න බොන්න දීලා එයාව ගිහිල්ලා කොහාට හරි අතහැරලා දානවා. දාලා, "මගෙන් නැති වුණා වූ සතාට මම ජීවිතයක් දුන්නා" කියලා සිතන්න ඕන.

ඒ කියන්නේ තමන් දක්ෂ නැත්නම් මේවා යටපත් කරගන්න, තමන් දක්ෂ වෙන්න ඕන අර විදියට උපක්‍රමශීලීව හරි යටපත් කරගන්න. එහෙමත් නැත්නම්, තමන්ගේ අතින් අකුසලයක් වෙලා තියෙනවා නම්, අතීතෙදි වෙච්ච අකුසල් ගැන ගැටෙන්න යන්න අවශ්‍යතාවයක් නැහැ. මොකද, අකුසල් වෙච්ච සිල්පද බිඳීම් ගැන අපි ගැටෙන්නට ගියොත්, ඒ ගැටෙන සිතෙන් අපි මැරුණොත් අපි යන්නේ දුගතියට.

නමුත් අපරාදෙ, රකින සිල්පද හතරක් මෙතන තියෙනවා. රකින සිල්පද හතරක් තියලා අපරාදෙ බිඳුණු සිල්පදය ගැන ගැටිලා අපි නිරයට වැටෙනවා. ඒ නිසා බිඳුණු සිල්පදය ගැන සිතන්න යන්න එපා කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ. ඒක නිවැරදි කරගන්න. නමුත් රකින සිල්පද හතර ගැන හිතලා සතුටු වෙන්න. ජීවිතයේ අපේ අතින් වුණා වූ වැරැද්දක් තියෙනවා නම්, ඒ වැරැද්ද නැවත මතුකරලා ගන්න යන්න එපා.

මොකද, චේතනාවයි කර්මය සකස් කරලා තියෙන්නේ. ඒ නිසා ඒක හැම වෙලාවෙ ම අතීත පංච උපාදානස්කන්ධයක් හැටියට දැකලා ඒක යටපත් කරලා දාන්නයි තියෙන්නේ. අතීතයේ වුණා වූ සිද්ධියක් ඒ සංස්කාරයන්ගේ ස්වභාවය අනිත්‍යයි කියලා දාලා යටපත් කරන්න ඕන. එහෙම නැත්නම් ශක්තිමත් කුසලයකින් අකුසලය යටපත් කරලා දාන්න, අපි දක්ෂ වෙන්න ඕන.

# මාරයා

**දහසයවන ප්‍රශ්නය :**

**ගෞරවණීය ස්වාමීන් වහන්ස, අපිට පැහැදිලි කර දෙන්න, මාරයා කියන්නේ කවුද?**

**පිළිතුර :**

මාරයා කියලා බුදුරජාණන් වහන්සේ කාරණා තුනකට කියනවා.

- පංච උපාදානස්කන්ධය මාරයා කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. ඒ කියන්නේ **රූපය කියන්නේ මාරයා.**
- **හිත කියන්නේ මාරයා.**
- ඊළඟට බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, වසවර්තී දිව්‍ය පුත්‍රයා, ඒ කියන්නේ **පරනිම්මිත වසවර්තියේ ඉන්න දිව්‍ය නායකයා මාරයා** කියලා.

එතනදී, අපේ ගිහි පින්වතුන්ලාට මාරයා බවට පත්වෙන්නේ හිතත්, රූපයත්. ඒ කියන්නේ පංච උපාදානස්කන්ධය. තේරුණාද? අර වසවර්තී දිව්‍ය පුත්‍රයා කවදාක්වත් අපේ ළඟට එන්නේ නැහැ. අපේ මේ ගිහි ජීවිතය ගත කරන ගිහි පින්වතුන්ලාට මාරයා බවට පත්වෙන්නේ කවුද? රූපයත්, හිතත් කියන කාරණා දෙක. මොකද, මේ සකස් වෙන හැම හිතක් ම මාරයා හැටියටයි බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ. ඒ කියන්නේ මොකක් හෝ සිතක්.

දැන් මට එක සැරයක් මතකයි, මම බස් එකේ නැඟලා කතරගමට යන්න ගියා. බස් එකේ නැඟලා මම ඉස්සරහා සීට් එකේ වාඩිවෙලා ඉන්නවා. මුළු බස් එකේ ම සෙනඟ. නමුත් මගේ අනත් සීට් එකේ කවුරුත් ඉඳගෙන හිටියේ නැහැ. මේ රත්මලාන හරියෙන් මහත්තයෙක් නැඟලා ඉඳගත්තා. නැෂනල් එකක් ඇඳපු මහත්තයෙක් නැඟලා ඉඳගෙන, දැන් එයා මට පිටුපාල තමයි වාඩිවෙලා තියෙන්නේ. ඉස්සරහා පැත්ත බලාගෙන නෙමෙයි. මට පිටිපස්ස හරවගෙන වාඩිවෙලා ඉන්නවා. එයා පාපුවරුව පැත්ත බලාගෙන. ඉතින් මම දන්නෑ ඇයි කියලා.

නමුත් මෙහෙම බස් එක අර අම්බලන්ගොඩට, තේ බොන්න යන තැනට ම ගියා. ගිහිල්ලා දැන් නැවැත්තුවා. නවත්තලා සෙනඟ ඔක්කොම බැස්සට පස්සේ මේ මහත්තයා මගේ පැත්තට හැරිලා අහනවා, "හාමුදුරුවනේ ඔබ වහන්සේට ගිලන්පස එකක් ඕන ද?" කියලා. ඒක අහනකොට ඒ මහත්තයාගේ එකපාරට මත්පැන් ගඳ ආවා. එතකොට මම දැනගත්තා මේ මහත්තයා මට පිටුපාලා හිටියේ මත්පැන් ගඳ මට එයි කියලා. ඒ වෙලාවේ මම කිව්වා, "එපා මහත්තයෝ ගිලන්පස" කියලා.

නමුත් එයා බස් එකෙන් බැහැලා ගිහිල්ලා මට බීම බෝතලයක් ම ගෙනල්ලා පූජා කළා. මම පින් දෙන කොට එයා ඒ පින අනුමෝදන් වුණා. අනුමෝදන් වෙලා එයා බැහැලා ගිහිල්ලා ආයෙමත් බස් එකට නැඟලා, බස් එක යන්න පටන්ගත්තට පස්සෙ, එයා ආයෙමත් අර පැත්තට හැරිලා තමයි වාඩිවුණේ. එතකොට මම දැන් දන්නවා, මෙයා මේ වාඩිවුණේ බීමත්කම නිසා කියලා.

මම කිව්වා, "මහත්තයෝ.." කියලා මම එයාව මේ පැත්තට හැරෙව්වා. හරවන කොට ඒ මහත්තයා කියනවා, "ස්වාමීන් වහන්ස මම මේ අර පැත්ත බලාගෙන හිටියේ මම ඊයේ රෑ, උදේ මත්පැන් බිව්වා. ඔබ වහන්සේට ගඳ එයි කියලා තමයි හැරුණේ" කියලා.

එයා කියනවා, "ස්වාමීන් වහන්ස, මම කට්ටඩි වැඩ කරන්නේ. මම මේ දකුණු පළාතෙ ඉඳන් වැඩකට ඊයේ රෑ ආපු ගමන්. මම ඒ වැඩේ කරලා දීලා, මම ඒ කරන කෙනාට කියනවා, හැමදා ම වැඩේ ඉවර වුණාට පස්සේ මට අරක්කු භාගයක් බොන්න ඕන කියලා. මම ඒකත් සල්ලිත් අරගෙන ගෙදර යන ගමන්" කියලා.

මම ඇහුවා, "මහත්තයෝ, මහත්තයාට මේ කට්ටඩි වැඩ තුළින් මොකක්ද කරන්න පුළුවන්?" කියලා. එයා කියනවා, "හාමුදුරුවනේ, මට මනුස්සයෙක් මරන්න පුළුවන්" කියලා. මම ඇහුවා, "ඇත්තට ම මහත්තයෝ, මහත්තයාට මනුස්සයෙක් මරන්න පුළුවන් ද?" කියලා. "ඔව්" කිව්වා. මම ඇහුවා, "මහත්තයා මරලා තියෙනව ද?" "ඔව්" කිව්වා.

මම කිව්වා, "මහත්තයෝ, මේක හරි පාපයක්නේ." "නෑ නෑ ස්වාමීන් වහන්ස, මේක පාපයක් නෑ. මම අනුන්ට මෛත්‍රිය උදෙසායි ඒ දෙය කරන්නේ. අනුන්ව ගලවා ගැනීම උදෙසායි ඒ දේ කරන්නේ" කියලා. එහෙම කියලා කියනවා, "මම ඒකෙන් තමයි ජීවත් වෙන්නේ. මගේ දරුවො විශ්ව විද්‍යාලෙ අධ්‍යාපනයට යනවා. මම ඔක්කෝට ම වියදම් කරන්නේ මෙතනින්," කියලා.

එතකොට බලන්න, දූන් හිත කියන්නේ මාරයා, රූපය කියන්නේ මාරයා. මේ මහත්තයා බස් එකට නැග්ග වෙලාවෙ ඉඳන් අර අවසාන වෙලාව වෙනකම් කොයි තරම් නම් හිත් සකස් වුණා ද? එතකොට, එයාට සංඝයා කෙරෙහි ගරුත්වයක් තියෙනවා. ගරුත්වයක් තියෙන නිසයි, අහක බලාගෙන හිටියේ. එහෙම ඉඳලා අවසානේ අර බස් එකේ ම ඉන්න අය බැහැලා ගිහිල්ලා තේ බීලා ආවා.

නමුත් මේ මහත්තයා විතරක් තමයි ඇහුවේ, "ස්වාමීන් වහන්ස, ගිලන්පස එකක් ඕන ද?" කියලා. "එපා" කිව්වහම එයා ගිහිල්ල බීම බෝතලයක් ම ගෙනල්ලා දුන්නා. ඒ ගෙනල්ලා දීලා

පින් දෙනකොට, "සාධු සාධු" කියලා ඒ පින අනුමෝදන් වුණා. එතකොට එයා බලන්න, එහෙම කරලා එයාගෙ වෘත්තියෙන් එයා මනුස්සයෝ මරනවා. මනුස්සයෝ මරලා එයා හිතනවා, "මෛත්‍රිය උදෙසායි මනුස්සයෝ මරන්නේ. අනුන්ට සේවයක් උදෙසායි මනුස්සයෝ මරන්නේ" කියලා.

එතකොට බලන්න, මේ මහත්තයාගේ සකස් වුණා වූ සිතිවිලි කොච්චර එකිනෙකට වෙනස් ද කියලා. කුසල් සිතුත් සකස් වෙනවා. සංඝයා කෙරෙහි ගරුත්වයත් තියෙනවා. අර සා මිනී මරන තැනටත් යනවා. ඒ සියල්ලත් එයා සාධාරණීකරණය කරනවා. ඒක තමයි හිත කියන්නේ මාරයා කියල කියන්නෙ.

සිත නිරතුරුව ම අපිව සුගතියත් දුගතියත් අතර දෝලනය කරමින් අපව අරගෙන යනවා. එතකොට, රූපය කියන්නේ මාරයා කියලා කියන්නේ... දැන් ඔබතුමිය ළඟට ඔබතුමියගේ තරහකාරයෙක් එනවා. දැන් ඔබට මේක පේනවා, තරහාකාරයා එනවා කියලා. නමුත් එහෙම එනකොට ඔබතුමිය විතර්ක සකස් කරන්, ඔබ තුළ තව තව තරහව ඇතිකර ගන්නවා. නමුත් ඔබතුමිය දැක්කා නම්, මේ එන රූපය මාරයා කියලා ඔබ කවදාකවත් ද්වේශය සකස් කර ගන්නවා ද? නැහැ. ඔබ දන්නවා මේ මාරයයි එන්නේ කියලා.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, රූපය මාරයා කියලා. ඒ නිසා රූපය මාරයා කියන කොට, ඔබ ඉස්සරහට රූපය එනකොට ම, මේ මාරයා කියලා හඳුන ගන්නවා. ඒ නිසා ඔබ කේන්ති ගන්නේ නැහැ. එයා කොච්චර ගැටෙන ස්වභාවයෙන් කතා කළත් ඔබ නො ගැටෙන ස්වභාවයෙන් කතා කරලා යනවා. එයා අකුසල් කරගත්තා. ඔබ කරගත්තා ද? නැහැ. මොකද, ඔබ රූපය මාරයා හැටියට දැක්කා.

ඒ නිසා අපේ ජීවිතයට හමුවන ඕනෑ ම රූපයක් මාරයා හැටියට දැක්කොත් කොතැනකදී වත් අපි අනුන් නිසා අකුසල්

රැස්කර ගන්නේ නැහැ. මේ සකස්වෙන සෑම සිතිවිල්ලක් ම අපි මාරයා හැටියට දැක්කොත්, මේ සකස්වෙන සිතිවිලි නිසා අපි කවදාකවත් අකුසලයක් සිද්ධ කරගන්නේ නැහැ. මොකද, අපි දන්නවා මේ මාරයා කියලා.

එහෙනම් ගිහි පින්වතුන්ලාට මාරයා බවට පත් වන්නේ කවුද? සිතත්, රූපයත්. ඒ කියන්නේ, පංච උපාදානස්කන්ධය කියලා ගත්තම හරි. හොඳද?

එතකොට, එයින් එහාත් මාරයෙක් ඉන්නවා. එයා තමයි පරිනිම්මිත වසවර්තියේ ඉන්න දිව්‍ය පුත්‍රයා.

පරනිම්මිත වසවර්තිය කියන්නේ, මේ මුළු ලෝක ධාතුවේ ම තිබෙන සශ්‍රීක ම, සැප ම තැන. ඊට වඩා සැපයක් මේ ලෝකයේ නැහැ. මොකද, පරිනිම්මිත වසවර්තියේ දවසක් කියන්නේ අපේ රටේ අවුරුදු දෙදාහක්. අපිට අවුරුදු දෙදාහක්, මනුස්සයාට අවුරුදු දෙදාහක් ඒගොල්ලන්ට එක දවසයි. තව ම බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පාලා දවස් එකහමාරක් ඒගොල්ලන්ට ගිහිල්ලා නැහැ. තවම දවස් එකහමාරක් ගිහිල්ලා නෑ. ඒ තරම් ඒගොල්ලෝ සැපෙන් වැඩියි. ඇයි සැපෙන් වැඩියි කියන්නේ? ඒ ගොල්ලන් ගේ පින වැඩියි. ඒ ගොල්ලන් ගේ පින වැඩි නිසා ම, ඒ ගොල්ලන්ට අකුසලය ප්‍රකට වෙන්නේ නැහැ. මාරයාට අකුසලය ප්‍රකට වෙන්නේ නැහැ.

දැන් මාරයා බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයට පත්වන වෙලාවෙත් ඇවිල්ලා පීඩා කරනවා; බාධා කරනවා. බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයට පත්වුණාට පස්සෙත් පීඩා කරනවා. ආයු සංස්කාරය අතහරින වෙලාවෙත් දැඩි ආකාරයෙන් පීඩා කරනවා. නමුත් මෙච්චර පීඩාවන් කරලත්, රහතන් වහන්සේලාට... මුගලන් මහ රහතන් වහන්සේගේ කුසට රිංගනවා, එකපාරක් මාරයා ඇවිල්ලා. මේ සා පීඩා කළත් එයාට අකුසලය ප්‍රකට නෑ. ඇයි? පින වැඩියි. ඒ තරම් පින ශක්තිමත්.

ඒකයි බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ, පින ගින්දරක් කියලා. පින අත් විඳිනකොට, පිනේ ශක්තිය වැඩිවෙන කොට, ඒගොල්ලන්ට අකුසලය ප්‍රකට වෙන්නේ නැහැ. දැන් වර්තමාන සමාජයේ ඉන්න ප්‍රභූ මහේශාක්‍ය මනුස්සයෝ බලන්න. ඒගොල්ලන්ගේ මහේශාක්‍ය භාවය කියන්නේ, පින. පින නිසා මේ ජීවිතයේ කරන අකුසල් මේගොල්ලන්ට ප්‍රකට නෑ නෝනා. ප්‍රකට වෙන්නේ නෑ.

පින ඒ තරම් ශක්තිමත්. අකුසල් කරනවා. කළත් ඒවා විපාකෙට එන්නේ නැහැ. මොකද, පින බලවත්. මාරයා කියන්නෙත් එහෙම කෙනෙක්. එයාගෙ අතීත කුසල් බලවත් නිසා මේ මොහොතේ කරන්නා වූ අකුසල් එයාගෙ විපාකය පිණිස ප්‍රකට වෙන්නේ නැහැ.

නමුත් මාරයා යම් දවසක සතර අපායට වැටුණොත් කල්ප ගණන් සතර අපාය මාරයාට දිගයි. මාරයත් කවදා හරි සතර අපායට වැටෙනවා. වසවර්ති මාරයා වැටෙනවා, පල්ලෙහාට. වැටුණට පස්සේ කල්ප ගාණක් එයාට දිගයි. නමුත් දැන් එයාගෙ පින ශක්තිමත්. ඒ නිසා අකුසල් එයාට ප්‍රකට වෙන්නේ නැහැ.

මෙන්න මේ මාරයා අනිවාර්යයෙන් ම බුදුරජාණන් වහන්සේලා, රහතන් වහන්සේලා ළඟට තමයි එන්නේ. ඉන් මෙහා අය ළඟට එන්නේ නැහැ. තේරුණාද? මාරයා කැමති නැහැ, කෙනෙක් ලෝකයෙන් මිදෙනවාට. ඒ කියන්නේ මාර්ගඵල පැත්තට යනවාට එයා කැමති නැහැ. එයාට ඕන, කාමය තුළ ලෝකය තියාගන්න.

**අතුරු ප්‍රශ්නය :**

**ගරු ස්වාමීන් වහන්ස, යහපත් ක්‍රියාවන්හි යෙදෙන පුද්ගලයන්ට කරදර කරන්න මාරයා පෙළඹෙන්නේ නැද්ද?**

**පිළිතුර :**

බලපෑම් කරන්න මාරයා එන්නේ නැහැ. මාරයා අවංකව ම එන්නේ, කෙනෙක් චතුරාර්ය සත්‍යය අවබෝධ කරගන්න යන වෙලාවට. අවසාන වෙලාවෙදි තමා එයා එන්නේ.

එයා එන්න ඉස්සෙල්ලා එයාගෙ මාර පිරිවර ඉන්නවා. ඒ වගේ ම මාර දූතියෝ කියලා, තණ්හා, රතී, රඟා කියලා තුන්දෙනෙක් ඉන්නවා. මේ මාරයා කියන්නේත්, තණ්හා, රතී, රඟා කියන්නේත්, මාර සේනාව කියන්නේත් මේ ලෝකයේ ජීවමාන චරිත.

අද මේ වර්තමානයේ රටේ ජනාධිපති කෙනෙක් ඉන්නවා කියන්නේ ජීවමාන චරිතයක් වගේ ම, මාරයා කියන්නෙත් ජීවමාන චරිතයක්, සංකල්පයක් නෙමෙයි. මාර දූතියන් කියන්නේත් ජීවමාන චරිත තුනක්. මාර පිරිවර කියන්නෙත් ජීවමාන චරිත ම යි.

දැන් අපි දන්න එක්තරා ස්වාමීන් වහන්සේ නමක් උතුම් සමාධියෙන් පසුවෙනවා. රාත්‍රී 10 ට විතර ඇතියි කියලා, ඒ ස්වාමීන් වහන්සේ වෙලාව කියන්නේ. උන්වහන්සේ සමාධියෙන් පසුවෙන කොට උන්වහන්සේට මීටර් 100 ක් විතර ඉස්සරහින්... එකපාරට කුළු මී හරක් රංචුවක් පහළ වෙලා තියෙනවා. කුළු මී හරක්. මේ කුළු මී හරක් රැල නහයෙන් දුම් විදගෙන වේගයෙන් ස්වාමීන් වහන්සේ ඉස්සරහට හඹා ඇවිල්ලා තියෙනවා.

දැන් ස්වාමීන් වහන්සේ සමාධියෙන් පසුවෙන්නේ. සමාධිය තුළ ස්වාමීන් වහන්සේ ළඟ බියක් සකස් වෙන්නේ නැහැ. ඒක සමාධියේ හේතුඵල ධර්මයක්. දැන් මේ කුළු මී හරක් රංචුව

වේගයෙන් ස්වාමීන් වහන්සේ ඉස්සරහට හඹා ඇවිල්ලා, ස්වාමීන් වහන්සේට මීටර් දෙකක් තුනක් තියලා දකුණු පැත්තට හැරිලා පලා ගිහිල්ලා තියෙනවා. ඒගොල්ලෝ ආපු වේගයෙන් ම දකුණු පැත්තට හැරිලා. මොකද, ඒගොල්ලන්ට ඉස්සරහ පැත්තට එන්න බැහැ.

ඒක තමයි ධර්මයේ ශක්තිය. ස්වාමීන් වහන්සේගේ ශක්තියක් නෙවෙයි ඒක. ධර්මයේ, සමාධියේ ශක්තිය. මේ කුළු මී හරක් පැනලා යද්දි ම අර ස්වාමීන් වහන්සේට පේනව ලු, අර කුළු මී හරක් පහළ වෙච්ච තැන එක තනි සද්දන්ත කුළුමීමෙක් පහළ වෙනවා. තනි සද්දන්ත කුළුමීමෙක්. එයා අඩි 7ක් විතර උසයි කියලයි, ඒ ස්වාමීන් වහන්සේ කියන්නේ. එයාගෙ මුළු ඇඟ ම මේ වෙල්වට් එකක් වගේ. දහස්කඩ සිවුරු තිබෙන්නේ, පුංචි පුංචි කොටු තියෙන. ඒ පුංචි පුංචි කොටු තියෙන දහස්කඩ සිවුරක්, වෙල්වට් රෙද්දෙන් වගේ හැදිලා ග්‍රීස් පැහැයක් ගන්නවා. දිලිසෙනවා එයාව. එයාගෙ මේ ඉස්සරහ නහයට ලොකු රත්තරන් වළල්ලක් දාලා තියෙනවා කියනවා. එහෙම දාපු, අර එකපාරට පහළ වුණු මේ සද්දන්ත කුළුමීමා අර වගේ ම දූම් පිඹගෙන ස්වාමීන් වහන්සේ ඉස්සරහට ඇවිල්ලා තියෙනවා. නමුත් ඒ එද්දිත් එයත් අර වගේ ම මීටර් 2ක් තියලා හැරිලා, පැනලා ගිහිල්ලා තියෙනවා.

දැන් ඊට පස්සේ තමයි, ස්වාමීන් වහන්සේ තමන්ගේ ප්‍රඥාවෙන් මේක බලන්නේ, ගළපලා මොකක්ද මේ වුණේ කියලා. එතකොට තමයි, අවබෝධ වෙන්නේ මේ ඉස්සෙල්ලා ම එන්නේ මාර සේනාව. මාර පිරිවර. දැන් මාර පිරිවර ඇවිල්ලා, මාර පිරිවර බයේ පැනලා දුවනකොට, අන්න අනෙන්ට මාරයා තමයි ඒ ආවේ.

එතකොට, මාරයා කියන කෙනාට, මාර පිරිවරට ඕනෑ ම වේශයක් ගන්න පුළුවන්. ඒගොල්ලොන්ට හරක් වේශය ද, වෙන ඕනෑ ම වේශයක් අරගෙන ඒගොල්ලොන්ට මතුවෙන්න පුළුවන්. ඒගොල්ලන්ගේ හැකියාව. එතකොට එතනදී... ඒ මාරයා එතනදි උත්සාහ ගන්නේ, එක්කො ඒ ස්වාමීන් වහන්සේ

බය කරලා, එතන හෙළක් තිබිලා තියෙනවා, ඒ හෙළෙන් පල්ලෙහාට වට්ටලා මොකක් හරි කරන්න.

ඒ වගේ ඒගොල්ලෝ, අනිවාර්යයෙන් ම කෙනෙක් ධර්මාවබෝධයක් කරා යන වෙලාවෙ තමයි ඒ අය එන්නේ. එතෙක් ඒගොල්ලෝ එන්නේ නැහැ. මුලින් ම මාර සේනාව එනවා. ඊළඟට මාර දූතියෝ එනවා. ඊළඟට තමයි, අවසාන ජවනිකාවෙදි තමයි මාරයා මේකට බහින්නේ. නමුත් ඒගොල්ලෝ ගිහි පින්වතුන්ලා ළඟට එන්නේ නැහැ. මොකද, ගිහි පින්වතුන්ලාට මාරයා වෙන්නේ හිතත්, රූපයත්. එහෙනම් මාරයා කියන්නේ ජීවමාන චරිතයක්. මාර දූතියො කියන්නේ ජීවමාන චරිත.

මොකද, අපි දන්න එක්තරා ස්වාමීන් වහන්සේ නමක් ඉදිරියට මාර දූතියෝ තුන්දෙනා ම අවස්ථා තුනකදි ඇවිල්ලා තියෙනවා. එක අවස්ථාවක එක මාර දූතියක් ඇවිල්ලා තියෙනවා, රෝගියෙක්ගේ ස්වභාවයෙන්. රෝගී කාන්තාවකගේ ස්වභාවයෙන්.

එතකොට සමාධියෙන් තමයි මේ සියල්ල දකින්නේ. පියවි ඇහින් දකින්න පුළුවන් දේවල් නෙමෙයි. සමාධි ඇහෙන් දකිද්දි ස්වාමීන් වහන්සේ දකින්නේ රෝගී කාන්තාවක්. එතකොට, රෝගී කාන්තාව අරමුණු කරගෙන ඉද්දි, එකපාරට ඒ රෝගී කාන්තාව ඉතාමත් අලංකාර ආකාරයෙන් දිව්‍යාංගනාවක් වෙලා තියෙනවා. ඒ දිව්‍යාංගනාවක් වෙලා තියෙන්නේ, හුඟක් අඩ නිරුවත් ස්වභාවයෙන් එයා මතුවෙන්නේ. මොකද, එයා හදන්නේ ස්වාමීන් වහන්සේ තුළ කාමය සකස් කරන්න. කාමය සකස් කරන්න.

එතකොට, ඒ ස්වාමීන් වහන්සේ කියනවා, අර රෝගීව වකුටු වෙලා හිටිය අර කාන්තාව එක ක්ෂණයෙන් ලස්සන දිව්‍යාංගනාවක් වෙනවා. ඒ දිව්‍යාංගනාවගේ පැහැය ඇවිල්ලා, හොඳට ඉදුණු පිනි ජම්බු ගෙඩියක් කැපුවහම පිනි ජම්බු ගෙඩියේ අර පැහැයක් තියෙනවනේ, රෝසපාට. අන්න ඒ පාට තමයි ඒගොල්ලන්ගේ

පැහැය. ඒගොල්ලෝ අඩ නිරුවත් කරලා තමයි මතුවෙන්නේ. ඒ මතුවෙන්නේ මොකට ද? ඒ ක්ෂණයෙන් ම ස්වාමීන් වහන්සේ තුළ කාමය සකස් කරන්න. නමුත් ඒ වෙලාවට ස්වාමීන් වහන්සේ තුළ කාමය සකස් වෙන තැනින් ඉස්සරහට ස්වාමීන් වහන්සේ ගිහිල්ලායි තියෙන්නේ.

ඉතින් ඒ වගේ අවස්ථා තුනකදි ම මේ මාර දූතියෝ තුන්දෙනා උන්වහන්සේ ළඟට ඇවිල්ලා තියෙනවා. ඒ කියන්නේ, මේවා ජීවමාන චරිත. නමුත් මේ ජීවමාන චරිත කවදා හරි අපිට මුණගැහෙන්නේ, අපි මේ ධර්ම මාර්ගයේ ඉස්සරහට ගිහිල්ලා මාරයාගෙන් ගැලවෙන්න පනින වෙලාවේ. එතෙක් එයා අපිට බාධා කරන්නේ නැහැ. එතෙක් ඒගොල්ලෝ නෙමෙයි, හිත සහ රූපය තමයි අපිට මාරයා බවට පත්වෙන්නේ.

# මිථ්‍යා ආජීවයෙන් ජීවත්වන අයට උදව් කරන්නේ කවුද?

**දහහත්වන ප්‍රශ්නය :**

**ගෞරවණීය ස්වාමීන් වහන්ස, සමහරු කියනවා, අපි කොච්චර හොඳ වැඩ කරත් අපිට සැනසීමක් නැහැ. හොඳ වැඩ කරන්න කරන්න අපිට කරදර වැඩියි. ඒ වගේ අවස්ථාවක ක්‍රියාත්මක වෙන්නේ කුමක්ද?**

**පිළිතුර :**

ඒවා අකුසල් විපාක. දැන් අපි කියමු, හොඳ වැඩ කරනවා කියලා. හොඳ වැඩ කරනවා කියලා අපිට මේ ප්‍රසාදය ලැබෙන්නේ සම්‍යක්දෘෂ්ටික බලවේගවලින් නෙවෙයි. අපි එතන ලොකු රැවටීමක ඉන්නේ.

දැන් එක මිථ්‍යා ආජීවයෙන් ජීවත්වන කණ්ඩායමක් ඉන්නවා. මිථ්‍යා ආජීව ගැන දන්නවානේ. මිථ්‍යා ආජීව කියන්නේ, එක්කෝ මත්පැන් විකුණනවා, එක්කෝ වසවිස විකුණනවා, එක්කෝ මස්මාංශ විකුණනවා. එක්කෝ වහල් වෙළඳාම් කරනවා. ඔය පැත්ත.

එතකොට මිථ්‍යා ආජීවයෙන් මහා කෝටි ප්‍රකෝටි ගාණක් හොයාගත්තු මනුස්සයෝ කණ්ඩායමක් යනවා, කතරගම විශාල පින්කමක් කරන්න. දැන් ඉතින් පින්කම කරන්න ඒගොල්ලෝ කතරගමට යන මොහොත දක්වා සුමාන ගාණක් කතරගමට පැල්

බැඳලා වහිනවා. සුමාන ගාණක් එකදිගට වහිනවා. නමුත් මේ මිනිස්සු කතරගමට බැස්ස වෙලාවේ ඉඳන් වැස්ස නැහැ. ඉතින් මේගොල්ලෝ දවස් දෙකක් විතර ලක්ෂ ගාණක් වියදම් කරලා දන්දීලා ඔක්කොම කරලා, අනේ දැන් සතුටු සිතින් ගෙදර එනවා, "අපිට දෙවියො ආශිර්වාද කළා" කියලා.

මේ දෙයියෝ නෙමෙයි ආශිර්වාද කරන්නේ, මේ මිථ්‍යාදෘෂ්ටික බලවේග. දැන් මිථ්‍යා ආජීවයෙන් ජීවත්වන අය කවදාකවත් දුප්පත් වෙනව ද? නැහැ. සිල්පදයක් බිඳිලා තියෙන්නේ. නමුත් දුප්පත් වෙන්නේ නැහැ. තව තව කෝටිපති ප්‍රකෝටිපතියන් බවට පත්වෙනවා. කවුද මේ උපකාර කරන්නේ? මිථ්‍යාදෘෂ්ටික දෙවිවරුයි උපකාර කරන්නේ. මිථ්‍යාදෘෂ්ටික දෙවිවරු උපකාර කරන්නේ මොකද? ඒගොල්ලන්ගේ මිථ්‍යාදෘෂ්ටික බලය වැඩිවෙන්න.

නමුත් අර මහත්තුරු හරි සන්තෝෂයෙන් ගෙදර ආවා, "අපිට කතරගම දෙයියෝ උපකාර කළා" කියලා. කතරගම දෙවියො නෙවෙයි උදව් කරන්නේ, අර මිථ්‍යාදෘෂ්ටික මාර බලවේග. ඇයි මාර බලවේග උපකාර කරන්නේ? තව තව මිථ්‍යා ආජීවය තුළ ශක්තිමත්ව ඉස්සරහට ගිහිල්ලා, තව තව ශක්තිමත් ආකාරයෙන් සතර අපායට ඒගොල්ලන් ගන්න. ඒ නිසා මේ වර්තමාන සමාජයේ හුඟක් අය කලකිරිලා ඉන්නවා, "අපි ධර්මය තුළ ජීවත් වෙනවා. අනේ අපිට යහපතක් නෑ" කියලා.

එතකොට "බලන්නකෝ, අරගොල්ලෝ අච්චර වැරදි කරනවා. ඒගොල්ලෝ යහපත්" කියලා. මොකද, එතන හරි රැවටීමක අපි ඉන්නේ. ඒගොල්ලන්ට උපකාර කරන්නේ සම්‍යක්දෘෂ්ටික බලවේග නෙවෙයි. තේරුණාද? තෙරුවන් සරණ ගිය කිසි ම කෙනෙක් මිථ්‍යා ආජීවයෙන් ජීවත් වෙන කෙනෙකුට උපකාර කරන්නේ නැහැ. එහෙම කරනවා නම් ඒ දෙවියො තෙරුවන් සරණ ගිහිල්ලා නැහැ.

තෙරුවන් සරණ ගිය අවංක ස්වාමීන් වහන්සේ කෙනෙක් කවදාවත් මිථ්‍යා ආජීවයෙන් ජීවත්වෙන අයට උපකාර කරනවද? ඒ වගේ තෙරුවන් සරණ ගිය දෙවියෙක් මිථ්‍යා ආජීවයෙන් ජීවත්වෙන අයට උපකාර කරන්නේ නැහැ. එහෙනම් කවුද උපකාර කරන්නේ? මිථ්‍යාදෘෂ්ටික බලවේග.

එතකොට ඒගොල්ලන්ට උපකාර කරන්න කරන්න තව තව ලැබෙන කොට ඒගොල්ලෝ තව තව රැවටෙනවා. ඒගොල්ලෝ හිතනවා, මේ අපිට සම්‍යක්දෘෂ්ටික දෙවියො උපකාර කරන්නේ කියලා. තව තව ශක්තිමත් කරගෙන ඒගොල්ලෝ ඉස්සරහට යනවා ආර්ථික වශයෙන්.

නමුත් අවසානයේ ඒගොල්ලොම දන්නෙ නැහැ, සතර අපායට වැටෙන වෙලාවෙ අවසානෙ ඒගොල්ලන්ට උපකාර කරලා තියෙන්නේ මාරයා කියලා. ඒ නිසා අපිට, සාමාන්‍ය කෙනෙකුට එවැනි උපකාරයක් නො ලැබෙනවා කියන්නේ... ඒ එයා කළා වූ අකුසල්වල විපාකයක්. අකුසල් විපාක දෙවියන්ට වළක්වන්න බැහැ. තේරුණාද? ඒ නිසා මේ දෙතැනේ තියෙන්නා වූ පරතරය අපි දකින්න ඕන.

ඒ කියන්නේ, වැරදි කරන අය කොච්චර කෝටිපතියෝ වුණත් ඒක ධර්මයේ වරදක් නෙවෙයි. එකක් ඒගොල්ලන්ගේ සංස්කාර; කුසල් සංස්කාර. අනිත් එක, ඒගොල්ලන්ට මිථ්‍යාදෘෂ්ටික දෙවිවරු උදව් කරනවා. මොකද, ඒගොල්ලන්ට ඒ පැත්ත තව තව වැඩි කරන්න ඕන. එතනදි අපි රැවටෙන්න නරකයි.

# මියගිය ඥාතීන් දැන් ඔබට අයිති නැහැ. ඔවුන්ට පින් දෙන්න

**දහඅටවන ප්‍රශ්නය :**

**ගෞරවණීය ස්වාමීන් වහන්ස, මළගියවුන් ගෙන්වා සාකච්ඡා කිරීම, ඒ අය සමඟ මේ සජීවී ලෝකයේ පුද්ගලයින් අදහස් හුවමාරු කර ගැනීම වෙන්නට පුළුවන් දෙයක් ද?**

**පිළිතුර :**

මේවායෙහි ඇත්තක් තියෙනවා. දැන් අපි කියමු, නෝනගේ තාත්තා නැතිවෙනවා. නැතිවෙලා එයා ඉන්නේ දුර්වල තැනක. ප්‍රේත තලයකට අදාළ දුර්වල තැනක. නමුත් ඔබ එයා ගැන හැම වෙලාවෙ ම හිතනවා. පැය 24 ම එයා ගැන හිතමින්, අඬමින්, දුක් වෙමින් එවැනි දේ කරමින් ම යි ඉන්නේ. එහෙම කරන කොට ප්‍රේතයාට අනුන්ගේ හිත් දැකීමේ ශක්තිය තියෙනවා, එයා තමන්ට වැහෙන ස්වභාවයට එනවා. මොකද, බැඳීම වැඩි නිසා.

ඒකයි බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ, යමෙක් මැරුණාට පස්සේ එතනින් එයාව අමතක කරලා දාන්න. දැන් එයා ඔබට අයිති නැහැ. තේරුණාද? එයාට පින් දෙන වෙලාවට නම කියලා පින් දෙන්න. ඉන්පස්සේ එයා ගැන හිතන්න යන්න එපා. මොකද, මැරිච්ච අය ගැන හිතලා ඉවර කරන්න බැහැ.

මේ ජීවිතයේ ඔබේ තාත්තා, අම්මා ගැන ඔබ හිතනවා නම් ඔබේ ගිය ජීවිතයේ තාත්තා, අම්මාට මොකද වෙන්නේ? ඊට

ඉස්සෙල්ලා ජීවිතයේ තාත්තා, අම්මට මොකද වෙන්නේ? එහෙනම් මේ ලෝකයේ ඔබට තාත්තා, අම්මා නොවෙච්ච කිසි ම කෙනෙක් නැහැ. ඒ කියන්නේ, මේ ලෝකයේ හැම කෙනෙක් ම ඔබට තාත්තා කෙනෙක්, අම්මා කෙනෙක් වෙලා තියෙනවා.

එහෙනම්, මේ අම්මා ගැන හිතලා විතරක් අපිට ඕක ඉවර කරන්න බැහැ. ඒකයි බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ, යමෙක් මිය පරලොව ගියාට පස්සේ එතනින් ඒක නවත්තලා දාන්න. එයා දැන් ඔබට අයිති නැහැ. ප්‍රේත ලෝකයේ ඉන්නවා නම්, එයා අපිට අයිති නැහැ. දිව්‍ය ලෝකයේ ඉන්නවා නම් එයා අපිට අයිති නැහැ. මව්කුසක ඉපදුණා නම්, දැන් ඒ අම්මා දරුවා මගේ කරගෙන එයා ජීවත් වෙනවා ඇති. එහෙනම් මැරුණට පස්සේ එයා අපිට අයිති නැහැ.

නමුත් මැරුණාට පස්සේ යුතුකමක් හැටියට පින් අනුමෝදන් කරන්න කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. එහෙම අපි මැරිච්ච කෙනා පිළිබඳ බැඳිලා යනවා නම්, අපි ශීලයෙන්, සමාධියෙන් දුර්වල නම්, ශ්‍රද්ධාවෙන් දුර්වල නම් ඒ මැරිච්ච කෙනා අපේ ඇඟට එනවා. එහෙම ඇවිල්ලා එයාට යම් යම් දේ කියන්න, කරන්න පුළුවන්. එහෙම කරන දේවල් තියෙනවා. ඒවා ඒ ආකාරයෙන් තමයි සිද්ධ වෙන්නේ.

නමුත් කවදාක්වත් දෙවියෙක් මනුස්සයෙක්ගේ ඇඟට වැහෙන්නේ නැහැ. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, මේ සශ්‍රීක දිව්‍ය තලවල ඉන්න දෙවියො, ඒ කියන්නේ තුසිතයේ, යාමය, නිම්මාණරතිය, පරිනිම්මිත වසවර්තිය, තාවතිංසය වගේ ඒ දෙවියෝ මනුස්සයාට යොදුන් සීයක් ඈතින් ඉන්නේ කියලා. මේ කුමාර කාශ්‍යප මහ රහතන් වහන්සේ යි කියන්නේ. මනුස්සයාට යොදුන් සීයක් ඈතින් ඉන්නේ. මනුස්සයාට යොදුන් සීයක් එයා ළංවෙන්නේ නැහැ. ඇයි? මනුස්සයාගේ ගඳ උහුලන්න බෑ කියනවා.

මනුස්සයාගේ ගඳ කියන්නේ දහදිය ගඳ නෙවෙයි. දුශ්ශීල භාවයේ ගඳ. ඒ නිසා සම්‍යක්දෘෂ්ටික දෙවියෝ හැම වෙලාවෙ ම යොදුන් සියයක් ඈතින් ඉන්නේ කියනවා. එහෙනම් සම්‍යක්දෘෂ්ටික දෙවිවරු යොදුන් සියයක් ඈත ඉන්නවා නම්, සශ්‍රීක දිව්‍ය තලවල සම්‍යක්දෘෂ්ටික දෙවිවරු මනුස්සයෙක්ගේ ඇඟට වැහෙනවා කියන එක අපි හිතන එක්තරා මුළාවක් විතරයි.

ඒ නිසා මනුස්සයින්ට ඇඟට වැහෙන්නේ ඔය ප්‍රාථමික ප්‍රේත කොටස්, භූත කොටස්. ඒ වගේ ම ප්‍රාථමික දෙවිවරුත් ඉන්නවා. දැන් සමහර ප්‍රාථමික දිව්‍ය ස්වභාවයන් තිබෙනවා, මනුස්ස ලෝකය ආශ්‍රිතව. ඒ වගේ අය ඇඟට වැහෙන්න පුළුවන්.

නමුත් කවදාක්වත් තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවක් තිබෙන පින්වත් දෙවිකෙනෙක් මනුස්සයෙක්ගේ ඇඟට වැහෙන්නේ නැහැ.

# මියගිය ඥාතියාට පින් ගන්න පුලුවන්ද?

**දහනවවන ප්‍රශ්නය :**

**ගෞරවණීය ස්වාමීන් වහන්ස, තමන්ගේ මියගිය ඥාතියා වෙනුවෙන් මෙලොව ජීවත්වෙන පුද්ගලයෙක් අවංකව ම හිතනවා නම්, ඒ කෙනාගෙ පරලොව ජීවිතය ගැන ගැඹුරින් හිතා බලනවා නම් ඒ පුද්ගලයාට කරන්න පුළුවන් හොඳ ම දේ කුමක් ද?**

**පිළිතුර :**

නිවැරදි ම දේ අපේ සමාජය තුළ සිද්ධ වෙනවානේ. අනිවාර්යයෙන් ම අපි මැරුණු වෙලාවට පාංශකූල පින්කමක් කරනවා. පාංශකූල පින්කමක් කරලා, දැන් සමාජ චාරිත්‍රයක් හැටියට වෙන්වෙලා තිබෙනවා හත් දවසෙ, තුන්මාසෙ, අවුරුදු කියලා දාන. ඒවා නිශ්චිත දින යි කියලා බුදුරජාණන් වහන්සේ කොතැනක වත් දේශනා කරලා නැහැ. ඒවා මේ සමාජය තුළ ගලාගෙන එන සම්ප්‍රදායන්.

ඒ නිසා ඒවා අනුව පින්පෙත් අනුමෝදන් කරන එකයි අපිට තියෙන්නේ. නමුත් බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, මැරුණාට පස්සේ පින් ගන්න බලාපොරොත්තුව නම් මැරෙන්න එපා කියලා. මැරුණාට පස්සේ පින් ගන්න බලාපොරොත්තු වෙන්න එපා. කවදාකවත් ඒක සිද්ධ වෙන්නේ නැහැ. තේරුණාද?

මොකද, මැරිලා පින් ගන්න පුළුවන් වෙන්නේ එක ම එක කට්ටියකට යි. ඒ තමයි පරදත්තරූප ජීවී ප්‍රේතයා, ප්‍රේතිය. එහෙම

නැතිනම් මැරිලා ගිහිල්ලා අපි මව්කුසක ඉපදුණොත් මනුස්සයෙක් වෙලා, අපිට පිනෙන් වැඩක් නැහැ. මැරිලා අපි සශ්‍රීක දෙවියෙක් වෙලා ඉපදුණොත් අපිට පිනෙන් වැඩක් නැහැ. මොකද, අපි පිනෙන් ආඪ්‍යයි. මැරිලා රූපාවචර, අරූපාවචර බ්‍රහ්ම තලයක ඉපදුණා නම් පිනෙන් වැඩක් නැහැ. මැරිලා තිරිසන් ලෝකයේක ඉපදුණා නම් පිනෙන් වැඩක් නැහැ. මැරිලා නිරයට වැටුණා නම් පිනෙන් වැඩක් නැහැ.

එහෙනම් මැරිලා පරදත්තරූප ජීවී ප්‍රේත, ප්‍රේති කියන තැනට තමයි පින් අවශ්‍ය. ඒ වගේ ම මේ මනුස්ස ලෝකය ආශ්‍රිතව ජීවත්වෙනවා මේ ප්‍රාථමික දෙවිවරු. රුක් දෙවිවරු; භූමාටු දෙවිවරු වගේ දෙවිවරු. ඒ දෙවිවරුන් පින දැකලා ඒගොල්ලෝ සතුටු වෙනවා. ඒ වගේ ම සම්‍යක්දෘෂ්ටික යක්ෂ බලවේග ඉන්නවා. ඒ සම්‍යක්දෘෂ්ටික යක්ෂ බලවේග මේ පින් දැකලා සතුටු වෙනවා.

නමුත්, අපේ අම්මා, තාත්තා මැරුණොත් මැරිලා ගිහිල්ලා පරදත්තරූප ජීවී ප්‍රේත වෙලා ඉපදිලා හිටියත් ඒගොල්ලන්ට පින් දුන්නා කියලා ඒගොල්ලෝ ආත්මීය වෙනසක් සිද්ධ කරගන්නේ නැහැ. තේරුණාද? පින නිසා ආයුෂය, වර්ණය, සැපය, බලය වැඩි කරගන්නවා. නමුත් ආත්මීය වෙනසක් සිද්ධ කරගන්නේ නැහැ.

මොකද, ඒගොල්ලො කුමක් නිසා ද මේ ප්‍රේතභාවයට පත්වුණේ? "උපාදාන පච්චයා භවෝ." උපාදානය සකස් වුණේ කුමක් නිසා ද? "තෘෂ්ණා පච්චයා උපාදානං." ගෙදර කෙරෙහි තියෙන තෘෂ්ණාව නිසායි, බිරිඳ, දරුවන් කෙරෙහි තියෙන තෘෂ්ණාව නිසයි, ඉඩ-කඩම් කෙරෙහි තිබුණු තෘෂ්ණාව නිසයි එයා දැන් මෙතෙන්ට බැස්සේ. තේරුණාද? දැන් බැස්සා නම් එයා කවදාකවත් මෙතනින් යන්න කැමති නැහැ.

මොකද, ප්‍රේත ලෝකයේ තියෙන ප්‍රශ්නය තමයි, ප්‍රේතයා දන්නේ නැහැ, තමන් විඳින්නේ දුකක් කියලා. දැන් අපි හිතන්නේ, අපේ තාත්තා, අම්මා ප්‍රේත ලෝකයේට වැටුණා නම් ඒගොල්ලෝ

දුකක් විඳින්නේ කියලා. නමුත් ඒගොල්ලන්ට දුකක් නැහැ. ඒගොල්ලෝ සැපයක් කොටයි එතන අල්ලන් ඉන්නේ. මොකද, ඒගොල්ලන්ගේ උපාදානය. තේරුණාද?

දැන් අපි හිතමු, පිටකොටුවේ යාචක අම්මා කෙනෙක් ඉන්නවා, දරුවෙක් එක්ක. හිඟාකාලා ජීවත් වෙන්නේ. නමුත් කවුරු හරි ඉල්ලනවා, මේ දරුවාව මම අහවල් ඉස්කෝලෙට ඇරලා උගන්නන්නම්, මට දෙන්න කියලා. එයා දෙනවද? නැහැ. එයාට සාපේක්ෂව එයාගෙ දරුවා විඳින්නේ දුකක් කියලා එයා දන්නේ නැහැ. ඒ එයාගෙ අකුසලය.

ඒ වගේ ප්‍රේතයාට සාපේක්ෂව ප්‍රේතයා විඳින්නේ දුකක් කියලා ප්‍රේතයා දන්නේ නැහැ. ඒ නිසා එයා මෙතන කැරකි කැරකි ඉන්නේ මේකෙන් මිදෙන්න නෙවෙයි; පින් දෙනකන් නෙවෙයි එයා ඉන්නේ. එයා මේක උපාදානය කරන් කැරකි කැරකි ඉන්නවා.

දැන් අපි හිතමු, අපේ අම්මා, තාත්තා මැරිලා, දැන් අපි හත් දවසේ දානෙ දෙනවා. දැන් දානෙ දෙනකොට බණට එන්න කියලා මුළු ගමට ම අපි කියනවා. දැන් ගේ ඇතුළෙ හරියට මඟුල් ගෙයක් වගේ. වත්තෙත් සෙනඟ. ගේ ඇතුළෙත් සෙනඟ. වත්තේ පිටියෙත් සෙනඟ. දැන් සෙනඟ පිරිලා, ගේ ඇතුළේ ඉන්නවා. තේරුණාද? ඉතින් දැන් හවස තුනේ විතර ඉඳන් ගේ ඇතුලේ කලබලකාරියි. කාමර ඇතුළෙ මිනිස්සු.

දැන් මේ අපේ අම්මා, තාත්තා ඇත්තට ම දැන් ප්‍රේතයෙක්, ප්‍රේතියෙක් වෙලා ගෙදර ඉන්නවා, පරදත්තරූප ජීවී. නමුත් මේ ප්‍රේතයා, ප්‍රේතිය දැන් ඔබලා සල්ලි වියදම් කරලා දන් දෙනවට කැමති නැහැ. මොකද, එයා තෘෂ්ණාව නිසයි මෙතන්ට ආවේ. සල්ලි කෙරෙහි තියෙන තෘෂ්ණාව නිසා. එතකොට, මේ ගේ ඇතුළේ මිනිස්සු පිරිලා ඉන්නවට, මේ වත්තේ පිරිලා ඉන්නවට, කාමර ඇතුළේ සෙනඟ පිරිලා ඉන්නවට එයා කැමති නැහැ.

මේ ප්‍රේතයා ගැටිලා ඉන්නේ. දැන් මෙයා හවස ඉඳන් එහෙ දුවනවා; වත්තේ දුවනවා; මෙහෙ දුවනවා. නෝනට ආදරේ පෙරේතයෝ ඉන්නවා, නෝනව මුර කරන් ඉන්නවා. එයා කැමති නැහැ, තව පිරිමියෙක් නෝනත් එක්ක කතා කරනවාට. සමහර ප්‍රේතයෝ ඉන්නවා, මෙහෙ බණ කියන කොට අල්මාරිය මුරකරන ප්‍රේතයෝ ඉන්නවා.

මෙහෙ හාමුදුරුවො බණ කියනවා. එයා අල්මාරිය මුර කරනවා, කවුරු හරි අල්මාරිය ඇරලා සල්ලි ගනියි, රත්තරන් බඩු ගනියි කියලා. සමහරු පොල් ගහ ළඟ මුර කරන, කොස් ගහ මුර කරන ප්‍රේතයෝ ඉන්නවා. ඒවා උපාදානය කරගෙන මැරිලා. දැන් මේ ප්‍රේතයා ගැටිගැටී මේවා කෙරෙහි තෘෂ්ණාවෙන් දුවදුව ඉන්නවා.

හාමුදුරුවො බණ කියලා ඉවරයි. පින් ගත්ත ද? පින් ගත්තේ නැහැ. හාමුදුරුවො බණ කියලා ඉවරයි. ප්‍රේතයා ගැටිගැටී තවත් අකුසල් කර ගත්තේ.

දැන් ගෙදරක පාටියක් තියෙනවා. පාටියෙදි දැන් කෑම මේසයක් තියෙනවා, කෑමවලින් පිරිලා. මෙතන පුංචි ළමයි හතරපස් දෙනෙක් ඉන්නවා. මේ හතරපස් දෙනා සෙල්ලම් කරලා, සෙල්ලම් කරලා නිදාගන්නවා, කෑම කෑවද? නැහැ. අම්මා දැනගන්න ඕන වේලාසනින් මේ දරුවට කෑම කවන්න. නැත්නම් කෑම මේසයක් තිබුණත් දරුවො නිදාගන්නේ බඩගින්නේ.

ඒ වගේ ප්‍රේතයාට පින් දෙන්න අපි දක්ෂ වෙන්න ඕන. වර්තමාන සමාජයේ පින් දෙන ක්‍රම අනුව කොතැනකවත් ප්‍රේතයෙක් පින් ගන්නේ නැහැ. මොකද, ප්‍රේතයෙක්, ප්‍රේතියෙක් වුණේ තෘෂ්ණාව නිසා. තෘෂ්ණාව නිසා ප්‍රේතියක් වුණු කෙනා බුෆේ එකක් දාලා කෑම දෙනවට කවදාකවත් කැමති නැහැ. වත්තේ පිටියේ මුළු ගමේ ම යාළුවන්ට, ඥාතීන්ට කියලා මේවා කන්න බොන්න දෙනවට කැමති නැහැ.

එහෙනම් පාටියක් දෙනවා නම් ඒක වෙන ම පාටියක්. පින්කම නම් පින්කමක්. ඒ නිසා තමන්ගේ ඥාතියාට අවංකව ම පින් දෙන්න ඕන නම්, තමන් බණ අහන්න කැමති අවශ්‍ය ම පිරිසට විතරක් එන්න කියනවා, වත්ත පිරෙන්න නෙමෙයි, සාලෙ පිරෙන්න.

නමුත් ඒගොල්ලොත් කැමති වෙන්න ඕන. සුදු ඇඳුමක් ඇඳන් යහපත් ආකාරයෙන් ඇවිල්ලා බණ අහන්න කැමති කෙනෙක් වෙන්න ඕන. එතකොට, හවස පහ වෙනකොට මේ කුස්සිවල තියෙන වැඩකටයුතු ඔක්කෝම අහවර කරන්න ඕන. ඔය කාමරවල මිනිස්සුන්ට ඉන්න දෙන්න නරකයි. බණ අහන වෙලාවට නෝනා, ප්‍රේතයා සන්සුන් කරලා මෙතන වාඩි කරගන්න අපි දක්ෂ වෙන්න ඕන.

මොකද, ප්‍රේතයාගේ හිත දිව්වොත් ප්‍රේතයා දුවනවා. ප්‍රේතයා කියන්නේ තෘෂ්ණාව. තේරුණාද? එහෙනම් ප්‍රේතයා මෙතන වාඩි කරගන්න අපි දක්ෂ වෙන්න ඕන. ප්‍රේතයා බණ කියන වෙලාවේ අපි ළඟ වාඩිකර ගත්තොත් සමහර විට ප්‍රේතයා යමක් ගන්න පුළුවන්. එහෙම නැත්නම් වර්තමානයේ ඔය බණ කියන ක්‍රමයෙන් නම්, ඉන්න ප්‍රේතයොත් තව තව ගැටිලා තව තව අකුසල් කරගන්නේ. අපි දකින්න ඕන.

ප්‍රේතයා, ප්‍රේතයෙක් වුණේ තෘෂ්ණාව නිසා. එයා කැමති නැහැ, ලෝකයේ ම මිනිස්සු ගෙනල්ලා ගෙදර කන්න දෙනවට. මොකද, එයා සල්ලිවලට තෘෂ්ණාවෙන් ආවේ. ඉතින් ඒ නිසා අපි දැනගන්න ඕන, උපක්‍රමශීලීව ප්‍රේතයාට පින් දෙන්න. ඉතින් ඒ නිසා අනිවාර්යයෙන් ම පිරිසිදු ආකාරයෙන්, ප්‍රේතයාගේ හිත නො ගැටෙන ආකාරයෙන්, හිත නො දුවන ආකාරයෙන් තැන්පත් පින්කමක් සිද්ධ කරගන්න ඕන.

එහෙම කළොත් තමයි, ප්‍රේතයාට පින් අරගෙන ආත්මීය වෙනසක් සිද්ධ වුණොත් වෙන්නේ. නැත්නම් එයා කවදාකවත් ආත්මීය වෙනසක් සිද්ධ කරගන්නේ නැහැ.

# මළගිය ඇත්තන්ට නිවසේදී ම පින් දෙන්න

**විසිවන ප්‍රශ්නය :**

**ගෞරවණීය ස්වාමීන් වහන්ස, අපි අසා තිබෙනවා, මියගිය ඥාතීන්ට නිවසේ පින් අනුමෝදන් කරන එක සුදුසු නැති කාරණයක් කියලා. ඒක සත්‍යයක් ද?**

**පිළිතුර :**

නැහැ නැහැ. ඒක සම්පූර්ණයෙන් වැරදි අදහසක්. පින් දෙන්න නම්, අනිවාර්යයෙන් ම නිවසේයි පින් දෙන්න ඕන. මොකද, දැන් කෙනෙක් කියනවා, "ගෙදර පින් දෙන්න හොඳ නැහැ. ගෙදර දන් දෙන්න හොඳ නැහැ" කියලා.

අපි හිතමු, ගෙදරක් තියෙනවා. එයා දන් දෙන්නෙත් නැහැ; පින් කරන්නෙත් නැහැ; සිල් සමාදන් වෙන්නෙත් නැහැ; ගෙදර කිසි ම කටයුත්තක් කරන්නේ නැහැ. එහෙම ගෙවල්වලට සම්පූර්ණයෙන් ම මිථ්‍යාදෘෂ්ටික බලවේග තමයි එන්නෙ. සම්‍යක්දෘෂ්ටික බලවේග එන්නේ නැහැ. මොකද, ඒගොල්ලෝ පිනක් කරන්නෙ නැහැනේ මෙතන. මිථ්‍යාදෘෂ්ටික බලවේගයි එන්නේ. මිථ්‍යාදෘෂ්ටික බලවේග ගෙදරට එන්න එන්න, තව තව අරයාගේ සිතිවිලි සකස් වෙන්නේ මිථ්‍යාදෘෂ්ටික පැත්තට ම යි. තව තව අගාධයටයි එයා යන්නේ.

එහෙනම් යමෙක් මින් බැහැරව කෙනෙක් හිතනවා නම්, "මම මේ ගෙදර දන් දෙනවා, පින් රැස් කරනවා, පින් දෙනවා" කියලා, පින්කම් කරනකොට සම්‍යක්දෘෂ්ටික බලවේග තමන් ළඟට එනවා. පින් කරනකොට සම්‍යක්දෘෂ්ටික බලවේග එනවා.

දැන් අරක්කු බොන කෙනෙක් ඉන්න ගෙදරකට අරක්කු බොන අයනේ එන්න කැමති. නේද? එතකොට, පන්සල් යන කෙනෙක්, සිල් ගන්න කෙනෙක් ඉන්න ගෙදරට සිල් ගන්න කෙනා තමයි එන්න කැමති. ඒ වගේ, තමන් ජීවිතේ පින්කම් කරන්නේ නැත්නම්, දන් දෙන්නේ නැත්නම්, පින් දෙන්නේ නැත්නම් ගෙදර, ඒවට අකමැති අය තමයි ගෙදරට එන්නේ, මිථ්‍යාදෘෂ්ටිකව.

මිථ්‍යාදෘෂ්ටික බලවේග ගෙදරට එනකොට සම්‍යක්දෘෂ්ටික බලවේග යනවා. ඒ කියන්නේ, එයාට මිථ්‍යාදෘෂ්ටික බලවේගත් එක්ක තමයි ජීවත් වෙන්න වෙන්නේ. මිථ්‍යාදෘෂ්ටික බලවේගයක් එක්ක ජීවත් වෙන්න වෙන්න, එයාගෙ සකස් වෙන සිතිවිලිත් මිථ්‍යාදෘෂ්ටික පැත්තට තමයි බරවෙන්නේ. ඒක ඉතින් මහා විනාශයක්.

ඒ නිසා බුදුරජාණන් වහන්සේ බිම්බිසාර රජ්ජුරුවන්ගේ රජ මාළිගයට ගිහිල්ලායි ඥාතීන්ට පින් දෙන්නේ. ඒ නිසා යමෙක් මැරුණා නම්, එයා පරදත්තරූප ජීවී ප්‍රේත වුණා නම් එයා ගෙදර ඉඩම ආශ්‍රිතව ම යි ජීවත් වෙන්නේ. ඒ නිසා පින් දෙන කෙනාට ගෙදර ම යි පින් දෙන්න ඕන.

# සතර අපාය වල
# දුක දකින්න

**විසිඑක්වන ප්‍රශ්නය :**

**සතර අපායේ දුක පිළිබඳව ධර්මානුකූලව අවබෝධයක් ලබාගන්නේ කොහොමද ස්වාමීන් වහන්ස?**

**පිළිතුර :**

සතර අපායේ දුක අපි ධර්මානුකූලව දකිනවා කියන්නේ, බුදුරජාණන් වහන්සේගේ ධර්මය තුළින් ම අපි දකින්න ඕන. නැත්නම් ඉතින් අපිට පේන ඇසින් අපි මේ ලෝකය දකින්න ඕන. මේ මස් ඇසින් අපිට සතර අපාය පේන්නේ නැහැනේ.

සතර අපාය කියන්නේ මේ ප්‍රේත ලෝකය, අසුර ලෝකය, නිරය කියන අපායන් තුන මේ මස් ඇසින් පේන්නේ නැහැ. කවදා හරි අපි සමාධිය දියුණු කරලා ඒ සමාධි ඇසෙන් තමයි දකින්න ඕන. එතෙක් අපිට මේ තිරිසන් ලෝකයේ සත්ත්වයා විඳින දුක දැකලා, මේ මනුස්සයා විඳින දුක දැකලා අපිට මේ දුක කියන කාරණය හඳුනගන්න පුළුවන්. නේද? සතර අපායට මනුස්සයා අයිති වෙන්නේ නැහැ. තිරිසන් ලෝකය අයිති වෙනවා.

තිරිසන් ලෝකයේ සත්ත්වයා විඳින දුක බලන්න. ඉතින් ඒ තිරිසන් ලෝකයේ සත්ත්වයා විඳින දුක දිහා බලලා, අපි ඒක සතර අපායේ දුක කියන කාරණය දකින්න වෙනවා. ඉන් එහාට අපිට

දිවැස් නැහැනේ, සමාධිය වඩලා නැහැනේ අපි, නොපෙනෙන ලෝකය දකින්න. එහෙම නැත්නම් ඉතින්, නොපෙනෙන ලෝකය දක්කා වූ අය කියන දේවල් අහලා, ඒ කෙරේ විශ්වාසය ඇති කරගෙන සංසාර භය සකස් කරගන්න ඕන. ඉතින් බුදුරජාණන් වහන්සේ පැහැදිලිව එවැනි දේවල් දේශනා කරලා තිබෙනවා, සංසාර භය ඇතිකරන්න.

ඉතින් ඒ නිසා, තිරිසන් ලෝකෙම ගන්නකො, කොච්චර නම් දුකක් ද කියලා. නේද? දැන් තිරිසන් ලෝකයේ හරකෙක්, බල්ලෙක්, පූසෙක්, එළුවෙක් කියන්නේ කවුද? මේ පෙර ලස්සන මනුස්සයෙක්. වෙන කවුරුත් නෙවෙයි. පූසෙක්, එළුවෙක්, හරකෙක්, බල්ලෙක් කියන්නේ පෙර ලස්සන මනුස්සයෙක් ම යි. මනුස්ස ජීවිතයක් ලබලා ශ්‍රද්ධාවක් තුළ හිටියේ නැහැ; ගුණධර්මයක් රැක්කේ නැහැ; ශීලයක් තුළ හිටියේ නැහැ. ගැටෙන සිතින් මැරිලා, අන්න සතර අපායට වැටෙනවා.

දැන් සතර අපායට වැටුණට පස්සේ, කල්ප ගණන් කාලය දිගයි. ඉතින් කවදාක්වත් ආයෙමත් කල්ප ගාණකින් මතුවන්නේ නැහැ. මොකද, තිරිසන් ලෝකයේ සතෙකුට ලෝභ, ද්වේශ, මෝහයන් ම යි සකස් වෙන්නේ. අකුසල මූලයන්. කුසල මූලයන් සකස් වෙන්නේ නැහැ. ඒ නිසා දුකෙන් දුකට, දුකෙන් දුකට වැටිලා, කල්ප ගණන් නිරයන්ට ගිහිල්ලා අප්‍රමාණ දුක් විඳිනවා. තේරුණාද?

ඉතින් ඒ වගේ තමයි, දැන් එක මහත්තයෙක් හිටියා. ඒ මහත්තයා බොහොම ද්වේශය අධික මහත්තයෙක්. නමුත් ජීවිතයේ මැදි වයසේ, තරුණ කාලේ ගොඩක් පින් කරපු කෙනෙක්. නමුත් අවසානේ දැඩි ආකාරයෙන් ද්වේශය සකස් කරගත්තා. එයාගෙ කරුමෙ කියන්නේ, එයා ද්වේශය සකස් කරගත්තේ මහා සංඝරත්නයත් එක්කයි. ගමේ පන්සලේ හාමුදුරුවෝ, ආරණ්‍යයේ හාමුදුරුවෝ එක්ක තමයි එයා ද්වේශය සකස් කරගත්තේ.

ඒ ද්වේශය සකස් කරගෙන නෝනා, අවසානෙදි එයා මැරෙනවා. මැරුණට පස්සේ අපි දන්න ස්වාමීන් වහන්සේ කෙනෙක් උතුම් සමාධියෙන් අරමුණු කරලා බලනකොට මේ මැරිච්ච මහත්මයා කොහෙද ඉපදුණේ කියලා, එයාට පේන්නේ කිඹුල් කුසක්. කිඹුලෙකුගේ කුසක්. කිඹුලෙකුගේ කුසක් කියන්නේ මොකක් ද? මෙයා කිඹුලෙකුගේ කුසේ උත්පත්තිය සකස් කරගෙන. එක්කො කිඹුල් බිත්තරේක හරි කුසක හරි.

එතකොට එහෙනම් ඇයි ඒ? ද්වේශයට අදාළව ඒ උත්පත්තිය ලැබුවා. මොකද, කිඹුලා කියන්නේ බොහොම ද්වේශයෙන් ජීවත් වෙන සතෙක්. එයා වතුරෙ පීන පීන හිටියට කිඹුලා හරි ම ද්වේශයෙන් ජීවත් වෙන්නේ. ඔය කිඹුලා රෑට වතුරෙන් ගොඩට ඇවිල්ලා ගොඩබිම ගොදුරු හොයාගෙන යනවා. එයා හරි වේගවත්. කටෙන් පිඹිනවා වගේ ම, වලිගයෙන් ගගහා පුදුමාකාර ද්වේශයක් පිට කරන සතෙක් තමයි කිඹුලා කියන්නේ.

එතකොට, දැන් අර ද්වේශයට අදාළව අරයා ගිහිල්ලා කිඹුල් කුසක උත්පත්තිය ලැබුවා. ඉතින් එහෙනම් ඒ කිඹුලා කියන්නේ කවුද? පෙර ජීවිතයක ඔය ද්වේශ සහගත මනුස්සයෝ ම යි. සර්පයෝ කියන්නේ කවුද? පෙර ජීවිතයේ මනුස්සයෝ ම යි. ද්වේශය වඩපු අය. ද්වේශයේ ඵලය තමයි ඔය සර්පයා කියලා කියන්නේ. සතර අපාය, අපි ඒ ආකාරයෙන් තමයි දකින්න ඕන.

අපිට පේන, මස් ඇහින් පේන සතර අපාය ඕකනේ. ඉතින් ඒ සතර අපායේ දුක අපි ඒ ආකාරයෙන් දකින්න ඕන. ඔය තිරිසන් ලෝකය කියන්නේ ඔය, පෙර ලස්සන මනුස්සයො. වෙන කවුරුවත් නෙවෙයි. දැන් මේ ලෝකයේ ජීවත් වෙච්ච, හුඟාක් ඝාතන කරපු මනුස්සයො ඉන්නවානේ, මිනී මරන මනුස්සයෝ. ඔය එක මිනී මරන මනුස්සයෙක් කෙලින් ම ගිහිල්ලා ඌරෙක් වෙලා උත්පත්තිය ලබලා තියෙනවා. ඇයි ඒ? මාස හයෙන් හයට මැරුම් කන්න. මොකද, ඌරා තමයි මැරෙන වෙලාවේ දරුණු ආකාරයෙන් වද

විඳලා මැරෙන සතා. එතකොට එයා උෟරු කුලේ ඉපදුණේ ඇයි? අර මිනිස්සු මැරුණා වගේ ම, එයා මිනිස්සු මැරුවා වගේ ම මාස හයෙන් හයට, අවුරුද්දෙන් අවුරුද්දට මැරුම් කන්න.

මොකද, උෟරෙක්, හරකෙක්, එළුවෙක් වගේ සතෙක් එකදිගට ආත්මභව 500 ක් උපදිනවා කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. එක ම කුලේ ආත්මභව 500 ක් උපදිනවා. මොකද, මැරෙන වෙලාවට ඒගොල්ලන්ට උපාදානය වෙන්නේ ඒගොල්ලන්ගේ කුලය ම යි. දැන් කුකුළෙක්, කිකිළියෙක් මැරෙන වෙලාවට උපාදානය වෙන්නේ බිත්තරේ ම යි. හරකෙක් මැරෙන වෙලාවට උපාදානය වෙන්නේ එයාගෙ රැල ම යි. ඒ නිසා ඒ රැලේ ම එයා උත්පත්තිය ලබනවා. එක දිගට ඔහොම ආත්මභව 500 ක් විතර උපදිනවා කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

එහෙනම්, එහෙම ඉපදෙද්දි දුකෙන් දුකට ම යි, දුකෙන් දුකට ම යි පත් වෙන්නේ. ඉතින් ඒ නිසා, දැන් අර මනුස්සයා මනුස්ස ජීවිතයක ඉඳලා, මුදල් වෙනුවෙන් හෝ මොකක් හෝ වෙනුවෙන් මනුස්ස ඝාතන අප්‍රමාණව සිද්ධ කරගත්තා. දැන් එයා උෟරෙක් වෙලා ඉපදිලා ඉන්නවා. ඉතින් උෟරෙක් වෙලා ඉපදිලා, දැන් එයා අර මිනිස්සු මැරුවේ යම් සේ ද කපලා කොටලා, ඒ විදිහට ම පොලුවලින් ගහලා, පිච්චිලා, ගල්වලින් ගහලා මැරුම් කනවා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, ආත්ම 500 ක් විතර ඉපදෙනවා කියලා.

ඉතින් ඒ නිසා ඒ 500 ඉපදිලා නැවත ගොඩ එන්නේ නැහැ. ඉන් පස්සේ නිරයටයි වැටෙන්නේ. මොකද, ද්වේශයමනේ සකස් වෙන්නේ, තිරිසන් සතා තුළ. මොකද, මරන මරන වෙලාවෙ ද්වේශයනේ සකස් වෙන්නේ. එයා මරනවා කියලා මරන කෙනත් එක්ක ද්වේශය සකස් කරගෙනයි එයා මැරෙන්නේ. ඉතින් ඒ නිසා ගැලවිල්ලක් නැහැ.

තිරිසන් ලෝකය දැක්කහම අපිට සතර අපාය පිළිබඳ හොඳ චිත්‍රයක් මවාගන්න පුළුවන්, තිරිසන් ලෝකය කියන්නේ මොකක්ද කියන කාරණය ගැන. ඒ තිරිසන් ලෝකයේ හැම සතෙක් ම, හැම තත්පරයකදී ම අකුසලයක් රැස් කරන්නේ.

තිරිසන් ලෝකයේ ඉන්න ලස්සන ම සතා තමයි කුරුල්ලා. කුරුල්ලාට බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, අකුසල් නිධියක් කියලා. ඒ තරම් අකුසල් ලියලනවා, කුරුල්ලා තුළ. මොකද, කුරුල්ලා උදේ ඉඳන් රෑ වෙනකල් ම පණුවන් මරමරා, දළඹුවන් මරමරා තමයි කන්නේ. මේ පණුවෙක්, දළඹුවෙක් මරන මොහොතක් පාසා මරණීය චේතනාව එයා තුළ සකස් වෙනවා; ප්‍රාණඝාත අකුසලය සිද්ධ වෙනවා.

නමුත් එයා කර්මය, කර්මඵල විශ්වාසය දන්නේ නැහැ. නමුත් ඒක හරි යන්නේ නැහැ. කර්මය, කර්මඵල විශ්වාස දන්නේ නැති වුණත් කමක් නැහැ, මරණීය චේතනාවට අදාළව ප්‍රාණඝාත අකුසලය සිද්ධ වෙනවා. එහෙනම් එක කුරුල්ලෙක් උදේ ඉඳන් හවස් වෙනකල් ජීවත්වෙලා, රෑට නින්දට යන්නේ ප්‍රාණඝාත අකුසල් සිය ගාණක් සිද්ධ කරගෙන. ඒ නිසා ම දුකෙන් දුකට, දුකෙන් දුකට වැටිලා කල්ප ගණන් නිරයන් දක්වා ඒගොල්ලන්ගේ ගමන දික් වෙනවා. ඔය සුන්දර කුරුළු ලෝකයේ ජීවිතය ඔහොම තමයි.

ඔය සුන්දර කුරුලු ලෝකය කියන තැන, ඉතින් තිරිසන් සතා කියන්නේ ලෝභ, ද්වේශ, මෝහයන් ම යි; අකුසල් මූලයන් ම යි. ඉතින් ඒගොල්ලන්ට කවදාක්වත් ගොඩ ඒමක් කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ නැහැ. නමුත් ඔය සෑම සතෙක් ම පෙර ජීවිතයේ මනුස්සයෙක් ම යි. පෙර ජීවිතයේ මනුස්සයෙක් ම යි. නමුත් මනුස්ස ජීවිතයේදී අපි එය දකින්නේ නැහැ.

සමහර මනුස්සයෝ ඉන්නවා, ඒගොල්ලෝ දන්නේ නැහැ, මැරුණට පස්සේ බල්ලෙක් වෙනවා කියලා. මැරුණට පස්සේ

හරකෙක් වෙනවා කියලා සමහර මනුස්සයො දන්නේ නැහැ. ඒගොල්ලො දන්නේ නැහැ. නමුත් බුදුරජාණන් වහන්සේ මේ ධර්මය දේශනා කරනවා.

වෙන කවුරුත් නෙවෙයි, අර අසදිසි දානය දුන්න මල්ලිකා බිසව මැරිලා ගිහිල්ලා පණු කුලයක උපදින්නේ, සතියක් වගේ කාලයකට. අසදිසි දානය, එක සම්මා සම්බුද්ධ ශාසනයකට එක දානයයි දෙන්න පුලුවන්. නමුත් මැරෙන වෙලාවෙදි එයාට මතක් වුණේ කාමයේ වරදවා හැසිරීමේ වරදක්. එයා කාමයේ වරදවා හැසිරීමක් සිද්ධ කළා. මැරෙන වෙලාවේ කාමයේ වරදවා හැසිරීමයි මතු වෙන්නේ. ඊට අදාළව පණු කුලයක උත්පත්තිය ලබනවා, සතියක් වගේ කාලයක්. නමුත් ඊට පස්සේ එයා සුගතියට යනවා.

නමුත් වර්තමානයේ කෙනෙක් පණු කුලේට වැටුණොත් ආයෙමත් සුගතියට යාමක් නැහැ. මොකද, මල්ලිකා බිසවගේ කුසල් ශක්තිය බලවත්. බුදුරජාණන් වහන්සේලාට, රහතන් වහන්සේලාට දන් දුන්න කෙනෙක්. වර්තමානයේ අපිට ඒ අවස්ථාවන් නැහැ. ඒ නිසා අපේ වර්තමානයේ එවැනි කුසල් මතුවෙන්නේ නැහැ. එයාට කුසල් ශක්තිය මතුවෙලා සතියෙන් ගොඩ ආවා. නමුත් වර්තමානයේ කෙනෙක් එතනට වැටුණොත් ආයෙමත් ගැලවෙන්න පුළුවන්කමක් නැහැ.

# අතහැරීම

**විසිදෙවන ප්‍රශ්නය :**

**ගෞරවණීය ස්වාමීන් වහන්ස, අත්හැරීම කියලා කියන්නේ කුමක් ද ?**

**පිළිතුර :**

මෙහෙමයි පුතේ, අත්හැරීම කියන කාරණය වරදවා පටලවා ගන්න නම් එපා. මේ අත්හරින්න කියලා කියන්නේ, මේ ගෙදර අත් හරින්නවත්, බිරිඳ අත් හරින්නවත්, දරුවා අත් හරින්නවත්, රැකියාව අත් හරින්නවත්, ව්‍යාපාරය අත් හරින්නවත් නෙවෙයි. තේරුණාද? අත් හරින්න කියන්නේ, මේවා කෙරෙහි තියෙන තෘෂ්ණාවයි අත් හැරෙන්න ඕන.

දැන් සමහරෙකුට මම කියනවා, දැනුම අත හරින්න කියලා. දැනුම අත හරිනවා කියන්නේ මේ දැනුම විසි කරනවා නෙමෙයි. දැනුම කෙරෙහි තියෙන තෘෂ්ණාවයි අත හැරෙන්න ඕන. ඒ නිසා ගිහි ජීවිතයේට, මේ සතර අපායෙන් මිදෙන්න යන ගමනේ දී අතහැරීම කියන්නේ මේ ඇසුරු කරන දේවල් කෙරෙහි තියෙන තෘෂ්ණාව අතහරින්න. මොකද, ගෙදර තුළ වත්, බිරිඳ තුළ වත්, ස්වාමිපුරුෂයා තුළ වත්, කාර් එක තුළ වත් නෙවෙයි තෘෂ්ණාව තියෙන්නේ.

තෘෂ්ණාව තියෙන්නේ අපි තුළයි. අපි තුළයි තෘෂ්ණාව තියෙන්නේ. කාර් එක, කාර් එකේ ස්වභාවයෙන් තියෙනවා. ගේ, ගෙදර ස්වභාවයෙන් තියෙනවා. නෝනා, නෝනගේ ස්වභාවයෙන්

ඉන්නවා. මහත්තයා, මහත්තයාගේ ස්වභාවයෙන් ඉන්නවා. ඒවා කෙරෙහි මමයි තෘෂ්ණාව සකස් කරගන්නේ. ඒ නිසා රූපය තියන්න. එය ඇසුරු කරන්න. ඇසුරු කරලා රූපයේ අනිත්‍ය භාවය දකිමින් රූපය කෙරෙහි තමා තුළ සකස් වෙන්නා වූ තෘෂ්ණාව අඩුකර ගන්න.

මොකද, මැරෙන වෙලාවෙ, සකස් වෙන අවසාන චුති සිත තියෙනවා. චුති සිත තමයි මේ අවසාන පංච උපාදානස්කන්ධය, මේ රූපය ඇසුරින් සකස් වෙන. මේ චුති සිත සකස් වෙන්නේ මනෝ විඤ්ඤාණයක් ඇසුරෙන්; මනසේ සකස් වෙන සිතිවිල්ලක් ඇසුරෙන්. මේ චුති සිතට මොකක් හෝ රූපයක් තමයි උපාදානය වෙන්නේ. අපි කැමති, අකමැති රූපයක්.

දැන් අපි මැරෙන වෙලාවේ දරුවන්ට වැඩිපුර ආදරේ නම්, එකපාරටම දරුවන් තමයි සිහිවෙන්නේ. දැන් සමහරු ඉන්නවානේ, අම්මා මැරෙන්න යනවා, දරුවො ටිකයි මුණුබුරෝ ටිකයි ඔක්කොම ඇඳ වටකර ගෙන කෑගහනවා; අඬනවා; බෙරිහන් දෙනවා. ඉතින් මැරෙන වෙලාවෙ අනේ අර අහිංසක අම්මා එකපාරට දරුවන්වයි උපාදානය කරගන්නේ. ඇයි? අර දරුවන් කෙරේ බැඳුණානේ. ඉතින් ඒ නිසා මැරිලා ඒ නිවසේ ම පරදත්ත රූප ජීවී ප්‍රේතියක් වෙනවා.

ඒ නිසා මැරෙන වෙලාවෙ නෝනා, අපිට සකස් වෙන අවසාන හිත මොකක් හරි රූපයක් ඇසුරු කරගෙන තමයි සකස් වෙන්නේ. පින් කරපු කෙනෙක් නම් මැරෙන වෙලාවේ පිනක් සිහිපත් වෙන්න පුළුවන්. පින්කමක්. එහෙම කළොත් එයා මනුස්ස, දිව්‍ය ජීවිතයකට යනවා. මැරෙන වෙලාවේ ඉඩකඩම් උපාදානය වුණොත් ඒ ඉඩමේ ම පරදත්ත රූප ජීවී ප්‍රේතයෙක්, නැත්නම් ගහක රුක් දෙවියෙක් වෙලා ඉපදෙනවා.

ඒ නිසා මැරෙන වෙලාවේ මේ සකස් වෙන්නා වූ අවසාන සිත අනිත්‍යයි කියලා දකින්න අපි දක්ෂ වෙන්න ඕනෑ. තේරුණා ද?

එතෙන්ට තමයි අපි මේ පුරුදු වෙලා යන්නේ. එහෙම නැත්නම් කොතැනක වත් මේ ගෙවල් අතහැරලා දාන්න, බිරිඳ අතහැරලා දාන්න, සැමියා අතහැරලා දාන්න, මේගොල්ලන් ගෙන් අයින් වෙන්න කියලා කියන්නේ නැහැ.

සෝවාන් ඵලයට යන ගමන කරා යන කෙනා හොඳ පෞරුෂත්වයක් තියෙන කෙනෙක්. තේරුණාද? එයා අනිත් අයට වඩා උද්‍යෝගිමත් කෙනෙක්. මොකද, එයා යමක් දැක්ක කෙනෙක්. මොකක්ද දැකලා තියෙන්නේ? ධර්මය. මොකක්ද ධර්මයේ දකින්නේ? සංස්කාරයන් මතයි මේ දේ සිද්ධ වෙන්නේ. ඒ නිසා එයා කොතැනවත් ඇලෙන්න යන්නෙත් නැහැ; ගැටෙන්න යන්නෙත් නැහැ. ගැටීම් සකස් වුණත් එයා දන්නවා හේතුවක්. ඇලීම් සකස් වුණත් එයා දන්නවා හේතුවක්. ඒ නිසා ඇලීම්, ගැටීම් වලින් තොර උපේක්ෂාව කියන තැනට එනවා.

එහෙනම් කොතැනත් එයා ශක්තිමත්ව කුසල් කරන කෙනෙක්. එයාගෙ යුතුකමුත් එයා කරන්නේ කුසලයක් හැටියට. එයා බිරිඳට සලකන්නේ කුසලයක් හැටියට. දරුවාට සලකන්නේ කුසලයක් හැටියට. එයා බිරිඳ නිසා, දරුවා උදෙසා කවදාක්වත් අකුසලයක් සිද්ධ කර ගන්නේ නැහැ. ඒ නිසා එයා සමාජයත් එක්ක යහපත් ආකාරයෙන් ජීවත් වෙන කෙනෙක්. එයා දක්ෂයි, සමාජයේ ඕන තැනකින් කුසලයක් මතුකරලා ගන්න.

ඒක තමයි සෝවාන් මාර්ගයට යන කෙනාගේ ලක්ෂණය. ඒ නිසා අතහරිනවා කියලා අන්තයකට යන්න බැහැ. දැන් එක ස්වාමීන් වහන්සේ කෙනෙක් ජීවත් වුණා. අතහැරීම කියලා උන්වහන්සේ අදහස් කළේ මොකක් ද? බුදුරජාණන් වහන්සේ අදහස් කරපු දේ නෙමෙයි. උන්වහන්සේ කැලේ තනියම ජීවත්වෙච්ච ස්වාමීන් වහන්සේ කෙනෙක්. උන්වහන්සේ දැන් කැලේ ජීවත් වෙනකොට උන්වහන්සේට විතර්කයක් ඇතිවෙනවා. මොකක්ද විතර්කේ? මේ සිවුරත්, පාත්තරෙත් මම අල්ලගෙන ඉන්නේ. මේකත්

අල්ලගෙනනෙ ඉන්නෙ මම. උන් වහන්සේ බුදුරජාණන් වහන්සේටත් වඩා ඉස්සරහට හිතනවා.

බුදුරජාණන් වහන්සේ තුන් සිවුරයි, පාත්තරෙයි ළඟ අපව නතර කරලා තියෙනවා, හේතුවක් නිසා. මේ ස්වාමීන් වහන්සේ ඉනුත් අන්තයට ගිහිල්ලා හිතනවා, සිවුරත්, පාත්තරෙත් අල්ලගෙ නයි ඉන්නේ. ඒ නිසා මම සිවුරයි, පාත්තරෙනුත් අයින් වෙනවා කියලා හිතනවා. එයා නිගණ්ඨ ආශ්‍රමයකට ගිහිල්ලා දැන් අමුඩයක් ගහගෙන ජීවත් වෙනවා.

ඒ කියන්නේ අන්තවාදී අත්හැරීමක්. තේරුණා ද? එවැනි අත්හැරීමක් බුදුරජාණන් වහන්සේ අපට දේශනා කරන්නේ නැහැ. බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ, තෘෂ්ණාවයි අත්හැරෙන්න ඕන. තෘෂ්ණාවයි අත්හැරෙන්න ඕන. ඒ කියන්නේ සියල්ල ඇසුරු කරනවා. ඒවා කෙරෙහි වූ තෘෂ්ණාව අතහරිනවා. තෘෂ්ණාව තිබ්බොත්, ඊට අදාළව ප්‍රතිසන්ධියකට යනවා. එහෙම තමයි බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ.

ඒ නිසා සියල්ල පරිහරණය කරන්න. ඒවා කෙරෙහි තෘෂ්ණාවෙන් බැහැර වෙන්න. තෘෂ්ණාවෙන් බැහැර වෙනවා නම් හැම වෙලාවෙ ම රූපයේ අනිත්‍යභාවය දකිමින් ජීවත් වෙන්න.

# ශීලය රැකගෙන කර්මඵල විශ්වාසයෙන් දන් දීමේ ආනිශංස

**විසිතුන්වන ප්‍රශ්නය :**

**ගෞරවණීය ස්වාමීන් වහන්ස, සිත දමනය කර ගැනීම තුළින් පුද්ගලයකුට නිරෝගී මනසක් නිරෝගී කයක් උරුම කරගැනීමට පුලුවන්ද?**

**පිළිතුර :**

මෙහෙමයි, නෝනා. කයේ ක්‍රියාකාරීත්වය කියල කියන්නේ සිත කියන කාරණයට. කය ක්‍රියාත්මක භාවයට පත්වෙන්නේ සිත තුළින්. මේ ලෝකයේ ක්‍රියාත්මක භාවය කියන්නේ මොකක් ද? මනුස්සයාගේ සිතේ තිබෙන ක්‍රියාත්මක භාවයට.

එතකොට, ලෝකය සංකීර්ණයි කියලා කියන්නේ මොකක්ද? මනුස්සයාගේ සිතිවිලිවල තිබෙන ක්‍රියාකාරීත්වයේ සංකීර්ණ භාවයට. සිතිවිලි සංකීර්ණ වෙන්න, සංකීර්ණ වෙන්න ලෝකය සංකීර්ණ භාවයට පත්වෙනවා. ඒ නිසා නිරතුරුව ම අපි දක්ෂ නම් සිත සන්සුන් කරගන්න, සිත සංයමයෙන් යුතුව ගත කරන්න, සිත දමනය කරගන්න... ඒ සිත දමනය කරගැනීම තුළින් මේ කයත්, වචනයත් කියන දේ හික්මෙනවා.

බුදුරජාණන් වහන්සේ අපිට විනය කාරණා 227 ක් පනවනවානෙ. උපසම්පදා භික්ෂුවකට විනය කාරණා 227 ක්

තියෙනවා. එතකොට, සාමණේර භික්ෂුවකට සාමණේර දස ශීලයයි, සේඛියා 75 යි කියලා විනයක් තියෙනවා. අපි මේ විනය කාරණා 227 ගැනම හිතනවට වඩා එයා මේ සිත කියන කාරණය දමනය කරගත්තොත් මේ විනය කාරණා 227 ම තමා තුළින් රැකිලා යනවා.

එහෙනම් කෙනෙක් දැන් පන්සිල් සමාදන් වෙලා ඒ වෙනුවෙන් කැපවෙනවා වගේ ම, තමන්ට පුළුවන් නම් මේ හිත දමනය කරගෙන ජීවත්වෙන්න, ඒ දමනය කර ගැනීම තුළ ම අපි ඒ සිත, කය, වචනය කියන කාරණා අපේ මේ සංවර භාවයට පත්වෙනවා. ඉතින් එය දමනය කරගන්න නම් නිරතුරුව ම තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන් ජීවත්වෙන්න ඕන; කර්මය, කර්මඵල තුළ විශ්වාසය තුළම ජීවත් වෙන්න ඕන; සංසාර භය දකිමින් අපි ජීවත් වෙන්න ඕන.

ඉතින් එහෙම ජීවත් වෙද්දි අපිට පුළුවන් නම් හිත සන්සුන් කරගන්න, හිත දමනය කරගන්න, ඒ හිතේ දමනය කිරීම මත කයින්, වචනයෙන් සිදුවෙන්නා වූ වැරදිවලට අපි යන්නේ නැහැ.

**අතුරු ප්‍රශ්නය :**

**ගෞරවණීය ස්වාමීන් වහන්ස, අද බොහෝ දෙනෙකුට නිරෝගිකම අහිමිවෙලා තිබෙනවා. තමන්ගේ නිරෝගීකම ආරක්ෂා කරගැනීමට පුද්ගලයෙක් නිරතුරුව ම පුරුදු කළ යුතු කුසල ධර්මයන් තිබෙනවා ද?**

**පිළිතුර :**

නිරෝගීකම කියන්නේ, ආයුෂය, වර්ණය, සැපය, බලය. මේ ආයුෂය, වර්ණය, සැපය, බලය කියන කාරණා අපිට ලැබෙන්නේ දානය තුළින්. වෙන දේකින් නෙවෙයි. තේරුණාද? දන් මේ ලෝකයේ ජීවත්වෙන්නා වූ මේ ආයුෂයෙන්, වර්ණයෙන්, සැපයෙන්,

බලයෙන් පිරුණා වූ සමාජයක් තිබෙනවා නම්... අපි හිතමු ප්‍රභූ මහේශාක්‍ය ජීවිත ගත කරන අයගේ ජීවිත තිබෙන්නේ. ඒ ප්‍රභූ භාවය, මහේශාක්‍ය භාවය කියන්නේ මොකක් ද? පෙර ජීවිතයේ පූජා කළා වූ දානයන්ගේ ආනිශංස ම යි.

ඒ නිසා දානය ම තමයි අපිට ආයුෂය, වර්ණය, සැපය, බලය ලබා දෙන්නේ. ඒ කියන්නේ, යමෙක් ආයුෂයෙන්, වර්ණයෙන්, සැපයෙන්, බලයෙන් හීන භාවයට පත්වුණා කියන්නේ එයා අනිවාර්යයෙන් ම පෙර ජීවිතයේ දානය තුළින් දුර්වල භාවයට පත්වෙලා කියන කාරණය යි.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා ***'මනුස්සයා, සත්ත්වයා කර්මය දායාද කොට උපදී'*** කියලා. ***'කර්මය මගේ කොටගෙන උපදී'*** කියලා. දැන් සමහර වෙලාවට දරුවෙක් ඉන්නවා, එයා මව්කුසේදී ම මිය යනවා. සමහර අය මව්කුසෙන් බිහිවෙන වෙලාවෙදි ම මිය යනවා. සමහර වෙලාවට මාසෙන්, දෙකෙන්, තුනෙන්, අවුරුද්දෙන්, අවුරුදු හතරෙන්, පහෙන් මිය යනවා. එතකොට, බුදුරජාණන් වහන්සේ මේකට මේ රෝහලේ වැරැද්ද, වෛද්‍යවරුන්ගේ වැරැද්ද කියලා කියන්නේ නැහැ. බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ, මෙය හේතුඵල ධර්මයක්. හේතුඵල ධර්මය මොකක් ද? මෙයා ගිය ජීවිතයේ සත්ත්ව හිංසාවන් සිදු කළා; සත්ත්ව ඝාතනයන් සිදු කළා. එහෙම කරලා ඒවායේ විපාක අනුව ගිය ජීවිතයේ මැරෙන වෙලාවෙ කුසල් චිත්තයක් සකස් වෙනවා. කුසල් චිත්තයක් සකස් වීම නිසා මනුස්ස මව්කුසකට බහිනවා. බැස්සත් කළා වූ අකුසලය විපාකය පිණිස එනවා.

දැන් කවුරුහරි දුගී කෙනෙක් ආහාරයක් නැතිව දුප්පත් භාවයට පත්වෙලා ජීවත්වෙනවා නම්, අපි ඒ තුළින් දකින්නේ කුමක් ද? එයා සංසාරයේ දන්දීලා නැහැ. අනුන්ගේ දානයන් වළක්වලා තියෙනවා. ඉතින් ඒ නිසා දානයෙන් ම යි යමෙකුට ආයුෂය, වර්ණය, සැපය, බලය ලැබෙන්නේ.

ඒ නිසා අපේ මේ ජීවිතයට ආයුෂය, වර්ණය, සැපය, බලය හීන භාවයක් දකිනවා නම්, ඒකට අපි ආණ්ඩුවට බැනලාවත්, වෙන දේකට බැනලාවත් හරියන්නේ නැහැ. බුදුරජාණන් වහන්සේ සමාජ අසාධාරණයක් කියන කාරණය වැඩිපුර අපිට දේශනා කරන්නේ නැහැ අපට. බුදුරජාණන් වහන්සේ හේතුඵල ධර්මයක් තමයි දේශනා කරන්නේ. හේතුව තමයි, අපි සංසාරයේ දන්දීලා නැහැ. ඒ නිසා අපිට සුඛෝපභෝගී භාවය, එහෙම නැත්නම් මහේශාක්‍ය භාවයන් අවශ්‍ය නම් අපි වැඩියෙන් කර්මය, කර්මඵල විශ්වාසයෙන් දන් දෙන්න ඕන.

ඒ දන්දීලා විතරක් වැඩක් නැහැ. දන් දෙන්න ඕන, ශීලය ආරක්ෂා කරගෙන. එහෙම කළොත් අපිට ආයුෂය, වර්ණය, සැපය, බලය ලැබෙයි. ඉතින් මේ ලෝකයේ යම් දිව්‍ය තලයක යම් දෙවි කෙනෙක් සශ්‍රීක භාවයෙන් ජීවත්වෙනවා නම්, මේ මනුස්ස ලෝකයේ යම් මනුස්සයෙක් සශ්‍රීක භාවයෙන් ජීවත් වෙනවා නම්, ඒ සශ්‍රීක භාවයට එක ම හේතුව ඒ අය පෙර ජීවිතයේ පූජා කළා වූ දානය යි. වෙන දෙයක් නෙවෙයි.

ඒ දිව්‍ය ආත්මය, මනුස්ස ආත්මය ලැබුණේ ශීලය තුළින්. නමුත් අර සශ්‍රීක භාවය ඒගොල්ලන්ට ලැබුණේ දානය නිසා ම යි. ඒ නිසා දන්දෙන කෙනා සංසාරයේ කොතැන උත්පත්තියක් ලැබුවත්, එයාට ආයුෂය, වර්ණය, සැපය, බලය ලැබෙනවා.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, ඔය තිරිසන් ලෝකයේ ජීවත්වෙන අලියා, කොටියා, සිංහයා වගේඅය ඉන්නෙ. ඒගොල්ලො තමයි කැලේ ඉන්න රජ්ජුරුවෝ. ඒගොල්ලන්ට කවුරුත් බයයි. එතකොට, කැලේ රජ්ජුරුවෝ හැටියට ඒගොලලො ඒ ජීවිත ලබන්නේ ඇයි? පෙර ජීවිතයේ දානයේ ආනිශංස නිසාමයි. දන් දුන්නා, එහෙත් සිල් රැක්කේ නැහැ.

දැන් අද සමහර මනුස්සයො ඉන්නවා, ඒ අය සිල් රකින්නේ නැහැ. සමහර වෙලාවට මිථ්‍යා ආජීවයෙන් ජීවත් වෙන්නේ. නමුත්

වෙසක් කාලෙට, පොසොන් කාලෙට දන්සල් දෙනවා; පන්සලට දන් දෙනවා; අප්‍රමාණ දේවල් දන් දෙනවා. නමුත් ඒගොල්ලන්ට කර්මය, කර්මඵල විශ්වාසයකුත් නැහැ. ඉතින් මෙහෙම අය මැරුණාට පස්සෙ, ඒ අය අර වගේ ඇත් කුලේ, කොටි කුලේ, සිංහ කුලේ වගේ කැලේ සද්දන්තයෝ වෙලා උත්පත්තිය ලබනවා. එයා කැලේ නායකයා. හැමෝම එයාට බයයි. එතකොට, ඒ නායකත්වය එයාට ලැබුණේ කොහොම ද? මොකක් ද ඒ නායකත්වය කියන්නේ? ආයුෂය, වර්ණය, සැපය, බලය.

එතකොට, මේ ආයුෂය, වර්ණය, සැපය, බලය ලැබුණේ කුමක් නිසා ද? ගිය ජීවිතයේ දන් දුන්නා. නමුත් සිල් ආරක්ෂා කළෙත් නෑ, කර්මය, කර්මඵල විශ්වාසයක් තිබුණෙත් නැහැ. නමුත් දානයේ ආනිශංස හැටියට එයා කැලේ රජ්ජුරුවෝ වෙලා උත්පත්තිය ලබනවා.

දැන් සමහර මනුස්සයෝ ඉන්නවා, ඒගොල්ලො මේ ජීවිතයේ දානය දීලා තියෙනවා. දානය දුන්නත් මැරෙන වෙලාවේ මොකක් හරි දේපළක් තමයි ඒගොල්ලන්ට උපාදානය වෙන්නේ. එහෙම දේපළක් උපාදානය වෙලා ප්‍රේත ලෝකයේට වැටුණත් ප්‍රේත ලෝකයේදි සද්දන්ත ප්‍රේතයෙක් වෙලා උත්පත්තිය ලබනවා. මොකද, සද්දන්ත ප්‍රේතයා අනෙක් සියලු ම ප්‍රේතයන් යට කරගෙන තමයි ඉන්නේ. එතකොට ඒ සද්දන්ත භාවය එයාට ලැබුණේ කුමක් නිසා ද? ආයුෂය, වර්ණය, සැපය, බලය නිසා.

පෙර ජීවිතයේ දන් දුන්නා. නමුත් දානයට වඩා එයා තුළ දේපළ කෙරෙහි තෘෂ්ණාව සකස් වුණා. මැරෙන වෙලාවෙ සකස් වුණේ දේපළ කෙරෙහි වූ තෘෂ්ණාවයි. ඉතින් ඊට අදාළව ප්‍රේත ලෝකය තුළ මහේශාක්‍ය ප්‍රේතයෙක් බවට පත්වෙනවා. හොඳට ඇඳුම් පැළඳුම් ලැබෙනවා. විකෘතියක් නැහැ. ඒ ඇයි? දානයේ ආනිශංස ම යි.

ඒ නිසා ආයුෂය, වර්ණය, සැපය, බලය කියලා යමෙක් හඳුන්වනවා නම් ඒ දේ අපිට ලැබෙන්නේ දානය නිසා ම යි කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, දානය නිසාමයි. මොකද, මේ ලෝකයේ කෝටිපති, ප්‍රකෝටිපති අය කොච්චර ඉන්නවද කියලා බලන්නකෝ. නේද? ඒ තැනට පත්වුණේ දානයේ ආනිශංස නිසා ම යි. වෙන දෙයක් නිසා නොවෙයි. පෙර ජීවිතයේ පූජා කළා වූ දානයන්ගේ ආනිශංස නිසා ම යි. කර්මය, කර්මඵල විශ්වාසය, සිල් ආරක්ෂා කරගෙන පූජා කළා වූ දානයේ ආනිශංස තමයි ඒ අය ලබන්නේ.

# බෞද්ධ ද, අබෞද්ධ ද කියන කාරණය සංස්කාර වලට අදාළ නැහැ

**විසිහතරවන ප්‍රශ්නය :**

**ගෞරවණීය ස්වාමීන් වහන්ස, ලෝකය පුරා අතිශය සුඛෝපභෝගී ජීවිත ගත කරන මිනිස්සු ඉන්නවා. ඒ අය විවිධ ආගම්වලට, විවිධ ජාතීන්වලට අයත් අය. නමුත් මේ හැමකෙනා ම බුදුරජාණන් වහන්සේගේ දර්ශනය පිළිගත් අය නො වෙයි. මේ අයගේ භව ගමන කොහොමද ස්වාමීන් වහන්ස අප පැහැදිලි කරගන්නේ?**

**පිළිතුර :**

ඒ කියන්නේ, අපිට ආයුෂය, වර්ණය, සැපය, බලය ගැන කතා කරද්දී, මේ වර්ණය කියන කාරණය අනිවාර්යයෙන් ම ලැබෙන්නේ ගිය ජීවිතයේ, අපි අප්‍රමාණව කළා වූ පින්කම් නිසා ම යි. හොඳද? දැන් අපි මේ ලස්සන ජීවිතයක් ලබන්න සමහරවිට ගිය ජීවිතයේ මල් වට්ටි දහස් ගාණක් පූජා කරන්න ඇති; මෛත්‍රී චිත්තයන් දහස් ගාණක් වඩලා ඇති; බෝමළු දහස් ගාණක් ඇමදලා ඇති. මේවායේ ආනිශංස ධර්මයන් නිසයි, අපිට මේ ජීවිතයේ ලස්සන සුරූපී ජීවිතයක් ලැබිලා තියෙන්නේ.

අපි දන්න එක්තරා ස්වාමීන් වහන්සේ නමක් සමාධියෙන් පසුවෙන කොට උන්වහන්සේට අරමුණු වෙනවා, දිව්‍ය තලයක දිව්‍යාංගනාවක්. නමුත් මේ දිව්‍යාංගනාව, මලින් හැදුණා වූ දිව්‍යාංග නාවක්. දැන් අපි හැදිලා තිබෙන්නේ සමෙන් හා මසෙන්නෙ. නමුත්

එයා හැදිලා තිබෙන්නේ මලින්. එතකොට අපි හිතමු, සුදුපාට විනිවිද පෙනෙන පොලිතින් උරයක් අරගෙන ඒ පොලිතින් උරයට රෝසපාට ඕකිඩ් මල් පුරවන්න. ඕකිඩ් මල් පුරවලා දාන් ඒ පොලිතින් උරය බාහිරින් දකින්නේ යම් සේ ද, ඒ වගේ මලින් හැදුණා වූ දිව්‍යාංගනාවක්. කුමක් ද මේ අසිරිය? මේ අසිරිය තමයි, පෙර ජීවිතයේ සිල්පද ආරක්ෂා කරගෙන පින්කම් සිද්ධ කළා. ශීලය ආරක්ෂා කරගෙන පින්කම් සිද්ධ කිරීම නිසයි, ඒ සා අසිරියක් ලැබුණේ.

එතකොට, මේ ලෝකයේ ශ්‍රේෂ්ඨ නාට්‍යාංගනාවක් ඉන්නවා. එයා මේ ලෝකයේ සිටින ශ්‍රේෂ්ඨ ම නාට්‍යාංගනාවක්. අපි දන්න එක්තරා ස්වාමීන් වහන්සේ නමක් උතුම් සමාධියෙන් අරමුණු කරලා බලලා තිබෙනවා, මේ නාට්‍යාංගනාව ගිය ජීවිතයේ කවරෙක් ද කියලා. එතකොට ස්වාමීන් වහන්සේ දකිනවා, ඇය ගිය ජීවිතයේ දේවදාසියක්.

දේවදාසියක් කියලා කියන්නේ... දෙවියන් උදෙසා ජීවිතය පූජා කරන්නී දේවදාසියක් කියලා තමයි ඉන්දියා සමාජයේ කියන්නේ. එතකොට එයා පෙර ජීවිතයේ දේවදාසියක්. එයා පුංචි කාලයේ ඒ ළමයා ගෙනල්ලා දෙවොලට පූජා කරනවා. දෙවොලට පූජා කරපු දවසේ ඉඳන් ඒ දරුවා මැරෙන මොහොත දක්වා මොකක්ද කරන්නේ? මල් කඩනවා, මල් මාලා සාදනවා, මල් ගොතනවා, දෙවියන්ට පළන්ඳනවා, කහ දියරෙන් මේ දෙවොල සෝදනවා, මුරුතැන් බත් උයනවා, දෙවොල අතුපතු ගානවා.

මුළු ජීවිත කාලෙ ම දෙවියන් උදෙසා ජීවිතයේ කැප කළා. බුදුරජාණන් වහන්සේ උදෙසා නො වෙයි, දෙවියන් උදෙසායි. දෙවියන් උදෙසා ජීවිතය කැප කළා. මෙහෙම ජීවිතය කැප කරලා, එයා අවසානෙදි මැරෙනවා. මැරිලා මේ ජීවිතය බෞද්ධ පවුලක නෙවෙයි, අර මිථ්‍යාදෘෂ්ටික පවුලක සුරූපී දූරියක් වෙලා උත්පත්තිය ලබනවා.

එතකොට ඒ සුරූපී දැරිය මේ මොහොතේ ලෝකයේ ඉන්න ශ්‍රේෂ්ඨ නාට්‍යාංගනාවක් බවට පත්වෙලා ඉන්නවා. එහෙනම් එයාට ඒ සුරූපී භාවය ලැබුණේ කුමක් නිසා ද? මුළු ගිය ජීවිතයක් ම තුළ දෙවියන් උදෙසා කළා වූ පූජෝපහාරයන් නිසා. මල් ලක්ෂ ගණනක් දෙවියන්ට පූජා කරන්න ඇති. මල් මාලා දසදහස් ගණනක් ගොතන්න ඇති. ඒ වගේ කහ දියරෙන්, මුරුතැන් බතින් මේ සියලු දෙයින් දෙවියන්ට පූජා කළා. එහි ආනිශංස හැටියට සුරූපී ජීවිතයක් සහිතව මේ ජීවිතයේ උත්පත්තිය ලබනවා.

ඒ නිසා අපි නිරතුරුව ම මෙවැනි පින්කම් සිද්ධ කරනවා නම් බෞද්ධ ද, අබෞද්ධ ද කියන කාරණය අදාළ වෙන්නේ නැහැ. දැන් අබෞද්ධ ජීවිතයක් ගත කරන මුස්ලිම් මහත්මයෙක්, හින්දු මහත්මයෙක්, ක්‍රිස්තියානි මහත්මයෙක් දෙවියන් උදෙසා දැඩි ආකාරයෙන් මලින්, සුවඳින්, ආලෝකයෙන් දෙවියන්ට පූජා කරනවා නම්... දැන් අපි දන්නවානේ කෝවිල් ආශ්‍රිතව, පල්ලි ආශ්‍රිතව මලින් මහ විශාල පූජාවන් සිද්ධ වෙනවනෙ. ඉතින් මේ අය මැරිලා ගිහිල්ලා, අබෞද්ධ පවුල්වල සුරූපී අය වෙලා උත්පත්තිය ලබනවා, මැරෙන වෙලාවෙ ම ඒ පින් උපාදානය වුණොත්. එහෙම නැත්නම් දෙවියෙක් වුණොත් මිථ්‍යාදෘෂ්ටික දිව්‍ය තලවල සම්පූර්ණ අසිරිමත් දෙවියෙක් වෙලා උත්පත්තිය ලබනවා.

ඒ නිසා බෞද්ධ ද, අබෞද්ධ ද කියන කාරණය සංස්කාරවලට අදාළ නැහැ. තේරුණා ද? බෞද්ධ කෙනෙක් මේවා සිද්ධ කළොත් එයා සම්මා දිට්ඨියට පත්වෙලා උත්පත්තිය ලබනවා. අබෞද්ධ කෙනෙක් ඒවා කළොත් සම්මා දිට්ඨියෙන් බැහැරට පත්වෙලා උත්පත්තිය ලබනවා. වෙන දෙයක් ඕතන නැහැ.

ඒ කියන්නේ සුරූපී භාවය කියන්නේ, අපි පෙර ජීවිතයේ කළා වූ පින්කම් ම යි. මලින් ම, සුවඳින් ම, ආලෝකයෙන් ම, මෛත්‍රී චිත්තයෙන් ම කළා වූ පින්කම්.

# තමාගේ රූපය වැරදි ආකාරයට පරිහරණය කළොත් .....

**විසිපස්වන ප්‍රශ්නය :**

**ගරු ස්වාමීන් වහන්ස, යම් පුද්ගලයෙක් තමන්ට උත්පත්තියෙන් උරුම වෙච්ච අඟපසඟ, ශෝභාමත් රුව තව කෙනෙකුගේ සිත තුළ රාගික, කාමුක සිතිවිලි ඉපැද්දීම සඳහා භාවිත කරනවා නම් ඔහුට හෝ ඇයට අත්වන ඉරණම කුමක් ද, ස්වාමීන් වහන්ස?**

**පිළිතුර :**

බුදුරජාණන් වහන්සේ බොහෝ ම පැහැදිලිව දේශනා කරනවා, තමන්ට ලැබුණා වූ රූපය... මම දැන් කිව්වා, මේ රූපය අපිට අම්මා, තාත්තා නිසා ලැබුණු රූපයක් නෙවෙයි. අපි අප්‍රමාණ මල් පූජා කරලා, බෝ මළු ඇමදලා, මෛත්‍රී චිත්තයන් වඩලා තමයි මේ ලස්සන රූපය ලැබුවේ. ඒ නිසා මේ ලැබුවා වූ ලස්සන රූපය, බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, නිරයගාමී බවට පත් කරගන්න එපා කියලා.

යමෙක් තමන්ට ලැබුණා වූ රූපය ඇඳුමෙන් පැළඳුමෙන් හෝ ලෝකයාට යම් නිරාවරණය කිරීමක් කරනවා නම්, එය අපායගාමී අකුසලයක් කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. මේක බුදුරජාණන් වහන්සේ පැහැදිලිව දේශනා කරනවා. අපායගාමී අකුසලයක්.

**අතුරු ප්‍රශ්නය :**

**ගරු ස්වාමීන් වහන්ස, නාට්‍යාංගනාවන්, රංගන ශිල්පිනියන් සම්බන්ධව කතා කරද්දි මේ තත්වය කොහොමද ස්වාමීන් වහන්ස පැහැදිලි කරගන්න පුළුවන්?**

**පිළිතුර :**

ඒක, බරපතළ තැනක්. ඒක අපිට සමාජයේදී කියන්නත් බැහැ. සමහරවිට කෙනෙක් ගැටෙන්න පුළුවන්. නමුත් කවුරු ගැටුණත් ධර්මය අපි ලෝකයේට කියන්න ඕන.

බුදුරජාණන් වහන්සේ දේශනා කරපු ධර්මය අපි ලෝකයේට කියන්න ඕන. නටගාමිණී කියන රංගන ශිල්පියා බුදුරජාණන් වහන්සේ ළඟට එනවා. එයා තමයි එදා දඹදිව හිටපු ලස්සන ම රංගන ශිල්පියා. මේ රංගන ශිල්පියා බුදුරජාණන් වහන්සේ ළඟට ඇවිල්ලා කියනවා, "භාග්‍යවතුන් වහන්ස, අපේ ගුරුවරු අපිට කියලා තියෙන්නේ මේ රූපය උපයෝගී කරගෙන අනුන්ව සතුටු කරන අය, අනුන්ව විනෝද කරන අය මරණින් පස්සේ "පායාස" කියන දිව්‍ය තලයට යනවා කියලා."

බුදුරජාණන් වහන්සේ කියනවා, "**නෑ ගාමිණී, අපි ඔය ප්‍රශ්නෙ ඔතනින් නතර කරමු**" කියලා. ගාමිණී දෙවෙනි වතාවෙත් අහනවා. දෙවෙනි වතාවෙත් බුදුරජාණන් වහන්සේ කියනවා, "**නෑ ගාමිණී, අපි ඔය ප්‍රශ්නය ඔතනින් නවත්තමු**" කියලා. තුන්වෙනි වතාවෙත් අහනවා. ඒත් කියනවා බුදුරජාණන් වහන්සේ, "**නවත්තමු අපි මෙතනින්**" කියලා.

හතරවෙනි වතාවෙ අහද්දි බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, "**ගාමිණී මේ පායාසය කියන්නේ දිව්‍ය තලයක් නෙවෙයි, පායාසය කියන්නේ නිරයක්**" කියලා. එතකොට පායාසය කියන නිරය කියන්නේ කවුරු යන තැනක් ද? මේ රූපය උපයෝගී කරගෙන ලෝකයා තුළ කාමාස්වාදයන් සකස් කරනවා නම්,

ලෝකයා තුළ විනෝදය, හාස්‍යය සකස් කරනවා නම් ඒ අය මරණින් පස්සේ 'පායාස' කියන නිරයට යනවා කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

මම නෙවෙයි කියන්නේ. තේරුණාද? එහෙනම් බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නා වූ ධර්මය අපි දේශනා කළ යුතුයි. මොකද, මේක සමාජයට මේ මොහොතේ බුදුරජාණන් වහන්සේ කරන්නා වූ බලවත් අනතුරු ඇඟවීමක්. තේරුණාද?

ඒ ගමන් ම බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, තමා පෙර පින නිසා ලැබුවා වූ මේ සුරූපී ජීවිතය ඇඳුමෙන් පැළඳුමෙන් හෝ අපි ලෝකයට නිරාවරණය කරනවා නම්, එය අපායගාමී අකුසලයක් කියලා.

එතකොට, අපි දන්නා වූ එක්තරා ස්වාමීන් වහන්සේ නමක් උතුම් සමාධියෙන් අරමුණු කරලා බලලා තියෙනවා, මේ පායාස නිරය කියන්නේ කොයි වගේ තැනක් ද කියලා. ඒ වෙලාවේ ස්වාමීන් වහන්සේ එය දකිනවලු සමාධියෙන්, මේ පායාස නිරයේ ඉන්න නිරිසතුන් ඇටසැකිල්ලක් හැටියටයි උත්පත්තිය ලබලා තියෙන්නේ. එයාට මස් මුහුණක් තියෙනවා, නමුත් ඇටසැකිල්ලක් හැටියට. මස එයාට ලැබිලා නැහැ. ඇයි මස ලැබිලා නැත්තේ? ගිය ජීවිතයේ එයාට ලැබුණා වූ මස, එයා කාමයන් උදෙසා යොමු කළා.

අනුන්ට අකුසලය උදෙසා එයා යොමු කළා. ඒ වගේ ම තව නිරිසතෙක් ඉන්නවා, ඒ පායාස නිරයේ. එයා නෝනා, හමගහපු නිරිසතෙක්. ඔබ මනුස්සයෙක්... හොඳ ශක්තිමත් මනුස්සයෙක් අරගෙන, ඒ ශක්තිමත් මනුස්සයාගේ මේ උඩු හම සම්පූර්ණයෙන් ගලවලා දාන්න. උඩු හම සම්පූර්ණයෙන් ම මූණෙ ඉඳන් උඩු හම ගැලෙව්වාට පස්සේ දැන් ඔබට පේනවා, රතු පාට ලේ තැවරුණු, මස් තැවරුණු, නහර තැවරුණු මේ මස් ගොඩ. අන්න ඒ වගේ හමගැහුවා වූ නිරිසතෙක්. මස ම පිච්චෙනවා. මසම ලෝදියට,

ගින්දරට පිච්චෙමින් මස ම පීඩාවට පත් කරනවා. ඇයි? ශරීරය, මස කියන කාරණය ලෝකයාගේ කාමාස්වාදයන් උදෙසා යොමු කළා.

ඒ නිසා, බුදුරජාණන් වහන්සේ මේක දේශනා කරලා තියෙන්නේ යම් හේතුවක් නිසා ම යි. එහෙනම් අපි දක්ෂ නම් බුදුරජාණන් වහන්සේ දේශනා කළ දේ තෝර ගන්න, නිවැරදි ව අපිත් පායාස නිරය කියන පැත්තට යෑමෙන් අපි වළකිනවා. ඒ නිසා බුදුරජාණන් වහන්සේ මේ දේශනා කරන්නා වූ කාරණය වර්තමාන ලෝකයාට ගොඩාක් වටිනවා. නමුත් අපිට ලෝකය නිවැරදි කරන්න බෑ. මොකද, ලෝකය කියන්නේ දුක කියන කාරණය.

ඒ නිසා ලෝකය මේ මොහොතේ යන දිශාව වෙනස් කරන්න මේ ලෝකයේ කාටවත් බැහැ. ශක්‍රයා ඇවිල්ලා මේ ලෝකයේ පාලකයා වුණත් නැවත මේ ලෝකය වෙනස් කරන්න බැහැ. මොකද, බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, මේ ලෝකය යන්නේ මෘග සංඥාව සකස් වෙන තැනටයි කියලා.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, මෙහෙම ගිහිල්ලා, මෙහෙම ගිහිල්ලා මනුස්සයාගේ පරමායුෂ අවුරුදු 10 යි කියන තැනට එනවා කියලා. බුදුරජාණන් වහන්සේගේ කාලයේ පරමායුෂ අවුරුදු 120 යි. දැන් වෙනකොට ඒක 70 ට වගේ බැහැලා තියෙනවා. එතකොට 120 ඉඳන් 70 කියන්නේ, අවුරුදු 50 ක් ගෙවී ගිය අවුරුදු 2600ට ආයුෂ අඩුවෙලා තියෙනවා. එතකොට මේ ගෙවුණා වූ අවුරුදු 2600 කියන්නේ, මේ ස්වාභාවිකත්වය තුළ ලෝකය ගලාගෙන ආපු අවුරුදු 2600ක්. මේ වසවිෂ, කෘමිනාශක, රසකාරක මේවා තිබ්බේ නැහැ.

නමුත් අදින් පස්සේ බිහිවෙන්නා වූ ලෝකය කියලා කියන්නේ මේ සියල්ලෙන් විකෘති වූ ලෝකයක්. එහෙනම් ඉතුරු

ආයුෂ 50, 60 ගෙවෙන්න තව අවුරුදු 1500 ක් යන්න අවශ්‍ය නැහැ. එහෙනම් පරමායුෂ අවුරුදු 10 යි කියන තැනට ලෝකය තව අවුරුදු 1500 ක් යනකොට පත්වෙනවා. ඒ පරමායුෂ අවුරුදු 10 යි කියන තැනදි බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, මනුස්සයාට මෘග සංඥාව සකස් වෙනවා කියලා. මෘග සංඥාව කියන්නේ මනුස්සයා තව මනුස්සයෙක්ව දකින්නේ මෘගයෙක් හැටියට. මරාගන්නවා කියනවා, කොටා ගන්නවා කියනවා, ලේ වලින් මේ පෘථිවිය තෙමෙනවා කියනවා.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා මෙතෙන්ටයි මේ ලෝකය යන්නේ. එහි බීජ අවස්ථාව තමයි අපි මේ ලෝකය තුළ දකින්නේ. ඒ නිසා මේ ලෝකය... ශක්‍රයා ඇවිල්ලා පාලකයා වුණත් මේ ලෝකය නැවත නිවැරදි කරන්න බැහැ කියලා බුදුරජාණන් වහන්සේගේ ධර්මය අපිට කියනවා. ඒ නිසා ලෝකය අපිට නිවැරදි කරන්න බැහැ. ඒ නිසා අපි ධර්මය තුළ නිවැරදි වෙන්න ඕනය කියන තැනයි අපි සකස් කරගන්න ඕන. ධර්මය තුළ අපි ශක්තිමත් වෙන්න ඕන.

ලෝකය යන දිශාවකට ගියදෙන්. මොකද, ලෝකය යන්නේ දුක දිශාවටයි. තේරුණාද? ඒ නිසා ලෝකය දුක දිශාවට යද්දි අපි ධර්මය දිශාවට එන්න කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. එතකොට අපි ධර්මය දිශාවට එනකොට, සමහරවිට ඔබ හුදකලා වෙන්න පුළුවන්. මොකද, ලෝකය බහුතරයක් යන්නේ එක පැත්තකට. එතකොට ධර්ම මාර්ගයේ යන කෙනා හැම වෙලාවෙ ම, උඩුගම් බලා යන කෙනෙක්. එයා මුහුද පැත්තට ගලාගෙන යන කෙනෙක් නෙවෙයි. එයා උඩුගම් බලාගෙනයි යන්නේ. උඩුගම් බලාගෙන යනකොට අනිවාර්යයෙන් ම එයා මේ සමාජයට අමුත්තෙක් වෙන්න පුළුවන්. එයා මේ සමාජය තුළ හුදකලා වෙන්න පුළුවන්. එයා මේ සමාජය තුළ පිස්සෙක් කියලා එයාව හඳුන්වන්නත් පුළුවන්.

නමුත් ඒ කොයි ආකාරයෙන් සමාජය ඔබව හැඳින්වුවත් ඔබ දක්ෂ වෙන්න ඕන, තමා ළඟ මුළු ලෝකය ම නැතිවුණත් බුදුරජාණන් වහන්සේ ඉන්නවා කියන විශ්වාසය ඇතිකර ගන්න. ඒ නිසා ඒ විශ්වාසය තුළ අපි මේ සංසාර භය දකිමින්. මේසා බරපතළ වූ අනතුරක් අපි ඉදිරියේ තියෙනවා. නේද කියලා දකින්න ඕනෑ. තේරුණාද?

මේ රූපය වැරදි ආකාරයට පරිහරණය කළොත්, ඒ සා බරපතළ වූ වැරදි අනතුරක් තියෙනවා. ඒ නිසා ඒ වැරදි අනතුර දකිමින්, අනතුරෙන් මිදෙන දිශාවට යන එක තමයි අපට කරගන්න තියෙන්නේ.

# දේවතානුස්සතිය වඩන්න. මාර්ගඵල ලාභී දෙවියෙක් දිව්‍යාංගනාවක් වන්න

**විසිභයවන ප්‍රශ්නය :**

**ගෞරවණීය ස්වාමීන් වහන්ස, මනුස්ස ලෝකය දිනෙන්දින අනතුරු බව්න් වැඩි ස්ථානයක් බවට පත්වෙලා තියෙනවා. විශේෂයෙන් ම අකුසලයට බර වූ මිනිස්සුන් නිසා. ඒ අය අපායගාමී වීමට තියෙන්නා වූ ඉඩකඩ වැඩියි. ගරු ස්වාමීන් වහන්ස, මනුස්ස ලෝකයේ පවතින මේ අනතුරින් මිදිලා නිර්වාණය දකින්නට තියෙන හොඳ ම මඟ දේවතානුස්සතිය වඩමින් දිව්‍ය ලෝකයේ සශ්‍රීක දෙවියකු වීමට වීර්ය කිරීම ද?**

**පිළිතුර :**

මෙහෙමයි, මහානාම ශාක්‍ය කියන ශාක්‍යයාට බුදුරජාණන් වහන්සේ දේවතානුස්සතිය කියන එක තනිව දේශනා කරන්නේ නැහැ. පළමුවෙන් ම බුද්ධානුස්සතිය, ධම්මානුස්සතිය, සංඝානුස්සතිය, සීලානුස්සතිය, ත්‍යාගානුස්සතිය, දේවතානුස්සතිය කියලයි කියන්නේ. තේරුණාද?

ඒ කියන්නේ, මෙතනදි බුදුරජාණන් වහන්සේ මහානාම ශාක්‍යයාට උපක්‍රමශීලී ධර්මයක් දේශනා කරන්නේ. උපක්‍රමශීලී ධර්මයක් දේශනා කරනවා කියන්නේ, එයාට බුදුරජාණන් වහන්සේ කියනවා බුද්ධානුස්සතිය වඩන්න; ධම්මානුස්සතිය වඩන්න; සංඝානුස්සතිය වඩන්න. ඊට පස්සේ ත්‍යාගානුස්සතිය. හැකිතාක්

දන් දෙන්න. හැකිතාක් සිල් රකින්න. සීලානුස්සතිය රකිමින් දේවතානුස්සතිය වඩන්න කියනවා.

දේවතානුස්සතිය කියන්නේ මේ සශ්‍රීක දිව්‍ය තලයක, ඔය තුසිතය, යාමය, නිම්මාණරතිය, පරනිම්මිත වසවර්තිය වගේ දිව්‍ය තලයක සශ්‍රීක දෙවියෙක්, දිව්‍යාංගනාවක් වෙනවා කියලා හිතන්න කියනවා. හැම රාත්‍රියක ම නින්දට යනකොට ඒ සශ්‍රීක දිව්‍යාංගනාවක් හිතෙන් මවාගෙන නිදාගන්න කියලා බුදුරජාණන් වහන්සේ කියනවා. ඒ සශ්‍රීක දෙවියෙක්, දිව්‍යාංගනාවක් දිව්‍ය ඕජාවෙන් විඳින්නා වූ සැපයන්, නුවණින් දකිමින් ජීවත් වෙන්න කියලා කියනවා. එවැනි දෙවියෙක් දිව්‍යාංගනාවකගේ ආලෝකමත් භාවය, ප්‍රභාශ්වර භාවය නුවණින් දකිමින්, ඒ දෙවියන් විඳින්නා වූ මහේශාක්‍ය බව, සශ්‍රීක බව නුවණින් දකිමින් ජීවත් වෙන්න කියල කියනවා.

මේකෙන් බුදුරජාණන් වහන්සේ උත්සාහ ගන්නේ දෙවියා කියන තැන සැප තියෙනවා කියන කාරණයේ අපේ සිත පිහිටුවන්න නෙවෙයි. තේරුණාද? එහෙම නැත්නම් දිව්‍ය තලයක ගිහිල්ලා උපදින්න කියන කාරණය තුළ හිත පිහිටුවන්න නෙවෙයි, බුදුරජාණන් වහන්සේ මේක කරන්නේ. මෙතනදි බුදුරජාණන් වහන්සේ මේ දෙවියා කෙරෙහි අපි තුළ තෘෂ්ණාවක් සකස් කරවනවා. දෙවියා කෙරෙහි, දිව්‍යතල කෙරෙහි බුදුරජාණන් වහන්සේ අප තුළ තෘෂ්ණාවක් සකස් කරවනවා.

දැන් ඔබ මේක අහලා, "නෑ මමත් දිව්‍යාංගනාවක් වෙනවා" කියලා චිත්තයක් ඇතිකර ගන්න. දෙවියෙක් වෙන්න උපාදානය ඇතිකර ගන්න. තෘෂ්ණාවක් ඇතිකර ගන්න. එහෙම ඇතිකර ගත්තට පස්සේ ඔබ මොකක්ද කරන්නේ? වැඩි වැඩියෙන් තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව තුළ ඉන්නවා; වැඩි වැඩියෙන් සිල් රකිනවා; වැඩි වැඩියෙන් දන් දෙනවා. ඇයි මේවා කරන්නේ? අනිවාර්යයෙන් ම දිව්‍යාංගනාවක්, දෙවියෙක් වෙන්න.

එතකොට එතන තමයි උපාදානය බුදුරජාණන් වහන්සේ තියන්නේ. එතන උපාදානය ඇතිකරලා බුදුරජාණන් වහන්සේ මොකද කරන්නේ? මේ කාරණා තුන වැඩි වැඩියෙන් වඩවනවා. මේ කාරණා තුන වැඩි වැඩියෙන් වඩන්න, වඩන්න ඔබ ඉබේ ම සෝවාන් ඵලය කියන තැනට පත්වෙනවා. ඒ අවසානෙදි මොකක්ද, දෙවියාව ඉලක්ක කරලා සෝවාන් මාර්ගය තමයි බුදුරජාණන් වහන්සේ අපි තුළින් වැඩෙව්වේ.

ඒ නිසා දේවතානුස්සතිය වඩනවා කියන්නේ සශ්‍රීක දෙවියෙක්, දිව්‍යාංගනාවක් වෙනවා'යි කියන තැන හිත පිහිටුවන්න. එතන හිත පිහිටලා විතරක් වැඩක් නැහැ. එතන හිත පිහිටලා එතන සපුරාගන්න නම් මෙතනින් තෙරුවන් කෙරෙහි වූ ශ්‍රද්ධාවත්, සීලානුස්සතියත්, ත්‍යාගානුස්සතියත් දක්ෂ ආකාරයෙන් වඩන්න ඕන.

ඉතින් අපි දක්ෂ නම් මේ කාරණා තුන වඩමින් කල්‍යාණ මිත්‍ර ආශ්‍රය ලබමින්, සද්ධර්මය ශ්‍රවණය කරමින්, නුවණින් මෙනෙහි කරමින් ඉස්සරහට යන්න, එයා කවදා හරි තමන් උපාදානය කරගත්තා වූ දේවතානුස්සතියත් අනිත්‍යයි කියලා දකිනවා. දැකලා එයා සෝවාන් ඵලයට, මාර්ගඵල ලාභී දෙවියෙක්, දිව්‍යාංගනාවක් කියන තැනට එනවා.

ඒ නිසා බුදුරජාණන් වහන්සේ එතන දේවතානුස්සතිය කියන කාරණය අපිට ඉලක්ක කරන්නේ මේ කාරණා තුන වැඩි වැඩියෙන් වඩවන්න. මේවා තුන වැඩි වැඩියෙන් වඩද්දි එයා කල්‍යාණ මිත්‍ර ආශ්‍රයත් ලබමින්, සද්ධර්ම ශ්‍රවණයත් කළොත් අනිවාර්යයෙන් ම මේ සංස්කාරයන්ගේ අනිත්‍ය භාවය දැකලා එයා දේවතානුස්සතියේ තියෙන අනිත්‍ය භාවයත් දකිනවා. දැකලා එයා මාර්ගඵල ලාභී දෙවියෙක්, දිව්‍යාංගනාවක් තමයි වෙන්නේ.

# ලෝකය පාලනය කරන්නේ දෙවියෙක් ද? බ්‍රහ්මයෙක් ද?

**විසිහත්වන ප්‍රශ්නය :**

**ගෞරවණීය ස්වාමීන් වහන්ස, සශ්‍රීක දිව්‍ය තලවල ඉන්නා වූ දෙවියන් හා මනුෂ්‍යයින් අතර තිබෙන සබඳතාවය කොයි ආකාරයි ද ස්වාමීන් වහන්ස?**

**පිළිතුර :**

මෙහෙමයි. බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවකයෙක් ඉන්නවා, කුමාර කාශ්‍යප මහරහතන් වහන්සේ කියලා. අසූ මහා ශ්‍රාවකයින් වහන්සේ නමක්. උන්වහන්සේ කියනවා, සශ්‍රීක දිව්‍ය තලවල ඉන්න දෙවියන්, ඒ කියන්නේ තුසිතය, යාමය, නිම්මාණරතිය, පරනිම්මිත වසවර්තිය, තාවතිංසය වගේ මේ සශ්‍රීක දිව්‍ය තලවල ඉන්න දෙවියන් නිරතුරුව ම මනුස්සයාට යොදුන් සියයක් ඈතින් ඉන්නේ කියලා. මොකද, ඒගොල්ලෝ යොදුන් සීයකට මෙහාට එන්නේ නැහැ. මොකද, මනුස්සයාගේ ගඳ ඒගොල්ලන්ට උහුලන්න බැහැ කියනවා.

මේ මනුස්සයාගේ ගඳ කියන්නේ දහදිය ගඳ නෙවෙයි. දුශ්ශීල භාවයේ ගඳ. තේරුණාද? දූන් දෙවියන්ට ඕන නම් මෙතන ඉඳන් මේ අපි කියන්නා වූ ධර්මය දිව්‍ය ශ්‍රෝත වලින් අහන්න පුළුවන්; දිව්‍ය චක්ඛු වලින් අපි මේ කියන දේ ඒගොල්ලන්ට දකින්න පුළුවන්. ඉතින් එහෙම දකිමින් මේ පින දූකලා ඒගොල්ලෝ සතුටු

වෙන්නත් පුළුවන්. හැබැයි කවදාක්වත් මේ සශ්‍රීක දිව්‍ය තලවල ඉන්න දෙවියන්ට අපේ පින අවශ්‍ය වෙන්නේ නම් නැහැ. මොකද, ඒගොල්ලෝ පිනෙන් ආඪ්‍යයි. නමුත් ඒගොල්ලෝ පිනට කැමතියි.

දැන් එක සැරයක් ස්වාමීන් වහන්සේ නමක් ධර්ම දේශනාවක් පවත්වන්න ගිහිල්ලා යම් හේතුවක් නිසා ඒ ධර්ම දේශනාව පැයක් විතර ප්‍රමාද වෙලා තියෙනවා. ඉතින් ඒ වෙලාවේ උන්වහන්සේ යම් ස්ථානයක ඉඳලා හිත සමාධිමත්ව ඉන්න වෙලාවේ උන්වහන්සේට පේනව ලු මේ ආකාසේ වලාකුළක් මත බාගෙට එරමිණියා ගොතාගත්ත... එක කකුලකින් එරමිණියා ගෙතිලා තියෙනවා. අනිත් කකුල පල්ලෙහාට වැටිලා තියෙනවා. ඒ ස්වභාවයෙන් ලස්සන, සුරූපී දෙව් කෙනෙක් ඉන්නවා. එයා ලස්සන සුදු පාට, නිල් පාට වගේ ලස්සන ඔටුන්නක් පැළඳගෙන, එයා මෙහෙම සාධුකාර දීගෙන බලන් ඉන්නවා, ඒ ස්වාමීන් වහන්සේ දැකලා තියෙනවා. ඒ කියන්නේ ඒ දෙවියා මේ ධර්මය අහන්නයි මේ ලෑස්ති වෙන්නේ.

ඉතින් ඒ වගේ දෙවිවරුත් මේ මගේ ධර්ම දේශනා විතරක් නෙවෙයි ඕනෑ ම ස්වාමීන් වහන්සේ කෙනෙක්ගේ, ඒ ස්වාමීන් වහන්සේලා සීලයෙන් පරිපූර්ණ නම්, ඒ කියන්නා වූ බුදුබණ අවංකව දේශනා කරනවා නම්, ඒ ඕනෑ ම ස්වාමීන් වහන්සේ කෙනෙක්ගේ සද්ධර්මය දෙවියන් ශ්‍රවණය කරනවා.

දෙවියන් විතරක් නෙමෙයි. සමහර පරදත්තරූප ජීවී ප්‍රේත, පිනට කැමති ප්‍රේත කොටසුත් ධර්මය ශ්‍රවණය කරනවා. මොකද, ස්වාමීන් වහන්සේ නමක් දවසක් ඈත ගමක එළිමහන් තණ පිටියක වගේ තැනක ධර්මයක් දේශනා කරලා රාත්‍රියේ, උන්වහන්සේ ගිහිල්ලා සැතපුණාට පස්සේ උන්වහන්සේට සමාධියෙන් පෙනිලා තියෙනවා, ඒ ධර්මය දේශනා කරපු තැන, මේ ප්‍රේත පවුල් දෙකක් වාඩිවෙලා ඉන්නවා. ප්‍රේත පවුල් දෙකක්. ඒ ප්‍රේත පවුල් දෙක පරදත්ත රූපජීවී ප්‍රේත පවුල්. ඒ කියන්නේ ඒගොල්ලෝ විකෘතියක් නෑ. හොඳට ඇඳුම් පැළඳුම් තියෙන ප්‍රේත පවුල්. එතකොට මේ ස්වාමීන් වහන්සේ උතුම් සමාධියෙන් ම අහලා තියෙනවා,

"ඔබලා ඇයි මෙතන ඉන්නේ?" කියලා. එතකොට ඒගොල්ලෝ මොකක්දෝ භාෂාවකින් යමක් කියලා තියෙනවා.

එතකොට දැන් මේ මේගොල්ලෝ මෙතන ඉන්නේ මොකද? නැවත බණ කියාවි කියලා තමයි, මේගොල්ලෝ මෙතෙන්ට වෙලා වාඩිවෙලා ඉන්නේ. එතකොට දෙවියා විතරක් නෙමෙයි. පරදත්ත රූපජීවී ප්‍රේත කොටස් වල බණ අහන්න කැමති ප්‍රේත කොටසුත් ඉන්නවා.

නමුත් ඉතින් සශ්‍රීක දිව්‍ය තලවල දෙවිවරුන් නම් මනුස්සයොත් එක්ක එච්චර ඇසුරට එන්නේ නැහැ. මොකද, ඒගොල්ලෝ කාමයන් තුළ, මහා සැපයන් තුළ ජීවත් වෙන්නේ. ඒ සැපයන් තුළට මේගොල්ලෝ ගොනුවෙලා ඉන්නවා මිසක් මනුස්ස ලෝකය ආශ්‍රිත කටයුතුවලට සශ්‍රීක දිව්‍ය තලවල දෙවියෝ එන්නේ නැහැ.

නමුත් මනුස්ස ලෝකය ආශ්‍රිතව ජීවත්වන දෙවිවරුත් ඉන්නවා. ඔය අපි කියන්නේ කතරගම දෙවියෝ, මහසෙන් දෙවියෝ, සමන් දෙවියෝ වගේ දෙවිවරු ඉන්නේ. ඒගොල්ලෝ මනුස්ස ලෝකය ආශ්‍රිතව මේ මනුස්ස ලෝකය උපාදානය කරගෙන මනුස්ස ජීවිත ගත කරලා දේවත්වයට පත්වෙච්ච අය.

ඊට අමතරව මේ ගම්මාන ආශ්‍රිතව ජීවත් වන දෙවිවරුත් ඉන්නවා. පින් කරලා ඒ පන්සල උපාදානය කරලා මැරිලා, ගම උපාදානය කරගෙන මැරිලා ගමේ ම දෙවියන් වූ සාමාන්‍ය මහේශාක්‍ය, අල්පේශාක්‍ය දෙවිවරුත් ඉන්නවා. නමුත් සශ්‍රීක දෙවිවරු නම් නෝනා, කවදාක්වත් පල්ලෙහාට, මනුස්ස ආශ්‍රයට එන්නේ නැහැ කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

නමුත් බුදුරජාණන් වහන්සේගේ කාලේ, රහතන් වහන්සේලාගේ කාලේ දෙවිවරු නිතර ම ඇවිල්ලා බුදුරජාණන් වහන්සේගෙන් ධර්මය අහලා, රහතන් වහන්සේලාගෙන් යම් යම් ප්‍රශ්න අහලා ඒ කටයුතු විසඳගත්ත අවස්ථා ඕන තරම් තියෙනවා.

**අතුරු ප්‍රශ්නය :**

**ස්වාමීන් වහන්ස, මනුස්සයින් සිල්වත් බවින් ඈත් වෙන කොට දෙවියනුත් මිනිසුන් කෙරෙන් ඈත් වෙනව ද?**

**පිළිතුර :**

නෑ නෑ, එහෙම දෙයක් නෑ. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, මනුස්සයා දුශ්ශීල වෙන්න, දුශ්ශීල වෙන්න දෙවියාත් දුශ්ශීල වෙනවා කියලා. දෙවියන් දුශ්ශීල වෙලා, දෙවියන් වැරදි වැඩ කරන අයට උපකාර කරනවා කියනවා. මොකද, ඒගොල්ලෝ තුළත් කාමයන් සකස් වෙනවා. කාමරාග, පටිඝයන් තුළ දෙවියෝ ඉන්නේ. තේරුණාද? මාර්ගඵල ලාභී දෙව්වරු තමයි මේ තත්වෙට වැටෙන්නේ නැත්තේ.

මාර්ගඵල ලාභී නො වන, සෑම දෙවියෙක් ම කාමරාග, පටිඝයන් තුළ ජීවත් වෙන්නේ. 'සක්කායදිට්ඨි - විචිකිච්ඡා - සීලබ්බතපරාමාසයන් තුළයි ජීවත් වෙන්නේ. ඒ නිසා ඒගොල්ලෝ උඩ ඉඳන් මේ මනුස්ස ලෝකයේ වෙන දේවල් දකින කොට ඒගොල්ලොත් දුශ්ශීල වෙනවා කියනවා. දුශ්ශීල වෙලා, දුශ්ශීල වෙද්දි ඒගොල්ලෝ තුළ කාමරාග, පටිඝයන් ඇති වෙලා අකුසල් සිද්ධ වෙන කොට ඒගොල්ලොත් දිව්‍ය තලවලින් චුත වෙලා, පල්ලෙහාට වැටෙනවා.

ඒ මාර්ගඵල ලාභී දෙවියන් මේ අනතුරට ලක්වෙන්නේ නැහැ. මොකද, ඒගොල්ලෝ පංච උපාදානස්කන්ධයේ අනිත්‍ය භාවය දැකලා, සීලයෙන් ඒගොල්ලෝ පරිපූර්ණ වෙලයි ඉන්නේ. නමුත් ඉන් මෙහා ඉන්න සෑම දෙවියෙක් ම, බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, මනුස්ස ලෝකය පිරිහෙන්න, පිරිහෙන්න ඊට සාපේක්ෂව ඒගොල්ලොත් ශීලයෙන් පිරිහෙනවා කියලා. පිරිහුණාට පස්සේ ඒගොල්ලො පල්ලෙහාට වැටෙනවා.

**අතුරු ප්‍රශ්නය :**

**ස්වාමීන් වහන්ස, දෙවියන් ස්වභාව ධර්මය පාලනය කරනවා ද?**

**පිළිතුර :**

දෙවියො සොබාදහම පාලනය කරන්නේ නැහැ. සොබාදහම කියන්නේ මේ සතර මහා ධාතුවෙන් පාලනය වෙන දෙයක්. තේරුණා ද? දෙවියන්ට ලෝකයක් පාලනය කරන්න බැහැ. ලෝකය පාලනය කරන්න දෙයක් නැහැ.

ලෝකය පාලනය වෙන්නේ මේ සතර මහා ධාතුවෙන් ම යි. වෙන දෙයක් නෙවෙයි. සතර මහා ධාතුවට ලෝකය පාලනය කරන්න බැහැ. සතර මහා ධාතුවේ ස්වභාවය තමයි නිරතුරුව ම වෙනස්වීමට ලක්ලක්වීම සතර මහා ධාතුවේ වෙනස්වීම තමයි මේ පාලනයක්, පාලකයෙක් කියලා අපි දකින්නේ.

ලෝකය පාලනය කරන්නේ දෙවියෙක්, බ්‍රහ්මයෙක් කවුරුවත් නෙවෙයි. තේරුණාද? ඒගොල්ලොත් සතර මහා ධාතුවෙන් හැදුණා වූ අය ම යි. පඨවි, ආපෝ, තේජෝ, වායෝ. මොකද, දෙවියාටත් මනුස්සයාට වගේ කයක් තියෙනවා. බ්‍රහ්මයාටත් මනුස්සයාට වගේ කයක් තියෙනවා. නමුත් ඒක සියුම් කයක්. අපේ මස් ඇහැට පේන කයක් නෙවෙයි. ඒක කවදාහරි සමාධියෙන් අපි දෙවියා දකිද්දි මේ මනුස්සයෙක්, අර රජ කෙනෙක් වගේ තමයි දෙවියාගේ ස්වභාවය දකින්නේ.

ඒ නිසා එයාටත් කයක් තියෙනවා. ඒ කය ඇවිල්ලා සතර මහා ධාතුව ම යි. ඉතින් ඒ සතර මහා ධාතුවේ ස්වභාවය අනිත්‍යයි. මෙන්න මේ අනිත්‍යයි කියන ධර්මතාවය තමයි මේ ලෝකයේ පාලකයා. වෙන කවුරුත් නැහැ.

# රතිඤ්ඤා දැල්වීමෙන් අකුසලයක් සිදුවේද?

**විසිඅටවන ප්‍රශ්නය :**

**ගෞරවණීය ස්වාමීන් වහන්ස, උත්සව අවස්ථාවල දී රතිඤ්ඤා, මල් වෙඩි පත්තු කිරීම සිද්ධ වෙනවා. මේ නිසා අපට නො පෙනෙන ලෝකයේ ජීවත් වන අමනුෂ්‍යයින් දුකට පත්වෙනව ද ස්වාමීන් වහන්ස?**

**පිළිතුර :**

ඒක මනුස්සයන්ගේ සතුට. බලාපොරොත්තු වන සතුට එක එක්කෙනා එක එක ආකාරයෙන් ඒ සතුට ප්‍රකාශයට පත් කරනවා. ඉතින් අපිට ඒකට කාටවත් දොස් කියන්න නම් බැහැ. මම කාටවත් ඒක වැරදියි කියලා කියන්නෙත් නැහැ. එපා කියලා කියන්නෙත් නැහැ.

මොකද, මේවා අපිට නිවැරදි කරන්න කවදාක්වත් බැහැ. මම කිව්වා ලෝකය යන්නේ දුක දෙසටයි. ලෝකය යන්නේ අකුසලය දෙසටයි. ලෝකය යන්නේ අර පරමායුෂ අවුරුදු දහයයි කියන, මෘග සංඥාව කියන තැනටයි. එහෙනම් ලෝකය යන ගමන වෙනස් කරන්න අපිට බැහැ. නමුත් ලෝකය යන ගමන වෙනස් කරන්න බැරිවුණත් ලෝකය තුළ වෙන්නා වූ දේ ගැන බුදුරජාණන් වහන්සේ අපිට ධර්මය තුළින් පැහැදිලි කරලා දීලා තියෙනවා.

ඒ නිසා, අපි යම් හෙයකින් දෙසැම්බර් 31 සහ සිංහල අවුරුදු වගේ රාත්‍රියක මුළු රට ම හෙල්ලිලා යන ආකාරයට රතිඤ්ඤා පත්තු කිරීම නිසා එක පැත්තකින් තිරිසන් ලෝකයේ ඉන්න සත්තු අප්‍රමාණ දුකට පීඩාවට පත්වෙනවා. තේරුණාද? බල්ලෙක්, පූසෙක්, හරකෙක් ගත්තත්, මහ පාරවල්වල දුවමින්, තැන් තැන්වල හැංගෙමින් ඒ පැය පුරාවට පුදුමාකාර ද්වේශයක්, බයක් ඒ සත්තුන්ට සකස් වෙනවා. එතකොට ගහකොළවල ඉන්න සිව්පාවුන්, එතනින් ගියාම කුරුල්ලෝ බලන්න. බිත්තර දාලා ඉන්න කුරුල්ලෝ, පැටව් දාලා ඉන්න කුරුල්ලෝ අප්‍රමාණ පීඩාවට පත්වෙනවා. ඒ බිත්තර විනාශ වෙලා ඒ සත්තු රෑ බයට ඉගිල්ලිලා වෙන සත්තුන්ගේ ගොදුරු බවට පත්වෙලා එතනින් විනාශ භාවයට පත්වෙනවා.

ඒවාගේ මේ මනුස්ස ලෝකය ආශ්‍රිතව, අප්‍රමාණ ප්‍රේතයෝ ජීවත් වෙනවා. සමහර විට මනුස්සයෝ දහදෙනෙක් ඉන්න තැන ප්‍රේතයෝ සීයක් ඉන්න පුළුවන්. ඒතරම් ප්‍රේත ජනගහනය ලෝකයේ වැඩියි. එවැනි ප්‍රේතයින් මේ පුපුරන පිපිරිල්ල හමුවේ විනාශයට පත්වෙන්න පුළුවන්. තේරුණාද? ඒගොල්ලන්ටත් ඕලාරික කයක් තියෙනවා. ඒගොල්ලොත් මේ රතිඤ්ඤා හඬ නිසා රතිඤ්ඤා පිපුරුමට බයෙන් ඒගොල්ලොත් විනාශයට පත්වෙන්න පුළුවන්.

එතනින් ගියාම මේ මනුස්ස ලෝකය ආශ්‍රිතව රුක් දෙවිවරු, භූමාටු දෙවිවරු වගේ මෙවැනි දෙවිවරු අප්‍රමාණව ජීවත් වෙනවා. එතකොට මේ දෙවිවරුත් විනාශයට ලක් වෙන්න පුළුවන්. විනාශ නො වුණත් මේගොල්ලෝ තුළ ද්වේශ සිත් ඇතිවෙන්න පුළුවන්.

එතකොට කිරි දරුවෙක් ගන්න. ගෙදරක ඉන්න අවුරුද්දක්, දෙකක්, මාස හයක් වයස කිරි දරුවා. මේ කිරි දරුවා වුණත් එදා රෑ දහයේ ඉඳන් පහුවදා උදේ වෙනකම් අඬමින්, කෑගහමින්, බෙරිහන් දෙමින් තමයි ඉන්නේ. මොකද, ඒ දරුවා බිය නිසා ම කෑගහනවා මේ සද්දෙට. ඒ වගේ ම රතිඤ්ඤා එකක් පත්තු කරන කෙනා බලන්න. එයා රතිඤ්ඤා එකක් පත්තු කරලා එයා එතන ඉන්නවද? එයත් පැනලා දුවනවා. ඒ කියන්නේ එයත් මර බයේ

තමයි රතිඤ්ඤා එක පත්තු කරලා පැනලා දුවන්නේ. ඒ කියන්නේ එයත් බය වෙලයි එදා රෑ ඉන්නේ.

එතකොට මෙහෙම බැලුවහම මේ 31 වෙනිදා රාත්‍රිය කියන්නේ මුළු ලෝකයා ම බියට පත් කරන්නා වූ රාත්‍රියක්. අසහනයට, වේදනාවට පත් කරන්නා වූ රාත්‍රියක්; මරණීය බයට පත් කරන්නා වූ රාත්‍රියක්. ඒ වගේ ම අප්‍රමාණ සත්ත්වයින් මැරෙන රාත්‍රියක්.

එදා පත්තු වෙන රතිඤ්ඤා ගොන්නට කුඹි, කඩි වගේ මේ පොළව ආශ්‍රිතව ජීවත් වන කෘමි සත්තු කී ලක්ෂයක් මැරෙන්න ඇත්ද කියලා හිතන්නකො. ඒ නිසා දෙසැම්බර් 31 රාත්‍රිය ඉවර වෙලා ජනවාරි 01 වෙනිදා උදෑසන ලබන්නේ, අප්‍රමාණ අකුසල් කන්දරාවක් මනුස්සයා සිද්ධ කරගෙන. එක පැත්තකින් තිරිසන් සත්තු බියට පත්වෙනවා. එක පැත්තකින් ළමා ළපටි බියට පත්වෙනවා. එක පැත්තකින් මේ කෘමි සතුන් බියට පත්වෙනවා. එක පැත්තකින් මේ ප්‍රේත කොටස්, දිව්‍ය කොටස් බියට පත්වෙනවා; විනාශ භාවයට පත්වෙනවා.

ඉතින් මේ සියලු අඥෝනාවන්, මේ සියලු බිය මුසු කරගෙනයි අපි ජනවාරි 01 වෙනිදා උදෑසන ලබන්නේ. ඒ නිසයි මම කියන්නේ, දෙසැම්බර් 31 වෙනිදා රාත්‍රිය මේ වගේ මේ කටුක, භය උපදවන රාත්‍රියක් ලෝකයා තුළ. ඒ නිසා අපි පටන්ගන්න අවුරුද්දේ පළමුවෙනි දවස මේ සා මනුස්සයා බියට පත් කරගෙන නම් සකස් කරන්නේ, ඒ ලබන්නා වූ අවුරුද්ද කවදාකවත් අපිට යහපත් අවුරුද්දක් වෙන්නේ නැහැ.

ලබන්නා වූ සෑම අවුරුද්දක් ම හැම අවුරුද්දකට ම වඩා අයහපත් අවුරුද්දක් හැටියටයි අපි දැන් ලෝකයේ දකින්නේ. විනාශයන් වැඩියි, අනතුරු වැඩියි, අපරාධයන් ගොඩාක් වැඩියි. ලබන, ලබන අවුරුද්ද පෙර අවුරුද්දට වඩා දුර්වල අවුරුද්දක් බවටයි පත්වෙන්නේ. තේරුණාද?

ඒ නිසා අපි යම් හෙයකින් පිරිතක් සජ්ඣායනා කරනකොට, පිරිත් දේශනාවක් සජ්ඣායනය කරන කොට ඒ පිරිත් සජ්ඣායනය තුළින් හැම සත්ත්වයෙක් ම සතුටු වෙනවා. ඒ කියන්නේ අහන කෙනාත් සතුටු වෙනවා; දෙවියනුත් සතුටු වෙනවා; අමනුෂ්‍යයිනුත් සතුටු වෙනවා; තිරිසන් සතාත් සතුටු වෙනවා.

අර වගේ කටුක රතිඤ්ඤා ශබ්දයකින් එය අහන, දකින හැම කෙනා ම බියටයි පත්වෙන්නේ. ඒ බිය කියන්නේ තමනුත් අකුසලය තුළ ජීවත් වෙලා ලෝකයාත් අකුසලය තුළට යනවා. ඒ නිසා අපි දක්ෂ නම්, 31 වෙනිදා රාත්‍රියේ ශබ්ද පූජාවක් කරන්න අවශ්‍ය නම් අපි හේවිසි පූජාවක්, මඟුල් බෙර පූජාවක්, නැත්නම් පන්සලේ සාණ්ටාරෙ හඬවන්න අපිට පුළුවන්. මෙවැනි තැනකින් කවදාක්වත් සත්ත්වයාට පීඩාවක්, බියක් සකස් වෙන්නේ නැහැ.

මුළු ලංකාවෙ ම, මුළු පල්ලිවල ම, මුළු කෝවිල්වල ම තියෙන සීනු ටික එදා රාත්‍රියේ 12 ට නාද කළොත් කොතැනකවත් මනුස්සයෙක් බියට පත්වෙන්නේ නැහැ. එම හඬ අහලා දෙවියනුත් සාධුකාර දෙයි; මනුස්සයොත් සාධුකාර දෙයි; අමනුස්සයොත් ප්‍රියවෙයි; තිරිසන් සතුනුත් ප්‍රිය වෙන තැනට පත්වෙයි.

නමුත් මේ තැනට ලෝකයේ කවදාකවත් එන්නේ නැහැ. තේරුණාද? මේ කියපු දේවල් වලින් එක දශමයක්වත් ලෝකයේ නිවැරදි වෙයි කියලා මම බලාපොරොත්තු වෙන්නේ නැහැ. ඒක තමයි ලෝකය කියන්නේ. නමුත් ලෝකය නිවැරදි වෙයි කියලා බලාපොරොත්තු වෙන් කියන දෙයක් නෙවෙයි මේක. ඇත්ත මේකයි කියලා කියන දෙයක් පමණයි.

ඉතින් මේ කියන දේ අහලා ලක්ෂයකින් දහදෙනෙක් හරි තීරණය කළොත් මේ කතාව ඇත්තයි කියලා, ඒ දහදෙනාට යහපතක් වෙයි.

## "වැරදි කරන අය හොඳින් ඉන්නවා. හොඳ වැඩ කරන අය දුකට පත්වෙනවා" ද?

**විසිනවවන ප්‍රශ්නය :**

**බුදුරජාණන් වහන්සේ දේශනා කරලා තිබෙනවා, නො කළ යුතු කර්මාන්ත පිළිබඳව. ගෞරවණීය ස්වාමීන් වහන්ස, මෙම නො කළ යුතු කර්මාන්තවලට සම්බන්ධ වන්නන්ට විඳින්නට වන විපාක මොනවද?**

**පිළිතුර :**

ඒවා අපි මේ දකින්නා වූ..., සමාජයේ දකින්නා වූ මේ සංකීර්ණ භාවය, මේ සමාජයේ තියෙන්නා වූ මේ ප්‍රශ්න, කම්කටොළු, පීඩන, ඔය ඔක්කෝම ඕවායේ ඵලයන් තමයි. බුදුරජාණන් වහන්සේ මිච්ඡා ආජීවය කියන සිල්පදයක් දේශනා කරනවා. මිච්ඡා ආජීවය කියන්නේ ඔය මස්මාංශ වෙළඳාම් කරන්න බැහැ; මත්පැන් වෙළඳාම් කරන්න බැහැ; වහල් වෙළඳාම, සතුන් වෙළඳාම කරන්න බැහැ; වසවිෂ වෙළඳාම් කරන්න බැහැ; වෙඩි බෙහෙත්, තුවක්කු, අවිආයුධ වෙළඳාම් කරන්න බැහැ.

ඉතින් ඕවා සමාජය තුළ වැඩි වෙන්න, වැඩි වෙන්න, අනිවාර්යයෙන් ම සමාජය තුළ ප්‍රචණ්ඩත්වය, එහෙම නැත්නම් දුශ්ශීල භාවය ම යි වැඩිවෙලා යන්නේ. තේරුණාද? ඉතින් ඕවා නිසා ගන්නා වූ ආදායම් තුළින් යැපෙන්නා වූ යම් යම් පිරිස්, ආදායම් බදු තුළින් යම් දේවල් ලැබෙන්නා වූ පිරිසුත් අනිවාර්යයෙන්ම විකෘති

මානසිකත්වයන්ට ම යි යන්නේ. ඒගොල්ලොත් ශීලයෙන් දුර්වල භාවයටයි පත්වෙන්නේ; ශ්‍රද්ධාවෙන් දුර්වල භාවයටයි පත්වෙන්නේ.

ඒ නිසා කොතැනක හරි අපි මිච්ඡා ආජීවයක් සිද්ධ කරනවා නම් ඒ මිච්ඡා ආජීවය තුළින් ලැබෙන්නා වූ ආනිශංසය, අපිව අන්ත අකුසලයක් කරා ම යි අරන් යන්නේ. එහි ඵලයක් තමයි අපි මේ සමාජය තුළින් දකින්නේ. ඉතින් ඒවායින් හොඳ ආදායම් මාර්ග සකස් වෙන්න පුළුවන්. නමුත් ආදායම් මාර්ග සකස් වෙන ප්‍රමාණයට, විනාශය කරායි සමාජය ගමන් කරන්නේ. මනුස්සයා විකෘතියක් බවට පත්වෙනවා. මොකද, මෙතන ශීලයෙන් දුර්වල වෙනවානේ. සීලයෙන් දුර්වල වෙනකොට එක පැත්තකින් සිහි මුළාවට පත්වෙච්ච මනුස්සයෝ තමයි බිහිවෙන්නේ.

අපි කියමු, දැන් මේ ජීවිතයේ කවුරු හරි මත්පැන් විකුණනවා කියලා. ඉතින් මත්පැන් විකුණුවාට පස්සේ ඒ මත්පැන් විකුණපු කෙනා පින්කම් කරනවා; දන් දෙනවා; පන්සලට දන් දෙනවා; වෙසක්, පොසොන් කාලෙට දහස් ගණනකට දන් දෙනවා. ඉතින් මෙයා මුළු ජීවිතයේ ම කරන්නේ අරක්කු විකුණන එක. නමුත් අරක්කු විකුණලා මෙයා මැරෙන වෙලාවේ, මෙයා අර කළා වූ පින්කමක් මතක් වෙනවා; දුන්නා වූ දානයක් සිහිපත් වෙනවා. දුන්නා වූ දානයක් සිහිපත් වෙලා ඔන්න මනුස්සයෙක් බවට පත්වෙනවා. මොකක් හෝ පින්කමක් උපාදානය වෙලා මනුස්සයෙක් බවට පත්වුණා.

නමුත් ගිය ජීවිතයේ මොකක්ද කළේ? අරක්කු විකුණුවා. මුළු ජීවිතයේ ම වයින් ස්ටෝර්ස් තමයි කළේ. නමුත් මේ දරුවා දැන් මනුස්ස ජීවිතයක් ලැබුවා. නමුත් මේ දරුවා මනුස්ස ජීවිතයක් ලැබුවා ම ඉස්කෝලෙ යන කාලෙ පටන් බොන්න පුරුදු වෙනවා.

සමහර අම්මලා ඇවිල්ලා අපිට කියනවා, "අනේ හාමුදුරුවනේ අපේ දරුවට වයස 16 යි. ඉස්කෝලෙ යනවා. අනේ මේ ළමයා මත්පැන් බොනවා" කියලා. ඒ මොකක්ද ඒ? පෙර

ජීවිතයේ වයින් ස්ටෝර්ස් මුදලාලිලා ඔය. එතකොට එහි විපාක හැටියට මේ ජීවිතයේ ළමා කාලෙදි ම එයා බොන්න පුරුදු වෙනවා; බේබද්දෙක් වෙනවා. දැන් බේබද්දෙක් වෙලා, දැන් ඔන්න බීලා බීලා විනාශ වෙලා, අවුරුදු 25 දි විතර ඔන්න කසාදයක් බඳිනවා. එයා දැන් කසාදයක් බඳිනකොට එයාට නෝනා කෙනෙක් ලැබෙනවා. ඒ නෝනා හැමදා ම අර මහත්තයා බීගෙන ආවහම ගුටි කනවා. සල්ලි නෑ. එක්කො ඇඳ යට රිංගනවා එනකොට. ඔක්කෝම ගුටිකනවා. ඒ පුදුමාකාර මානසික පීඩනයක් ඒ කාන්තාව විඳිනවා.

දැන් අපි බලන්න, අපේ රටේ සමහර පවුල් ඉන්නවා, මහත්තයාගේ බීමත් භාවය නිසා අප්‍රමාණ නිරාදුක් විඳින කාන්තාවෝ මේ රටේ ඉන්නවා. ඒ කර්ම ඵලයක්. ඒ කර්ම ඵලය මොකක් ද? ඒ නෝනා, ගිය ජීවිතයේ වයින් ස්ටෝර්ස් මුදලාලි කෙනෙක්ගේ නෝනා කෙනෙක්.

දැන් අපි හිතමු, මේ ජීවිතයේ මිච්ඡා ආජීවයෙන් ජීවත්වන වයින් ස්ටෝර්ස් එකක මුදලාලි කෙනෙක්ගේ නෝනා කෙනෙක් ඉන්නවා කියන්නකෝ. ඒ නෝනා මහා සැපයක්නේ විඳින්නේ. එයා ඒ සැපය විඳින්නේ කුමක් නිසා ද? දහස් ගාණකට මේ පැත්තෙන් අරක්කු දීලා, ඒ ලාබෙන්. එතකොට ඒ දහස් ගාණක් අරක්කු බොන මිනිස්සු ගෙදර ගිහිල්ලා කොච්චර බිරින්දෑවරුන්ට ගහනවද? කොච්චර දරුවන්ව බය කරනවාද? කොච්චර සමාජ අනතුරුවලට ලක්වෙනවද කියලා බලන්නකො. එවැනි නෝනා කෙනෙක් තමයි ඊළඟ ජීවිතයේදී අර බේබදු මහත්තයාට ලැබෙන්නේ. ඒ එයාගෙ අකුසල් විපාකයක්.

ඉතින් මේ හේතුඵල ධර්මයන්. මේ දෙන්නට ඔන්න ළමයෙක් ඉපදෙනවා. ළමයත් ඉපදුණු දා පටන් ම පීඩාවට පත්වෙනවා. මොකද, තාත්තා බොනවා. අම්මා ගුටිකනවා. ළමයාටත් මොකුත් ම නැහැ. එතකොට මේ ළමයා කවුද? මේ ළමයා ගිය ජීවිතයේ මිච්ඡා ආජීවය කරපු කෙනෙක්ගේ සැප වින්ද දරුවෙක්.

දැන් මේ ජීවිතයේ මිච්ඡා ආජීවය කරන අයගේ දරුවො සැපෙන් ජීවත් වෙන්නේ. එවැනි දරුවෙක් තමයි අතන්ටත් එන්නේ. ඒකයි බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ, මේ ලෝකයේ කාටවත් අසාධාරණයක් වෙලා නැහැ කියලා.

පවුලක් ඉන්නවා. ඒ පවුලේ මහත්තයා පුදුමාකාර විදියට බොනවා. බීම නිසා නෝනා හැමදා ම ගුටිකනවා. දරුවා තාත්තා එනකොට හැමදා ම ඇඳ යට තමයි ඉන්නේ. තේරුණාද? නමුත් ඒ දෙන්නටවත් අසාධාරණයක් වෙලා නැහැ. මොකද, ඒකත් සාධාරණයක් එතන වෙලා තියෙන්නේ. අසාධාරණයක් නැහැ. මොකද, ඒගොල්ලෝ කළ දේයි ඒගොල්ලෝ ලබන්නේ.

ඔබලා මෙතනින් එළියට බහිනකොට මෙතන පුංචි දරුවෙක් මරලා දාලා ඉන්න පුළුවන්. නමුත් ඒ පුංචි දරුවාට කවදාකවත් අසාධාරණයක් වෙලා නැහැ. එයා පෙර ජීවිතයේ දී මේ විදියෙ ම තවත් දරුවෙක් මරලා දාන්න ඇති. ඒ නිසා තමයි එයා මේ ජීවිතයේ මේ ආකාරයෙන් මැරුම් කෑවේ.

ලෝකයේ කොතැනකවත්, කාටවත් අසාධාරණයක් වෙලා නැහැ කියලා බුදුරජාණන් වහන්සේ කියනවා. අපි කරපු දේයි අපි ලබලා තියෙන්නේ. ඔබ මේ මොහොතේ ඇහින් කඳුළක් හෙළනවා නම්, ඒ කඳුළට හේතුවත් ඔබමයි. ඔබ මේ මොහොතේ හිනාවෙනවා නම්, ඒ සිනාවට හේතුවත් ඔබමයි. මොකද, කඳුළත් හිනාවත් කියන්නේ ඔබ සංසාරයේ කළා වූ හේතුවක් ම යි. ඔබ මේ මොහොතේ කඳුළක් හෙළනවා කියන්නේ ඔබ සංසාරෙ කාට හරි කඳුළක් දීලා තියෙනවා. ඔබ මේ මොහොතේ හිනාවෙනවා කියන්නේ ඔබ සංසාරෙ කාවහරි හිනස්සලා තියෙනවා. එහෙනම් කඳුළයි සිනහවයි දෙක ම ඔබ කරගත්තා වූ දෙයක් ම යි.

එහෙනම් අපි ඇලිලා, ගැටිලා වැඩක් නැහැ. ඒක තමයි ධර්මය කෙරෙහි අචල ශ්‍රද්ධාව කියන්නේ. ඒ තැනට ආව කෙනා තමයි ලෝකයත් එක්ක ගැටෙන්න යන්නේ නැත්තේ. එයා ගැටෙන්නේ

නැහැ කොතැනකවත්. කොයි සා විනාශයන් සමාජය තුළ සිද්ධ වුණත් එයා ගැටෙන්නේ නැහැ. එයා හේතුඵල ධර්මයන් අනුව දකිනවා. මොකද, අපි කළා වූ දේයි අපි මේ ලබලා තියෙන්නේ.

ඒ නිසා අපි දැනගන්න ඕන, බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා නම් මිච්ඡා ආජීවයෙන් දුකයි සකස් වෙන්නේ කියලා, මිච්ඡා ආජීවයෙන් බැහැර වෙලා ජීවත් වෙන්න. මොකද, ඒවා තුළ ජීවත් වෙන තාක් කල් අපිට සංසාරයේ අප්‍රමාණ දුක්වලට පත්වෙන්න සිද්ධ වෙනවා.

නමුත් මිච්ඡා ආජීවය කරන අයට අප්‍රමාණ මිථ්‍යාදෘෂ්ටික දෙවිවරු උපකාර කරනවා. ඒ උපකාර කරන්නේ තව තව මිථ්‍යාදෘෂ්ටිය තුළ ශක්තිමත් වෙලා සතර අපායට ඒගොල්ලන්ව ඇදලා ගන්න.

ඒ නිසා සමහර මනුස්සයෝ කියනවා, "අනේ, බලන්නකො අපි මෙච්චර සිල් ආරක්ෂා කරන් ජීවත් වෙනවා. අපිට කිසි දියුණුවක් නෑ. අර මිනිස්සු වැරදි ම යි කරන්නේ බලන්නකො. අච්චර දියුණු වෙනවා" කියලා. එකක් ඒගොල්ලන්ගේ සංස්කාරය ඒක. සංස්කාර නිසා ඒගොල්ලන්ට ලැබෙනවා. අනිත් එක මිථ්‍යාදෘෂ්ටික දෙවිවරු ඒගොල්ලන්ට අප්‍රමාණ උපකාර කරනවා, ශක්තිමත්ව ඒ මාර්ගය තුළ ඉස්සරහට යන්න.

ඒ නිසා කොතැනකවත් අපි ගැටෙන්න හොඳ නැහැ. "වැරදි කරන අය හොඳින් ඉන්නවා. මේ අපි හොඳින් ඉන්න අය, දුකට පත්වෙනවා," කියන කාරණයේ ගැටෙන්න අවශ්‍ය නැහැ. මොකද, වැරදි කරන අය හොඳින් ඉන්නවා නම් ඒ එක පැත්තක් ඒගොල්ලන්ගේ සංස්කාර; කුසල් සංස්කාර.

එතකොට මෙතන ඉන්න අපි දක්ෂ වෙන්න ඕන, ඒවා දැකලා අපිත් වැරදි තැනට යොමුවෙන්න නෙවෙයි. තේරුණාද? මේ භයානක භාවය, වැරැද්දේ භයානක භාවය දැකලා, අපි නිවැරදි වෙලා, අපි කුසල්වලින් ශක්තිමත් වෙලා අනාගතයේ දී ශක්තිමත් ජීවිතයක් ලබන්න.

# මේ ජීවිතයේ මා ලැබූ බිරිඳ/සැමියා මේ භව ගමනේ දී ලබන අවසාන බිරිඳයි/සැමියායි කියන තැනට එන්න

**තිස්වන ප්‍රශ්නය :**

**ගෞරවණීය ස්වාමීන් වහන්ස, අපි දකිනවා අද දවසේ දී සැනසීමෙන් යුග ජීවිත ගත කරන්නන් අඩුයි. මේ අනුව ස්වාමි-භාර්යාවන් හැටියට සම්බන්ධ වෙන්නේ කර්මානුරූපීව එකිනෙකාට වෛර කරන උදවිය ද ස්වාමීන් වහන්ස?**

**පිළිතුර :**

එහෙම වෙන්න පුළුවන්. දැන් සිදුහත් කුමාරයාට යශෝධරාව හම්බවෙන්නේ සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයකට ඉස්සර එයා අර දීපංකර බුදුරජාණන් වහන්සේගේ පාද මූලයේදී නියත විවරණ ලබනකොට ම යශෝදරාව එයාට එවෙලේ මුණගැහිලා ඉවරයි. එහෙනම් එදා ඉඳන් දස පාරමී පුරාගෙන ආවා වූ, දීර්ඝ වූ කුසල් දහම් වඩමින් ම ආවා වූ ගමනක්. ඒ පාරමී ශක්තිය නිසයි ඒගොල්ලොන්ට ඒවා ලැබෙන්නේ.

නමුත් වර්තමානයේ, අපි නිරතුරුව ම අකුසල් තුළ ම යි අපේ ජීවිත ශක්තිමත් වෙන්නේ. එහෙනම් අකුසල් ජීවිත තුළ ශක්තිමත් වුණොත් නිරතුරුව ම ගැටුම්කාරී ගැටලුකාරී ජීවිත තමයි අපිට ලැබෙන්නේ. ඒ ශීලයේ දුර්වල භාවය. නමුත් එහෙම නැතුව, හොඳ සමගි සම්පන්නව ජීවත්වන පවුල් ජීවිත අප්‍රමාණව තියෙනවා. ඒ ඒගොල්ලන් කුසලය තුළ ශක්තිමත් භාවය නිසා.

එතකොට යමෙක් මේ ජීවිතයෙදි ශීලයෙන් පරිපූර්ණ වෙන්නෙ කුසලය තුළ ශක්තිමත් වෙන්නේ කුමක් නිසා ද? පෙර සංසාර පුරුදු නිසා. පෙර සංසාර පුරුදු. ඒගොල්ලෝ හොඳින් ශීලය වැඩුවා; හොඳින් ශ්‍රද්ධාව තුළ හිටියා. ඒ සංසාර පුරුදු නිසා ඒගොල්ලෝ මේ ජීවිතෙත් ශීලය තුළ ශක්තිමත්ව ජීවත් වෙනවා; ශ්‍රද්ධාව තුළ ශක්තිමත්ව ජීවත් වෙනවා; පවුල් ජීවිතයේ ගොඩාක් ආදර්ශවත් ආකාරයෙන්, සුන්දර ආකාරයෙන් ගත කරනවා.

එතකොට ඒ හැකියාව ඒගොල්ලොන්ට ලැබුණේ මොකක් නිසා ද? පෙර සාංසාරික පුරුදු. එතකොට පෙර සංසාරේ ශීලයෙන් දුශ්ශීල භාවයට පත්වෙලා, ශ්‍රද්ධාවෙන් බැහැරට පත්වෙලා, නමුත් මනුස්ස ජීවිත ලබලා එනකොට, මේ ජීවිතයෙදිත් ශීලයෙන් දුර්වල වෙන කොට, ඊට අදාළ දේවල් තමයි ලැබෙන්නේ. ඒ කියන්නේ, මේ සමාජය තුළ තියෙන්නා වූ දික්කසාද, පවුල් ප්‍රශ්න... මේ සියල්ල මොකක් ද? දුශ්ශීල භාවයේ ප්‍රතිඵල ම යි. දුශ්ශීල භාවයේ ප්‍රතිඵල ම යි.

ඉතින් ඔය දුශ්ශීල භාවයේ ප්‍රතිඵල මේ ජීවිතයේ විතරක් නෙවෙයි, අතීත භවයන්හි අපි කළා වූ කර්මයන්ගේ ප්‍රතිඵල තමයි අපිට ලැබෙන්නේ.

**අතුරු ප්‍රශ්නය :**

**ස්වාමීන් වහන්ස, එම කර්මානුරූපී දුක් සහගත බැඳීම සැමියා හෝ බිරිඳ පිළිගත යුත්තේ කොහොම ද?**

**පිළිතුර :**

මම ඒකයි කිව්වේ, අපි කරගත්තා වූ දේයි අපිට ලැබිලා තියෙන්නේ. දැන් එක මහත්තයෙක් මෙතෙන්ට ඇවිල්ලා එයාගෙ ෂර්ට් එකේ අත මෙතනට උස්සලා කිව්වා, "මේ බලන්න ස්වාමීන්

වහන්ස, ගිය සුමානෙ මගේ නෝනා හැපුවා" කියලා. "මගේ නෝනා යක්ෂණියක් ස්වාමීන් වහන්ස" කිව්වා. එයාගෙ ම වචනයෙන් කියනවා නම්, "මගේ නෝනා යක්ෂණියක්. මේ බලන්න මාව හපලා ලේත් එනවා. මම කොච්චර කිව්වත් කියන දේ අහන්නේ නැහැ. එයා ද්වේශය තුළ ම යි ඉන්නේ" කිව්වා.

මම ඒ වෙලාවේ කිව්වා, "පුතේ, ඔබ ම කියනවා, ඔබේ නෝනා යක්ෂණියක් කියලා. එහෙනම් දැන් ඔබේ නෝනා ඔය කියන්නේ මොකක් ද? ඔබටත් යක්ෂයෙක් වෙන්න කියලයි." " එහෙනම් නෝනා යක්ෂණියක් වුණාදෙන්. ඔබ කවදාකවත් යක්ෂයෙක් වෙන්න යන්න එපා". තේරුණාද? මොකද, ඔබ කළා වූ දෙයක් ඔබට ලැබිලා තියෙන්නේ. ඒ නිසා ඔබට නෝනා පාරක් ගැහුවොත්, ඔබ තව පාරක් ගහන්න කියලා කියන්න එයාට. දෙවෙනි පාරත් ගැහුවොත්, තුන්වෙනි පාරත් ගහන්න හිස නමන්න. නමුත් ඔබ ඒ හිස නමන්නේ නෝනට නෙවෙයි, ධර්මයට යි.

ඔබට අකීකරු නෝනා කෙනෙක් ලැබුණා නම් ඒ ලැබුණේ ඔබේ සංසාරෙ අකුසලයක් නිසා ම යි. එහෙනම් ඒ අකීකරු නෝනා තුළින් ඔබ ධර්මය මතුකර ගන්න දක්ෂ වෙන්න ඕන. වෙන කරන්න දෙයක් නැහැ. නමුත් අවංකව ම ඒ මහත්තයා මාස පහක් විතර ගියාට පස්සේ හමුවෙලා මට කිව්වා, "ස්වාමීන් වහන්ස, දැන් මගේ නෝනා මට ගහන්නේ නැහැ" කියලා. දැන් එයා ප්‍රශ්නය අමතක කළා. තේරුණාද?

නමුත් කවදාහරි දවසක අපි ඔය ප්‍රශ්නෙන් මිදෙන්න නම්, අපි එන්න ඕන තැන ඔතන නෙවෙයි. අපි එන්න ඕන තැන මොකක් ද? බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, "අපි අකමැති දේවල් අපිට ලැබිලා, ඒ නිසා අපි හෙළුවා වූ කඳුළු මහා සාගරේ ජලයට වැඩියි" කියලා. අපි අකමැති බිරින්දෑවරු ලබලා, අපි අකමැති සහෝදර සහෝදරියෝ ලබලා, අකමැති ඥාතීන් ලබලා, අපි හැඬුවා වූ කඳුළු මහා සාගරේ ජලයට වැඩියි කියනවා. එහෙනම් කවදාක්වත් අපිට

මේ කඳුළු සාගරය හිඳින්න නම් අපි කරන්න ඕන මොකක් ද? මේ ජීවිතයේ ලැබුවා වූ බිරිඳ, මේ භව ගමනේ ලබන අවසාන බිරිඳයි කියන තැනට එන්න වෙනවා. තේරුණාද? මේ ජීවිතයේ ලැබුවා වූ ස්වාමිපුරුෂයා, මම මේ භව ගමනේ ලබන අවසාන ස්වාමිපුරුෂයා කියන තැනට එන්න වෙනවා.

එහෙනම් අපිට නරක බිරිඳක්, සැර පරුෂ ස්වාමිපුරුෂයෙක් ලැබුණා නම්, ඒ ලැබුණේ හේතුවක් නිසා ම යි. අපි කාටවත් ස්වාමිපුරුෂයාට හෝ බිරිඳට බනින්න බැහැ. මොකද, පෙර ජීවිතයේ මමත් මගේ ස්වාමිපුරුෂයාට අකීකරු වෙලා ඇති. පෙර ජීවිතයේ මමත් බිරිඳට අකීකරු වෙලා ඇති. ඒවායේ ඵලයන් තමයි අපි මේ ජීවිතයේ ලබන්නේ. ඒ නිසා මේක කවදාකවත් අපිට හොඳින් ඔය වගේ ඔළුව නමලා විසඳගෙන ඉස්සරහට යන්න පුළුවන් ගමනක් නෙවෙයි.

එහෙනම් අපි කරන්න තියෙන්නේ, බිරිඳ කියන්නේ දුකක්, ස්වාමිපුරුෂයා කියන්නේ දුකක්, ඒ නිසා මේ භවගමනේ මම ලබන අවසාන ස්වාමිපුරුෂයායි, අවසාන බිරිඳයි ලබන්නේ කියන තැනක ඉඳලා ඒ චිත්තය ඇති කරගෙන, ගුටිකන තරමක් ඔළුව පහත් කරගෙන ගුටිකමින් අපි එයත් එක්ක ජීවත් වෙන්නයි තියෙන්නේ. මොකද, මම කරපු දේකුයි මම විඳින්නේ.

එහෙම නැත්නම් ඉන් එහාට අපි ඉස්සරහට යනවා නම් ඒ ඉස්සරහට යෑම තුළ තව තවත් විනාශයන් කරායි අපි යන්නේ. ඒ ඉස්සරහට යනවා කියන්නේ, මේ බිරිඳ හොඳ නෑ කියලා, තව බිරිඳක් කෙරේ විශ්වාසය ඇති කරගන්නවා. මේ ස්වාමිපුරුෂයා හොඳ නැහැ කියලා, තව ස්වාමිපුරුෂයෙක් කෙරෙහි විශ්වාසය ඇතිකර ගන්නවා. නමුත් බුදුරජාණන් වහන්සේ කියන්නේ, බිරිඳක් ලැබුව ද, ස්වාමිපුරුෂයෙක් ලැබුව ද, ඔබ ලබලා තියෙන්නේ දුකක් ය කියන කාරණයයි.

එහෙනම් මේ ගැටලුවෙන් අපිට මිදෙන්න තියෙන එක ම මඟ තමයි, මේ භව ගමනේ මම ලබන අවසාන ස්වාමිපුරුෂයයි, බිරිඳයි ලැබුවේ කියල හිතන්න. මොකද, ඔබ මේ ජීවිතයේ මාර්ගඵල ලාභී දෙවියෙක්, දිව්‍යාංගනාවක් වුණොත් ඔබට නැවතත් බිරිඳක්, ස්වාමිපුරුෂයෙක් ලැබෙන්නේ නැහැ. එතන තමයි ගැලවීමේ මඟ.

ලෝකයේ කොතැනකත් ඔය රණ්ඩුවීම් වෙනවා, අපිටත් අප්‍රමාණ අය කියනවා, "අනේ ස්වාමීන් වහන්ස, ස්වාමිපුරුෂයා මෙහෙමයි. බිරිඳ මෙහෙමයි." කියලා. නමුත් ඉතින් කරගත්තා වූ දේයි අපි ලබන්නේ. තව තව අපි මේ ජීවිතයේ දුශ්ශීල නම්, ඒ කරගත්තා වූ දේ තව තව බලවත් ප්‍රශ්න බවට අපි පත්කර ගන්නවා.

ඒ නිසා එවැනි ප්‍රශ්න තියෙනවා නම් වහා ම, ඉස්සෙල්ලා ම අපි සීලයෙන් පරිපූර්ණ වෙන්න ඕන. අපි සීලයෙන් පරිපූර්ණ වෙලා... මම ඒකයි කිව්වේ, "පාරක් ගහද්දි දෙවෙනි පාරටත් හිස නමන්න. ඒ ගුටි කන්නේ බිරිඳගෙන් නෙවෙයි, ඔබ ඒ හිස නමන්නේ ධර්මයටයි" කියන කාරණයටයි. වෙන ඉතින් කරන්න දෙයක් නැහැ.

# ගිහියකුගේ නිත්‍ය ශීලය පංච ශීලයයි. එක් සිල් පදයක් බිඳුනොත් .....

**තිස්එක්වන ප්‍රශ්නය :**

**ගෞරවණීය ස්වාමීන් වහන්ස, ගිහියෙකු රැකිය යුත්තේ ආජීව අෂ්ටමක ශීලය ද? පංචශීලය ද?**

**පිළිතුර :**

ගිහි පින්වතුන්ට ආජීව අෂ්ටමක ශීලය, පංචශීලයට වඩා ශ්‍රේෂ්ඨයි. සාමාන්‍ය ගිහි කෙනෙකුට පංචශීලය තමයි අපි අනුදැන්වන්නේ. මොකද, ආජීව අෂ්ටමක ශීලයට ගියොත් එතන මිච්ඡා ආජීවය කියන සිල්පදයක් තියෙනවා. එතකොට පිසුණාවාචා, පරුෂාවාචා, සම්ඵප්පලාපා කියන සිල්පද තියෙනවා.

දූන් දාන දෙන්න සමහරු ආරණ්‍යවලට එනවා. ඒ ඇවිල්ලා වාහනේක, බස් එකක තමයි ඒගොල්ලෝ එන්නේ. ඉතින් ආපුවාම ඒගොල්ලන්ට ආජීව අට්ඨමක ශීලය සමාදන් කරනවා. නමුත් සමාදන් කරලා ඒගොල්ලෝ යනගමන් ම වාහනේ සිංදු කියාගෙන, බෙර ගහගෙන ඕවා කර කර තමයි යන්නේ. එතකොට ම අර ශීලය දුර්වල වෙනවා. තේරුණාද?

එතකොට අපි කියමු, යම් කෙනෙක් ඉන්නවා... කඩේ හන්දියේ ග්‍රොසරියක් කරන මහත්තයෙක් ඉන්නවා. එයා ග්‍රොසරියේ අයිස් පෙට්ටියේ කුකුල් මස් විකුණනවා. ඒ වගේ ම කඩේක හන්දියේ හෝටලයක් කරන මහත්තයෙක් ඉන්නවා. ඒ හෝටලේ මහත්තයා

කොත්තු රොටියක්, එහෙම නැත්නම් මාළු පීරිසියක්, මාළු බත් එකක් විකුණනවා. ඒ මොහොතෙ ම නෝනා, ඒගොල්ලො මිථ්‍යා ආජීවයට අහුවෙනවා. මොකද, ඒගොල්ලෝ මස්මාංශ වෙළඳාම් කරනවා.

එහෙම නම් එතනදි අපිට ගැළපෙන ශීලය තමයි පංචශීලය. එතකොට අපි කිව්වොත් එහෙම, "නෑ පංචශීලය නෙමෙයි, හැමෝම ආජීව අට්ඨමක ශීලය රකින්න" කියලා, එහෙනම් මේ රටේ ඉන්න කිසි ම ග්‍රොසරියක්, කිසි ම හෝටලයක් කරන කෙනෙකුට ආජීව අෂ්ටමක ශීලය රකින්න බැහැ. තේරුණාද? එහෙනම් අපි ඒගොල්ලන්ව ධර්මයෙන් ඈත් කරන්න බැහැ. ධර්මයෙන් අයින් කරන්න බැහැ. ඒගොල්ලොත් මේ ශාසනේ ම කොටසක්.

ඒකයි බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ, නිත්‍ය ශීලය පංචශීලය බවට රකින්න. පංචශීලය සමාදන් වුණාට පස්සේ ඔබ හෝටලේ මාළු කෑල්ලක් වික්කාය කියලා ඔබට සිල්පදයක් බිඳෙන්නේ නැහැ. ඉතින් තමන් ශීලය තුළ ශක්තිමත් වෙලා ඉස්සරහට යද්දි, ශ්‍රද්ධාවෙන් පරිපූර්ණ වෙද්දි, මාර්ගය ශක්තිමත් වෙද්දි එයා මිථ්‍යා ආජීවයෙන් ඉවත් වෙයි.

එහෙම නැතුව, සාමාන්‍ය ගිහි කෙනෙකුගේ නිත්‍ය වූ ශීලය පංචශීලය කියලයි බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ.

**අතුරු ප්‍රශ්නය :**

**ගෞරවණීය ස්වාමීන් වහන්ස, සමාදන් වන එම ශීලයන් බිඳෙන කොට සිද්ධ වෙන අකුසල කර්මයන් කොයි ආකාරයෙන් ද ස්වාමීන් වහන්ස පැහැදිලි කරගන්න පුළුවන්?**

**පිළිතුර :**

මෙහෙමයි. නිරතුරුව ම හුඟාක් අය සමාජයෙන් කියන ප්‍රශ්නයක් තමයි, "හාමුදුරුවනේ, මම ව්‍යාපාරයක් කරන කොට,

රැකියාවක් කරන කොට මට බොරුවක් කියවෙනවා. නැත්නම් මම මඟුල් ගෙදරක ගියාම මත්වතුර ටිකක් පෙවෙනවා. ඒ නිසා ස්වාමීන් වහන්ස, මේ සිල්පදය, නැත්නම් මේ සිල්පද දෙක නිසා අපි නිරතුරුව ම ගැටෙන සිතින් ජීවත්වෙන්නේ" කියලා.

ඒ නිසා කොයි ම වෙලාවකවත්, බිඳෙන සිල්පදය ගැන හිතලා ගැටෙන්න යන්න එපා. මොකද, තමන් බිඳෙන සිල්පදය ගැන හිතලා ගැටෙන මොහොතක තමා මිය පරලොව ගියොත්, ඔබව වැටෙන්නේ සතර අපායට. ඒක මහා අපරාධයක්. තේරුණාද? රකින සිල්පද හතරක් තියෙනවනෙ. හැම වෙලාවෙ ම රකින සිල්පද හතර ගැන හිතලා සතුටුවෙමින් ජීවත් වෙන්න. රකින සිල්පද හතර ගැන හිතලා සතුටු වෙමින් ජීවත් වෙද්දි, ඒ සතුට විසින් ම බිඳෙන සිල්පදය නිවැරදි කරගන්න අපිට පුළුවන්කම ලැබෙනවා.

කොයි ම වෙලාවකවත් සිල්පදයක් බිඳුණා කියලා බිඳුණු සිල්පදය ගැන ගැටෙන්න යන්න හිතන්න එපා. ඒක නිවැරදි කරන්න උත්සාහ ගන්න. නමුත් රකින සිල්පද හතර ගැන හිතලා සතුටු වෙන්න. රකින සිල්පද හතර ගැන හිතලා සතුටු නො වුණොත්, ඒ බිඳෙන සිල්පදය ගැන ගැටුණොත්, අපි අනිවාර්යයෙන් ම සතර අපායටයි යන්නේ. නමුත් හරි අපරාධයක්, රකින සිල්පද හතරක් තියෙනවනෙ. ඒ නිසා අපි උත්සාහ ගන්න ඕන බිඳෙන සිල්පදය නිවැරදි කරගන්න. නමුත් බිඳෙන සිල්පදය ගැන හිතන්න යන්න එපා. රකින සිල්පද හතර ගැන හිතලා සතුටු වෙන්න. ඒ සතුට ම බිඳෙන සිල්පදය නිවැරදි කරගන්න හේතු වේවි.

ඒ වගේ ම තමන්ගේ අතීතයේ වුණා වූ සිල්පද බිඳීමක් තියෙනවා නම්, කොයි ම වෙලාවකවත් ඒ සිල්පද බිඳීම නැවත නැවත සිහියට ගන්න යන්න එපා. ඒ සිල්පදය අතීත පංච උපාදානස්කන්ධයක් හැටියට දකලා යටපත් කරලා දාන්න. එය අකුසලයේ විපාකය පිණිස ඒවි. නමුත් ඒක ප්‍රශ්නයක් නැහැ. නමුත් අතීතයේ සිදුවුණා වූ සිල්පද බිඳීම් තියෙනවා නම්, ඒක අතීත පංච

උපාදානස්කන්ධයක් හැටියට යටකරලා දාන්න, නැවත මතුකරලා ගන්න එපා. මේ මොහොතේ ඉඳන් ශක්තිමත්ව ශීලය තුළ ජීවත් වෙන්න.

දැන් අංගුලිමාල මිනිස්සු 999 ක් මරනවා. නේද? මිනිස්සු 999 ක් මරලා අම්මාව මරන්න කියලයි මේ යන්නේ, ආනන්තරීය පාපකර්මයක් කරගන්න. නමුත් ඒ සා මනුස්ස ඝාතන කරලත් ඒ සෑම ඝාතනයක් ම, අකුසලයක් ම අතීත පංච උපාදානස්කන්ධයක් හැටියට යටපත් කරලා උතුම් රහත් භාවයට පත්වුණා. නමුත් අකුසලය විපාකයට ආවා.

අකුසලයේ විපාකයට අපි භය වෙන එක නොවෙයි වෙන්න ඕන. මේ ධර්මාවබෝධය තුළ ශක්තිමත්ව ඉස්සරහට යන්න. ඒ නිසා සිල්පදයක් බිඳුණොත් කොයි වෙලාවකවත් බිඳුණු සිල්පදය ගැන ගැටෙන්න එපා. නිවැරදි කරගන්න උත්සාහ ගන්න. රකින සිල්පද හතර ගැන හිතලා සතුටුවෙන්න.

# සෝවාන් වීම අතිශය අසීරුද?

**තිස්දෙවන ප්‍රශ්නය :**

**ගෞරවණීය ස්වාමීන් වහන්ස, ගිහි ජීවිතයක් ගත කරන කෙනෙකුට සෝවාන් භාවයට පත්වීම අතිශය අසීරු කාරණයක් ද ස්වාමීන් වහන්ස?**

**පිළිතුර :**

අනේ නැහැ. බුදුරජාණන් වහන්සේගේ කාලේ විශාඛාව, අනේපිඬු සිටාණන්, නකුල මාතා, නකුල පියා ඔය වගේ දසදහස් ගණන්, ලක්ෂ ගණන් උපාසක උපාසිකාවන් හිටියා. ඒක අපහසුතාවයක් නැහැ. ඒක අපහසු වෙන්නේ අපි තුළ විචිකිච්ඡාව තියෙන නිසා. මේක අපහසුයි කියන සැකය නිසා ම අපිට මේක අපහසුවක් බවට පත්වෙනවා.

ඉතින් මේ අපහසුවක් නෑ කියන කාරණය සකස් කරලා දෙන්නේ කවුද? ශ්‍රද්ධාව. අපිට හිතෙනවා නම් සෝවාන් ඵලයට පත්වීම අපහසුයි කියලා, මොකක් ද ප්‍රශ්නෙ තියෙන්නේ? ශ්‍රද්ධාවේ ප්‍රශ්නයක්. එහෙනම් ශ්‍රද්ධාව ඇතිකර ගන්නේ කොහොමද? කල්‍යාණ මිත්‍ර ආශ්‍රය ලබන්න ඕන. සද්ධර්ම ශ්‍රවණය කරන්න ඕන. ශ්‍රවණය කළා වූ සද්ධර්මය නුවණින් මෙනෙහි කරන්න ඕන. ඔන්න එතකොට ශ්‍රද්ධාව සකස් වෙනවා. තේරුණාද? ශ්‍රද්ධාව සකස් වුණාට පස්සේ මේ ජීවිතයේ සෝවාන් වෙන්න බැහැයි කියන විචිකිච්ඡාව තමන්ගෙන් බැහැරට යනවා. එතනයි ප්‍රශ්නේ තියෙන්නේ. කාටහරි මේ ජීවිතයේ සෝවාන් ඵලයට පත්වෙන්න බැහැයි කියල කියනවා නම්, ශ්‍රද්ධාවේ ප්‍රශ්නයක් එතන තියෙන්නේ. වෙන කිසි ම දේක ප්‍රශ්නයක් නෙවෙයි.

# තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන් හා ශීලයෙන් පරිපූර්ණ වූ ජීවිතය අතිශයින් ආරක්ෂිතයි

**තිස්තුන්වන ප්‍රශ්නය :**

**ගෞරවණීය ස්වාමීන් වහන්ස, පංචශීලය රකින කෙනෙකුට වුණත් අමනුෂ්‍යයින්ගේ බලපෑම ඇතිවිය හැකි ද?**

**පිළිතුර :**

මෙහෙමයි. බලපෑම් ඇතිවෙන්න බැරිකමක් නැහැ. නමුත් කෙනෙක් ශ්‍රද්ධාවෙන් පරිපූර්ණ නම්, ශීලයෙන් පරිපූර්ණ නම් තමන් තුළ විශ්වාසයක් සකස් වෙන්න ඕන, අමනුෂ්‍යයෙකුට තමන්ගේ ජීවිතයට බලපෑමක් කරන්න බැහැ කියලා. එහෙම සකස් වෙන්න ඕන.

සමහරවිට අපි ශ්‍රද්ධාවෙන් පරිපූර්ණ නැහැ. නමුත් සිල්පද පහ අපි ආරක්ෂා කරනවා. සිල්පද පහත් ආරක්ෂා කරගෙන අපි නිරතුරුව ම අපේ මැරිච්ච අම්මා ගැන, තාත්තා ගැන, ආච්චි ගැන, සීයා ගැන හිතමින් හිතමින් ඒවා පස්සෙ ම දුවනවා. ඔය සමහරු ඉන්නේ, ආච්චි මැරිලා දැන් අවුරුදු 20 යි. තාමත් ආච්චි ගැන හිත හිතා, අඬ අඬා ඉන්නවා. එතකොට මේගොල්ලෝ මේ පරදත්තරූප ජීවී ප්‍රේත කියන තැන ඉන්නවා නම්, ප්‍රේත ලෝකවල ඉන්නවා නම් ඒගොල්ලන්ට මේ අපේ හිත දකින්න පුළුවන්. තේරුණාද? එතකොට එහෙම දැක්කහම මේ අය, මැරිච්ච අප කෙරෙහි මෙච්චර ළෙන්ගතුයි කියලා, ඒගොල්ලෝ අපේ ජීවිතයේට එන්න පුළුවන්. එහෙම බැරිකමක් නැහැ. එහෙම එන්න පුළුවන්.

ඔය සමහරු සාස්තර කියනවා වගේ කියන්නේ. ඔය දෙවිවරු නෙවෙයි. දෙවියො එන්නේ නැහැ කවදාක්වත් මනුස්සයෙක්ගේ ඇඟට. ඔය මේ පල්ලෙහා ඉන්න නීච කොටස්. මොකද, ඒවා කෙරෙහි උපාදානය සකස් කරගෙන, ඒගොල්ලොත් කැමතියි අපිට උදව් කරන්න, අපිට කීයක් හරි හම්බකරලා දෙන්න.

ඒ වගේ ම ඒගොල්ලෝ මේ ශරීරෙට වැහිලා එක එක දේවල් කරන්න පුළුවන්. ඒ ඒගොල්ලන්ගේ උපාදානය නිසා. මුගලන් මහ රහතන් වහන්සේගේ කුසටත් එක්තරා අවස්ථාවක මාරයා රිංගනවා. ඒ වගේ අමනුෂ්‍ය කොටස් ශරීරයට රිංගලා සමහර වෙලාවට රෝගාබාධයන් ඇතිකරන්න පුළුවන්.

අමනුෂ්‍ය කොටස් වගේ ම මේ ප්‍රේතයෝ, භූතයෝ වගේ ම ප්‍රේත තිරිසන් ලෝකයකුත් තියෙනවා. මනුස්ස ලෝකය ආශ්‍රිතව ප්‍රේත තිරිසන් ලෝකයක්... ප්‍රේත අලි, ප්‍රේත හරක්, භූත මුව, භූත කුකුල්ලු, භූත මොනරු, භූත මාළු, භූත තලගොයි, භූත මකුළුවෝ, භූත මදුරුවො. මේ වගේ මේ මනුස්ස ලෝකය ආශ්‍රිතව භූත තිරිසන් ලෝකයක් තියෙනවා. ඒ භූත තිරිසන් ලෝකයේ භූත තලගොයි ඉන්නවා. එතකොට මේ භූත තලගොයා ජීවත්වෙන්නේ කොහොම ද? භූත මකුළුවන්ව මරාගෙන කාලා. එතකොට මේ භූත ලෝකයේ ඉන්නා වූ භූත මකුළුවා වගේ සතෙකුට වුණත් අපේ ජීවිතේට රිංගන්න පුළුවන්.

කොහොම වුණත් මෙවැනි දේවල් සිද්ධ වෙන්නේ අපි ශ්‍රද්ධාවෙන්, ශීලයෙන් දුර්වල භාවයට පත් වෙලා නම් තමයි. අපි ශ්‍රද්ධාවෙන්, ශීලයෙන් පරිපූර්ණ නම් මෙවැනි අමනුෂ්‍ය බලවේග යන්ට අපේ ජීවිතයට එන්න බැහැ. මොකද, ලෝකය ඒ තරම් සංකීර්ණ තැනක්. පියවි ඇහැට අපට පේන්නේ ලෝකයෙන් පුංචි ම තැනක් විතරයි; පුංචි දෙයක් විතරයි. මේ නො පෙනෙන සමාධියේ ඇහැ තමයි මේ ලෝකයේ යථා ස්වභාවය දකින්නේ. යථා ස්වභාවයේ දී මේ මනුස්ස ලෝකයේ ජීවත්වන තිරිසන් සතුන්ට වඩා භූත ලෝකයේ තිරිසන් සතුන් වැඩියි. තේරුණාද?

එක ස්වාමීන් වහන්සේ කෙනෙක් සමාධියෙන් පසුවෙන කොට, මුහුද ආශ්‍රිතව තියෙන කුටියක දී උන් වහන්සේ දකිනවා. මේ සද්දන්ත යක්ෂයෙක්. ඒ යක්ෂයා මිථ්‍යාදෘෂ්ටික යක්ෂයෙක්. මිථ්‍යාදෘෂ්ටික කියන්නේ මේ, දළ එළියට පැනලා, ඇස් රතු වෙලා එළියට පැනලා, බඩ නෙරපු මිථ්‍යාදෘෂ්ටික යක්ෂයෙක්.

එතකොට මේ මිථ්‍යාදෘෂ්ටික යක්ෂයා ඉන්න තැන තියෙනවා, හරක් ඔළු හතක් නැත්නම් අටක්. ඒ හරක්ගේ ඔළු අපේ හරක් වගේ විශාල ඔළු නෙවෙයි. ඊට වඩා පොඩියි. එතකොට එයා මුහුද අයිනේ ඉන්න නිසා එයා ළඟ තියෙනවා මේ මාළු ගොඩක්. ඒ එක මාළුවෙක් කොහොමත් මීටර් 30 ක් විතර විශාලයි. ඒ එක මාළුවෙක්, නෝනා. ඒ මාළුවා දෙකට කපලා තුනට නමලා තියෙන්නේ. ඒ වගේ මාළු දෙන්නෙක් විතර මෙහෙම නවලා, එක ගොඩේ ගහලා තියෙනවා. එතකොට මේ හරක් ඔළු තියෙන්නේ ඇයි? මෙයා මේ හරක් ටික කාලා.

එතකොට මේ හරක් කියන්නේ, මේ මනුස්ස ලෝකයේ ජීවත් වන හරක් නෙවෙයි. මනුස්සයා මනුස්ස ලෝකයේ ජීවත්වෙන හරක් මරාගෙන කනවා වගේ, ඒ අමනුෂ්‍ය යක්ෂ ප්‍රේත කොටස්, යක්ෂ කොටස් අර භූත ලෝකයේ ඉන්න සත්තු තමයි මරාගෙන කන්නේ. දැන් මුහුදේ මාළු ඉන්නවා වගේ ම භූත මාළුත් ඉන්නවා; මහ විශාල මාළු ඉන්නවා. ඒගොල්ලෝ මැරිලා ගිහිල්ලා භූත ස්වභාවයේ මාළු වෙලා උත්පත්තිය ලබනවා. ඔය හරක් රැල් පිටිපස්සේ භූත හරක් අප්‍රමාණව ඉන්නවා. මොකද, හරකෙක් මැරෙන වෙලාවේ එයාට රැල පිළිබඳවයි උපාදානය සකස් වෙන්නේ. නමුත් එයා හරකෙක්ගේ කුසේ ඉපදුණේ නැත්නම් ඒ රැලේ ම භූත සතෙක් වෙලා ඉපදෙනවා.

එතකොට මේ භූත සත්තු තමයි මේ යක්ෂයෝ අල්ලගෙන මරාගෙන කන්නේ. ඉතින් ඒ වගේ සංකීර්ණ ලෝකයක් අපි ඉස්සරහා තියෙනවා. ඉතින් ඒ සංකීර්ණ ලෝකයේ ඉන්න මේ

මකුළුවා වැනි සතෙකුටත් අපේ ජීවිතේට රිංගන්න පුළුවන්. රිංගලා අපේ කොතැන හරි ලෙඩ කරන්නත් පුළුවන්. එහෙම නැහැයි කියලා කියන්න බැහැ. ඉතින් එහෙම නම්, ඒවායින් අපි ආරක්ෂා වෙන්න නම්, අපිට මේ නො පෙනෙන ලෝකය නැතිකරන්න බැහැ. භූත ලෝකය, එහෙම නැත්නම් ප්‍රේතයා, යක්ෂයා කියන කෙනා නැති කරන්න බැහැ. ඒවා ලෝකයේ ස්වභාවයන්.

එහෙම නම් අපි මේවාට ඔරොත්තු දෙන ජීවිතයක් සකස් කරගන්න ඕන. **මේවාට ඔරොත්තු දෙන ජීවිතය කියන්නේ මොකක් ද? තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවත් ශීලයෙනුත් පරිපූර්ණ වෙච්ච ජීවිතය.**

# බුදුරජාණන් වහන්සේට දක්වන උතුම් ම උපහාරය වෙසක් දිනයේ දී සිදුකරන්න

**තිස්හතරවන ප්‍රශ්නය :**

**ගෞරවණීය ස්වාමීන් වහන්ස, බුදුරජාණන් වහන්සේගේ ත්‍රෛමගල්‍යයන් යෙදෙන වෙසක් පොහෝදා බෞද්ධ බැතිමතුන් කළ යුතු දේ සහ නොකළ යුතු දේ වශයෙන් තේරුම් ගත යුත්තේ කුමක් ද ස්වාමීන් වහන්ස?**

**පිළිතුර :**

මෙහෙමයි. එතනදි අපි ඉස්සෙල්ලා ම දකින්න ඕන, බුදුරජාණන් වහන්සේ කෙනෙක් ලෝකයට පහළ වෙන්නේ කුමන හේතුවක් මුල් කරගෙන ද කියලා. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ නමක් ලෝකයට පහළ වෙන්නේ, එක ම එක කාරණයක් ලෝකයට දේශනා කරන්නයි. ඒ කාරණය තමයි චතුරාර්ය සත්‍යය. තේරුණා ද?

චතුරාර්ය සත්‍යය කියන මේ උතුම් කාරණය අවබෝධ කරගන්න තමයි, බෝධිසත්ත්වයන් වහන්සේ කෙනෙක් සාරාසංඛ්‍ය කල්ප ලක්ෂ ගාණක් පාරමී ධර්මයන් පුරාගෙන එන්නේ. එහෙනම් බුදුරජාණන් වහන්සේ කෙනෙක් මේ ලෝකයට පහළ වෙන්නේ, මේ චතුරාර්ය සත්‍යය කියන මෙන්න මේ උතුම් ධර්මතාවය ලෝකයාට දේශනා කරන්න.

ඒ චතුරාර්ය සත්‍ය ධර්මතාවයේදී බුදුරජාණන් වහන්සේ දේශනා කරන මුල් ම ආර්ය සත්‍යය තමයි දුක කියන කාරණය. එතකොට දුක කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ, මේ ජාති, ජරා, ව්‍යාධි, මරණ, ශෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, ප්‍රියයන්ගෙන් වෙන්වීම, අප්‍රියයන් හා එක්වීම, පංච උපාදානස්කන්ධය නිත්‍ය භාවයෙන් ගැනීම් තුළ සකස් වෙන්නා වූ දුක. තේරුණාද? මේ දුක තුළ මේ ලෝකයේ ජීවත්වන සෑම සත්ත්වයෙක් ම යම් යම් ප්‍රමාණයන්ට ඉන්නවා. එහෙනම් දුක කියන කාරණය අපි තුළ තියෙනවා ද? තියෙනවා.

එහෙනම් මේ දුක කියන කාරණය අපි තුළ තියෙනවා නම්, බුදුරජාණන් වහන්සේ දෙවෙනි ආර්ය සත්‍යයේදී දේශනා කරනවා, දුක ඇතිවීමට හේතුව තෘෂ්ණාව කියලා. තේරුණාද? එහෙනම් දුක තියෙන්නේ අපි තුළ නම්, තෘෂ්ණාව අපි තුළ තියෙනවා ද? නැද්ද? තියෙනවා. මොකද, දුකට හේතුව තෘෂ්ණාව යි.

තුන්වෙනි ආර්ය සත්‍යයේදී බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. දුක තියෙන්නෙත් තමා තුළ නම්, තෘෂ්ණාව තියෙන්නෙත් තමා තුළ නම්, දුක නැති කරන්න නම් මොකක් ද කරන්න ඕන? තෘෂ්ණාව නැති කරන්න ඕන. එහෙනම් දුක තියෙන්නෙත් තමා තුළ නම්, තෘෂ්ණාව තියෙන්නෙත් තමා තුළ නම්, දුක නැති කරන්න, තෘෂ්ණාව නැති කරන්න ඕන කවුද? තමා ම යි. තේරුණාද?

හතරවෙනි ආර්ය සත්‍යයේදී බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, දුක තියෙන්නෙත් තමා තුළ නම්, තෘෂ්ණාව තියෙන්නෙත් තමා තුළ නම්, දුක නැති කරන්න, තෘෂ්ණාව නැති කරන්න ඕනෙත් තමාම නම්, දුක නැති කිරීමේ මාර්ගය ආර්ය අෂ්ටාංගික මාර්ගයයි කියලා.

එහෙනම් බුදුරජාණන් වහන්සේ නමක් මේ ලෝකයට පහළ වෙන්නේ මේ දුක නැති කිරීමේ මාර්ගය, ආර්ය අෂ්ටාංගික මාර්ගය මේ ලෝකයේට දේශනා කරන්න. තේරුණාද? එහෙනම්

නෝනා, බුදුරජාණන් වහන්සේගේ උත්පත්තිය, බුද්ධත්වය, පිරිනිවීම කියන කාරණා තුන තුළින් අපේ ජීවිතයේ අපි අර්ථවත් කරගන්න ඕන, මේ ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ශක්තියයි.

ඒ නිසා යමෙක් ඇහුවොත් අපි කොහොම ද මේ තෙමඟුල සිහිපත් කරන්නේ කියන කාරණය, අපි මේ තෙමඟුල සිහිපත් කරන්න ඕන, ආර්ය අෂ්ටාංගික මාර්ගය වැඩෙන ආකාරයට. ආර්ය අෂ්ටාංගික මාර්ගය වැඩෙන ආකාරයෙන් මේ තෙමඟුල සිහිපත් කිරීම තමයි බුදුරජාණන් වහන්සේ උදෙසා අපිට කරන්න තියෙන ශ්‍රේෂ්ඨ ම උපහාරය. ඊට වඩා උපහාරයක් නැහැ.

ඒ නිසා ආර්ය අෂ්ටාංගික මාර්ගය වැඩෙන ආකාරයෙන් පින්කම් සිද්ධ කරනවා කියන්නේ, මේ ශීල, සමාධි, ප්‍රඥා කියලා කොටස් තුනකට බෙදෙනවා.

ශීලයට අදාළ අංගයන් හැටියට බුදුරජාණන් වහන්සේ සම්මා වාචා, සම්මා කම්මන්තෝ, සම්මා ආජීවෝ කියන කාරණා තුන වෙන් කරනවා.

සමාධියට අදාළව බුදුරජාණන් වහන්සේ සම්මා වායාමෝ, සම්මා සති, සම්මා සමාධි කියලා වෙන් කරනවා.

ප්‍රඥාවට අදාළ කාරණා හැටියට බුදුරජාණන් වහන්සේ සම්මා දිට්ඨි, සම්මා සංකප්පයන් වෙන් කරනවා. එතකොට මේ ආර්ය අෂ්ටාංගික මාර්ගය මේ ආකාරයට බෙදලා තියෙනවා.

මෙහෙම බෙදද්දි, අපි දක්ෂ වෙන්න ඕන දකින්න, සම්මා දිට්ඨියෙන් තොරව කවදාක්වත් සම්මා සංකප්පයක් සකස් වෙන්නේ නැහැ. සම්මා සංකප්පයකින් තොරව කවදාක්වත් සම්මා වාචාවක් සකස් වෙන්නේ නැහැ. සම්මා වාචාවකින් තොරව කවදාක්වත් සම්මා කම්මන්තයක් සකස් වෙන්නේ නැහැ. සම්මා කම්මන්තයෙන් තොරව සම්මා ආජීවයක්, වායාමයක්, සතියක්, සමාධියක් සකස්

වෙන්නේ නැහැ කියලා. මේ එක අංගයෙන් අංගය තමයි මේක වැඩෙමින් යන්නේ. හේතුඵල ධර්මයක්. තේරුණාද?

එහෙනම් මේ ආර්ය අෂ්ටාංගික මාර්ගයේ මුල් ම මාර්ග අංගය තමයි, සම්මා දිට්ඨිය. එතකොට සම්මා දිට්ඨිය කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා වගේ ම, බුදුරජාණන් වහන්සේ මේ ආර්ය අෂ්ටාංගික මාර්ගය කොටස් දෙකකට බෙදනවා. එකක් ලෞකික ආර්ය අෂ්ටාංගික මාර්ගය. ඊළඟට ලෝකෝත්තර ආර්ය අෂ්ටාංගික මාර්ගය.

එතකොට ලෞකික ආර්ය අෂ්ටාංගික මාර්ගයේදී සම්මා දිට්ඨිය කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ,

- මුලින් ම '**තෙරුවන් කෙරෙහි වූ ශ්‍රද්ධාව**'.
- දෙවනුව '**කර්මය, කර්මඵල විශ්වාසය**'.
- තුන්වනුව '**තමන් මැරිලා හේතුඵල ධර්මයන් අනුව නැවත උපතක් තියෙනවා කියන විශ්වාසය**'.
- ඊළඟට '**දන් දුන්නොත්, සිල් සමාදන් වුණොත් එහි ආනිශංස තියෙනවා**'යි කියලා ඇතිකරගන්න විශ්වාසය.
- ඊළඟ එක තමයි '**අම්මා තාත්තාගේ ගුණයන් කෙරෙහි ඇතිකර ගන්නා වූ විශ්වාසය**'.
- ඊළඟ එක තමයි '**මේ ධර්මය සන්දිට්ඨිකව තියෙන තාක් කල් මේ උතුම් ආර්ය මාර්ගය තුළ ඒ ශක්තිමත් භාවයන්, ඒ ප්‍රතිඵලයන් ලබන්න පුළුවන්**' කියලා ඇතිකර ගන්නා වූ විශ්වාසය.
- ඊළඟට **ඕපපාතිකව සත්ත්වයින් උපදිනවාය කියන විශ්වාසය**

එතකොට යමෙක් තුළ මේ විශ්වාසයන් තියෙනවා නම්, එයා ලෞකික සම්මා දිට්ඨිය තුළ ඉන්නවා. එතකොට ලෞකික සම්මා දිට්ඨිය තුළ ඉඳීමෙන් අපිට ලැබෙන ඵලය මොකක් ද? සුගතියේ

උපතක් ලැබෙනවා. ඒක හොඳට තේරුම් ගන්න ඕන. ලෞකික සම්මා දිට්ඨිය තුළ ඉඳීමෙන් අපිට සුගතියේ උපතක් ලැබෙනවා.

ඒ නිසා යමෙක් වෙසක් දවස අරමුණු කරගෙන වෙසක් තොරණක් හදනවා නම්, වෙසක් කූඩුවක් හදනවා නම්, භක්ති ගීතයක් කියනවා නම්, ආමිසයෙන් පූජා පවත්වනවා නම් ඒක ලෞකික සම්මා දිට්ඨියට අයිති වෙනවා.

නමුත් මේ සම්මා සම්බුද්ධ ශාසනයේ අදක්ෂයෙකුත් ඉන්නවා; දක්ෂයෙකුත් ඉන්නවා; වඩාත් දක්ෂයෙකුත් ඉන්නවා.

අදක්ෂයා මොකද කරන්නේ? එදාට ඔළුබක්කෝ නටවලා හරි එයා දුගතියට අවශ්‍ය සංස්කාර රැස්කර ගන්නවා. එයා අදක්ෂයෙක්. එයා වෙසක් දවසට එහෙම නැත්නම් තෙමඟුලට නොගැළපෙන ආකාරයෙන් හැසිරෙනවා. එක්කෝ මත්පැන් බීගෙන එයා හැසිරෙනවා. එහෙම නැත්නම් වැරදි ආකාරයෙන් චර්යාවන්ගෙන් එයා හැසිරෙනවා. එහෙම නැත්නම් කාමය ඇවිස්සෙන ආකාරයේ දේවල් සිද්ධ කරමින් ඔය කටයුතු වලට එයා එදාට යනවා. එයා අදක්ෂයා. තෙමඟුල උපයෝගී කරගෙන එයා දුගතියට යනවා.

එතකොට දක්ෂයෙකුත් ඉන්නවා, මේ සම්මා සම්බුද්ධ ශාසනයේ. ඒ දක්ෂයා මොකක් ද කරන්නේ? ඒ දක්ෂයා එදාට එක්කෝ සිල් සමාදන් වෙනවා. එක්කෝ දාන, ශීල, භාවනා පින්කම්වල යෙදෙනවා. එක්කෝ එයා වෙසක් තොරණක් උදෙසා, එහෙම නැත්නම් වෙසක් කූඩුවක් උදෙසා, ඒ වගේ සැරසිලි උදෙසා බුදුරජාණන් වහන්සේ අරමුණු කරගෙන ඒවා සිද්ධ කරනවා. නැත්නම් එයා බුදුරජාණන් වහන්සේගේ ගුණයන් මෙනෙහි කරමින්, ඒවා සජ්ඣායනා කරමින් භක්ති ගීත කියනවා. ඉතින් මේවා ආමිස ගණයට වැටෙනවා. එතකොට එයා දක්ෂයා.

ඒ ආමිසය අපිට හේතුවෙනවා, අනිවාර්යයෙන් ම සුගතිය කරා යන්න. නමුත් ඒ ආමිසය තුළ එයා යෙදෙන්න ඕන සිල්පද

පහ ආරක්ෂා කරගෙන යි. සිල්පද පහ ආරක්ෂා කරගෙන ආමිසයේ යෙදුණොත්, එදාට ඒක සුගතිගාමී කුසලයක් බවටයි එයාට පත්වෙන්නේ. තේරුණාද?

නමුත් මේ ලෝකයේ, සම්මා සම්බුද්ධ ශාසනයේ සැබෑ ම දක්ෂයෙකුත් ඉන්නවා. ඒ සැබෑ ම දක්ෂයා එදාට, මේ සංස්කාරයන්ගේ අනිත්‍ය භාවය දකිමින් එයා විදර්ශනා නුවණ සකස් කරගන්නවා කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. වෙසක් තොරන් හදන්න, වෙසක් කූඩු හදන්න, භක්ති ගීත කියන්න එයා යන්නේ නැහැ. එයා මේ සංස්කාරයන්ගේ අනිත්‍ය භාවයන් නුවණින් මෙනෙහි කරනවා. එයා නුවණින් මෙනෙහි කරනවා.

'අතීතයේ බුදුරජාණන් වහන්සේලා ලක්ෂ ගාණක් මේ ලෝකයේ පහළ වුණා - ඒ සෑම බුදුරජාණන් වහන්සේ නමක් ම පිරිනිවී ගියා' කියන කාරණය එයා මෙනෙහි කරනවා. ඒ වගේ ම අපේ ගෞතම බුදුරජාණන් වහන්සේත් පිරිනිවී ගියා කියන කාරණය නුවණින් මෙනෙහි කරනවා. අතීතයේ සම්මා සම්බුද්ධ ශාසන ලක්ෂ ගාණක් පැවතියා. ඒ සෑම ශාසනයක් ම අතුරුදහන් වෙලා ගියා කියන කාරණය එයා නුවණින් දකිනවා.

ඒ වගේ ම මේ ගෞතම සම්මා සම්බුද්ධ ශාසනයත් කවදාහරි අතුරුදහන් වෙනවා කියලා එයා දකිනවා. අතීතයේ සම්මා සම්බුද්ධ ශාසනවල භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා සිව්වනක් පිරිස කෝටි, ප්‍රකෝටි ගාණක් වැඩසිටියා කියලා එයා දකිනවා. ඒ සෑම කෙනෙක් ම අනිත්‍ය භාවයට පත්වුණා කියලා දකිනවා.

එහෙනම් මේ මොහොතේ වැඩ සිටින මහා සංඝරත්නයත් අනිත්‍ය වූ ධර්මතාවයක් කියලා එයා දකිනවා. එයා අනාගතයේ දී කහපාට නූලක් විතරක් බැඳගත්ත කාසාය කණ්ඨකලාගේ ලෝකය නුවණින් දකිනවා. එතකොට ඒ දකින මොහොතක් පාසා එයා විදර්ශනා නුවණයි සකස් කරගන්නේ.

එයා දක්ෂයි දකින්න... අතීතයේ ගෙවාගෙන පැමිණි සම්මා සම්බුද්ධ ශාසනවල අපි වෙසක් තොරන් ලක්ෂ ගණන් ගොඩනගලා ඇති. අපි දන්සැල් ලක්ෂ ගණන් දීලා ඇති. අපි සිල් සමාදන් වෙලා ලක්ෂ වාරයක් ඉන්න ඇති අතීතයේ. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, අපි මේ ආවා වූ දීර්ඝ භව ගමනෙදි, ඔබත් මමත් සම්මා සම්බුද්ධ ශාසන මුණගැසුණු වෙලාවේ, අපි සිල් සමාදන් වෙන්න ඇන්ද සුදු සිල් රෙදි එක ගොඩක් ගැහුවොත් ගිජ්ඣකූට පර්වතයට වඩා විශාලයි කියලා. ඒ කියන්නේ ඒ සා සංසාරේ සිල් සමාදන් වෙලා තියෙනවා. නමුත් මේ සෑම ශීලයක් ම අපි භවය අරමුණු කරගෙන, සංස්කාරයන් කෙරෙහි ආස්වාදය තුළ ඉඳගෙන තමයි රැක්කේ. තේරුණාද?

එහෙනම් මේ සම්මා සම්බුද්ධ ශාසනයේ 'සැබෑ ම දක්ෂයා' තෙමගුල උපයෝගී කරගෙන, විදර්ශනා නුවණ කියන කාරණය සකස් කරගන්නවා. එතකොට 'අදක්ෂයා' තෙමගුල උපයෝගී කරගෙන ඔළුබක්කෝ නටලා, මත්පැන් පානය කරලා, වැරදි විදියට හැසිරිලා, අනුන් තුළ කාමච්ඡන්දයන් සකස් වෙන විදියට හැසිරිලා එයා දුගතියට යනවා. ඒ අදක්ෂයා.

'දක්ෂයා' සිල්පද පහ ආරක්ෂා කරගෙන, දාන, ශීල, භාවනා පින්කම් මෙහෙයවලා, වෙසක් තොරන් හදලා, වෙසක් කූඩු හදලා, භක්ති ගීත කියලා ආමිසයෙන් බුදුරජාණන් වහන්සේ පූජා කරලා.... හැබැයි සිල්පද පහ රැකගැනීම අත්‍යවශ්‍යයි. සිල්පද පහ බිඳගෙන තොරන් හැදුවා කියලා ඒගොල්ලන්ට වෙන සෙතක් නැහැ. සිල්පද පහ බිඳගෙන වෙසක් කූඩු තරග පැවැත්තුවා කියලා ඒගොල්ලන්ට වෙන සෙතක් නැහැ. සිල්පද ආරක්ෂා කරගෙන, ආමිසයෙන් බුදුරජාණන් වහන්සේ පූජා කරලා ඒගොල්ලෝ සුගතියට යනවා. තේරුණාද?

**අතුරු ප්‍රශ්නය :**

**ස්වාමීන් වහන්ස, මේ වෙසක් සමයේ දී නුවණැති බෞද්ධයා වඩාත් දක්ෂ විය යුත්තේ කුමක් සඳහා ද?**

**පිළිතුර :**

වෙසක් සතිය තුළ අපි දක්ෂ වෙන්න ඕනෙ, බුදුරජාණන් වහන්සේ තුළ තිබ්බා වූ ඒ අයෝමය කැපවීම මොහොතක් දකින්න. ඉතින් මේ වෙසක් සතිය සමරනවා කියන්නේ, බුදුරජාණන් වහන්සේගේ තෙමඟුල සමරනවා කියන කාරණයයි.

ඒ නිසා ඒ ලොව්තුරා සම්බුදුරජාණන් වහන්සේ උත්තම සම්මා සම්බුද්ධ ඥානය අවබෝධ කරගන්න කොයි සා කැපවීමක්, කොයි සා උත්සාහයක් ගත්තා ද කියන කාරණය අපි නුවණින් දකින්න ඕන. මොකද, අපි මේ ජීවිතයේ යම් සතුටක් ලබනවා නම්, මේ බණ ටික අහලා, මේ ධර්ම සාකච්ඡාව අහලා යම් සතුටක් ලබනවා නම්, එහෙම නැත්නම් මේ භව නිරෝධය කරා යන ගමන තුළ ගිහිල්ලා අපි යම් සතුටක් ලබනවා නම්, ඒ සතුට අපි ලබන්නේ ලොව්තුරා බුදුරජාණන් වහන්සේ නිසා.

අපි මැරිලා නැවත ඉපදෙනවා කියන කාරණය අපි දැනගත්තේ ලොව්තුරා බුදුරජාණන් වහන්සේ නිසා. ඒ වගේ ම මේ සා දුකෙන් පිරුණා වූ සතර අපායක් තියෙනවා කියලා අපි දැනගත්තේ ලොව්තුරා බුදුරජාණන් වහන්සේ නිසා. අම්මා තාත්තාට සැලකුවොත් ශක්‍රයා කියන තරම් ඉහළ සැපයකට යන්න පුළුවන් කියලා සැපයට තියෙන මාර්ගය අපි දැනගත්තේ බුදුරජාණන් වහන්සේ නිසා. ඒ වගේ ම මේ ජීවිතයේ දී මේ උතුම් සෝවාන්, සකෘදාගාමී, අනාගාමී, අර්හත් ඵලයන්ට පත්වෙන්න මේ උතුම් ආර්ය අෂ්ටාංගික මාර්ගය අපිට මතුකරලා දුන්නේ ලොව්තුරා බුදුරජාණන් වහන්සේ ම යි.

ඒ නිසා බලන්න, මේ සා සැනසිල්ලක් ලබන්න මාර්ගයක් සකස් කරලා දෙන්න ලොව්තුරා බුදුරජාණන් වහන්සේ කොයි සා කැපවීමක් සංසාරයක් පුරාවට කරන්න ඇත්ද කියලා අපි දකින්න ඕන. මොකද, අපි බුදුරජාණන් වහන්සේ ගැන දකිද්දි අපි දකින්නේ, සිදුහත් කුමාරයා හැටියට හිටියා, ගිහිගෙය හැරගියා, සම්මා සම්බුද්ධත්වයට පත්වුණා කියන කාරණය විතරයි. ඉන් එහා අප්‍රමාණ අර පාරමී ධර්මයන් පුරන කාලේ සාරාසංඛ්‍ය කල්ප ලක්ෂ සියක් කෝටි ගාණක් ආවා වූ ගමනේ උන්වහන්සේ කරපු කැපවීම අපි දකින්නේ නැහැ.

බුදුරජාණන් වහන්සේ පසුකාලීන ව ආනන්ද ස්වාමීන් වහන්සේට දේශනා කරනවා, *"මම මේ ආවා වූ දීර්ඝ පාරමී දම් ගමනෙදි, මම මේ මහ සාගරේ ජලයට වඩා රුධිරය දන් දුන්නා, ආනන්ද"* කියලා. *"මම මේ මහ පොළවේ පසට වඩා ශරීර මාංශ දන් දුන්නා, ආනන්ද. මම මේ ආකාසේ තියෙන තරු කැටවලට වඩා ඇස් ගලව ගලවා දන් දුන්නා, ආනන්ද. මම මේ මහාමේරුව උස පරාද වෙන තරමට ඔටුනු පැළැන්දා වූ හිස් දන් දුන්නා, ආනන්ද"* කියනවා. *"මට බිසවක්, රටක්, රාජ්‍යයක්, දරුවෙක්, මුණුබුරෙක් ලැබුණා නම් ඒ සෑම දෙයක් ම, ආනන්ද මම දන් දුන්නා."* කුමක් උදෙසා ද? ඔබත් මමත් මේ මොහොතේ මේ විඳින්නා වූ සැනසිල්ල උදෙසා පින්වතුනි.

ඊළඟට උන්වහන්සේ සිදුහත් කුමාරයා හැටියට උත්පත්තිය ලබනවා. ඒ සිදුහත් කුමාරයා හැටියට උත්පත්තිය ලබලා රම්‍ය, සුරම්‍ය, සුභ මාලිගා ලබනවා; සක්විති රජකමේ උරුමය ලබනවා; යශෝධරාව, ඒ වගේ ම රාහුල වගේ රූමත් බිරිඳක්, දරුවෙක් ලබනවා. ඒ සෑම දෙයක් ම අර උදේට එළියට දාන කෙළ පිඬක් වගේ එළියට දැම්මා. කවුරුන් උදෙසා ද? ඔබත් මමත් මේ මොහොතේ ලබන මේ සැනසිල්ල උදෙසා පින්වතුනි.

ඉන්පස්සේ උන්වහන්සේ හය අවුරුද්දක් දුෂ්කර ක්‍රියා කරනවා. බුදුරජාණන් වහන්සේ පසුකාලීනව දේශනා කරනවා, *"ආනන්ද, මට ගුරුවරයෙක් හිටියේ නෑ. පතක් පොතක් තිබුණේ නැහැ. මේ මාර්ගය දැන කියා ගන්න, කියලා දෙන්න කෙනෙක් හිටියේ නෑ. මම දුක තුළින් ම යි දුක ජය ගන්නේ කියලයි හිතුවේ.*

*ආනන්ද, ඒ නිසා මම අප්‍රමාණව මේ ශරීරෙට දුක් දුන්නා. එදා මගේ උදරය කියලා, පිට කොන්ද කියලා දෙකක් තිබ්බේ නැහැ. උදරය අතගානකොට පිට කොන්දයි අහුවුණේ. පිට කොන්ද අතගානකොට උදරයයි අහුවුණේ. ඒ සා මම මේ ශරීරයට දුක් දුන්නා, ආනන්ද. මම සමහරදාට එක කඩල ඇටයක් විතරයි වැළඳුවේ. සමහරදාට මම එක මුං ඇටයක් විතරයි වැළඳුවේ. සමහරදාට මම එක බත් ඇටයක් විතරයි වැළඳුවේ. ඊට වඩා දෙයක් මම මේ ශරීරෙට දුන්නේ නෑ, ආනන්ද.*

*දුක තුළින් ම යි දුක ජයගන්නේ කියල හිතුවේ. දැන් මට ඇවිදින්න බැහැ. දැන් මම කැලේ බඩගාමින් තමයි ජීවත් වෙන්නේ. මම බඩගාමින් ගිහිල්ලා, අර ගොපලු ගාල්වලට, ගොපලු රැන් ළඟට ගිහිල්ලා, ගොපලු දරුවා ඈතට යනකන් ඉඳලා, අර හරක්ගේ තනපුඩුවලට කට තියාගෙන කිරි උරා බිව්වා"* කියනවා. *"ඒ හරක් පයින් ගහද්දි ඒ ගොපලු ගාලේ ක්ලාන්තේ දාලා සතිය, දෙක මම වැටිලා හිටියා"* කියනවා. *"මට සිහිය එනකොට මට බඩගාගන්නත් පණ නෑ. මම අර හරක් පැටව් දාලා තිබ්බ කහපාට අසූචි වළඳනවා, ආනන්ද. ඒත් මට අපුලක්, දුගඳක් දැනුණේ නැහැ"* කියනවා.

එහෙනම් බලන්න බෝධි සත්ත්වයෝ අර හරක් පැටව් දාපු කහපාට අසූචි වළඳද්දිත් අපුලක්, දුගඳක් නො දැනුණේ කුමක් නිසා ද? ඔබටත් මටත් මේ සැනසිල්ල ලබාදීම උදෙසා ම යි. උන් වහන්සේ අවසානෙදි දැනගන්නවා, දුක තුළින් දුක ජයගන්න බැහැ කියලා. අර සුජාතාවගේ කිරිපිඬු දානය වළඳලා, ජය ශ්‍රී මහා බෝධි මූලෙ වාඩිවෙලා, උන්වහන්සේ චිත්තයක්, අධිෂ්ඨානයක් ඇතිකර

ගන්නවා, *"මේ ලේ, මස්, සම්, ඇට, නහර වියළේවා. මේ සම්මා සම්බුද්ධ රාජ්‍යය අවබෝධයෙන් තොරව නැගිටින්නේ නැහැ"* කියලා.

එතකොට මොකක් ද මේ බුදුරජාණන් වහන්සේ මෙතනදි කරන්නේ? ජය ශ්‍රී මහා බෝධි මූලයේදී බෝධි සත්ත්වයෝ ජීවිතය මරණයට දානවා. ජීවිතය මරණෙට දැම්මා. ජීවිතය මරණෙට දැම්මා කියන්නේ, රූපය කෙරෙහි තියෙන තෘෂ්ණාව අතහැරුණා; වේදනාව කෙරෙහි තියෙන තෘෂ්ණාව අතහැරුණා; සඤ්ඤාව, චේතනාව, විඤ්ඤාණය කෙරෙහි තියෙන තෘෂ්ණාව අතහැරුණා. පංචඋපාදානස්කන්ධය කෙරෙහි තියෙන තෘෂ්ණාව අතහැරෙද්දි, ජීවිතය මරණයට වැටෙද්දි අන්න චතුරාර්ය සත්‍යයත්, සම්මා සම්බුද්ධ රාජ්‍යයත් අවබෝධ කරගන්නවා.

එහෙනම් මෙවැනි වෙසක් සතියක ඒ බෝධි සත්ත්වයෝ සම්මා සම්බුද්ධ රාජ්‍යය අවබෝධ කරගන්නේ ජීවිතය මරණයට දාලා. ජීවිතය මරණයට දාලා ලබාගත්තා වූ අවබෝධයක ඵලයකුයි අපි මේ අත්විඳින්නේ. ඉන්පස්සේ බලන්න, ඒ උතුම් සම්මා සම්බුද්ධ රාජ්‍යය ලබලා, ඔබ නුවණින් මෙනෙහි කරන්න, මේ බෝධි සත්ත්වයෝ ආවා වූ සාරාසංඛ්‍ය කල්ප ලක්ෂ ගාණක් වූ දීර්ඝ පාරමී ගමනේ දී උන්වහන්සේ දේශනා කරනවා නම්, මේ මහා සාගරයේ ජලයට වඩා රුධිරය දන් දුන්නා කියලා, මහ පොළවේ පසට වඩා ශරීර මාංශ දන් දුන්නා කියලා, ආකාසේ තරුකැටවලට වඩා ඇස් ගලව ගලවා දන් දුන්නා කියලා, මහාමේරුවේ උස පරාද වෙන තරමට ඔටුනු පැළැන්දා වූ හිස් දන් දුන්නා කියලා; තමා තුළින් තමා ම නුවණින් දකින්න ලක්ෂ කී වාරයක් බුදුරජාණන් වහන්සේ ජීවිතය මරණයට දාන්න ඇත්ද කියලා. ලක්ෂ කී වාරයක් ජීවිතය මරණයට දාලා ලැබුවා වූ අවබෝධයක ඵලයක් පින්වතුනි, අපි මේ වෙසක් සතිය තුළ සමරන්නේ.

ඒ නිසා ඒ කැපවීම අද දවසේ ජීවිතය තුළින් දකින්න. කොයි සා කැපවීම් සම්භාරයක් මේ උතුම් සම්මා සම්බුද්ධ ඥානය උදෙසා බෝධි සත්ත්වයෝ කළා ද කියන කාරණය. ඒ සා කැපවීම් ජීවිත ලක්ෂ ගාණක් මරණයට දාලයි, බෝධි සත්ත්වයෝ මේ සම්මා සම්බුද්ධ ඥානය අවබෝධ කරගන්නේ. මේ සා කැපවීමක් කරලා අවසානෙ, 45 වසරක් ඒ සම්මා සම්බුද්ධ රාජ්‍යය අවබෝධ කරගෙන, උන්වහන්සේ මොකක් ද කළේ? ඔබත් මමත් වැනි අසරණ සත්ත්වයින්ට මේ නිවනේ මාර්ගය ම යි කියලා දුන්නේ පින්වතුනි.

අවසාන වශයෙන් උන්වහන්සේ පිරිනිවන් මංචකයේ සැතපිලා අවසාන වචනය හැටියට බුදුරජාණන් වහන්සේ අපිට මොකක් ද දේශනා කරන්නේ? ***"මහණෙනි, මේ සියලු සංස්කාරයෝ අනිත්‍යයි."*** සියලු සංස්කාරයෝ කියන්නේ පින්වතුනි, මේ කුසල් සංස්කාරයනුත් විපාක දීලා අනිත්‍ය වෙනවා; මේ අකුසල් සංස්කාරයනුත් විපාක දීලා අනිත්‍ය වෙනවා. ඒ නිසා ***"මේ කුසලයට, අකුසලයට බැඳෙන්න එපා. මේ කුසලයට, අකුසලයට බැඳෙන්නේ නැතුව, හිස ගිනි ගත්තෙක් ඒ ගිනි නිවන්නේ යම් සේ ද, භව ගින්දර ම නිවාගන්න"*** කියලයි බුදුරජාණන් වහන්සේ අපට දේශනා කරන්නේ.

ඒ නිසා වෙසක් සතියක් සමරන, තෙමඟුල සමරන මේ මොහොතේ අපි දක්ෂ වෙන්න ඕන, බුදුරජාණන් වහන්සේ කියන ඒ උතුම් චරිතය, මේ සා මේ සම්මා සම්බුද්ධ ඥානය අවබෝධ කරගන්න කළා වූ කැපවීම් සම්භාරය කොච්චරක් ද කියලා. ඒ සා කැපවීමක් කරලා, ඒ මහා සාගරයේ ජලයට වඩා රුධිරය දන් දීලා, මහ පොළවේ පස්වලට වඩා ශරීර මාංශ දන් දීලා, ජීවිතයේ ලක්ෂ වතාවකට වැඩිය ජීවිතය මරණයට දාලා මේ ලබාගත්තා වූ අවබෝධය තුළින් උන්වහන්සේ අපෙන් බලාපොරොත්තු වෙන්නේ එක ම එක දෙයයි. ඒ සා කැපවීමක් කරලා උන්වහන්සේ මේ

සම්මා සම්බුද්ධ රාජ්‍යය ලබගත්තත් උන්වහන්සේ, උන්වහන්සේගේ ශ්‍රාවකයින් හැටියට අපෙන් බලාපොරොත්තු වෙන්නේ එක ම එක දෙයයි පින්වතුනි.

ගිහි පින්වතුන්ලා ගෙන් ලොව්තුරා බුදුරජාණන් වහන්සේ බලාපොරොත්තු වෙන්නේ ***තෙරුවන් කෙරෙහි වූ අචල ශ්‍රද්ධාව ඇතිකර ගෙන, ශීලය ආර්ය ශීලයක් හැටියට වඩමින්, පංච උපාදානස්කන්ධයේ අනිත්‍ය භාවය දකිමින් ජීවත් වෙන්න කියන කාරණයයි*** පින්වතුනි. බලන්න අර සා කැපවීම් සම්භාරයක්, ජීවිතය ලක්ෂ වාර ගාණක් මරණයට දාලා උන්වහන්සේ ලැබුවා වූ අවබෝධය තුළින් උන්වහන්සේ අපෙන් බලාපොරොත්තු වෙන්නේ මේ සරල කාරණා තුන විතරයි පින්වතුනි. ගිහි පින්වතුන්ලාගෙන් බලාපොරොත්තු වෙන්නේ මේ සරල කාරණා තුන පමණයි.

ඒ කාරණා තුන තමයි, තෙරුවන් කෙරෙහි වූ අචල ශ්‍රද්ධාව. දෙවෙනි කාරණය ශීලය, ආර්ය ශීලයක් හැටියට වඩන්න. තුන්වෙනි කාරණය පංච උපාදානස්කන්ධය අනිත්‍යයි කියලා දකින්න පින්වතුනි. එහෙනම් මෙවැනි වෙසක් සතියක් සමරන මේ මොහොතේ ඒ බුදුරජාණන් වහන්සේ අපෙන් බලාපොරොත්තු වුණා වූ දේ අපි ඉටුකරන්න දක්ෂ නැත්නම් පින්වතුනි, ඒ අදක්ෂ භාවය විසින් ම අපි බුදුරජාණන් වහන්සේට ණයකරුවෙක් බවට පත්වෙනවා. මොකද, අපි උදෙසා බෝධි සත්ත්වයෝ අර සා කැපවීම් සම්භාරයක් දැක්වූවා. ඒ වගේ ම ලක්ෂ වාර ගාණක් ජීවිතය මරණයට දැම්මා.

ඒ සියල්ල සිද්ධ කරලා අවසානෙ උන්වහන්සේ ශ්‍රාවකයින් හැටියට අපෙන් බලාපොරොත්තු වෙන්නේ තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවත්, ශීලය ආර්ය ශීලයක් හැටියට රැකීමත්, පංච උපාදානස්කන්ධයේ අනිත්‍ය භාවයත් කියන කාරණ තුන නම්, අපි දක්ෂ වෙන්න ඕන, මේ වෙසක් සතිය තුළ ඒ තෙරුවන් කෙරෙහි වූ අචල ශ්‍රද්ධාව ඇතිකරගෙන, ඒ වගේ ම ශීලය ආර්ය ශීලයක්

හැටියට වඩමින්, පංච උපාදානස්කන්ධයේ අනිත්‍ය භාවය දකිමින් ජීවත් වෙන්න පින්වතුනි. අපි දක්ෂ වුණොත් ඒ කාරණා තුන දකිමින් මේ වෙසක් සතිය ගත කරන්න, එතනදි අපි බුදුරජාණන් වහන්සේට ණය නොවූ ශ්‍රාවකයෙක් බවට පත්වෙනවා.

ඉන් මෙහා අපි උත්සාහ ගන්නේ වෙසක් සතිය තුළ මේ ශ්‍රද්ධාවෙන්, ශීලයෙන්, එහෙම නැත්නම් අනිත්‍ය සංඥාවෙන් බැහැර වෙලා ජීවත් වෙන්න නම්, වෙනදා වගේ ම කාමච්ඡන්දයන් උපදින ආකාරයේ කටයුතු කරලා ජීවත් වෙන්න නම්, සිල්පද පහ බිඳෙන ආකාරයෙන් කටයුතු කරලා ජීවත් වෙන්න නම්, ඒ කරන කටයුත්තක් කටයුත්තක් පාසා ම අපි බුදුරජාණන් වහන්සේට ණයකරුවෙක් බවට පත්වෙනවා පින්වතුනි.

එහෙනම් බුදුරජාණන් වහන්සේට ණයකරුවෙක් වුණාය කියන්නේ, එහි බරපතළ අකුසල් විපාකයන් අපිට සංසාරයක් පුරාවට අත්විඳින්න වෙනවා. මොකද, බෝධි සත්ත්වයෝ අර සා කැපවීම් සම්භාරයක් සිද්ධ කළා, අපිට මේ උතුම් ධර්මය ලබලා දෙන්න. උන්වහන්සේට අවශ්‍යතාවයක් තිබ්බේ නැහැ, භවයට බැහැලා මෙච්චර දුක් විඳින්න, උන්වහන්සේ වෙනුවෙන්. උන්වහන්සේට එහෙම නම් තිබුණා, දීපංකර බුදුරජාණන් වහන්සේගේ පාද මූලයේදි චතුරාර්ය සත්‍යය අවබෝධ කරලා රහත් භාවයට පත්වෙන්න. එහෙනම්, එදා ඒ චතුරාර්ය සත්‍යය අවබෝධය අතහැරලා, මේ සා දුක් කන්දරාවක් විඳගෙන මේ සංසාරයට බහින්නේ අපි නිසා ම යි.

ඒ නිසා, අපි නිසා නම් මේ සා දුක් කන්දරාවක් බෝධි සත්ත්වයෝ වින්දේ, ජීවිතයේ ලක්ෂ වතාවකට වැඩිය මරණයට දාලා තියෙනවා නම්, අපි දක්ෂ වෙන්න ඕන, ඒ ශාස්තෘන් වහන්සේ උදෙසා අපිට කරන්න තියෙන යුතුකම් ඉටු කරන්න.

ඒ යුතුකම හැටියට උන්වහන්සේ ගිහි පින්වතුන්ලාගෙන් බලාපොරොත්තු වුණේ මේ **තෙරුවන් කෙරෙහි වූ අචල ශ්‍රද්ධාවත්, ශීලය ආර්ය ශීලයක් හැටියට වැඩීමත්, පංච උපාදානස්කන්ධය අනිත්‍ය භාවය දැකීමත්.** ඒ නිසා මේ වෙසක් සතිය තුළ ඔබ දක්ෂ වෙන්න, මේ කාරණා තුන ජීවිතයට එකතු කරගෙන ඔබ බුදුරජාණන් වහන්සේට ණයකරුවෙක් නො වූ දරුවෙක් බවට පත්වෙන්න.

**අතුරු ප්‍රශ්නය :**

**ස්වාමීන් වහන්ස, මේ ත්‍රෛමංගල්‍යයන් සැමරෙන සමයේ ආමිස පූජාවන් ගැන කතා කරද්දි අපි දකිනවා, දන්සැලක් දීලා අවසානයේ මත්පැන් පානය කරලා විවිධ විකාර රූපී නර්තනයන් වල යෙදෙන පිරිස්. එහෙම නොවෙන පිරිස් බොහෝයි. ඒ පිළිබඳවත් මතක් කරන්න ඕන. ඒ වගේ ම ඔළුබක්කෝ, ඇටසැකිලි නටවනවත් අපි දකිනවා. හොල්මන් මන්දිරත් මේ කාලෙදි ඉදිවෙනවා. මේ ක්‍රියාවන්වල ප්‍රතිඵල කොයි ආකාරයෙන් ද පැහැදිලි කරගන්න පුළුවන් ස්වාමීන් වහන්ස?**

**පිළිතුර :**

මේවා අනිවාර්යයෙන් ම දුගතියට වැටෙන්නේ. ඒගොල්ලොන්ගේ කර්මය, කර්මඵල විශ්වාසය නැතිකම. තේරුණාද? කර්මය, කර්මඵල විශ්වාසයකින් තොරව අපි දන්සැල් දාහක් දුන්නත් තේරුමක් නැහැ. සිල්පදයක් රකින්නේ නැතුව, කර්මය, කර්මඵල විශ්වාසය නැතුව දන්සැල් දාහක් දුන්නත් තේරුමක් නැහැ.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, ඔය කැලේ ඉන්න අලියෙක්, කැලේ ඉන්න සිංහයෙක්, කැලේ ඉන්න කොටියෙක්, ඒ අලියෙක්, සිංහයෙක්, කොටියෙක් වෙලා උපදින්නේ ඇයි? පෙර ජීවිතයේ කර්මය, කර්මඵල විශ්වාසයෙන් තොරව පින්කම් සිද්ධ කළා; දන් දුන්නා. ඒගොල්ලන්ට කර්මය, කර්මඵල විශ්වාසයක්

තිබ්බේ නැහැ. පින්කම් කරලා, දන් දීලා, ඊළඟට මත්පැන් බීගෙන කාමච්ඡන්දයන් තුළ ජීවත් වෙලා අර දුගතියට අවශ්‍ය සංස්කාරයි රැස් කළේ.

නමුත් දුගතියට වැටෙද්දි දානය ඇවිල්ලා විපාකෙට එනවා. ඇයි? දන්සැල් දුන්නානේ... විපාකෙට එනවා. අන්න කැලේ රජ්ජුරුවෝ වෙලා එයා ඉපදෙනවා. ඒ අලියෙක් වෙලා, කොටියෙක් වෙලා, සිංහයෙක් වෙලා ඉපදුණොත් රටේ රජ්ජුරුවෝ කැලේට ගියත් අලියෙක්, කොටියෙක් දැක්කොත් මඟහැරලා යන්න ඕන. ඇයි එයාට ඒ සා බලයක් ලැබුණේ? දානයේ ආනිශංස. තේරුණාද? ඒ නිසා අපි පින්කමක් කරද්දි වෙසක් අරමුණු කරගෙන, වෙසක් සතිය අරමුණු කරගෙන අපි පින්කම් සිද්ධ කරනවා නම්, ඒ සෑම පින්කමක් ම සිල්පද පහ ආරක්ෂා කරගෙනයි පින්කම් කරන්න ඕන.

සිල්පද පහ බිඳගෙන කරන්නා වූ සෑම පින්කමක් ම, අපිව දුගතිය කරායි අරන් යන්නේ. නමුත් දුගතියට වැටුණට පස්සේ අපිට ඒ පින විපාකෙට එනවා. තේරුණාද? අතන මත්පැන් බීලා දන්සැල් දුන්නා. නමුත් ඊට අදාළ සංස්කාරයන් දුගතියට දාන කොට, දානයට අදාළව මැරුණු තැනදි විපාකෙට එනවා.

අදක්ෂයා සිල්පද බිඳගෙන, එදාට පින්කම් සිද්ධ කරලා දුගතිය සකස් කරගන්නවා. එයා තෙමඟුල තුළින් දුගතියයි සකස් කරගන්නේ. දක්ෂයා සිල්පද ආරක්ෂා කරගෙන, ආමිසය තුළ ජීවත් වෙලා සුගතියට අවශ්‍ය පාර සකස්කර ගන්නවා. සැබෑ ම දක්ෂයා මේ සෑම සංස්කාරයක ම අනිත්‍ය භාවය නුවණින් දැකලා, මේ සෑම කුසල්, අකුසල් සංස්කාරයක් ම විපාක දීලා අනිත්‍ය වන බව නුවණින් දැකලා, එයා මේ පංච උපාදානස්කන්ධයේ අනිත්‍ය භාවය වඩලා, ඒ තෙමඟුල දවසේ උතුම් විදර්ශනා නුවණ සකස්කර ගන්නවා.

එතකොට එතනදි එයා තමයි ලෝකෝත්තර ආර්ය අෂ්ටාංගික මාර්ගය වඩන කෙනෙක් බවට පත්වෙන්නේ. එතකොට අර දන්සල් දීලා, ආමිසය තුළ සිල්පද ආරක්ෂා කරගෙන ජීවත් වෙන කෙනා, වෙසක් තොරණ හදලා සිල්පද ආරක්ෂා කරගෙන ජීවත් වන කෙනා, එහෙම නැත්නම් සිල් සමාදන් වෙලා ශීල භාවනා පින්කම්වල යෙදෙන කෙනා එදාට ලෞකික සම්මා දිට්ඨිය තුළ තමන්ට අවශ්‍ය සංස්කාර රැස්කර ගන්නවා.

ඉතින් මේ කාරණා තුනක් තියෙනවා. අදක්ෂයා දුගතියට යන පාර සකස්කර ගන්නවා. දක්ෂයා සුගතියට යන පාර සකස්කර ගන්නවා. වඩාත් ම දක්ෂයා විදර්ශනා නුවණ සකස්කර ගන්නවා.

ඒ නිසා ලෝකය කවදාක්වත් අපිට තෙමඟුල උදෙසාවත් ඔය වෙසක් තොරන්, එහෙම නැත්නම් ඔය වෙසක් කූඩු, එහෙම නැත්නම් භක්ති ගීත, ඕවා එපා කියලා අපට කියන්න බැහැ. හැම කෙනාගෙ ම ඉන්ද්‍රිය ධර්මයන් එක හා සමාන ව වැඩිලා නැහැ. එකිනෙකාට වෙනස් ආකාරයෙන් තමයි ශ්‍රද්ධා, වීර්ය, සති, සමාධි, ප්‍රඥා කියන ඉන්ද්‍රියන් වැඩිලා තියෙන්නේ. ඒ නිසා ඒ ඉන්ද්‍රිය ධර්මයන්ට අදාළව ඒ අය එදාට හැසිරෙනවා. අපිට ඒ ගැන කාටවත් දොස් කියන්න බැහැ. ලෝකයේ ස්වභාවය එහෙමයි.

ඒ කියන්නේ එදාට වෙසක් තොරන් තියෙන්නත් ඕන; වෙසක් කූඩු තියෙන්නත් ඕන; භක්ති ගීත තියෙන්නත් ඕන. ඒ වගේ ම එදාට මේ සියලු සංස්කාරයෝ අනිත්‍යයි කියලා දකින පිරිසකුත් ලෝකයේ ඉන්න ඕන. ඒ නිසා අපේ දක්ෂ භාවය මත අපිට නිදහස තියෙනවා, සැබෑ ම දේ තෝරා ගන්න.

ඒ නිසා තමන් කැමති නම් ලෞකික ආර්ය අෂ්ටාංගික මාර්ගය තුළ එදාට ජීවත් වෙලා, සුගතියට අවශ්‍ය සාධක සකස් කරන්න පුළුවන්. ඒ වගේ ම ලෞකික ආර්ය අෂ්ටාංගික

මාර්ගයත්, විදර්ශනා නුවණින් දකලා අවශ්‍ය කෙනාට ලෝකෝත්තර සම්මා දිට්ඨිය, ලෝකෝත්තර ආර්ය අෂ්ටාංගික මාර්ගයට අදාළ විදර්ශනා නුවණක් සකස් කරගන්න පුළුවන්. එතකොට ලෞකික සම්මා දිට්ඨිය කියලා මම කිව්වේ, තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව, කර්මය, කර්මඵල විශ්වාසය, මැරිලා නැවත හේතුඵල ධර්මයන් අනුව උපතක් තියෙනවාය කියන විශ්වාසය, අම්මා තාත්තාගේ ගුණයන් පිළිබඳ විශ්වාසය, දන් දුන්නොත්, සිල් රැක්කොත් ආනිශංස තියෙනවා කියන විශ්වාසය.

දැන් මේ විශ්වාසය අපි තුළ තියෙනවා නම් අපි කොතැනද ඉන්නේ? ලෞකික ආර්ය අෂ්ටාංගික මාර්ගය තුළ. එතකොට මේක ලෝකෝත්තර ආර්ය අෂ්ටාංගික මාර්ග යක් බවට පත් කරන්නේ මේ ලෞකික ආර්ය අෂ්ටාංගික මාර්ගය විදර්ශනා නුවණින් දකින්න දක්ෂ වෙන කෙනා. විදර්ශනා නුවණින්. එතනයි ලෝකෝත්තර ආර්ය අෂ්ටාංගික මාර්ගය, නිවන් මාර්ගයට අදාළ මාර්ගය වැඩෙන්නේ. මේක කොහොම ද විදර්ශනා නුවණින් දකින්නේ? ලෞකික ආර්ය අෂ්ටාංගික මාර්ගය? දැන් ඔබ හිතන්න, ලෞකික ආර්ය අෂ්ටාංගික මාර්ගයේ එක අංගයක් තමයි, තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව. දැන් අපි ගෙවාගෙන පැමිණි සම්මා සම්බුද්ධ ශාසන ලක්ෂ ගානෙදි අපි කොච්චර නම් තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව සකස් කරගෙන ඉන්න ඇත්ද? නමුත් ඒ නිසා කුමක් ද අපිට ලැබුණේ? සුගතියේ උපතක්. ආයෙමත් ඒ සංස්කාර ඉවර වෙද්දි ආයෙමත් අපි සතර අපායට වැටුණා.

එහෙනම් ලෞකික සම්මා දිට්ඨිය තුළ සකස් වෙන තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව නිත්‍ය වූ දෙයක් ද? අනිත්‍ය වූ දෙයක් ද? අනිත්‍ය වූ දෙයක්. එහෙනම් ඒ අනිත්‍ය වූ දේ අනිත්‍ය භාවයෙන් දකින මොහොතේ විදර්ශනා නුවණයි සකස් වෙන්නේ. තේරුණාද? දැන් අපි කර්මය, කර්මඵල විශ්වාසයෙන් සංසාරයේ කොච්චර සිල් රකින්න ඇත්ද? කොච්චර දන් දෙන්න ඇත් ද? නේද?

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, බුදුරජාණන් වහන්සේලා අරමුණු කරගෙන, මහා සංඝරත්නය අරමුණු කරගෙන ඔබත් මමත් සංසාරයේ පූජා කරලා තිබෙන්නා වූ දානයන් එක ගොඩක් ගැහුවොත් ගිජ්ඣකූට පර්වතයට වඩා විශාලයි කියලා. ඒ සා දන් අපි සංසාරේ පූජා කරලා තියෙනවා. නමුත් ඒ සංස්කාර නිත්‍ය ද? අනිත්‍ය ද? අනිත්‍යයි. විපාක දීලා අනිත්‍ය වුණා.

ඔබත් මමත් අම්මා තාත්තාගේ ගුණයන් හඳුනගෙන, අම්මලා තාත්තලා කරේ තියාගෙන අපි කොච්චර සලකන්න ඇත්ද? නමුත් ඒ සංස්කාර නිත්‍ය ද? අනිත්‍ය ද? අනිත්‍යයි.

අන්න මේ ලෞකික සම්මා දිට්ඨිය විදර්ශනා නුවණින් දකිද්දි අන්න ලෝකෝත්තර සම්මා දිට්ඨිය සකස් වෙනවා. ඒ විදියට මුලින්ම අපි ලෞකික ආර්ය අෂ්ටාංගික මාර්ගය තුළ ශක්තිමත් වෙලා, මේ ලෞකික ආර්ය අෂ්ටාංගික මාර්ගය විදර්ශනා නුවණින් දකලා ලෝකෝත්තර ආර්ය අෂ්ටාංගික මාර්ගයට යන්න ඕන. ඒ නිසා දක්ෂයා තෙමඟුල දවසේ ලෞකික ආර්ය අෂ්ටාංගික මාර්ගය තුළ ජීවත් වෙනවා. එයා දක්ෂයා.

සැබෑ ම දක්ෂයා එදාට මේ ලෞකික ආර්ය අෂ්ටාංගික මාර්ගයත් විදර්ශනා නුවණින් දකලා ලෝකෝත්තර ආර්ය අෂ්ටාංගික මාර්ගය තුළ වැඩෙමින් ඉන්නවා. අන්න ඒ එයා තමයි බුදුරජාණන් වහන්සේ දේශනා කරන සැබෑ ම, බුදුරජාණන් වහන්සේට උපහාරයන් දක්වපු, ගෞරව දක්වපු කෙනා බවට පත්වෙන්නේ.

# සශ්‍රීක දෙවියන්ගේ ආශ්චර්යවත් ක්‍රියාකාරකම්

**තිස්පස්වන ප්‍රශ්නය :**

**ගෞරවණීය ස්වාමීන් වහන්ස, එදා අලුත් අවුරුදු දිනයේ දී කිරිවෙහෙරෙන් කිරි පැහැති දියරයක් ගලා යනවා එම පූජනීය භූමියේ සිටි මිනිසුන් දුටුවා. තවත් එවැනි ම ආශ්චර්යවත් සිදුවීම් රාශියක් මේ රටේ පසුගිය කාලේ සිද්ධ වුණා. එවැන්නක් සිදුවිය නොහැකි බවට සමහරක් ස්වාමීන් වහන්සේලා හේතු දැක්වුවා. ගරු ස්වාමීන් වහන්ස, අපි කොහොම ද පැහැදිලි කරන්නේ? එවැන්නක් විය නොහැකි ද ස්වාමීන් වහන්ස?**

**පිළිතුරු :**

නෑ, මෙහෙමයි. ඒවා සිදුවෙන්නේ හේතුඵල ධර්මයන් මත. අපි ඊට ඉස්සෙල්ලා ධාතූන් වහන්සේලා ගැන කතා කරමුකෝ.

දැන් සමාජය තුළ මතයක් තියෙනවා, ධාතූන් වහන්සේලා එක තැනක ඉඳගෙන තව තැනකට වඩිනවා කියලා. දැන් සමහරු කියනවා, "මගේ ධාතු කරඬුවේ හිටිය ධාතූන් වහන්සේලා අතුරුදහන් වෙලා" කියලා. සමහරු කියනවා "මගේ ධාතු කරඬුන් වහන්සේ එක ධාතූන් වහන්සේයි හිටියේ. දැන් තුන් නමක් ඉන්නවා" කියලා. ධාතූන් වහන්සේලා දෙනමක් වැඩම කරලා තියෙනවා. ඒ නිසා මේ ධාතූන් වහන්සේලා තැනින් තැනට වඩිනවා කියලා පින්වතුන්ලාගේ මතයක් තියෙනවා.

නමුත්, ධාතූන් වහන්සේලාට කවදාක්වත් තැනින් තැනට වැඩම කරන්න බැහැ. ධාතූන් වහන්සේ නමක් කියන්නේ මේ සතර මහා ධාතුවෙන් හැදුණු රූපයක් පමණයි. තේරුණාද? ඒ ධාතූන් වහන්සේ තුළ විඤ්ඤාණයක් බැසගෙන නැහැ. විඤ්ඤාණයක් බැසගෙන නැති නිසා පංච උපාදානස්කන්ධයක් සකස් වීමක් නැහැ; නාම ධර්මයන් සකස් වීමක් නැහැ. එතන රූපයක් පමණයි තියෙන්නේ. එතකොට, රූපයක් පමණක් තියෙනවා නම් කවදාක්වත් ඒ රූපයට ඍද්ධියක් සකස් වෙන්නේ නැහැ. එයාට එක තැනක ඉඳලා තව තැනකට වඩින්න පුළුවන්කමක් නැහැ.

ඒ නිසා ධාතූන් වහන්සේලා වඩිනවා කියන කාරණය ධර්මයට එකඟ නැහැ. නමුත් ධාතූන් වහන්සේලාට මේ දේ සිද්ධ වෙනවා. මේ දේ සිද්ධ වෙන්නේ, ඒ ධාතූන් වහන්සේලාගේ වැඩීමක් නෙවෙයි. මේවා මේ දෙවියන් තමයි එක තැනකින් තව තැනකට අරගෙන යන්නේ. තේරුණාද?

මොකද, දැන් මේ ලෝකයේ සාරිපුත්ත මහ රහතන් වහන්සේගේ ධාතූන් වහන්සේලා කොහේ හරි වැඩ ඉන්නවා නම්, නිවසක හෝ පන්සලක මේ මොහොතේ, සාරිපුත්ත මහ රහතන් වහන්සේගේ ශිෂ්‍යයෝ වෙලා හිටපු ස්වාමීන් වහන්සේලා, භික්ෂුණීන් වහන්සේලා, ගිහි පින්වතුන්ලා, දසදහස් ගණන් දෙවිවරු වෙලා දිව්‍ය තලවල ඉන්නවා. මුගලන් මහ රහතන් වහන්සේගේ ශිෂ්‍යයෝ වෙලා ජීවත් වෙච්ච භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකාවන් දසදහස් ගණන් දිව්‍ය තලවල සෝවාන්, සකෘදාගාමී, නැත්නම් ලෞකික දෙවියන් හැටියට ජීවත් වෙනවා.

එතකොට මේ දෙවිවරුන්ට දිවැස් තියෙනවා. ඒ දෙවියා දන්නවා, තමාගේ ගුරුවරයාගේ ධාතූන් වහන්සේ වැඩ ඉන්නේ කොතැනද කියලා. මෙතන අපි ගෙදරක් කියලා හිතමුකෝ. මෙතන සාරිපුත්ත මහ රහතන් වහන්සේගේ ධාතූන් වහන්සේලා මෙතන

වැඩ ඉන්නවා නම් ගෙදර ගෘහ මූලිකයා ඒ ධාතූන් වහන්සේලා උදෙසා කිසි ම වත්පිළිවෙතක් කරන්නේ නැත්නම්, අර උඩ ඉන්න දෙවියෝ දිවැසින් දකිනවා. දිව්‍ය ශ්‍රෝත තියෙනවා ඒගොල්ලන්ට.

ඒ දිව්‍ය ශ්‍රෝතවලින් දකින දෙවිවරු මේ ධාතූන් වහන්සේ ගෙනැල්ලා සුදුසු තැනක තියනවා. ඒකයි මේ ධාතූන් වහන්සේලා ගමන් කරනවා කියන්නේ. එහෙම නැතුව ධාතූන් වහන්සේලාට ඍද්ධියක් නැහැ. ධාතූන් වහන්සේ කියන්නේ රූපයක් පමණයි. නාම ධර්මයන් සකස්වීමක් නැහැ. මොකද, ධාතූන් වහන්සේ තුළ විඤ්ඤාණයක් බැසගෙන නැහැ. ඒ නිසා ධාතූන් වහන්සේ කෙනෙක් කියන්නේ සතර මහා ධාතුවක් විතරයි. ඒ සතර මහා ධාතුවට කවදාක්වත් ඍද්ධි ප්‍රාතිහාර්ය පෑමේ ශක්තියක් නැහැ.

එහෙනම් මෙතන සකස් වෙන්නේ, මේ දෙවියන් තමයි මේ සිද්ධීන් සිද්ධ කරන්නේ. එතකොට ඒ විදියට බලද්දි, බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, බුදුරජාණන් වහන්සේ ළඟට අද රාත්‍රියේ දෙවියෙක් ආවා. එයා මුළු ප්‍රදේශය ම කහපාටින් ආලෝකවත් කරගෙන ආවේ කියනවා. ඒ දෙවියා ම හෙට දවසෙත් එනවා. එදාට මුළු ප්‍රදේශය ම නිල්පාටින් ආලෝකවත් කරගෙන එන්නේ කියනවා. ඒ දෙවියන් ඊට පහුවදාත් එනවා. එදාට එයා රතුපාටින් ප්‍රදේශය ම ආලෝකවත් කරගෙන එන්නේ කියනවා. ඒ වගේ, මේ ආලෝකවත් දෙවිවරු අප්‍රමාණව ජීවත් වෙනවා.

එක දවසක් අපි දන්න ස්වාමීන් වහන්සේ නමක් රාත්‍රි 11.00ට විතර තවත් ස්වාමීන් වහන්සේ නමක් එක්ක ධර්ම සාකච්ඡාවක් පවත්වලා. පැය 3 ක් 4 ක් ධර්ම සාකච්ඡාවක් පවත්වලා හොඳ සමාධිමත් හිතෙන් ඉන්න වෙලාවේ, ඒ ස්වාමීන් වහන්සේ අහස දෙස බලද්දි මුළු අහස ම එක එක පැහැයන්ගෙන්... මම හිතන්නේ ලක්ෂ ගාණක් පැහැයන්. නිල්පාට, කහපාට, දම්පාට, රතුපාට.... හරියට වෙසක් තොරන් අහසේ පායලා වගේ. ඒ සා ආලෝකවත් දෙවිවරු පින්වතුනි. දසදහස් ගණන් දෙවිවරු. එය අපිට මෙච්චරයි කියලා කියන්න බැහැ.

එතකොට මේ සමහර ශක්තිමත් පින්කම් කරන වෙලාවේ, එහෙම නැත්නම් රුවන්වැලි මහා සෑය, කිරිවෙහෙර මහා සෑය වගේ තැන්වලදී ශක්තිමත් පින්කම් කරන කොට සමහර පින්වතුන්ලා කියනවා, "අන්න බුදුරැස් දැක්කා. අන්න බුදුරැස් දැක්කා" කියලා. බුදුරැස් නැවත අපිට ලෝකයේ දකින්න ලැබෙන්නේ නැහැ. බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පාලා ඉවරයි. ඒ බුදුරැස් හැටියට අපි දකින්නේ දිව්‍ය ආලෝක. තේරුණාද? අර පින්කමට සම්බන්ධ වෙච්ච, අර පින්කම දැකලා සාධුකාර දුන්න, අර පින්කම දිව්‍ය සෝතවලින් අහන් හිටපු දෙවිවරු දහස් ගාණක් එක එක වර්ණයන්ගෙන් ආකාසය තුළ සැරිසරන කොට අපිට බුදුරැස් හැටියට පේනවා. නැතුව බුදුරැස් නෙවෙයි ඒ.

බුදුරැස් ආයෙමත් පහළ වෙන්නේ නැහැ. බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පාලා ඉවරයි. බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑවාට පස්සේ බුදුරැස් ලෝකයේ තියෙනවා කියනවා නම් ඒක ආත්මීය සංඥාවක් වෙනවා. ඒක ධර්මයට එකඟ නැහැ. බුදුරජාණන් වහන්සේ පැහැදිලි ව සූත්‍රයකින් දේශනා කරනවා, බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑවාට පස්සේ මේ ලෝකයේ කිසි ම දෙවියෙකුට, බ්‍රහ්මයෙකුට, මනුස්සයෙකුට නැවත බුදුරජාණන් වහන්සේගේ රූපකාය දකින්න ලැබෙන්නේ නැහැ කියලා. සූත්‍රයකින් දේශනා කරන්නේ.

එහෙනම් බුදුරජාණන් වහන්සේගේ රූපකාය දකින්න ලැබෙන්නේ නැත්නම් බුදුරැස් ලෝකයේ කොහෙවත් සැඟවිලා තියෙන්න බැහැ. එහෙනම් මේ පින්කම් කරන වෙලාවේ පිනට කැමති සම්‍යක්දෘෂ්ටික දෙවිවරු ආලෝකවත් ස්වභාවයෙන් දසදහස් ගණනක් එනකොට ඒ එක එක ආලෝකයන් එකට ළංවෙලා දකිද්දි අපි ඒවා දකින්නේ බුදුරැස් විදිහට.

ඒ වගේ, කිරිවෙහෙර තුළ ඔවැනි දෙයක් සිද්ධ වුණා නම්, මම නම් දැක්කේ නැහැ. ඒවා බුදුරජාණන් වහන්සේ වැඩ සිටිය පූජනීය

ස්ථාන. ඒ නිසා අපි කිරිවෙහෙර දිහා දකින්නත් ඕන ජීවමාන බුදුරජාණන් වහන්සේ හැටියට ම යි. ඒ වගේ ම කිරිවෙහෙරට අධිගෘහිත දෙවි කෙනෙක් ඉන්නවා, **මහසෙන්** දෙවියෝ කියලා. ඒ මහසෙන් දෙවියෝ ශ්‍රද්ධාවට අධිගෘහිත දෙවි කෙනෙක්.

අපි දන්න එක්තරා ස්වාමීන් වහන්සේ නමක් උතුම් සමාධියෙන් පසු වෙනකොට උන්වහන්සේට මේ මහසෙන් දෙවියො අරමුණු වෙලා තියෙනවා. ඒ මහසෙන් දෙවියො කිරි ම කිරි පාට... කිරිවෙහෙර වහන්සේ අලුතෙන් තීන්ත ආලේප කරපු වෙලාවට බැබළෙන්නා වූ කිරි ම කිරි පාට වර්ණයක් තියෙනවානේ. ඒ පාට වර්ණයකින් යුක්ත අර උඩරට මනමාලයෝ අඳිනවා වගේ ඇඳුමක් ඇඳලා සුදු පාට සැට්ටය වගේ එක ඇඳපු, කිරි ම කිරි පාට, ශ්‍රද්ධාවට අධිගෘහිත දෙවි කෙනෙක්. එයා කිරිවෙහෙරට අධිගෘහිතවයි ඉන්නේ.

එතකොට එහෙනම් මේ දෙව්වරු කියන අය ඉන්නවා. ඒ අය පින් ගන්නවා. පින් දැකලා සතුටු වෙනවා. අර වගේ පූජාවක් සිද්ධ කරපු වෙලාවක දෙවියන් සිය ගණන්, දහස් ගණන් ඒ කොත ආශ්‍රිතව වැඩ ඉන්න පුළුවන්. තේරුණාද? ඒ දෙව්වරු, කිරි පාට ආලෝකවත් දෙව්වරු සිය ගණන්, දහස් ගණන් ඒ කොත අසල වැඩ සිටින කොට අපිට ඒ ආලෝකය වැගිරෙන කිරක් වගේ තමයි පෙනෙන්නේ. තේරුණාද? එහෙම නැතුව මම දන්න ධර්මය තුළ.... මොකද, අපි අන්තයන්ට බර වෙලා නෙවෙයි ධර්මය දකින්න ඕන. අන්තයන්ට බර වුණොත් ධර්මයේ අර්ථයෙන් අපි බැහැරට යනවා.

ඒ නිසා ඒ වෙලාවට කිරි වැගිරෙනවාය කියන කාරණයක් ගැන මම කියන්න දන්නේ නැහැ. මම ඒ දේ දකින්නේ දෙව්වරු සිය ගාණක් එකතු වෙච්ච වෙලාවක දෙවියන්ගේ ප්‍රභාශ්වර කිරි ආලෝකය, කිරි දියරයක් හැටියට පල්ලෙහාට වැටෙනවා.

එහෙම නැත්නම් දෙවියන්ට පුළුවන් උතුරන කිරි දෝතින් අරගෙන වගුරුවන්න. එහෙම වගුරුවන්න පුළුවන්.

දැන් එක ස්වාමීන් වහන්සේ නමක් කැලේ වැඩ ඉන්නකොට, ඒ කාලේ ඒ ස්වාමීන් වහන්සේට ආහාර පිළිබඳ හුඟක් හිඟ පාඩුවක් තිබිලා තියෙනවා. නමුත් කොහෙවත් ඒ ගමේ අයට ස්වාමීන් වහන්සේලාට මේ පැණිරසක්, අතුරුපසක්, පලතුරක් දීලා පුරුද්දක් නැහැ. ඒ නිසා මේ ස්වාමීන් වහන්සේගේ ශරීරයේ සීනි ප්‍රමාණය අඩුවෙලා තියෙනවා. නමුත්, අපිට විනයක් තියෙනවා, අපිට කෙනෙක්ගෙන් කටින් යමක් ඉල්ලන්න බැහැ. නමුත් ඉල්ලන්න බැරිවුණත්, යමක් ගන්න ක්‍රමය බුදුරජාණන් වහන්සේ දේශනා කරලා තියෙනවා.

එතකොට ඒ ස්වාමීන් වහන්සේ කාගෙන්වත් ඉල්ලන්න ගිහිල්ලා නැහැ. දැන් මේ ස්වාමීන් වහන්සේ මෙහෙම සති දෙකක් විතර, දීර්ඝව ඒ දානෙ වළඳමින් ඉන්න කොට එක හවසක මේ ස්වාමීන් වහන්සේට දැඩි ක්ලාන්තයක් ඇවිල්ලා තියෙනවා. එතකොට උන්වහන්සේ දැනගෙන තියෙනවා, මේ ක්ලාන්තය ආවේ ශරීරයේ සීනි ප්‍රමාණය අඩුවෙලා කියලා. නමුත් ඒ ගමේ කිසි ම කෙනෙක් කවදාක්වත් සීනි පූජා කරලා නැහැ.

නමුත් මේ කුටියේ දැන් රෑ හත, අට වෙනකොට ස්වාමීන් වහන්සේට දැන් හොඳට ම ක්ලාන්තෙයි. එයා හොඳට ම දන්නවා දැන් සීනි නැහැ කියලා. මේ කුටියේ තිබිලා තියෙනවා පරණ සීනි බෝතලයක්. ඒ වෙලාවේ ඒ සීනි බෝතලේ ඇලිච්ච සීනි තිබිලා තියෙනවා. එයා ඒ සීනි බෝතලේට වතුර දාලා ඒක කලවම් කරලා ඒක වළඳලා තියෙනවා. නමුත් ඒත් ඒක දැනිලා නැහැ. තවත් උන්වහන්සේට ක්ලාන්තේ වැඩිවෙන කොට උන්වහන්සේ දෙවෙනි පාරත්, "අනේ! අරක තවත් පොඩ්ඩක් හරි සීනි ඇති"යි කියලා ඒකත් දාලා වළඳලා තියෙනවා. දැන් ඒත් ස්වාමීන් වහන්සේට බැහැ.

දැන් රෑ 10, 11 වෙනකොට උන්වහන්සේගේ දැන් සම්පූර්ණයෙන් ම ඔළුව උන්වහන්සේගේ පාලනයෙන් බැහැර වෙලා. සීනි අඩු වුණාට පස්සේ ඒ දේ සිද්ධ වෙනවා. උන්වහන්සේ

දැන් හොඳට ම දන්නවා, එළිවෙන කොට උන්වහන්සේ අපවත් වෙයි කියලා. ඉතින් අපවත් වුණොත් මිනිස්සු හොයාගෙන එයි, හෙට උදේට පිණ්ඩපාතේ වැඩියෙ නැත්තේ ඇයි කියලා.

උන්වහන්සේ ඉස්සෙල්ලා ම අර දොරේ තියෙන ලොක් එක අයින් කරලා තියනවා. අයින් කරලා උන්වහන්සේ කොට්ටෙට හිස තියලා, උන්වහන්සේ "සිතත්, කයත් දෙක මගේ නෙවෙයි" කියලා අතහැරලා තියනවා. දැන් උන්වහන්සේට මේ දැනෙන්නා වූ වේදනාව මට අයිති දෙයක් නෙවෙයි කියලා එයා පංච උපාදානස්කන්ධය අතහැරලා ඇස් දෙක පියාගෙන තියෙනවා.

එතකොට එයාට එහෙම ම නින්ද ගිහිල්ලා තියෙනවා. නින්ද ගියාට පස්සේ... ඒක සමාධිමත් නින්දක්. එක පාරට එයාට සමාධියෙන් එයාගේ අත මෙහෙම ඉස්සිලා තියෙනවා. මේක සමාධියෙන් වෙන දෙයක්. මෙහෙම ඉස්සෙද්දි මේ අතට රත්තරන් පාට සීනි අහුරක් හම්බවෙලා තියෙනවා. ඒ රත්තරන් පාට සීනි අහුර ඒ ස්වාමීන් වහන්සේ සමාධියෙන් ම තොලගාලා තියෙනවා. එතනින් ඒක ඉවරයි.

දැන් උදේ පාන්දර තුනහමාරට විතර ස්වාමීන් වහන්සේ අවදි වෙලා. අවදි වෙද්දි අර ඊයේ රාත්‍රියේ තිබුණ කිසි ම අමාරුවක් උන්වහන්සේට නැහැ. උන්වහන්සේ උදේ හයට නැගිටලා හැතැප්ම දෙකක් පිණ්ඩපාතෙත් වැඩලා පිණ්ඩපාතෙත් කරගෙන ඇවිල්ලා තියෙනවා.

එතකොට ඒ රෑ මොකක් ද වුණේ සමාධියෙන්? දෙවියන් දිව්‍ය ඕජාව දුන්නා. ඒ රත්තරන් පාට සීනි කියන්නේ දිව්‍ය ඕජාව. එතකොට ඒ දෙවියන් දිව්‍ය ඕජාව තමයි දුන්නේ. තේරුණාද? දෙවියන්ගේ ආහාර එහෙම තමයි. දෙවියන්ට යම් පැණි රසක් වළඳන්න හිතනකොට අර වගේ ම ඒක පහළවෙලා ඉවරයි. එතකොට ඒ දිව්‍ය ඕජාව තමයි ඒ රත්තරන් පාට සීනි අහුර හැටියට දෙවියන් දුන්නේ.

මොකද, මෙතන භික්ෂුවක් සිත, කය අතහරින කොට, පංච උපාදානස්කන්ධය අත්හරින කොට, ඒක මේ ලෝකයේ තියෙන ශ්‍රේෂ්ඨ ම අතහැරීමක්. ඒ ශ්‍රේෂ්ඨ ම අතහැරීම අතහැරෙද්දි දිව්‍ය ලෝකවලට ඒක දැනෙනවා. දෙවියෝ බලනවා, මොකක් ද වුණේ කියලා. එතකොට එතනදි තමයි දෙවියන් ඒ දිව්‍ය ඕජාව දෙන්නේ.

ඒ වගේ දෙවියන්ට පුළුවන් නම් ඒ ජීවිතයේ අතහැරපු භික්ෂුවක් උදෙසා ඒ රත්තරන් සීනි අහුරක් දිව්‍ය ඕජාව හැටියට දෙන්න, දෙවියන්ට කවදාහරි කිරිවෙහෙරේ කොත ළඟට අර පල්ලෙහා උතුරන කිරිවලින් දෝතක් අරන් පල්ලෙහාට දාන්න බැරිකමක් නැහැ

එහෙනම් ඒවා අපි ධර්මානුකූලව ගළප ගන්න ඕන. එහෙම නැත්නම් අපි හිතනවා නම් කිරි වෙහෙර සෑ සමිඳුන්ගෙ ඇතුළෙන් කිරි ගලාගෙන ආවා කියලා ඒවා ධර්මානුකූලව අපි ගළපා ගනිද්දි අවබෝධාත්මක පැත්තට අපිට බාධා සිද්ධ වෙනවා. ඒවා අන්තයකටයි යන්නේ. ඒනිසා මේවා දෙවියන්ගේ ආශ්චර්යයන්.

# වර්ෂාව ඇති කරවන්නේ දෙවියන් විසින් ද?

**තිස්භයවන ප්‍රශ්නය :**

**ගරු ස්වාමීන් වහන්ස, ශ්‍රී දළදා මාලිගවේ දන්ත ධාතූන් වහන්සේ බොහෝ දෙනාට වන්දනා මාන කිරීම පිණිස දැකබලා ගැනීම පිණිස එළියට වැඩම කරවන අවස්ථාවන්වල විවිධ වූ ආශ්චර්යමත් සිද්ධීන් වනවා. වර්ෂාව ඇද හැලීම් වැනි සිද්ධීන් අපිට උදාහරණයක් හැටියට දැක්විය හැකියි. එවැනි සිදුවීමුත් දෙවියන්ගේ ආශ්චර්යයන් ද ස්වාමීන් වහන්ස ?**

**පිළිතුර :**

එහෙයි. එහෙයි. අනිවාර්යයෙන් ම ඒ දෙවියන්ගේ ආශ්චර්යයන්. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා හේතූන් කිහිපයක් නිසා වැසි වසිනවා කියලා. එකක් දෙවියන් කාමච්ඡන්දයන් විඳිනකොට වැහි වහිනවා. දෙවියෝ කියන්නේ මේ සෑම වළාකුලකට ම අධිගෘහිත දෙවියන් ඉන්නවා. හොඳද? ඒගොල්ලන්ට කියනවා වැස්සවලාහක දෙවියෝ කියලා.

වළාකුළු උපාදානය කරගෙන වැස්ස උපාදානය කරගෙන ජීවත් වන අය ඉන්නවනේ, සමහර ගම්මාන වල. ඒගොල්ලෝ වහින වෙලාවත් දන්නවා, පායන වෙලාවත් දන්නවා. ඒවා උපාදානය කරගෙන ඒගොල්ලෝ ජීවත් වෙනවා. එතකොට මැරෙන වෙලාවේ මෙවැනි උපාදානයන් සකස් වුණොත් වැස්ස කෙරෙහි තෘෂ්ණාව

එහෙම සකස් වුණොත් ඒ අය ඒ වළාකුළුවල ගිහිල්ලා වැස්ස වලාහක දෙවියන් වෙලා උපදිනවා.

බුදුරජාණන් වහන්සේ කියනවා, වැස්ස වළාහක දෙවියෝ කවුද? වැස්ස වළාහක දෙවියන්ගේ බිසව කවුද? වැස්ස වළාහක දෙවියන්ට බොහොම ලස්සන සුරූපී දූවරු දෙන්නෙක් ඉන්නවා කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. ලොකු දුවගේ නම තමයි "කෝකනදා". පොඩි දුවගේ නම තමයි "චුල්ල කෝකනදා". එතකොට මේ දෙව්වරු සිය ගණන් දිව්‍යාංගනාවෝ වට කරගෙන ඉන්නවා කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

මේගොල්ලෝ කාමච්ඡන්දයන් විඳිනවා. විනෝද වෙනවා. සතුටු වෙනවා. ක්‍රිකට් ගහනවා, වොලිබෝල් ගහනවා, සෙල්ලම් කරනවා වගේ ඒගොල්ලොත් වළාකුළු උඩ ඉඳන් සතුටු වෙනවා. කාමච්ඡන්දයන් විඳිනවා. සෙල්ලම් කරනවා. විනෝද වෙනවා. එහෙම විනෝද වෙන කොට මේ වළාකුළු එකට ගැටෙනවා. එකට ගැටීම නිසා වැස්ස ඇතිවෙනවා කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

ඊළඟට බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා වැස්ස ඇතිවීමට තව හේතුවක් තමයි සතර මහා ධාතුව කිපීම නිසා වැස්ස ඇතිවෙනවා. දැන් ඔය මහා ගොරවලා, අකුණු ගහලා වහින වැහි තියෙන්නේ, ඒ වැස්ස වළාහක දෙවියෝ ඒකට සම්බන්ධ නැහැ. ඒවා සතර මහා ධාතුවේ කිපීම් නිසා ඇතිවෙන්නා වූ දේවල්. ඔය සමහර වෙලාවට අපි පින්කමක් කරද්දි ලස්සන මල් වැහි වහින්නේ වැස්ස වළාහක දෙවියෝ සතුටු වෙනවා, ඒ වෙලාවෙට කාමච්ඡන්දයන් විඳිනකොට ඒ මල් වැහි වහිනවා.

වැස්ස ඇතිවෙන්න තුන්වෙනි කාරණය බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා මේ රාහු කියන අසුරේන්ද්‍රයා එයාගෙ දෝතින් මහ සාගරයට අත් දෙක දාලා වතුර අහුරක් අරගෙන

බිමට දැම්මොත්, ඒ වතුර අහුරට මුළු දඹදිවට ම වහිනවා කියලා. මොකද රාහු කියන අසුරෙන්ද්‍රයා ඒ සා මේ ලෝකයේ සිටින විශාල ම සත්ත්වයෙක්. තේරුණාද? අපි කියනවා මේ ඉර, රාහු ගිල්ලා කියලා.

බුදුරජාණන් වහන්සේගේ කාලෙ මේ රාහු ඇවිල්ල ඉර ගිලිනවා. ගිලින කොට මේ ඉරට අධිගෘහිත දෙවියෙක් බුදුරජාණන් වහන්සේට ඇවිල්ලා කියනවා මේ රාහු ඉර ගිල්ලා කියලා. එතකොට අඳුරු වුණා මුළු ලෝකය ම. මොකද ඉර ගිලලා තියෙන්නේ රාහු. ඒ වෙලාවේ බුදුරජාණන් වහන්සේ දෙවියට කියනවා ඔබ ගිහිල්ලා රාහුට කියන්න බුදුරජාණන් වහන්සේගේ ආඥාවේ බලයෙන් මොහුව අතහරින්න කියන්න කියලා. ඒ දෙවියා ගිහිල්ලා කියනවා රාහුට. ඒ කියන වෙලාවේ රාහු ඉර අතහැරලා පැනලා යනවා.

ඒ කියන්නේ රාහු කියන්නේ ඒ සා විශාල කෙනෙක්. ඔබ හිතන්නකෝ දැන් ඉර කියන ධර්මය මේ මොහොතේ මුළු ආසියාව ම එළිය කරනවා. ඔබ මෙහෙම දැන් අහස දිහා බැලුවොත් ඔබට පේන්නේ පුංචි රවුමක් විතරයි. නමුත් මේ පුංචි රවුම මේ මොහොතේ මුළු ආසියාව ම එළිය කරනවා. එහෙනම් බලන්න, ඒ සා ශක්තියක් තියෙන හිරු රාහු ඇවිල්ලා ගිලිනවා නම්, රාහු කොච්චර විශාල කෙනෙක් වෙන්න ඕනද? රාහු ඉරටත් වඩා ශක්තිමත් කෙනෙක් වෙන්න ඕන. මේ රාහු එයාගෙ ශක්තිමත් විශාල අත්දෙක මහ සාගරේට මෙහෙම දාලා වතුර දෝතක් අරන් එළියට දැම්මොත් ඒ වතුර දෝතට මුළු දඹදිවට ම වහිනවා කියනවා.

මෙන්න මේ කාරණා තුන නිසා වැස්ස සකස් වෙනවා කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

ඒ නිසා ඔය විශේෂයෙන් ම දළදා මාලිගාවේ පින්කම් කරද්දී, ඔය විශේෂ ස්ථානවල පූජනීය ස්ථානවල පින්කම් කරද්දී, ඒ ධාතූන් වහන්සේලා ප්‍රදර්ශනයන් සිද්ධ කරද්දි ඒ වහින වැහි වැස්ස වළාහක දෙවියන් කාමච්ඡන්දයෙන් සතුටු වීම නිසා, වහින්නා වූ වැහි. ඒවා ධර්මයේ සඳහන් වෙනවා.

# මේ ජීවිතයේ චතුරාර්ය සත්‍යය දැකීම සඳහා කාරණා තුනක් වඩන්න

**තිස්හත්වන ප්‍රශ්නය :**

**ගෞරවණීය ස්වාමීන් වහන්ස, භාවනාවේ තිබෙන වටිනාකම කොහොමද අපි පැහැදිලි කරගන්නේ ?**

**පිළිතුර :**

මෙහෙමයි, ඒක පැහැදිලි කරගන්නේ ශ්‍රද්ධාව තුළින්. බුදුරජාණන් වහන්සේගේ මහපට ඇඟිල්ලේ තියෙන නියසිලට මහ පොළොවෙන් පස් ටිකක් අරගෙන ලෝකයාට පෙන්නලා කියනවා *"මහණෙනි, මේ මැරෙන සත්ත්වයින්ගෙන් සුගතිගාමී වෙන්නේ මේ නියසිලේ තියෙන පස් ප්‍රමාණයටයි"* කියලා.

දැන් මොකක්ද මේකෙන් බුදුරජාණන් වහන්සේ ලෝකයාට දේශනා කරන්නේ? මැරෙන සත්ත්වයින්ගෙන් ශ්‍රද්ධාව සකස් කරගෙන ඉන්නේ නියසිලේ තියෙන පස් ප්‍රමාණයටයි. එහෙම කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා මේ ලෝකයේ තියෙන ශ්‍රේෂ්ඨ ම ධනය ශ්‍රද්ධාව කියලා. ශ්‍රද්ධාවට වඩා ශ්‍රේෂ්ඨ ධනයක් නැහැ. ඔබට සක්විති රජකම තියෙන්න පුළුවන්. සක්විති රජකමටත් වඩා ශ්‍රද්ධාව ශ්‍රේෂ්ඨයි කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

එහෙනම්, මේ ශ්‍රද්ධාව කියන කාරණය එසේ මෙසේ ලේසි දෙයක් වෙන්න බැහැ. එහෙනම් අපි දකින්න ඕන අපි

ලක්ෂයකට බණ කිව්වත් ඒ ලක්ෂයෙන් මේ ධර්මය අල්ලන්නේ මේ නියසිලේ තියෙන පස් ප්‍රමාණයටයි කියන කාරණය. බුදුරජාණන් වහන්සේයි මේ කියන්නේ. තේරුණාද? ඒ සා මේක දුෂ්කර වූ කාරණයක්. බුදුරජාණන් වහන්සේ ඒකයි කියන්නේ මෙච්චර මනුස්සයෝ ජීවත් වෙන ලෝකයේ මෙපමණයි සුගතිගාමී වෙන්නේ කියලා. අපි ඒ ධර්මතාවය දකින්න ඕන.

ඒ නිසා අපි දක්ෂ වෙන්න ඕන බුදුරජාණන් වහන්සේ මේ නියසිලට අරන් පෙන්වන පස් ටිකෙන් එක වැලි කැටයක් වෙන්න. ඒ දක්ෂ භාවය, ඒ අධිෂ්ඨානය තුළයි භාවනාව ශක්තිමත් වෙන්නේ. භාවනාව ශක්තිමත් වෙන්නේ. ඒ අධිෂ්ඨානය නැති තාක් කල් අපි භාවනාව දුර්වල කරගන්නවා. කාටවත් දොස් කියන්න බැහැ. මොකද බුදුරජාණන් වහන්සේ ම දේශනා කරනවා මෙපමණයි සුගතිගාමී වෙන්නේ කියලා. මේ මම කියන කාරණයක් නෙවෙයි, බුදුරජාණන් වහන්සේයි දේශනා කරන්නේ.

එහෙනම් අපි දක්ෂ වෙන්න ඕන, අපි ශක්තිමත් ආකාරයෙන් වීර්යය ඇතිකර ගන්න ඕන, මේ බුදුරජාණන් වහන්සේ දේශනා කරන මේ බලවත් අනතුරු ඇඟවීම නුවණින් මෙනෙහි කරලා නිහතමානී භාවය ඇති කරලා අපේ තියෙන ශ්‍රද්ධාවේ දුර්වලතාවයන් හඳුනාගන්න.

ඒ නිසා කෙනෙකුට භාවනාව වැඩෙන්නේ නැත්නම් සතිය, සමාධිය පිළිබඳව ප්‍රශ්නයක් තියෙනවා නම්, එයා සතිය, සමාධිය ගැන නෙමෙයි හිතන්න ඕන. ඉන් ඉස්සරහා තියෙන සම්මා දිට්ඨිය ගැනයි හිතන්න ඕන. සම්මා සංකප්පයන් ගැනයි හිතන්න ඕන. මොකද මේවායේ දුර්වලතාවයන් නිසයි සතිය, සමාධිය අපි තුළ සකස් වෙන්නේ නැත්තේ. තේරුණාද?

ඒ නිසා භාවනාවේ දුර්වලතාවයක් තියෙනවා නම්, ඒ කියන්නේ වීර්යයේ දුර්වලතාවයක් තියෙනවා. වීර්යය දුර්වල වෙන්න එක ම හේතුව ශ්‍රද්ධාවේ දුර්වලභාවය නිසා.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා ඔබට මේ ජීවිතයේ චතුරාර්ය සත්‍යය දකින්න ඕන නම්, ඔබ කාරණා තුනයි වඩන්න ඕන කියලා.

- එක ශ්‍රද්ධාව.
- දෙක වීර්යය.
- තුන හිරිඔතප්.

එහෙනම් ශ්‍රද්ධාව සකස් කරගත්ත කෙනා තුළ ඊළඟට සකස් වෙන්නේ මොකක්ද? වීර්යය. කුමක් කෙරෙහි වීර්යය ද? ආර්ය අෂ්ටාංගික මාර්ගය තුළ ගමන් කිරීමේ වීර්යය. ඒ වීර්යයෙන් එයා ආර්ය අෂ්ටාංගික මාර්ගය තුළ ගමන් කරන කොට එයා තුළ හිරිඔතප්, ලැජ්ජාව භය දෙක සකස් වෙනවා. කුමක් සඳහා ද? නැවත සතර අපායට වැටීම කෙරෙහි ලැජ්ජාව, භය.

මොකද අපි තාම සෝවාන් ඵලයට පත්වෙලා නැත්නම්, නැවත තිරිසන් සතෙක් වෙන්නේ නෑ කියලා සහතිකයක් අපිට නැහැ. නැවත ප්‍රේතයෙක්, තිරිසතෙක්, අසුරයෙක් වෙන්නේ නෑ කියලා සහතිකයක් අපිට නැහැ. එහෙනම් මාර්ගය තුළ වීර්යයෙන් ගමන් ගනිද්දි, අන්න ඒ සහතිකය අපිට ලැබෙනවා. තේරුණාද? මොකද එයා හිරිඔතප් දෙක ඇතිකර ගන්නවා. එහෙනම් මුල් වෙන්නේ, ශ්‍රද්ධාවයි.

ඒ නිසා අපි මේ කාරණයේ දී දැන ගන්න ඕන බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, මේ නියසිලට ගන්න පස් ප්‍රමාණයයි සුගතිගාමී වෙන්නේ. මහ පෙළොවේ පස් ප්‍රමාණයට දුගතියටයි යන්නේ. නියසිලේ තියෙන පස් ප්‍රමාණයයි ශ්‍රද්ධාව සකස් කර ගන්නේ. මහ පොළොවේ තියෙන පස් ප්‍රමාණයට අමූලිකා ශ්‍රද්ධාව තුළයි ඉන්නේ. බුදුරජාණන් වහන්සේයි මේ දේශනා කරන්නේ. මෙතනදි නිහතමානීභාවය අපිට අත්‍යවශ්‍ය වෙනවා, මේ කරුණෙන් අපි පරිපූර්ණ වෙන්න.

එතනදි බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, මේ ශ්‍රද්ධාව සකස් වෙන්න නම්, කාරණා තුනක් අපි ඇතිකර ගන්න ඕන කියලා. පින්කම් කළා කියලා, සිල්පද පහ රැක්කා කියලා, දන් දුන්නා කියලා, ශ්‍රද්ධාව සකස් වෙනවා කියලා බුදුරජාණන් වහන්සේ කොතැනකවත් දේශනා කරලා නැහැ. ඒවා අවශ්‍යයි මාර්ගයට. නමුත් ඔබ තුළ තාම සංසාරය කෙරෙහි බියක් සකස් වෙලා නැත්නම්, ඒ කියන්නේ ශ්‍රද්ධාවේ දුර්වලතාවයක් නිසා. එහෙම නම්, කොතැනකදිවත් භාවනාවෙන් සාර්ථක ප්‍රතිඵලයක් ලබාගන්න බැහැ.

ඒ නිසා මූලික කාරණය ශ්‍රද්ධාවයි. ඒ නිසා අනිවාර්යයෙන් ම ශ්‍රද්ධාව කියන කාරණය ශක්තිමත් ආකාරයෙන් පෝෂණය කරන්න. එතකොට වීර්යය සකස් වෙනවා. ආර්ය අෂ්ටාංගික මාර්ගය තුළ ඉස්සරහට යනවා.

# ඔබේ සංස්කාරයන්ට ගැලපෙන කෙනා ඔබට ලැබී ඇති බැවින් ඒ ගැන ගැටෙන්න එපා!

**තිස්අටවන ප්‍රශ්නය :**

**ගරු ස්වාමීන් වහන්ස, ගෙදරක සෙසු සාමාජිකයන් ප්‍රතිපත්ති ගරුක අයුරින් හැසිරෙන කොට එක් සාමාජිකයෙක් පමණක් අනෙක් අයගේ හිත රිදවමින් එම ප්‍රතිපත්තීන් කඩමින්, හැසිරෙන්නට පුළුවන්. එවිට මගේ අම්මා, මගේ තාත්තා, මගේ දරුවෝ ඇයි මෙහෙම හැසිරෙන්නේ කියලා කෙනෙක්ට පශ්චාත්තාපයක් ඇතිවෙන්න පුළුවන්. මෙය කොහොමද අපි ධර්මානුකූලව අවබෝධ කරගත යුත්තේ ?**

**පිළිතුර :**

ඒ ලෝක ස්වභාවයන්. ඔබට අම්මා කෙනෙක් ලැබුණා නම්, ඔබේ සංස්කාරයන්ට ගැළපෙන අම්මා කෙනෙක් තමයි ලැබුණේ. ඔබට තාත්තා කෙනෙක් ලැබුණා නම් ඔබේ සංස්කාරයන්ට ගැළපෙන තාත්තා කෙනෙක් ලැබුණේ. ඔබට බිරිඳක්, ස්වාමිපුරුෂයෙක් ලැබුණා නම්, ඔබේ සංස්කාරයන්ට ගැළපෙන බිරිඳක්, ස්වාමිපුරුෂයෙක් ලැබුණේ. ඔබට දරුවෙක් ලැබුණා නම්, ඔබේ සංස්කාරයන්ට ගැළපෙන දරුවෙක් තමයි ඔබට ලැබුණේ.

ඔබට ඒ සංස්කාරයන්ට ගැළපෙන කෙනා ලැබුණාට පස්සේ ලැබුණ කෙනා ගැන ගැටිලා වැඩක් නැහැ. දැන් ඔබ හිතන්න ඔබ ගිය ජීවිතයේ මනුස්සයෙක් වෙලා විවාහ ජීවිතයක් ගත කරපු

කෙනෙක්. ඔබ ගිය ජීවිතයේ ඔබේ ස්වාමිපුරුෂයාට දැඩි ආකාරයෙන් පීඩනයක් එල්ල කළා. එහි ප්‍රතිඵලය හැටියට මේ ජීවිතයේ ඔබට ලැබෙන්නා වූ ස්වාමිපුරුෂයා ඔබට දැඩි ආකාරයෙන් පීඩා කරන කෙනෙක් බවට පත්වෙනවා.

එතකොට ඔබේ ස්වාමිපුරුෂයා ඔබට පීඩා කරන ස්වභාවයට පත්වෙද්දි ඔබ ස්වාමිපුරුෂයා වෙතින් ධර්මය දකින්න දක්ෂ වෙන්න ඕන. මොකද ස්වාමිපුරුෂයා තුළ ධර්මය තියෙනවා. එතකොට ඔබ ළඟ ධර්මය තියෙද්දි, ඔබ ධර්මය මගහැරලා මේ එරමිණියා ගොතාගෙන භාවනා කරන්න යනවා. මේ ධර්මයේ කමටහන මේ ළඟ තියෙනවා. මොකක්ද කමටහන? මේ සංස්කාරයන්ගේ ස්වභාවය. තේරුණාද?

ඒ නිසා ඔබේ අකීකරු ස්වාමිපුරුෂයා තුළින්, ඔබේ අකීකරු බිරිඳ තුළින්, ඔබේ අකීකරු දරුවා තුළින්, ඔබේ අකීකරු අම්මා, තාත්තා, තුළින් ඔබ සංස්කාරයන්ගේ ස්වභාවයයි දකින්න ඕන. ඒ සංස්කාරයන්ගේ ස්වභාවය දකිමින් ඔබට ජීවත් වෙන්න පුළුවන් නම්, ඔබ ජීවත්වන හැම තත්පරය ම විදර්ශනා නුවණ සකස් කරගත්ත කෙනෙක් බවටයි පත්වෙන්නේ.

**අතුරු ප්‍රශ්නය :**

**සමාවෙන්න ස්වාමීන් වහන්ස, එම තැනැත්තාව හෝ තැනැත්තියව යහමඟට ගැනීමට කොතෙක් උත්සාහ කළත්, නිවැරදි වීම සඳහා ඒ පුද්ගලයාට ශක්තියක් නැති අවස්ථාවල බොහෝදෙනා කණගාටුවකට පත්වෙනවා, ස්වාමීන් වහන්ස!**

**පිළිතුර :**

වැඩක් නැහැ. තේරුමක් නැහැ. එයාට ඒ ශක්තිය නැත්තේ ඊට අදාළ සංස්කාරයන්ගෙන් එයා පරිපූර්ණ නැහැ. මොකක්ද සංස්කාර? ඊට අදාළ කළ්‍යාණ මිත්‍ර ආශ්‍රය, සද්ධර්ම ශ්‍රවණය, නුවණින් මෙනෙහි කිරීම දුර්වලයි. වෙන හේතුවක් නිසා නෙවෙයි.

ඒ නිසා එවැනි කෙනෙක් ඉන්නවා නම්, අපි උත්සාහ කරන්න ඕන, එයාට ඒ අවස්ථාවන් සලසලා දෙන්න. එයා ඒ අවස්ථාවන් සලසලා දෙද්දිත් ඒවා ගන්නේ නැත්නම්, අපි දක්ෂ වෙන්න ඕන එයාට ආදර්ශයක් වෙන විදියට අපි ජීවත් වෙන්න. තේරුණාද?

දැන් ගෙදර නෝනයි, මහත්තයයි, දරුවොයි ඉන්නවා. ගෙදර නෝනා හැමදා ම භාවනා කරන්න යනවා. ඉතින් ගෙදර ඇවිල්ලා බනිනවා 'ඔයා කිසිදෙයක් කරන්නේ නැහැ. භාවනාවක් කරන්නේ නැහැ. මේවා කරන්නේ නැහැ' කියලා. නෝනා ගෙදර ආපු වෙලාවේ ඉඳන් මහත්තයත් එක්ක රණ්ඩු කර කරයි ඉන්නේ.

ඉතින් මහත්තයා බලනවා 'දෙයියනේ භාවනාවක් කළා නම් මෙහෙම වෙන්න විදියක් නැහැ. ඒ නිසා මම භාවනා කරලා වැඩකුත් නැහැ.' නේද? ඒ නිසා තමා ධර්මය තුළ ඉන්නවා නම්, තමා භාවනා කරනවා නම් ඒ ගුණාත්මකභාවය තමා තුළ තියෙන්න ඕන. තේරුණාද?

තමා භාවනා කරනවා කියලා ගෙදරට ගිහිල්ලා ස්වාමිපුරුෂයත් එක්ක ගැටෙනවා නම් ස්වාමිපුරුෂයාත්, ඔබත් දෙන්නම ඉන්නේ එකම ගොඩේ. දෙන්නම ඉන්නෙ එකම ගොඩේ. ස්වාමිපුරුෂයාටත් බනින්න බැහැ, මෙයාටත් බනින්න බැහැ.

ඒ නිසා තමා ධර්මය තුළ ඉන්නවා නම්, ඒ ධර්මයේ ගුණාත්මකභාවය තමා තුළ තියෙන්න ඕන. එතකොට තමන්ගේ ස්වාමිපුරුෂයා අකීකරු නම් එයා හිතන්න ගන්නවා 'දෙයියනේ මෙයා තුළ යම් ගුණාත්මකභාවයක් වැඩෙනවානේ. මෙයාට මම මෙච්චර බනිනවා. මෙයා මට බනින්නේ නැහැ. මෙයාට මම මෙච්චර ගහනවා. මෙයා මට ගහන්නේ නැහැ. මෙයාට මම මෙච්චර නොසළකා හැරීම් කරනවා. මෙයා මාව නොසළකා හරින්නේ නැහැ. එහෙනම් මෙයා තුළ යම් ගුණයක් තියෙනවා. මෙයා වඩන ධර්මය තුළ යම් ශක්තියක් තියෙනවා. අන්න එයා හිතන්න ගන්නවා. තේරුණාද?

එහෙම නැතුව ඔබ ධර්මය තුළ ඉන්නවා, ඔබ භාවනා කරන්න යනවා කියලා ඒ ගුණාත්මකභාවයන් ඔබ තුළ නැත්නම් අර අකීකරු කෙනා කවදාක්වත් නිවැරදි වෙන්නේ නැහැ. වැඩක් නැහැ. එයයි ඔබයි දෙන්නම එක ගොඩේ. එයත් ගැටෙනවා. ඔබත් ගැටෙනවා.

ඒ නිසා ඔබ ධර්මය තුළ ඉන්නවා කියන්නේ, ධර්මයේ ගුණාත්මකභාවය ඔබ තුළ තියෙන්න ඕන. ඒ ධර්මයේ ගුණාත්මකභාවයන් දකින කොට ඒ ඉවසීම කියන කාරණා ජීවිතය තුළින් දකින කොට අනිත් කෙනා ඒවා අනුව හිතන්න ගන්නවා. ඒවා අනුව හිතන්න අරගෙන, එයා නිවැරදි වෙන්න උත්සාහ ගන්න පුළුවන්.

එහෙම නැතුව මම කොච්චරවත් ධර්මය තුළ ඉන්නවා, පන්සල් යනවා, දන් දෙනවා, සිල් ගන්නවා කියලා ගෙදර ගිහිල්ලා දුවත් එක්ක, පුතත් එක්ක, ස්වාමිපුරුෂයත් එක්ක එහෙම නැත්නම් අසල්වැසියාත් එක්ක රණ්ඩු කරන්න යනවා නම්, අපි ධර්මය තුළ නැහැ. එහෙනම්, ඉතින් අපි ලෝකයාගෙන් නිවැරදිභාවය බලාපොරොත්තු වෙන්න බැහැ.

ධර්මය තුළ ඉන්න කෙනා ලෝකයාත් එක්ක ගැටෙන්න යන්නේ නැහැ. ගැටෙන අවස්ථාවක් තියෙනවා නම් ඒ ලෝකයාගේ වැරැද්ද නෙවෙයි. තමාගෙයි. මොකද තමා තුළයි ගැටීම සකස් වෙලා තියෙන්නේ. ලෝකයා ලෝකයාගේ ස්වභාවයෙන් ඉන්නවා. තමා තුළයි තමා ගැටීම සකස් කරගෙන තියෙන්නේ. තමා තමා තුළ ගැටීම සකස් කරගත්තේ එයා ධර්මයෙන් බැහැරව හිතපු නිසයි.

ඒ නිසා ගැටෙන ස්වභාවයක් තියෙනවා නම්, ගැටීමේ මුල සකස් වෙන තමායි නිවැරදි වෙන්න උත්සාහ ගන්න ඕන. මොකද තමායි ගැටෙන්නේ. මහත්තයා නෙවෙයි. තේරුණාද? ඒ නිසා තමා තුළින් තමයි තමා නිවැරදි වෙන්න ඕන. තමා නිවැරදිව ලෝකයාට ආදර්ශයක් වුණොත් ලෝකයා ඒ ආදර්ශය අනුව හිතන්න පටන් ගනීවි.

## බෝධිසත්ත්වයන් වහන්සේ සය අවුරුද්දක් දුෂ්කර ක්‍රියා සිදු කරද්දී දෙවියන් දිව්‍ය ඕජාව ලබා නොදුන්නාද?

**තිස්නවවන ප්‍රශ්නය :**

**අවසරයි ගරු ස්වාමීන්වහන්ස, ඔබවහන්සේ පැහැදිලි කරන ලද කාරණයක් සම්බන්ධව කෙනෙක් ප්‍රශ්නයක් මතුකළා. ඔබ වහන්සේ යම් ධර්ම කාරණයක් පැහැදිලි කරන අවස්ථාවක, භික්ෂුවක් අපවත් වෙන්නට යනවා, ජීවිතය අත්හරින්නට යනවා යයි දකින අවස්ථාවක, දෙවියන් එම භික්ෂුවට දිව්‍ය ඕජාව දුන්නායයි කියල ඔබවහන්සේ අපට යම්කිසි සිද්ධියක් පිළිබඳව ධර්මානුකූලව පැහැදිලි කළා. ගරු ස්වාමීන්වහන්ස, මෙම ප්‍රශ්නයෙන් විමසන්නේ, සිදුහත් තවුසාණන් දුෂ්කර ක්‍රියා කරන අවධියේ දී අනේක දුක්පීඩාවන් විඳි බව අප ශ්‍රවණය කර තිබෙනවා, අප දන්නවා. එවැනි අවස්ථාවක සිදුහත් තවුසාණන්ට දිව්‍ය ඕජාව ලබාදෙන්නට දෙවියන් පෙළඹුණේ නැත්තේ ඇයි ස්වාමීන්වහන්ස ?**

**පිළිතුරු :**

මෙහෙමයි. මෙතැනදී ඇත්ත වශයෙන්ම ඒ සිදුහත් තවුසාණන්ට ඒ දුෂ්කර ක්‍රියා කරන වෙලාවේ දිව්‍ය ඕජාව දුන්නාද නොදුන්නාද කියන කාරණය, මම ස්ථිරව කියන්න දන්නේ නැහැ.

නමුත්, මම මේ වෙලාවේ කියලා තියෙන්නේ, භික්ෂුවක් මේ ධර්ම මාර්ගය තුළ ගමන් කරද්දී, ධර්ම මාර්ගය කියන්නේ මේ මධ්‍යම ප්‍රතිපදාව, ආර්ය අෂ්ටාංගික මාර්ගය තුළ ගමන්කරලා, ඒ භික්ෂුව මේ සිතයි කයයි දෙක අතහරින වෙලාවේ, ඒ කියන්නේ, පංච උපාදානස්කන්ධය මගේ නෙවෙයි කියලා අතහරින වෙලාවේ, දෙවියන් දිව්‍ය ඕජාව දුන්නා කියලයි මම එතැන කියන්නෙ.

නමුත් බෝධිසත්ත්වයන් වහන්සේ ඒ දුෂ්කර ක්‍රියා කරන වෙලාවේ, කොතැනකවත් මධ්‍යම ප්‍රතිපදාවක් තුළවත්, ආර්ය අෂ්ටාංගික මාර්ගය තුළවත් ගතකරන කෙනෙක් නෙමෙයි. උන්වහන්සේ ඒ වෙලාවේ අන්තයක් තුළයි ඉන්නේ, අන්තයක් කියන්නේ අත්ථකිලමථානුයෝගය තුළයි ඉන්නේ. සම්පූර්ණයෙන්ම ධර්මයෙන් බැහැර වූ මාර්ගයක් තුළයි උන්වහන්සේ ඒ වෙලාවේ ගමන් කරන්නේ. තේරුණාද? ඒ ධර්මයෙන් බැහැරව ගමන් කරන වෙලාවේ, කොතනකවත් උන්වහන්සේට, 'මේ මොහොතේ මේ සිත කය අත්හරින්න ඕන', එහෙම නැත්තම්, 'පංච උපාදානස්කන්ධය අතහරින්න ඕන' කියන ධර්මයක් උන්වහන්සේ දැනගෙන හිටියේ නැහැ.

ඒ නිසා දුෂ්කර ක්‍රියා කරන වෙලාවේ උන්වහන්සේ මේ පංච උපාදානස්කන්ධය අත්හැරීමක් කොයි වෙලාවකවත් සිද්ධ කළේ නැහැ. නමුත්, උන්වහන්සේ ඉන් පස්සේ සම්මා සම්බුද්ධ ඥානය අවබෝධ කරගත්තට පස්සෙයි, අපිට උන්වහන්සේ මේ ධර්මය දේශනා කරන්නේ. තේරුණාද?

මෙතැන බැඳිලා තියෙන්නේ පංච උපාදානස්කන්ධයටයි, 'පංච උපාදනස්කන්ධය මගේ නෙමෙයි' කියල අත්හැරෙන කාරණය, මේ ලෝකයේ තියෙන ශක්තිමත්ම අතහැරීමයි කියන කාරණය බුදුරජාණන් වහන්සේ අපිට දේශනා කරන්නේ උන්වහන්සේ සම්මා සම්බුද්ධ ඥානය අවබෝධ කරගත්තට පස්සෙයි. ඒ මාර්ගය ඔස්සේ ගිහිල්ල තමයි අපි ඒවා ජීවිතයට එකතුකර ගත්තේ.

නමුත් උන්වහන්සේ අත්ථකිලමථානුයෝගය තුළ, ඒ අන්තයක් තුළ ගමන් කරන වෙලාවේ, ධර්මයක් තුළ, ආර්ය අෂ්ටාංගික මාර්ගයක් තුළ හෝ මධ්‍යම ප්‍රතිපදාවක් තුළ හිටියේ නැහැ.

අනිත් කාරණය නෝනා, බුදුරජාණන් වහන්සේ දේශනාකළ මේ හේතුඵල ධර්මතාවයන් අනුව, කර්මය, කර්මඵල කියන ධර්මතාවන් අනුව, උන්වහන්සේ අතීතයේ කළාවූ අකුසල් විපාකයක් නිසාමයි උන්වහන්සේට එවැනි සය අවුරුද්දක් දුෂ්කර ක්‍රියා කරන්නට සිද්ධ වෙන්නේ.

මොකද උන්වහන්සේ දේශනා කරනවා, අපට යමක් සිද්ධ වුනා නම්, අපට යම් දුකක් සිද්ධ වුණා නම්, වේදනාවක් සිද්ධ වුණා නම්, සතුටක් සිද්ධ වුණා නම්, ඒ සියල්ල සිද්ධ වෙන්නේ අපි සංසාරයේ කළාවූ කුසල් සහ අකුසල් විපාකයන් නිසා කියලා. නමුත් උන්වහන්සේ ඒ වෙලාවේ ඒ ධර්මය අවබෝධ කරගෙන හිටියේ නැහැ. උන්වහන්සේ එදා දැනගෙන හිටියේ නැහැ, 'මට මේ විපාක දෙන්නේ අකුසල් විපාකයක්' කියල. නමුත් උන්වහන්සේ සම්මා සම්බුද්ධ ඥානය අවබෝධ කර ගත්තට පස්සේ අපට දේශනා කරන්නේ, උන්වහන්සේටත් එදා ඒ සය අවුරුද්දක් දුෂ්කර ක්‍රියා කරන්ට සිද්ධ වුනේ, උන්වහන්සේ කළාවූ අකුසල් විපාකයක් නිසයි කියලයි.

ඒ නිසා කොතැනක හරි භික්ෂුවක් හැටියට මම ප්‍රකාශ කරලා තියෙන්නේ, ඒ මොහොත, මේ සිතත්, කයත්, පංච උපාදානස්කන්ධයත් අතහැරෙන මොහොතේ, ඒවා දිව්‍ය තලයන්ටත් දැනෙනවා කියන ධර්මතාවයයි. මේක බෝධිසත්ත්වයන් වහන්සේ සය අවුරුද්දක් දුෂ්කර ක්‍රියාකරන කාලයට ගලපාගන්නට අදාලකමක් නැහැ. එක පැත්තකින් අකුසලයක් විපාක දෙනවා. අනිත් පැත්තෙන් උන්වහන්සේ මධ්‍යම ප්‍රතිපදාවෙන්, ආර්ය අෂ්ටාංගික මාර්ගයෙන්, බැහැරවූ අන්තයක් තුළයි ගමන් කරන්නේ.

ඒ නිසා ඒ වෙලාවේ දෙවියන් දිව්‍ය ඕජාව නොදුන්නා වෙන්න පුලුවන්, ඒ ශක්තිය මතු නොවුණා වෙන්න පුළුවන්.

# සප්ත සූර්යුග්ගමන සූත්‍රය සහ අග්ගඤ්ඤ සූත්‍රය අනුව ලෝක විනාශය සිදුවන අයුරු

**හතලිස්වන ප්‍රශ්නය :**

**ගෞරවණීය ස්වාමින්වහන්ස, සොබා දහම අතිශයින් වෙනස් වෙලා, අකල් වැහි වහිනවා, අකල් නියං ඇතිවෙනවා, ඉස්සර මිනිස්සු සොබා දහමත් එක්ක හරිම අහිංසක විදිහට ඉතාමත් හොඳින් ගනු දෙනු කළා. අද සොබා දහමත්, වෙනස් මිනිස්සුත් වෙනස්, මෙහෙම වුනේ ඇයි ස්වාමින්වහන්ස ?**

**පිළිතුරු :**

මෙහෙමයි. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, මනුෂ්‍යයා තුළ තෘෂ්ණාව වැඩි වෙන්න, වැඩි වෙන්න මේ ලෝකයේ විකෘතීන් සකස් වෙනවා කියලා. දැන් බුදුරජාණන් වහන්සේ අග්ගඤ්ඤ කියන සූත්‍රයේ දී මේ කාරණය බොහොම ලස්සනට දේශනා කරනවා, මේ ලෝකයේ හටගැනීම පිළිබඳව.

මේ ලෝකය හටගැනිමේදී, බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, කල්ප විනාශය සිද්ධ වෙලා, ඒක සිද්ධ වෙන්නේ මෛත්‍රී බුදුරජාණන් වහන්සේ පහළ වුනාට පස්සේ, 'මේ භද්‍රකල්පය විනාශවෙලා ඉරවල් හතක් පායලා, මේ මුළු පෘථිවියම අළු දූවිලි ගොඩක් බවට පත්වෙනවා' කියලා. අඟුරු කෑල්ලක්වත් හොයන්න තැනක් නැතුව යනවා කියනවා. සියල්ලම අළුවෙනවා කියනවා, ඒක එළඟිතෙල් පිච්චිලා එන අළු වගේ අතට ගත්ත ගමන් ඒ අළු

ටිකත් දියවෙලා යනවා කියනවා, ඒ තරම් මුළු පෘථිවියම අළු දූවිලි ගොඩක් වෙනවා කියනවා.

ඉන් පස්සේ නෝනා, නැවත මේ ලෝකය බිහිවෙන හැටි, බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. ඒ අළු බිහිවුනාට පස්සේ බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, මේ මහපොලව මත යෝගට් එකක් වගේ මිදෙනවා කියලා. ඒක යෝගට් එකක ස්වභාවයක් තියෙනවා කියනවා, ඒක හරියට මීපැණි වගේ රසවත්, සුගන්ධවත් කියනවා.

ඒ වෙලාවේ මේ ආභස්සර බ්‍රහ්ම ලෝකයේ ඉන්න බ්‍රහ්මයෝ, ආලෝක සංඥාවෙන් මේ පෘථිවියට එනවා කියනවා.

**අතුරු ප්‍රශ්නය :**

**මට සමාවන්න ස්වාමින්වහන්ස, ආභස්සර බඹලොව බ්‍රහ්මයින් පමණද මේ අවස්ථාවේදී ඉතිරිවන්නේ ?**

**පිළිතුර :**

සප්ත සුරියුග්ගමන කියන සූත්‍රයේ දී බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා මේ ලෝකය විනාශවෙන හැටි. තේරුණාද? මේ ලෝකය විනාශ වෙන හැටි දේශනා කරන විටදී, එක තැනකදී උන්වහන්සේ දේශනා කරනවා, මේ යොදුන් අසූහතර දාහක් උස මහාමෙරුවක් මේ ලෝකයේ තියෙනවා කියල. මේ පෘථිවිය මතයි ඒක තියෙන්නේ, මේ යොදුන් අසූහතර දාහක් උස මහාමේරුව දිව්‍යතලවලට උසයි කියනවා. තේරුණාද?

දිව්‍යතල වල තියෙන ඔය දිව්‍ය විල්, අනවතප්තය, රථකාරය, සිංහප්‍රපාතය, මන්දාකිණිය, ෂඩ්ධනය කියන මේ දිව්‍ය විල් වලට ජලය යන්නේ මේ මහාමේරු පර්වතයෙන් කියනවා. ඒ කියන්නේ මහාමේරු පර්වතය දිව්‍යතලයන්ටම උසයි. ඒ මහාමේරු පර්වතය, මේ මොහොතේත් පෘථිවිය මත තියෙන දෙයක්.

නමුත් මේ මොහොතේ ඔය විද්‍යාව හදාරන අයට අපි මේක කිව්වොත්, ඒ අය ඇත්තටම හිනාවෙනවා. මොකද මේ පෘථිවිය මත යොදුන් අසූහතර දාහක් උස, දිව්‍ය තලයන්ට උස, මහාමේරුවක් තියෙන්න බැහැ කියලා. මොකද මේ මුළු පෘථිවියම සැටලයිට් වලින් ඡායාරූප ගත කරලා තියෙන්නෙ, එහෙම කන්දක් තියෙනවනම් අහුවෙන්න ඕන කියලයි කියන්නේ.

නමුත් බුදුරජාණන් වහන්සේ බොහොම පැහැදිලිව දේශනා කරනවා, යොදුන් අසූහතර දාහක් උස මහාමේරුව මේ මොහොතේ, මේ මහා පොළොවේ තියෙනවා කියලා. ඒක යොදුන් අසූහතර දහසක් උස, මහ පොළොවෙන් ඉහලට විතරයි. මහ පොළොවෙන් යටට, මහා සාගරයට තවත් යොදුන් අසූහතර දහසක් යටයි. තේරුණාද? ඒක පෙනෙන්නේ නැහැ, මොකද ඒක මහා සාගරයෙන් යටවෙලයි තියෙන්නේ.

එහෙම කියල බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, මෙහෙම ගිහිල්ල අවුරුදු සීයක් දාහක් වැස්ස නැතුව යනවා කියලා. මෙහෙම වැස්ස නැතුව යනකොට, ඔන්න මහමේරුව පේන්න ගන්නවා කියනවා. එහෙනම් මොකක්ද මෙතන සිද්ධ වෙන්න ඕන? අවුරුදු සීයක් දාහක් වැස්ස නැතිවෙන කොටයි, මහමේරුව පේන්නෙ. ඔන්න මෙතැනදී තමයි අපි මේක නුවණින් ගලපාගන්න ඕන. ප්‍රඥාව අවශ්‍ය වෙන්නේ මෙතනටයි.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා නම්, අවුරුදු සීයක් දාහක් වැස්ස නැතිව තියෙන කොටයි මහාමේරුව මතු වෙන්නේ කියලා, ඒ මොකද වෙන්නේ? අවුරුදු සීයක් දාහක් වැස්ස නැතිවෙනකොට සම්පූර්ණයෙන්ම හිම දියවී යනවා. උෂ්ණත්වය විසින් හිම දියවී ගියාට පස්සේ අන්න මහාමේරුව පේන්න ගන්නවා.

එහෙනම් මේ මොහොතේ හිමාලයේ කොහේ හරි මහාමේරුව හිමෙන් යටවෙලා තියෙනවා.

දැන් අද ඉන්දියාව ගත්තොත් ඉන්දියාවේ තාක්ෂණය කොච්චර දියුණු වුණත්, අර ගංගා නම් ගඟ නැත්නම්, යමුනා නදිය පටන්ගන්නේ කොතනින් ද කියලා ඒගොල්ලො දන්නේ නැහැ. ඒගොල්ලෝ දන්නවා හිමාලයෙන් පටන් ගන්නවා කියලා. නමුත් මුල් දිය උල්පත තියෙන්නෙ කොතනද කියල ඒගොල්ලො දන්නේ නැහැ. මොකද ඒ තැන්වලට යන්ට බෑ ඒවා අභිරහස්. ඒවා මීදුමින් වැහිලා, හිමෙන් වැහිලා.

මනුෂ්‍යයකුට තාක්ෂණය කොච්චර දියුණු වුණත් ඒ තැන් වලට යන්න බැහැ. තේරුණාද? ඒ වගේ මහාමේරුව මේ වෙලාවෙ අන්න එවැනි තැනක තියෙනවා, නමුත් පේන්නේ නැහැ. පේන්නේ අවුරුදු සීයක් දාහක් වැස්ස නැතුව හිම දියවෙලා ගියාට පස්සෙයි.

ඔය මහාමේරුව, දිව්‍යතලවලට උසයි කියනවා. එහෙම කියල ආයිමත් බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, මේ හයවෙනි ඉර පායද්දි, මේ මහාමේරුව හතර වටින්ම දුම් දාන්න ගන්නවා කියලා, පෘථිවියේ උෂ්ණත්වය වැඩි භාවය නිසා. දුමෙන්ම මුළු පෘථිවියම වැහෙනවා කියනවා.

එහෙනම් බලන්න, මේ මහාමේරුව දිව්‍ය තලවලටත් උසනම්, මුළු දුමෙන්ම පෘථිවිය වැහෙනවානම් ඒ දුමෙන් දිව්‍යතල වැහෙන්නේ නැද්ද? වැහෙන්න ඕන.

ඊට පස්සේ ආයිමත් බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, මෙහෙම අවුරුදු සීයක් දාහක් වැස්ස නැතුව තිබිලා, මේ විදිහට පෘථිවිය දුමෙන් වැහිලා තිබිලා, අවුරුදු සීයක් දාහක් ගියාට පස්සේ හත් වැනි ඉරත් පායලා තියෙනවා කියලා. නමුත් මේ ඉරවල් බලන්න මිනිස්සු නැහැ. තේරුණාද? පළමුවෙනි ඉර පායලා, දෙවෙනි ඉර පායන කොටත් දකින්න මිනිස්සු මේ ලෝකයේ නැහැ, ඒ කියන්නේ මනුස්සයෝ නිවන් දැකලා නෙවෙයි.

දැන් මෙහෙම තිබිලා අවුරුදු සීයක් දාහක් වැස්ස නැති වෙනකොටම මනුෂ්‍යයෝ මේ ලෝකයේ නැහැ. මනුෂ්‍යයෝ නිවන් දැක්කා නෙවෙයි, මනුෂ්‍යයෝ මේ ඉඩෝරයට ඔරොත්තුදෙන සත්ත්වයින් හැටියට උත්පත්තිය ලබනවා. ප්‍රේතයෝ වෙලා, භූතයෝ වෙලා, කෘමිසතුන් වෙලා, ඉඩෝරයට ඔරොත්තුදෙන සත්ත්වයින් හැටියට උත්පත්තිය ලබනවා. ලබමින් මේ සෑම ඉරකටම පිච්චි පිච්චි මැරී මැරී, පිච්චි පිච්චි, මැරී මැරී තමයි ජීවත් වෙන්නේ.

දැන් හත්වැනි ඉර පායද්දි, හත්වැනි ඉරට වඩා උෂ්ණත්වයක් මේ පෘථිවියට දරන්න බැහැ. දැන් හත්වැනි ඉරේදි අර දුම්දාලා ගිනියම්වී ඇති මහාමේරුව ගිනි අරගෙන කෑලිවලට කැඩිල පෘථිවියට ඇද හැලෙනවා කියනවා. ඊට පස්සෙ මුළු පෘථිවියම එකම ගිනි ජාලාවක් වෙලා අළු දූවිලි වෙනවා කියනවා.

එහෙනම්, මේ ගින්නට දිව්‍යතල හසු නොවෙනවා කියල අපට කියන්නට බැහැ. බුදුරජාණන් වහන්සේ දේශනා කරලා නැහැ, මේ ගින්නට දිව්‍යතල හසුවෙනවා කියලා. නමුත් අපි නුවණින් කල්පනා කරන්න ඕන. යොදුන් එක්ලක්ෂ හැට අටදාහක් උසයි මේ වෙලාවේ මහාමේරුව. මොකද පස්වෙනි ඉර පායනකොට මහසාග රයත් සම්පූර්ණයෙන්ම හිඳිලා යනවා. එතකොට මහා සාගරය යට තිබෙන යොදුන් අසූහතර දාහත් මතුවෙලා.

එතකොට මේ යොදුන් එක්ලක්ෂ හැට අටදාහක් විශාල මේ මහාමේරුව ගිනිඅරගෙන දුම්දාද්දි දිව්‍ය තලවලට බලපාන්නේ නැහැ කියලා, අපිට කියන්න බැහැ, එතකොට දිව්‍ය තලවල තියෙන අනෝතප්තය, රථකාරය ආදී පංච මහාවිල් හිඳිල ගියාට පස්සෙ දෙවියනුත් ඉඩෝරයට අහුවෙනවා.

ඒ තුන්වැනි ඉර වගේ පායනකොට තමයි ඒක වෙන්නේ, දෙවියනුත් ඉඩෝරයට අහුවෙනවා. එහෙනම් ඒ වෙලාව වෙනකොට දිව්‍යතලත් විනාශවෙලා තියෙන්න ඕන, මම දන්න තරමින්, ධර්මයේ කොතැනකවත් දැකලා නැහැ. නමුත් මේ හේතුඵල

ධර්මයන් ගලපද්දී අපි දකින්නට ඕන, දෙවියනුත් මේකෙන් පීඩාවට පත්වෙනවා කියන කාරණය. දෙවියන් පීඩාවට පත්වෙනවා කියන්නේ මොකක්ද? දෙවියන් තුළත් ලෝභ, ද්වේෂ, මෝහ සකස් වෙනවා.

එතකොට දෙවියාත් දිව්‍යතල වලින් පිරිහීලා, දෙවියනුත් පල්ලෙහා ඉන්න අර පිච්චි පිච්චි මැරෙන සත්ත්වයන් ගොන්නට එකතුවෙනවා. එහෙනම් දිව්‍යතලත් මේ වෙලාවේ පීඩාවට පත්වෙනවා.

# මනුෂ්‍යයා බිහිවීම සහ තෘෂ්ණාව විසින් ලෝකයත් මනුෂ්‍යාත් විනාශයට පත්වීම සිදුවන ආකාරය

**හතලිස් එක්වන ප්‍රශ්නය :**

**හොඳමයි ගරු ස්වාමින් වහන්ස, මේ ආකාරයෙන් විනාශයට පත්වුණු පෘථිවිය, ඒ වගේම නැවත ජීවින් පහල වීම, මේ දේවල් පිළිබඳව බුදුරජාණන් වහන්සේ දේශනා කර තියෙන්නේ කුමක්ද ස්වාමීන් වහන්ස?**

**පිළිතුර :**

බුදුරජාණන් වහන්සේ අග්ගඤ්ඤ සූත්‍රයේදී දේශනා කරන්නේ, ආභස්සර කියන බ්‍රහ්මලෝකයෙන් ආලෝක සංඥාවෙන් බ්‍රහ්මයින් පෘථිවියට එනවා කියලා, මේ විනාශය වුනාට පස්සේ. ඇවිල්ලා ඒගොල්ලෝ අර පෘථිවියේ මිදිලා තියෙන යෝගට් එක, නැත්නම් යොදයේ සුවඳ දැනෙනවා කියනවා. සුවඳ දැනුනාම ඒක ආඝ්‍රාණය කරනවා. ඊට පස්සේ ඒ අය මේක කඩාගෙන කනවා, මේක බදාගෙන කනවා, මේක පෙරේත කමින් කනවා, කන්න ගිහිල්ල මේ යෝගට් එක වැනි දේ අතුරුදහන් වෙනවා කියනවා.

ඒ තෘෂ්ණාව සකස් වෙද්දීම, ඒ ආලෝක සංඥාවෙන් ආවා වූ බ්‍රහ්මයෝ, කය ඝන වෙලා මනුෂ්‍ය ස්වභාවයට පත්වෙනවා කියනවා, එතන තමයි මනුෂ්‍යයාගේ ආරම්භය ලෙස බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ.

අර තෘෂ්ණාව නිසාම ඒගොල්ලන්ගේ කය ස්වාභාවිකව ඝන වෙනවා කියනවා. දැන් අපි කියමු දෙවියෙක් හෝ බ්‍රහ්මයෙක් අපි දකිනවා කියල, ඒක කවදා හරි අපි දකින්න ඕන, සමාධියෙන්. තේරුණාද? සමාධියෙන් අපි දෙවියෙක් දැක්කත්, දැන් ඔය ආලෝකයක් හැටියට ඉන්න දෙවිවරු ඉන්නවනෙ, ඒ ආලෝකයක් හැටියට ඉන්න දෙවියෙක් වුණත්, සමාධියෙන් දකිද්දී, එයාට තියෙන්නේ මේ මනුෂ්‍ය රූපයක් මයි. බ්‍රහ්මයාට තියෙන්නෙත් මනුෂ්‍ය රූපයක් මයි. තේරුණාද? එතකොට මේ මනුෂ්‍ය රූපයෙන් ඒ දෙවියා, බ්‍රහ්මයා හිටියාට, අපි දන්නේ නැහැ එයා මේ මනුෂ්‍ය රූපයෙන් ඉන්නවා කියලා, මොකද අපේ මස් ඇහැට පේන්නේ නැහැ.

නමුත් ප්‍රඥාවේ ඇහෙන් දකිනකොට එයාගෙ සියුම් කය මනුෂ්‍යස්වභාවයෙන් යුක්ත බව පෙනෙනවා. එතකොට ඒ මනුෂ්‍ය ස්වභාවයෙන් යුක්ත, ඒ ආභස්සර බ්‍රහ්ම ලෝකයේ බ්‍රහ්මයෝ, ආලෝක සංඥාවෙන් මේ පෘථිවියට ආවත්, ආලෝක සංඥාව තිබ්බත් එයා තුළ මනුෂ්‍ය ස්වභාවය තියෙනවා. එතකොට ආලෝක සංඥාවෙන් ආපු බ්‍රහ්මයින්, අර යෝගට් එක තොල ගාද්දී තෘෂ්ණාව වැඩිවෙන්න වැඩිවෙන්න, අර සියුම් කය ඝන ස්වභාවයට පත්වෙනවා. එතනින් තමයි මනුෂ්‍යයා කියන කෙනා බිහිවුනා කියලා, බුදුරජාණන් වහන්සේ දේශනාකරන්නේ.

ඊට පස්සේ මේ යෝගට් එක අතුරුදහන් වුනාට පස්සේ නෝනා, බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, හතු වර්ගයක් පිපෙනවා කියලා. ඒකත් මීපැණි වගෙයි කියනවා. සුවඳ හමනවා කියනවා. ඒකත් අරවගේම තෘෂ්ණාවෙන් අරගොල්ලෝ කන්න ගිහිල්ල, එකතු කරගන්න ගිහිල්ල ඒකත් අතුරුදහන් වෙනවා කියනවා.

ආයිමත් මෙහෙම යනකොට පළා වර්ගයක් මතුවෙනවා කියනවා. ඒකත් අරවගේ මීපැණි වගේ සුගන්ධවත් රසවත් කියනවා.

ඒකත් අර විදිහටම තෘෂ්ණාවෙන් අයිති කරගන්න ගිහිල්ලා, කන්න ගිහිල්ලා, ඒකත් අතුරුදහන් වෙනවා කියනවා. ඊට පස්සෙ, ඇල්හාල් පහළ වෙනවා කියනවා. ඒක උදේ වැපුරුවාට පස්සේ, හවසට අස්වැන්න නෙලන්න පුළුවන් කියනවා, ඒ ගැනත් තෘෂ්ණාව ඇතිවෙලා, මේවා කොටු කරගන්න ගිහිල්ලා, මේවා එකතු කරගන්න ගිහිල්ලා, ඒකත් අතුරුදහන් වෙලා යනවා කියනවා.

ඉතින් මේ වගේ තෘෂ්ණාව නිසාම, මේ සත්ත්වයාගේ පටන්ගැනීම නිසා ඇතිවුනා වූ මේ විනාශයන් සිද්ධ වෙනවා කියලා, බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

එතකොට එහෙම ඇවිල්ලා, එහෙම ඇවිල්ලා, මේ වෙලාවේ බලනකොට, දැන් අපි මීට අවුරුදු හතලිහකට පනහකට කලින් අපේ පුංචිකාලේ, පළතුරක් වැළඳුවත්, එළවළුවක් වැළඳුවත්, ඒවායේ රසයක් ගුණයක් කියන කාරණය තිබ්බා. නේද?

නමුත් වර්තමානයේ පළතුරක් ගත්තත්, එළවළුවක් ගත්තත්, මහ පොළොවේ වැවෙන වෙන දෙයක් ගත්තත්, ඒ අතීතයේ තිබුණා වූ රස ඕජාව ඒවා තුල නැහැ. ඒ රස ඕජාව නැති වුණේ කුමක් නිසාද, මනුෂ්‍යයාගේ තෘෂ්ණාව නිසාම ඒ රස ඕජාව විනාශ කරලා දැම්මා. ඇයි? වැඩි අස්වනු ගන්න ගිහිල්ලා, වැඩි පලදාව ගන්න ගිහිල්ලා, මහ පොළොවට කෘමිනාශක ගහලා, වස විස ගහලා, බෙහෙත් ගහලා රසායනික පොහොර ගහලා, පොළොවේ තියෙන්නා වූ රස ඕජාව මරලා දැම්මා. පොළවේ තියෙන්නාවූ රස ඕජාව මරලා දැම්මේ කුමක් නිසාද? මනුෂ්‍යයාගේ තෘෂ්ණාව නිසාමයි.

එතකොට, මනුෂ්‍යයාගේ තෘෂ්ණාව නිසාම මීට අවුරුදු ගාණකට ඉස්සෙල්ලා, මනුෂ්‍යයෝ අර රසවත් කියලා කාපු පළතුරු ටික, එළවලු ටික, නැත්නම් හාල් ටික, වී ටිකේ තිබුණු රසය නැතුව ගියා. ඒ රසය නැතුව යද්දී දැන් මොකක්ද වෙන්නේ? රසය ඇතිකර

ගන්න කෘත්‍රිම රස කාරක, කෘත්‍රීම වර්ණක යොදලා අපි දැන් රසය ඇතිකර ගන්නවා. එතකොට දැන් ඒ රසය ඇතිකරගන්න යන ගමනේදී, අපි දැන් කොතෙන්ටද යන්නේ? ලෙඩුන් බවටයි අපි පත්වෙන්නේ.

මේ කෘත්‍රිම රසකාරක, කෘත්‍රිම වර්ණක මේවා යොදන්න ගිහිල්ලා ඒවා නිසා සමාජය රෝගී භාවයට පත්වෙන තැනට, සමාජය ඇවිල්ලා තියෙනවා. කුමක් නිසාද? මේක මෙතැනට ආවේ, තෘෂ්ණාව නිසයි. මනුෂ්‍යයාගේ තෘෂ්ණාව නිසාම, වැඩි අස්වනු වැඩි ආදායම් ලබන්න ගිහිල්ලම, ඒ පොළොවේ තියෙන රස ඕජාවත් මරලා දැම්මා.

දැන් මනුස්සයකුට, පළතුරක් වළඳලා, එහෙම නැත්නම් එළවළුවක්, බතක් වළඳලා, ඒගොල්ලන්ට අවශ්‍ය රසය ජීවිතයට ගන්ට බැහැ. ඒ නිසා මනුෂ්‍යයා මොකද කරන්නේ? එතනින් ඒ රසය නැති වෙනකොට මනුෂ්‍යයා මස් මාංශ උදෙසා යොමු වෙනවා. මොකද එතන තමයි ඒගොල්ලන්ට රසය තියෙන්නේ.

එතකොට මස් මාංශ උදෙසා මනුෂ්‍යයා තෘෂ්ණාව ඇති කරගත්තට පස්සේ මොකක්ද වෙලා තියෙන්නේ? ඒ මස් මාංශවල ඉල්ලුම වැඩි වෙන කොට මස් මාංශ ඉක්මනට හදන්න, අන්න කුකුළන්ට, එළුවන්ට, ඌරන්ට එන්සයිම් දීලා, බෙහෙත් දීලා පුළුවන් තරම් අඩු ආයුෂයෙන් ඒ සතා මරන්න ගන්නවා. දැන් ඉස්සර මාස හයක් ජීවත් වෙච්ච කුකුළා දවස් හතළිස් පහෙන් මරනවා. ඉස්සර අවුරුදු දහයක් ජීවත් වෙච්ච හරකා දැන් අවුරුද්දෙන් මරනවා. ඒ සතුන්ට බෙහෙත් දීලා එන්සයිම් දීලා, මේ විදිහට මරන්න ගත්තම ඒ තෘෂ්ණාවේ අධික භාවය නිසාම මෙහෙම යද්දී, මස් මාංශ කියන ජාතියේත් රසය හීන වෙනවා.

දැන් වෙලා තියෙන්නේ ඒකයි. දැන් එළවළු වල රසයක් නෑ, පළතුරුවල රසයක් නෑ, වවන දේ රසයක් නෑ කියලා කියනවා.

ඊට පස්සේ ඒ රසය හොයන්න මිනිස්සු මස් මාංශ වලට යොමු වුණහම මස් මාංශවල ඉල්ලුම වැඩි වෙනවා. ඉල්ලුම වැඩි වුනහම සැපයුම වැඩි කරන්න මොකද කරන්නේ? මේ පැත්තෙන් පුළුවන් තරම් ඉක්මනට බෙහෙත් දීලා, අරව මේවා කරල සත්තු මරලා වෙළඳ පොළට එවනවා.

දැන් බලන කොට අවසානයේ එළවළු වලත් තියෙන රසය අඩු වුනා, දැන් මස් මාංශ වලත් තියෙන රසය අඩු වෙනවා. කුමක් නිසාද අඩු වුණේ? තෘෂ්ණාව නිසාමයි. දැන් මෙහෙම ගිහිල්ලා, මේ ලෝකය එන්නේ කොතනටද? දැන් එළවළු, පළතුරු මේ සියල්ලේමත් රසය නැතිවුනාට පස්සේ, ඊට පස්සේ මස් මාංශ වලත් රසය අර විදිහට කෘත්‍රිම හේතුන් නිසා නැති කලාට පස්සේ, බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, මනුෂ්‍යයා, මනුෂ්‍යයාව මරාගෙන කන තැනට පත්වෙනවා කියලා, ඒක තමයි 'මෘග සංඥාව' කියලා කියන්නේ. දැන් මනුෂ්‍යයා හොයන්නේ ලේ වල රසයයි.

දැන් අළුත්ම ආහාර තාක්ෂණය තමයි, සතුන්ගේ ලේ අරගන්නවා, ලේ අරගෙන මුදවලා යෝගට් එක හදනවා, බදිනවා, එක එක රස කෑම හදනවා. මේ මොහොතේ ඔය චීනය වැනි දියුණු රටවල් වල පවා, කළල රූප ගබ්සා කරනවා ළමා කාලයේ දීම. තේරුණාද? ජනගහනය වැඩි හේතුව නිසාමත් කළල රූපය ඒගොල්ලෝ ගබ්සා කරනවා. අම්මලා සල්ලිවලට කළල රූපය විකුණනවා. කිසි ප්‍රශ්නයක් නැහැ. ඒ කළල රූපය තමයි අද හුඟක් තැන්වල තියෙන රසවත්ම ආහාරය බවට ඒ ගොල්ලන්ට පත්කරලා තියෙන්නේ.

ඒ නිසා මනුෂ්‍යයාගේ මස් තමයි අවසානයේ අපට රස තියෙන මසක් බවට පත්වෙන්නේ. මොකද තෘෂ්ණාව නිසා එක පැත්තකින් පොළවේ තියෙන රස ඕජාව මරලා, දැන් පොළවේ තියෙන ආහාරයක රසයක් නැහැ.

ඊළඟට මස් මාංශ වලට යොමුවෙලා, මස් මාංශ කෙරෙහි ඉල්ලුම වැඩිවීම නිසා මස්මාංශ ගන්න සතුන් අඩු වයසින් මරන්න එන්සයිම් දීලා, බෙහෙත් දීලා, දැන් මස් මාංශ වල රසයකුත් නැහැ. ඔය මිනිස්සු කියන්නේ, 'බ්‍රොයිලර් කුකුළන්ගේ රස නැහැ' කියලා, එහෙම කියනවා නේද? එහෙම කියලා ගම් කුකුල්ලු හොයාගෙන යන්නේ. ඒ නිසාම දැන් ඒකෙත් රස නැහැ.

දැන් මේ සියල්ලේම රස අහිමි වුනාට පස්සේ, මනුස්සයා ලේවල රසයි දැන් බලන්න යන්නේ. මනුෂ්‍යයාගේ මස මනුස්සයා කාලා, එතැන තමයි මනුස්සයාගේ රස පිහිටන්නේ, ඒ නිසා නෝනා, තෘෂ්ණාව විසින් මේ සා විනාශයක් සමාජය තුලට සිද්ධ කරලා තියෙනවා.

# අධර්මිෂ්ට වන දෙවියන් අධර්මිෂ්ට මනුෂ්‍යයන්ට උදවු කරනවාද?

**හතලිස් දෙවන ප්‍රශ්නය :**

**මේ විකෘතී වන ලෝකය ඉදිරියේ දෙවියන් මිනිසුන්ට පිහිට වෙන්නේ නැද්ද ස්වාමින් වහන්ස ? ගරු ස්වාමීන් වහන්ස, මේ පිළිබඳව අපට පැහැදිලි කර දෙන්න.**

**පිළිතුර :**

ලෝකය විකෘති වෙන්න, විකෘති වෙන්න, මනුෂ්‍යයා දුශ්ශීල භාවයට පත්වෙන්න පත්වෙන්න, දෙවියොත් දුශ්ශීල භාවයට පත්වෙනවා කියනවා. දැන් මේ මිනිස්සු දුශ්ශීල වෙනකොට දෙවියන් හොඳ වෙන්නේ නැහැ. මොකද මේ දෙවියා කියන්නේත්, මේ මනුස්ස ලෝකයේම ඉඳලා ගිය කෙනෙක්, වෙන කෙනෙක් නෙමෙයි. තේරුණාද?

එක අවස්ථාවක ශක්‍රයා ඇවිල්ලා බුදුරජාණන් වහන්සේට කියනවා, 'භාග්‍යවතුන් වහන්ස, මට තවත් වෙලා මෙතන ගත කරන්ට බැහැ, දිව්‍ය ලෝකයේ හරි ප්‍රශ්න බුදුරජාණන් වහන්ස, සමහර දෙවියො ගහ ගන්නවා, ඇන කොටා ගන්නවා, සමහරු වෙන දෙවියෙක්ගේ විමානයෙන් කෑල්ලක් අල්ලගන්නවා, සමහරු වෙන දෙවියෙක්ගේ දිව්‍යාංගනාව අරන් පැනලා යනවා', ඒ සියලුම දේවල් දිව්‍ය තලයේත් තියෙනවා, මොකද මේ මනුස්ස ලෝකයේ අයමනේ එහෙ ගිහින් ඉපදිලා ඉන්නේ, ඉතින් ඒ වගේ,

මනුෂ්‍යලෝකය පිරිහෙන්න පිරිහෙන්න, දිව්‍යතලත් පිරිහෙනවා කියල බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

එතකොට දිව්‍ය තලවල් පිරිහෙනකොට බුදුරජාණන් වහන්සේ පැහැදිලිව සූත්‍රයක දේශනා කරනවා, දෙවියන් මේ අධර්මිෂ්ට අයට උපකාර කරනවා කියලා. දිව්‍යතල පිරිහෙනකොට, අධර්මිෂ්ට අයට උපකාර කරලා, ඒ අධර්මිෂ්ට භාවය තව තවත් රට තුළ, ලෝකය තුළ වැඩි කරනවා කියනවා. තේරුණාද? අකලට වැසි වස්සනවා කියනවා, මේ පායන කාලයේ මහා වැසි වහිනවා කියනවා, මහා වැහි වහින කාලයට පායනවා කියනවා, ඒ වගේ අකලට වැසි වස්සලා, අකලට ඉඩෝරය ඇතිකරලා, මනුෂ්‍යයාව දැඩි ආකාරයෙන් පීඩාවට පත්කරනවා කියනවා.

මොකද ඒගොල්ලෝ ගුණදම් රකින අයටත් කැමති නැහැ. ඒ වගේ, බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, මනුෂ්‍යයාගේ පිරිහීමට සාපේක්ෂව දෙවියනුත්, පිරිහීමට පත්වෙනවා කියලා. ඒ දෙවියෝ මිථ්‍යාදෘෂ්ටික භාවයන්ට පත්වෙලා, මනුෂ්‍යයාට පීඩා කරන්න අකලට වැසි වස්සනවා, අකලට ඉඩෝරයන් ඇතිකරනවා. ඉඩෝරයන් ඇතිකරලා, අධර්මිෂ්ට භාවයට උපකාර කරනවා කියලා බුදුරජාණන් වහන්සේ දේශනාකරනවා. ඒ වගේ, එවැනි හේතූන් නිසාත් මෙවැනි කාලගුණික විපර්යාසයන් ඇතිවෙන්න පුළුවන්.

ඒ වගේම, තව දෙයක් තියෙනවා, වැස්සක් වහිනවා කියන කාරණයේදී අපි දන්නේ, එකම එක දෙයයි. ඒ කියන්නේ 'අර ඉන්දියාවේ හරි කොහේ හරි තියෙන බෙංගාල බොක්කේ වායු පීඩනයක් ඇති වුනා' කියන කාරණය විතරයි, ඊට වඩා දෙයක් දන්නේ නැහැ. වැස්සක් ඇති වුනාම ඕක තමයි දන්නේ, මාධ්‍යයෙන් හෝ කාල ගුණයෙන් හෝ කියන්නේ, 'අහවල් බෙංගාල බොක්කේ මේ විදිහේ වායු සුළඟක් ඇති වුනා' කියලා. නමුත් ඉන් එහාට දෙයක් අපි දන්නේ නැහැ. නමුත් ඉන් එහාට දෙයක් බුදුදහම තුළින්, අපිට මතුකරලා පෙන්වනවා.

ඒ මතුකරලා පෙන්වන්නේ මොකක්ද, අපි සංසාරයේ අප්‍රමාණ වැස්ස වලාහක දෙවිවරු වෙලා ඉපදිලා ඉඳලා තියෙනවා. අපි සංසාරයේ වැස්ස වලාහක දෙවිවරු වෙලා ඉපදිලා, අපි කාමච්ඡන්දයන් විඳින්න, සතුටු වෙන්න, ඒ වලාකුළු උඩ සෙල්ලම් කරපු වෙලාවේ, සතුටුවෙන වෙලාවේ, ඒ වැහැපු වැසි නිසා අප්‍රමාණ මිනිසුන් අපි පීඩාවන්ට පත්කරලා තියෙනවා. ඒ වගේම අපි අධර්මිෂ්ට දෙවිවරු වෙලා ඉපදිච්ච වෙලාවේ, ඒ අධර්මිෂ්ට භාවය නිසා, වැසි ඇති කරලා අප්‍රමාණ මිනිසුන්ට පීඩා කරලා තියෙනවා.

ඒ වගේම අපි සංසාරයේ මනුෂ්‍ය ජීවිතවල ඉපදිලා, ඔය ගංවතුර ආධාර ගසා කාලා, එහෙම නැත්නම් අප්‍රමාණ ඊට සම්බන්ධ දේවල් කරලා මනුෂ්‍යයින්ව පීඩාවට පත්කරලා තියෙනවා. එහි විපාකයන් නිසා, මේ විදිහේ වැසි ඇතිවෙලා, අපිත් ඒ විදිහේ පීඩාවන්ට ලක්වෙනවා. අපි පෙර ජීවිතවල වැස්ස වලාහක දෙවිවරු හැටියට ඉපදිලා, වැසි වස්සලා, මනුෂ්‍යයින්ට පීඩාකළා වගේම, අපි මනුෂ්‍යයෝ වෙච්ච වෙලාවේ, ඒ අකුසල් විපාකයන් අපි අත්විඳිනවා.

එහෙනම්, කොතන හෝ වැස්ස නිසා ගංවතුර නිසා ඉඩෝරය නිසා, පීඩා විඳින අප්‍රමාණ මනුෂ්‍යයෝ ලෝකයේ ඉන්නවා. සමහරු ඉඩෝරය නිසා මිය යනවා. සමහරුන්ට ඉඩෝරය නිසා ලෙඩ රෝග හැදෙනවා. සමහරු වැස්ස නිසා, ගංවතුරේ ගහගෙන ගිහිල්ලා, ගිලිලා අප්‍රමාණව මැරෙනවා.

නමුත් මේ කිසිම දෙයක් නෝනා, හේතුවක් නැතුව සිද්ධ වෙච්ච දේවල් නෙමෙයි. මේ සංසාරයේ හේතුඵල ධර්මයන්මයි. අද වැස්සට අහුවෙලා කොටුවෙලා කව්රුහරි ආහාරයක් නැතුව දුක් විඳිනවා නම්, එයා සංසාරයේ එයාට ලැබුණු අවස්ථාවේදී ඔය සහනාධාර, ගංවතුර සහනාධාර ආදිය, ගසාගෙන කාපු කෙනෙක්මයි, තේරුණාද? මේ හේතුඵල ධර්මයක්. හේතුඵල ධර්මයෙන් තොරව අපට ජීවිතය දකින්න බැහැ. බුදුරජාණන් වහන්සේගේ ධර්මය අපිට

එහෙමයි කියන්නේ. ඒ නිසා වැස්ස වැස්සත්, ඉඩෝරය ඇති වුනත්, හේතුවක් නිසාමයි ඒවා සකස් වෙන්නේ.

ඒ හේතු කියන්නේ, අපිත් සංසාරයේ ඊට අදාළ තැන්වල ඉඳලා, අපි ඉඩෝරයන් ඇති කරලා, වැසි ඇති කරලා, අප්‍රමාණ මනුෂ්‍යයන්ට පීඩා කරලා, සත්ත්වයින්ට පීඩාකරලා තියෙනවා. තේරුණාද? අපට ලැබුණ අවස්ථාවන්වලදී අපි මනුෂ්‍යයන්ට උපකාර කරන අවස්ථාවන් වලදී, ඒ ධනය පැහැරගෙන ඒවා වංචා කරලා, අප්‍රමාණ මනුෂ්‍යයින්ට දුක් දීලා තියෙනවා.

ඉතින් ඒවායේ විපාකයන් නිසා මෙවැනි දේවල් සිද්ධ වෙන්න පුළුවන්. ඒ නිසා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, ලෝකයා අධර්මිෂ්ට වෙන්න, අධර්මිෂ්ට වෙන්න දෙවියොත් අධර්මිෂ්ට වෙනවා. දෙවියොත් අධර්මිෂ්ට වෙලා, ඒ අධර්මිෂ්ට වූ දෙවියන්, අධර්මිෂ්ට මනුස්ස බලවේගයන්ට උපකාර කරනවා. ඒ උපකාර කරද්දී ඒවා ශක්තිමත් වෙන්න, ශක්තිමත් වෙන්න, ඒ දෙවියොත් දුශ්ශීල භාවයන්ට පත්වෙලා, මේ විනාශය කරා ලෝකය ඇදී යනවා කියලා, බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

එහෙනම් මෙතන මුල තෘෂ්ණාවයි. තෘෂ්ණාව නිසාම අපි කරගන්නා වූ සිල්පද බිඳ ගැනීම් ආදී අකුසලයන් නිසා, මෙවැනි හිතාගන්න බැරි වැසි, හිතාගන්න බැරි ඉඩෝර, හිතාගන්න බැරි සුළං මේවා තුළින් අපිට සිද්ධ වෙන්න පුළුවන්.

**අතුරු ප්‍රශ්නය :**

**ගෞරවණීය ස්වාමින්වහන්ස, දෙවියනුත් අධර්මිෂ්ට වෙනවා නම්, ධර්මිෂ්ට මට ඔබට, ඇතිවන රැකවරණය කුමක්දැයි අපට පැහැදිලිකර දෙන්න.**

**පිළිතුර :**

රැකවරණය තමයි, මේ සිද්ධ වෙන්නාවූ ලෝක ධර්මයන්, කල්‍යාණ මිත්‍ර ආශ්‍රය, සද්ධර්ම ශ්‍රවණය, නුවණින් මෙනෙහි කිරීම තුල අවබෝධ කරගෙන, ලෝකයෙන් එතෙර වෙලා යන්න, එච්චරයි. ඊට වඩා දෙයක් නැහැ.

මේකට තාවකාලික විසඳුම් නැහැ.

**අතුරු ප්‍රශ්නය :**

**ගෞරවණීය ස්වාමින්වහන්ස, ධර්මිෂ්ට පුද්ගලයන්ටත් දෙවියන් කරදර කරනවාද ?**

**පිළිතුර :**

ධර්මිෂ්ට කෙනාටත් කරදරයක් කරනවා නම්, ඒකත් හේතුඵල ධර්මයක්. ඒකත් එයා කළාවූ අකුසලයක්. ඔය අකුසලය අපිට කතා කරලා කවදාකවත් විසඳන්න බැහැ. අර රාහුල කුමාරයා සුලැඟිල්ලේ එල්ලිලා බුදුරජාණන් වහන්සේගෙන් දායාදය ඉල්ලගෙන එද්දී, උන්වහන්සේ රාහුල කුමාරයට දුන්නේ මේ ලෝකයේ තිබෙන ශ්‍රේෂ්ඨතම දායාදයයි. ඒ උතුම් පැවිද්ද කියන, පැවිදි උපසම්පදාව කියන දායාදයයි. ඒ උතුම් දායාදය දුන්නේ ඇයි? බුදුරජාණන් වහන්සේ දන්නවා, ඉන් මෙහා මේ ප්‍රශ්නයට විසඳුමක් නැහැ කියලා.

ඒ නිසයි, බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ, මේ මොහොත අපි මේ ජීවිතයේ පළමු වතාවට අත්දකින දෙයක්

නොවෙයි. මම අර කිව්වා වගේ ඉරවල් හතක් පායලා, කල්ප විනාශයන් දස දහස් ගණනකට අපි සංසාරයේ මුහුණ දීලා තියෙනවා කියනවා. ඒ වගේම අපි අධර්මිෂ්ට දෙවියන් වෙලා, අප්‍රමාණ මනුෂ්‍ය ජීවිතවලට, මනුෂ්‍ය ප්‍රජාවට පීඩා කරලා තියෙනවා, දෙවියන්ට පීඩා කරලා තියෙනවා, කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. එහෙනම් මේක මෙතනින් නවත්වන්න බැහැ. තේරුණාද?

අපිට අනාගතයේ ලෝකය සැලසුම් වෙන්නේ, කොතැනකවත් ධර්මිෂ්ට කෙනාටවත් මේකෙන් ගැලවෙන්න පුළුවන් විදිහකට නෙමෙයි. මොකද මාරයා ලෝකය සැලසුම් කරන්නේ වැරදි කරන කෙනාත්, වැරදි නොකරන කෙනාත්, දෙදෙනාම මේකට කොටුවෙන විදිහටයි. වැරදිකරන කෙනා, වැරදිකරලා අපාගත වෙනවා. එයා වැරදි කරලා අපා ගත වෙනවා. වැරදි නොකරන කෙනා, වැරදි කරන කෙනා කරන දේවල් ගැන ගැටිලා අපාගත වෙනවා. දෙන්නාම මේකට කොටු කරලයි තියෙන්නේ.

ඒ නිසා ඔබ ධර්මිෂ්ටව ජීවත් වුනා කියලා ඔබට මේ සමාජයෙන් ගැලවෙන්නට බැහැ. ඇයි ගැලවෙන්න බැරි? වැරදි කරන කෙනා වැරැද්ද තුළින් මාරයා, අකුසලයට කොටු කරනවා, නිවැරදි කෙනා වැරදි කරන කෙනා දිහා බලලා, ගැටිලා එයත් අකුසලයට කොටු කරනවා. ලෝකයේ ඒකනේ වෙන්නේ. නේද?

දැන් වැරදි කරන අය පිලිබඳ ප්‍රවෘත්තියක්, පුවත්පතක ගත්තොත්, මාධ්‍යයක ගත්තොත්, මේක කියවලා වැරදි නොකරන කෙනා මේවා බල බල, ගැටි ගැටී, ද්වේෂය වඩ වඩා, වැරදි කර කර, මේවට එරෙහිව ඒගොල්ලොත් සටන් කරන්න යනවා. දැන් මොකක්ද කරලා තියෙන්නේ, දෙන්නාම එක ගොඩට වැටිලා. එහෙනම් මාරයා මෙතෙන්ට ලෝකය දාලා තියෙනවා. මෙතෙන්ට ලෝකය දාලා නම්, මේ දෙන්නාටම මේ මාර්ගය තුළ ගිහිල්ල ගැලවෙන්න බැහැ.

ගැලවෙන්න තියෙන්නේ එකම දෙයයි, මේ ලෝක ධර්මය තේරුම් අරගෙන, හැකිතාක් කල්‍යාණ මිත්‍ර ආශ්‍රය, සද්ධර්ම ශ්‍රවණය, නුවණින් මෙනෙහි කිරීම කරමින් මේ ලෝකයෙන් ගැලවිලා යන කාරණයයි අපිට කරන්න තියෙන්නේ. ඉන් මෙහා විකල්පයක් නම් අපිට නැහැ.

# සහස්සී, දසසහස්සී ලෝක ධාතුවල වෙසෙන ජීවීන් සම්‍යක් දෘෂ්ඨිකද?

**හතලිස් තුන්වන ප්‍රශ්නය :**

**ගෞරවණීය ස්වාමින්වහන්ස, වෙනත් ග්‍රහලෝකවල ජීවීන් සිටින බවට සාක්ෂි තිබෙනවාද, ඒක සත්‍යයක්ද, ඒවගේම ඒ අයගෙන් මනුලොව මිනිස්සුන්ට තර්ජනයක් තියෙනවද, මේ ග්‍රහලෝකවල ජීවත්වෙනවායයි කියන ජීවීන් බුදුරජාණන් වහන්සේ සරණ ගිය අයද ?**

බුදුරජාණන් වහන්සේ සරණ ගිය ජීවීන් ඉන්නවා කියලා නම් කියන්න මම දන්නේ නැහැ. දිව්‍යතල බ්‍රහ්මතලවල හැරුණුකොට, වෙනයම් තියෙන්නාවූ ග්‍රහලෝක හරි, කොහේ හරි, බුදුරජාණන් වහන්සේ සරණ ගිය අය ඉන්නවද කියන්න නම් මම දන්නේ නැහැ.

නමුත් මේ මනුෂ්‍ය ලෝකය වගේම අප්‍රමාණ මනුෂ්‍ය ප්‍රජාවන් ඉන්න ලෝකයන් තව තියෙනවා. ඒක බුදුදහමෙන් ප්‍රතික්ෂේප වෙන්නේ නැහැ. තේරුණාද? නමුත් දැන් අපි දන්නා ස්වාමින්වන්සේ නමක්, උන්වහන්සේ උතුම් සමාධියකින් පසුවෙලා ඉන්නකොට, වෙනින් මනුෂ්‍යයෝ ජීවත්වෙන ග්‍රහලෝකයක් අරමුණු වෙලා තියෙනවා. උන්වහන්සේ දකින හැටියට, ඒ ග්‍රහලෝකය, සම්පූර්ණයෙන්ම කෘත්‍රිමව හදපු ලෝකයක්, කෘත්‍රිම පරිසරයක් එතන තියෙන්නේ. මේ ගහකොළ වැල්, ගෙඩි ඒවා මොනවත් ඒකේ නැහැ. කෘත්‍රිමව හැදුවාවූ, ඉතාමත් දියුණු තාක්ෂණයක් තියෙන්නාවූ පරිසරයක් ඒක.

ඒ ස්වාමීන් වහන්සේ දකිනවා, එතන විශාල පාරක්, මාර්ගයක් තව තැනක ළමයින් සෙල්ලම් කරන උද්‍යානයක්. තේරුණාද? ඒ පාර හරියට මේ, අලුතින් හදලා තියෙන හයිවේ පාරවල් තියෙන්නේ, ඒ වගේ ඉතාමත් දියුණු තාක්ෂණයක් තුළ හදපු නවීන මාර්ගයක් ඒක. එතන සෙල්ලම් කරන්න ඇවිල්ලා, ළමයින් විසි දෙනෙකුගේ විතර කණ්ඩායමක් ඉඳලා තියෙනවා. ඒ ළමයි විසිදෙනාම අඩි දෙක-හමාරක් තරම්වත් උස නැහැ. ඒ සියළුම ළමයින් විසිගාණම ඇඳලා තියෙන්නේ එකම යුනිෆෝම් එකක් වගේ, ඒ කියන්නේ පාසල් ශිෂ්‍යයෝ වගේ පිරිසක්, වැඩිහිටියොත් ඉඳලා තියෙනවා. ඒ වැඩිහිටියොත් අඩි හතරකට වඩා උසවෙලා නැහැ.

ඒගොල්ලො එතන සෙල්ලම් කරනකොට, එක යානයක් ඇවිල්ල තියෙනවා. ඒ යානය ඔය වෙසක් කාලයට හදන බක්කි කූඩු වගේ හතරැස් කූඩු තියෙන්නේ, ඒ කූඩුවක් වගේ එකක්. ඒ යානයෙන් තව ළමයින් පිරිසක් බහිනවා, අර ස්වාමීන් වහන්සේ දැකලා තියෙනවා. කෘත්‍රිමව හැදුවාවූ නගරයක් ඒක. කිසිම ගහක් කොලක්, කිසිම දෙයක් නැහැ, ගලක් වැලිකැටයක්වත් පේන්න නැහැ. තනිකර කෘත්‍රිමව හැදුවාවූ දෙයක්, කෘත්‍රිමව හැදුවාවූ නගරයක් ඒක.

එතකොට එහෙම නම් මේ ලෝකයේ අපේ ප්‍රජාවට වඩා දියුණු ප්‍රජාවන් සිටිනවා. තාක්ෂණය අතින් දියුණු අය. නමුත් ඒ වෙලාවේ නෝනා, එතැන එක උස මහත්තයෙක් ඉඳලා තියෙනවා, අඩි හතරක් විතර උස. ඒ මහත්තයා පැළඳගෙන ඉඳලා තියෙන්නේ, යුරෝපීය ඇඳුමක්. යුරෝපිය ඇඳුම තියෙන්නේ දිග කලිසම, කෝට් එක දාලා - ඒ යුරෝපිය ඇඳුමක් තමා එයා පැළඳගෙන ඉඳලා තියෙන්නේ.

මේ කියනදේ, කෙනෙක් දැඩි විදිහට ප්‍රතික්ෂේප කරන්න පුළුවන්. නමුත් ගන්න කෙනෙකුට මෙතන ගන්න දේකුත් තියෙනවා. එහෙනම් අපේ ප්‍රජාවට වඩා දියුණු ප්‍රජාවක් ලෝකයේ ජීවත්

වෙනවා. නමුත් ඒගොල්ලත් මේ පටිච්ච සමුප්පන්න ක්‍රියාවලියට යටත් සත්ත්වයින්.

දැන් අපි කියමු, ඔය නාසා ආයතනය වගේ ආයතන තියෙනවනේ. ඒවයේ ඉන්න මහත්වරු, මුළු ජීවිතයේම උපාදාන කරගෙන ඉන්නේ මොනවද? ඔය ග්‍රහලෝක, වෙනත් ලෝක, ඉර-හඳ-තාරකා, ඕවා තමයි උපාදාන කරගෙන ඉන්නේ. ඒගොල්ලන් මුළු ජීවිතයේම පරීක්ෂණ පවත්වන්නේ, ග්‍රහලෝක, වෙනත් මනුෂ්‍යයින් ගැනම තමයි. මේගොල්ලෝ මැරෙන වෙලාවේදී, මෙවැනි උපාදානයක් සකස් වුනොත් මේගොල්ලෝ ගිහිල්ලා, කුරුමිට්ටෝ වෙලා, ඒ ග්‍රහලෝකවල ඉපදෙනවා. එහෙම තමයි ඒ ලෝකස්වභාවය. පටිච්චසමුප්පන්න ක්‍රියාවලියක් මේ යන්නේ.

එතකොට ඒ ග්‍රහලෝකවල ඉන්න අය, මේ ග්‍රහලෝකය ගැන හිතලා, ඒගොල්ලොත් මේවා ගැන පරීක්ෂණ පවත්වමින් ඉන්නවා නම්, මැරෙන වෙලාවට, ඒවා ඒ අයට උපාදානය වුනොත්, ඒ ගොල්ලොත්, මෙහෙ ඇවිල්ලා ඉපදිලා ඉන්න පුළුවන්, ඉපදෙන්න පුළුවන්.

ඒ නිසා මේ ලෝකයේ කොහේ මනුෂ්‍යයෙක් ජීවත් වුනත්, ඒ සෑම මනුෂ්‍යයෙක්ම මේ පටිච්චසමුප්පන්න ක්‍රියාවලියට යටත්වයි ජීවත් වෙන්නේ. ඒ නිසා, ලෝකයේ කොතැනකවත් වෙනත් මනුෂ්‍යවාසයක්, වාසස්ථාන නැහැ කියලා, ධර්මානුකූලව අපට කියන්ට බැහැ.

අර ස්වාමීන්වහන්සේ දැක්ක උදාහරණයක් තමයි, මම මේකට යම් ශක්තියක් ගන්න මතක් කළේ. ඒ නිසා 'එවැනි අයගෙන් අපට බලපෑම් එන්න බැහැ' කියලා කියන්න අපට බැහැ. මොකද, ඒ ගොල්ලෝ අපට වඩා තාක්ෂණයෙන් දියුණු, අපිට වඩා දියුණු ජාතියක්. අපේ කොතැනකවත් එවැනි නගරයක් නැහැ. කොළ කැල්ලක් වැටිලා නැති, වැලිකැටයක් ගල්කැටයක් බිම වැටිලා නැති

තැනක් නැහැ. ඒවා නිකම් මැදපු දේවල් වගේ, ඉතාමත් පිරිසිදුව, ඉතාමත් දියුණු තාක්ෂණයෙන් යුතු දේවල්.

ඒගොල්ලන්ගෙන් අපට බලපෑමක් නොවෙයි කියලා, අපිට කියන්න බැහැ, ඒක අපි දන්නේ නැහැ. නමුත් එවැනි දේවල් ලෝකය තුළ තියෙනවා නෝනා. ධර්මයට කොතකවත් ඒවා එරෙහි නැහැ.

බුදුරජාණන් වහන්සේ සහස්සී දසසහස්සී ලෝක ධාතූන් ගැන අපට කියල තියෙනවා. නමුත් ඒගොල්ලො තෙරුවන් සරණ ගිය අය නම් නෙවෙයි. ඒගොල්ලො මිථ්‍යාදෘෂ්ඨික භාවයන් තුළ ජීවත්වන අය.

# ඔබත් මෛත්‍රී බුදුරජාණන් වහන්සේගෙන් බණ අහන්නට ප්‍රාර්ථනා කරනවාද?

**හතලිස් හතරවන ප්‍රශ්නය :**

**ගෞරවණීය ස්වාමීන්වහන්ස, මෛත්‍රී බුදුරජාණන් වහන්සේ දකින එක බොහෝ දෙනෙකුගේ ප්‍රාර්ථනයයි. උන්වහන්සේ ගෙන් දහම් ශ්‍රවණය කොට නිර්වාණය ප්‍රාර්ථනා කිරීම ඒ අයගේ එකම අරමුණයි. ඒ සඳහා කල යුතු පුණ්‍ය ක්‍රියා මොනවද කියලා බොහෝ දෙනකු විමසනවා.**

**පිළිතුරු :**

ඒකට උත්තරයක් වත් මම නම් කියන්න කැමති නැහැ. බුදුරජාණන් වහන්සේ අපට එහෙම කියන්නේ නැහැ, මෛත්‍රී බුදුරජාණන් වහන්සේ පහලවෙන්න නම්, තව අවුරුදු ලක්ෂ විසිපහක්වත් යනවා, අඩුම ගණනේ. අවුරුදු ලක්ෂ විසිපහක් යනවා කියන්නේ මේකයි.

බුදුරජාණන් වහන්සේ බොහොම පැහැදිලිව දේශනා කරනවා, මෛත්‍රී බුදුරජාණන් වහන්සේ පහල වෙන්නේ, මනුෂ්‍යයාට අවුරුදු අසූදාහක් ආයුෂ තියෙන කාලයේ කියලා. අවුරුදු අසූදාහක් එතකොට අවුරුදු අසූදාහක් ආයුෂ තියෙන මනුෂ්‍යයෝ බිහිවෙන්න නම්, අපි ගණනය කරලා බලන්න ඕනෑ, බුදුරජාණන් වහන්සේගේ කාලයේ පරමායුෂ අවුරුදු එකසිය විස්සයි. අද වෙනකොට ඒක හැත්තෑවකට වගේ අඩුවෙලා තියෙනවා. ඒ කියන්නේ අවුරුදු

පනහක ආයුෂ වෙනස් වීමක් සිද්ධ වෙලා තියෙනවා. මේ අවුරුදු පනහක ආයුෂ වෙනස් වීමක් සිද්ධ වෙන්න, අවුරුදු දෙදාස් හයසීයක කාලයක් ගිහිල්ල තියෙනවා. අවුරුදු දෙදාස් හයසීයක කාලයක් තුළ අවුරුදු පනහක ආයුෂ වෙනස්වීමක් තමයි සිද්ධ වුනේ. තේරුණාද?

මෙහෙම ගිහිල්ලා, මෙහෙම ගිහිල්ලා, බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, මේ මනුෂ්‍යයාගේ දුශ්ශීල භාවය නිසා මනුෂ්‍යයාගේ පරමායුෂ අවුරුදු දහයයි, කියන තැනට බහිනවා කියලා. එතකොට අවුරුදු දහයේ දී, මනුෂ්‍යයා ජීවත්වෙලා ඉගෙනගෙන, විවාහ වෙලා, මැරිලා ගිහිල්ලා ඉවරයි.

දැන් එතකොට මේ මනුෂ්‍යයාගේ පරමායුෂ මෙහෙම ගිහිල්ල, මෙහෙම ගිහිල්ලා, අවුරුදු දහයට අඩුවෙලා, අවුරුදු දහයේ ඉඳන්, ආයිමත් අර මෘග සංඥාවෙන් මේ මනුෂ්‍ය ප්‍රජාව දුර්වල වෙලා, එතන ඉඳන් ආයිමත් සිල්වත් භාවය විසින් මනුෂ්‍යයාගේ පරමායුෂ, අවුරුදු අසූදාහයි කියන තැනට අරගෙන යනවා. එහෙනම්, පෑනක් කොලයක් අරගෙන ගණන් බලන්න, මේ අවුරුදු පනහක ආයුෂ වෙනස්වීම සිද්ධ වෙන්න, අවුරුදු දෙදාස් හයසීයක් ගිහිල්ල තියෙනවා නම්, අවුරුදු අසූදාහක් ආයුෂ තියෙන මනුෂ්‍යයෝ බිහිවෙන්න අවුරුදු කොච්චර යයි ද කියලා. අවුරුදු ලක්ෂ විසිපහක දීර්ඝ වූ අබුද්ධෝත්පාද කාලයක් - ධර්මයක් නැහැ; මිථ්‍යාදෘෂ්ටික භාවය තුළ වැසුණ, ගිලුන ලෝකයක්. බුදුන්, දහම්, සඟුන් කියන වචනයක් නැහැ.

අපි කොතන ඉපදුනත් දුක තුළයි උපදින්නේ. ඔබ හිතන්න, අවුරුදු ලක්ෂ විසිපහක් කියන්නේ, මේ අවුරුදු හැට, හැත්තෑවත් එක්ක හිතලා බලන්න. හිතාගන්න වත් බැරි කාල පරාසයක්. ඒ නිසා යමෙක්, මෛත්‍රී බුදුරජාණන් වහන්සේගේ ශාසනයේදී නිවන් අවබෝධ කරගන්න බලාපොරොත්තු වෙනවා නම්, ඉන්නවා නම්, ඒක මේ ලෝකයේ තියෙන අවිද්‍යාවේ බරපතලම තැනක්.

ඒ නිසා අපිට පුළුවන් මේ මොහොතේත් මෛත්‍රී බුදුරජාණන් වහන්සේව දකින්න. මේ මොහොතේ අපිට පුළුවන්, මෛත්‍රී බුදුරජාණන් වහන්සේ දේශනා කරන ධර්මය අහන්න. ඔබට 'මෛත්‍රී බුදුරජාණන් වහන්සේගේ ශාසනයේ නිවන් දකිනවා' කියලා සකස්වෙන සිත, අනිත්‍යයි කියලා දකින මොහොතේ, ඔබ දකින්නේ මෛත්‍රී බුදුරජාණන් වහන්සේ යි. තේරුණාද? ඔබට 'මෛත්‍රී බුදුරජාණන් වහන්සේගේ ශාසනයේ නිවන් දකින්න ඕනේ' කියන සිත, අනිත්‍යයි කියලා දකින මොහොතේ ඔබ දකින්නේ, මෛත්‍රී බුදුන්වහන්සේ දේශනා කරන ධර්මයයි, පංච උපාදානස්කන්ධයේ අනිත්‍ය භාවය කියන ධර්මයයි.

එහෙනම් මෛත්‍රී බුදුරජාණන් වහන්සේ පහළ වුනත් ඔය ධර්මය මයි දේශනා කරන්නේ. මොකක්ද දේශනා කරන්නේ? පංච උපාදානස්කන්ධය අනිත්‍යයි. එහෙනම්, ඔබ 'මෛත්‍රී බුදුරජාණන් වහන්සේ දැකලා නිවන් දකිනවා' කියන හිත, අනිත්‍යයි කියලා දකින මේ තත්පරයේදීම ඔබ, මෛත්‍රී බුදුරජාණන් වහන්සේ දේශනා කරන ධර්මය දකිනවා. තේරුණාද? මෛත්‍රී බුදුරජාණන් වහන්සේව ජීවමානව දකිනවා.

එහෙනම් 'මේ මොහොතේ සකස්වෙන හිත අනිත්‍යයි' කියලා දකිද්දී, ඔබට පුළුවන් නම් මෛත්‍රී බුදුරජාණන් වහන්සේව දකින්න, මෛත්‍රී බුදුරජාණන් වහන්සේ දේශනා කරන ධර්මය දකින්න, අපි අවුරුදු ලක්ෂ විසිපහක දීර්ඝ අබුද්ධෝත්පාද කාලයක් පහුකරගෙන යනවා කියන්නේ, මේ ලෝකයේ බරපතලම මෝහ භරිත ක්‍රියාවක් තේරුණාද?.

ඒ නිසා දක්ෂවෙන්න, මේ මොහොතේ මෛත්‍රී බුදුරජාණන් වහන්සේව දකින්න. ඒ දකින වෙලාවේ, මෛත්‍රී බුදුරජාණන් වහන්සේ වගේම, අපේ ගෞතම බුදුරජාණන් වහන්සේත් දැක්කා වෙනවා. මොන බුදුරජාණන් වහන්සේ පහළ වුනත් දේශනා කරන්නේ, පංච උපාදානස්කන්ධය අනිත්‍යයි කියන ධර්මය විතරයි.

# අප කාටවත් කොතනකවත් අසාධාරණයක් සිදුවී නැහැ

**හතලිස් පස්වන ප්‍රශ්නය :**

**ගරු ස්වාමින්වහන්ස, පෞරුෂත්ත්වයෙන් ඉහල ඉතාම බලවන්ත මිනිසුන් අපි දකිනවා. ඒ වගේම මනුෂ්‍යත්වය ලැබුවත්, ඒ මනුෂ්‍යත්වයට ඔබින පෞරුෂත්වයක් නැති පුද්ගලයින් අපි දකිනවා. මෙවන් විෂමතාවයක් ඇතිවෙන්නේ කොහොමද ස්වාමීන් වහන්ස?**

**පිළිතුරු :**

බුදුරජාණන් වහන්සේ ඒක "කම්ම දායාද" කියන සුත්‍රයේදී දේශනා කරනවා. *'මේ සත්ත්වයා කර්මය දායාද කොට උපදී'' කියලා. 'කර්මය මගේ කොට උපදී"* කියලා. එතැනදී බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, යමෙක් හීන ආයුෂ ලබනවා නම්, නිරතුරුවම රෝගී භාවයනය පත් වෙනවා නම්, අඩු ආයුෂින් කෙනෙක් මැරෙනවා නම්, ඒකට හේතුව පෙර ජීවිතයේදී එයා සත්ත්ව හිංසාව, සත්ත්ව ඝාතන කරලා තියෙනවා. තේරුණාද?

ඒ නිසා අපේ වර්තමාන සමාජයේ අපිට පේනවා, සමහරු මව් කුසේදි නැති වෙනවා, අවුරුද්දෙදී, දෙකේදී, තුනේදී, දහයේදී, පහළොවේදී නැති වෙනවා. එහෙම නැති වෙන්නේ සමාජයේ වරදකින් වත්, එහෙම නැත්නම් කාගේවත් වරදකින් වත් නෙවෙයි. ඒ එයා සංසාරයේ පෙර ජීවිතයේ, සත්ත්ව හිංසාවන්, සත්ත්ව ඝාතන කරලා තියෙනවා.

එක දරුවෙක් හිටියා, ඒ දරුවා, අවුරුදු දහය-දොළහ වගේ වයසේදී ම, ඒ දරුවා අධිවේගී සුඛෝපභෝගී බස් රථයක ගමනක් යද්දී, දැඩි අනතුරකට ලක් වෙලා මිය පරලොව යනවා. තේරුණාද? හැමෝම වේවා අනෙක් සියල්ලෝම වේවා, බැන්නේ කාටද, අර රියදුරෝ දෙන්නට. මහා චෝදනා. මේ ගොල්ලන්ගේ වරදින්, පොලිසියට එක පැත්තකින් බැනලා, හරි ප්‍රශ්න ගොඩක් මතුවෙලා.

අපි දන්නා එක්තරා ස්වාමින්වහන්සේ නමක්, උතුම් සමාධියෙන් අරමුණු කරලා බලලා තියෙනවා, මේ මැරිච්ච දරුවා පෙර ජීවිතයේ කුමක්ද කළ අකුසලය කියලා. මොකද මේ දරුවා මේ ජීවිතයේ අකුසලයක් කරපු කෙනෙක් වෙන්න බැහැ. මේ ජීවිතයේ දෙමාපියන්ට කීකරුව ජීවත් වෙච්ච, හොඳ දරුවෙක්. පෙර ජීවිතයේ මේ දරුවා ඉහළ පෙලේ නිවසක මෙහෙකාර වෘත්තියක් වගේ කරපු කෙනෙක්. සුදු කෝට් එක ඇඳලා, සුදු සරම ඇඳලා - එහෙම කරන අර ඉහලපෙලේ සේවක පිරිස් ඉන්නේ, එවැනි කෙනෙක්.

මේ කෙනා, ඒ ස්වාමින්වහන්සේ දකිනවා, එයා වත්තේ වැඩ කරන වෙලාවේ, එයා තියුණු කැත්තකින් සර්පයෙකුට ගහලා කපලා මරණවා. නමුත් ඒ සර්පයා කහ පාට සර්පයෙක්. ඒ කියන්නේ ගැරඩියෙක් වගේ සර්පයෙක්. විස සර්පයෙක් නෙවෙයි. එතකොට ඒ සර්පයා මැරීමේ අකුසලය නිසයි, මේ දරුවා මේ විදිහට අර වාහනයේ අනතුරට පත් වුණේ. ඒක හේතුඵල ධර්මයක්. තේරුණාද?

දැන් බලන්න, මෙතන සර්පයෙක් ඉන්නවා, විසකුරු සර්පයෙක්. දැන් මේ මහත්තයා මෙතෙන්ට එනවා, ඇවිල්ල හිතනවා, 'දැන් හාමුදුරුවෝ මෙතනට ආවොත්, මේ සර්පයා දෂ්ට කරන්න පුළුවන්, නැත්නම් වෙන දායක මහත්තයෙක් ආවොත් මේ සර්පයා දෂ්ට කරන්න පුළුවන්, ඒ නිසා මම මේ සර්පයාට ගහනවා, ගහල, මරලා දානවා' කියලා සර්පයාව මරලා දානවා. දැන් එයා සර්පයාව මැරුවා.

නමුත් තව තැනකට මේ මහත්තයා යනකොට එයාට පේනවා, ගැරඬියෙක්. ගැරඬියා එයාගේ පාඩුවේ යනවා. නමුත් එයාගේ පාඩුවේ යන මේ අහිංසක ගැරඬියාට, පොල්ලක් අරන් ගහලා, මරනවා. දැන් මේ දෙකේ අකුසලයෙ බලවත් වැඩි කෝකද? අර අහිංසක සතාට ගහපු එකයි.

මෙතන මේ විසකුරු සතාට මෙයා ගහද්දි, ඒ මහත්තයාට මරණීය චේතනාව සකස් වුණා වගේම, ඒ මහත්තයා තුල මෛත්‍රී චේතනාවකුත් සකස් වෙනවා, 'අනේ ස්වාමින්වහන්සේට දෂ්ට කරයි', නැත්නම් 'මෙතනට එන දායකයෙකුට දෂ්ට කරයි, දෂ්ට කළොත් මැරෙයි' කියලා. මෛත්‍රී චිත්තයක්, අර මරණ චේතනාවත් එක්කම, එයා තුළ සකස් වෙනවා. නමුත් අතන සකස් වෙන්නේ, අහිංසක සතෙක් මරණ බරපතල අකුසලයක්.

එතකොට අර දරුවා එදා මරලා තියෙන්නේ අහිංසක සතෙක්. එයා ඒ සතාව කැත්තෙන් කෑලි කෑලි වලට කපලා මරනවා, අර ස්වාමින්වහන්සේ සමාධියෙන් දකිනවා. එතකොට බලන්න, එහෙනම් ඒ විපාකය සකස් වුණේ කුමක් නිසාද? අර අකුසලය විපාකයට ආවා. තේරුණාද? එතකොට අකුසලයක් විපාකයට එද්දී, අපි බස් ගිනි තියලා, වැඩක් තියෙනවද? පොලිසියට ගහලා වැඩක් තියෙනවද? ඒ හේතුඵල ධර්මයක්. බුදුදහමින් තමයි මේ හේතුඵල ධර්මය අපට මතුකරලා දෙන්නේ. නමුත් අපි හේතුඵල ධර්මයන් දකින්න දක්ෂ නැති නිසා, අපිට දරාගැනීමේ ශක්තිය නැති නිසා, අපි සමාජය තුළ මහා විනාශයන් සිද්ධ කරගන්නවා.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, යමෙක් අඩු ආයුෂයෙන් මිය යන්නේ, යමෙක් රෝගී භාවයට පත් වෙලා ජීවත් වෙන්නේ, එයා පෙර ජීවිතයේ සත්ත්ව හිංසා, සත්ත්ව ඝාතන කරපු නිසා කියලා. කෙනෙක් මේ ජීවිතයේ දුප්පත් භාවයට පත්වෙලා, අල්පේශාක්‍ය භාවයන්ට පත්වෙලා, ජීවත් වෙන්නේ, එයා පෙර ජීවිතයේ දන් පූජා කරපු නැති කෙනෙක් නිසා. කෙනෙක් මේ

ජීවිතයේ විරූපී භාවයන්ට පත්වෙලා, සමාජ අප්‍රසාදයන්ට ලක්වෙලා ජීවත් වෙන්නේ, එයා පෙර ජීවිතයේ, ක්‍රෝධය, ව්‍යාපාදය වඩපු කෙනෙක් නිසයි, කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

කෙනෙක් මේ ජීවිතයේ මේ ඉහල තනතුරු දරන්නේ, ඒ කියන්නේ ඔය වෘත්තීය මට්ටමෙන් ඉහල වෛද්‍යවරු, ඉංජිනේරුවරු වගේ පිරිස් ඉන්නවනේ, බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. ඒකත් හේතුඵල ධර්මයක් කියලා. ඒ හේතුඵල ධර්මය මොකක්ද? එයා පෙර ජීවිතයේ මහණ බමුණන් ළඟට ගිහිල්ලා, ධර්මය-අධර්මය මොකක්ද කියලා අහලා තියෙනවා, කළයුත්ත-නොකළයුත්ත, හොඳ-නරක මොකක්ද කියලා, අහලා තියෙනවා. අහලා, ඒ විදිහට ජීවිතය හැඩ ගස්සලා තියෙනවා. එහි ප්‍රතිඵලයක් තමයි, මේ ජීවිතයේ මේ ඉහල වෘත්තීන් ලැබෙන්නේ කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

දැන් අපි හිතමු දොස්තර මහත්මයෙක් ඉන්නවා කියලා, එයා ඇත්තටම සතුටුවෙනවා, මම වෛද්‍යවරයෙක් වුනේ, අපේ රටේ නිදහස් අධ්‍යාපනය තියෙන නිසා කියලා. නමුත් නිදහස් අධ්‍යාපනය තියෙන නිසා නෙවෙයි, ඒ මහත්තයා වෛද්‍යවරයෙක් වුනේ. එහෙනම් නිදහස් අධ්‍යාපනයෙන් හැම දරුවෙක්ම වෛද්‍යවරයෙක් එහෙම වෙන්න ඕන. එයා වෛද්‍යවරයෙක් වුනේ, වෛද්‍යවරයෙක් වීමට අදාළ සංස්කාර එයා පෙර ජීවිතයේ රැස්කළා, ඒ සංස්කාර මොනවද? එයා මහණ බමුණන් ළඟට ගිහිල්ලා, අර විදිහට කළයුත්ත-නොකළයුත්ත, හොඳ-නරක, ශීලය-දුශ්ශීලභාවය, විමසලා ඒ අනුව ජීවත්වුනා. තේරුණාද?

ඒ වගේම මේ ජීවිතයේ ද්වේශය, ඊර්ෂ්‍යාව, ගුණමකුකම වගේ දේවල් වඩනකොට, බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, ඒ අය අල්පේශාක්‍ය ජීවිත ලබා උපදිනවා කියලා. ඒ අය කිසිම තැනක පිළිගැනීමක් ලබන්නේ නැහැ. මොකද, පෙර ජීවිතයේදී, ඒ අය අනුන්ව පිළිගත්තේ නැහැ. අනුන්ව දෙවැනි තැනට දාල කතා

කළා. පල්ලෙහාට දාලා කතා කළා. ඒ නිසාම ඒගොල්ලෝ මේ ජීවිතයේ අල්පේශාක්‍ය ජීවිත ලබනවා කියනවා.

රාජ්‍ය නායකයො ඉන්නවානේ. ඒ රාජ්‍ය නායකයින් අප්‍රමාණ ආයුෂය, වර්ණය, සැපය, බලය ලබන්නේ ඇයි? පෙර ජීවිතයේදී සිල් ආරක්ෂා කරගෙන දන් දීපු අයයි. ඒ දානය, ශීලය වගේම, ඒගොල්ලන් පිරිවර සම්පත් ඇතුව උපදින්නේ, පෙර සංසාරයේ ඒගොලේලො හවුලේ හැමෝම එකතු කර ගෙන පින්කම් කරපු නිසා. එහි ඵලය තමා ඒගොල්ලෝ ලබන්නේ.

පාලකයෙක් බවට ඡන්දයෙන් පත්වෙන්නේ, ජනතාවගේ ඡන්දය නිසා නෙමෙයි. අපි හිතනවා, අපි තමයි, ඒගොල්ලෝ පත් කළේ කියලා. අපි පත් කළා නොවෙයි. අපිට ඒගොල්ලන්ව පත් කරන්න හිතෙන්නේ කුමක් නිසාද? ඒගොල්ලන්ගේ ආයුෂය, වර්ණය, සැපය, බලය නිසයි. ඒකට වශී වෙලයි, අපි ඒගොල්ලන්ට ඡන්දය දෙන්නේ. එහෙනම් අපිට ඒ හිත සකස් වෙන්නේ, ඒගොල්ලන් තුළ තියෙන ඒ ශක්තිය නිසා. ඒ ශක්තිය නැත්නම්, අපිට කවදාක්වත් එයාට ඡන්දය දෙන්න හිතෙන්නේ නැහැ.

එතකොට ඒ ශක්තිය ලැබුනේ කුමක් නිසාද? පෙර ජීවිතයේ දානය, ශීලය වගේම මෛත්‍රිය කියන කාරණයත් ඒගොල්ලෝ වඩලා තියෙනවා. එහෙනම්, ඒ ඵලය තමයි, අපි මේ සමාජයේ දකින්නේ. ඉතින් ඒ සමාජය දකිද්දී ඒකයි කියන්නේ, කොතැනකවත්, අපි කාටවත් අසාධාරණයක් වුනා කියන කාරණය, අපේ ධර්මයේ කියන්නේ නැහැ. එතනින් තමයි අපි ඒක දකින්න ඕන.

**අතුරු ප්‍රශ්නය :**

**ඔබවහන්සේ පැහැදිලිකරන ආකාරයට, තේජවන්ත පෞරුෂත්වයක් ලබන්නට හේතුව වෙන්නේත් අපි කරන කුසල කර්ම මයි ?**

**පිළිතුර :**

එහෙයි. අනිවාර්යයෙන් ම. ඒ පෞරුෂත්වය ලැබෙන්නේ එහෙමයි. ඒ පෞරුෂත්වයක්, නැත්නම් එයාට ආකර්ෂණයක් නැහැ. ඒ ආකර්ෂණය කියන්නේ ඒකයි. ඒ කියන්නේ අපේ ජීවිතයේ අපිට තව කෙනෙකුගේ ආකර්ෂණයක් ලබාගැනීමේ ශක්තියක් නැත්නම්, අපි කරන්න ඕන, පුළුවන් තරම් දානය තුළ ශක්තිමත් භාවයට පත්වීමයි.

එතැනින්ම තමයි අපට ආයුෂය, වර්ණය, සැපය, බලය ලැබෙන්නේ.

# ලෝකයේ සිදුවන මේ ව්‍යසනය දකිමින් ලෝකයට ලෝකයේ ස්වභාවයෙන් යන්න ඇරලා ඔබ නවතින්න

**හතලිස් හයවන ප්‍රශ්නය :**

**ගෞරවණීය ස්වාමීන්වහන්ස, මේ අළුත් අම්මලා තාත්තලා, මේ නූතන පරම්පරාවේ අම්මලා, තාත්තලා තමන්ගේ කුසින් බිහිකරන දරුවෝ ඝාතනය කරනවා. දියණියන්ව ගණිකා සේවයේ යොදවනවා. තම දරුවන්ව දූෂණයට ලක් කරවනවා. මේ වගේ තත්ත්වයන් ඇතිවෙලා තියෙන්නේ ඇයි ස්වාමීන්වහන්ස ?**

**පිළිතුර :**

මේක හේතුඵල ධර්මයක්. දැන් මේවා වැඩි වෙන්න වැඩි වෙන්න, ඔය හේතූන් නිසා සකස් වෙන්නාවූ ඵලයන් වැඩි වෙනවා. සමහර අම්මලා තාත්තලා කියනවා දරුවන්ට, 'මම උඹව මරාගෙන කනවා', කියලා. ඔය දරුවෝ කොච්චර ඉන්නවද, සමහර අම්මලාට තාත්තලාට කියනවා, 'මම උඹව මරාගෙන කනවා' කියලා. ඉතින් ඒවගේ ඒගොල්ලෝ, මැරෙන වෙලාවේදීත් ඔය තෘෂ්ණාවන් සකස් වුනොත්, ඊට අදාළ කුල වල ඉපදිලා, ඒ දරුවා මේගොල්ලන්ව මරාගෙන කනවා.

ඉතින් ඒ සමාජ ඵලය තමයි අපි දකින්නේ. ඉතින් මේ මනුෂ්‍යයා දුශ්ශීල වෙන්න දුශ්ශීල වෙන්න, මනුෂ්‍යයාගේ හැසිරීම්

රටාව පිරිහෙන්න, පිරිහෙන්න, ඊට අදාළ පරිසරයන් තමයි ලෝකය තුළ සකස් වෙන්නේ. ඒ නිසා ඉතින්, ඒවායේ විපාකයන් තමයි අත්විඳින්න වෙන්නේ. එහෙනම් ඉතින් 'කොතැනකවත් කාටවත් අසාධාරණයක් වෙන්නේ නැහැ' කියලා බුදුරජාණන් වහන්සේ ඒකයි දේශනා කරන්නේ.

අපි කරපු දේ, අපිට සංසාරයේදී ලැබෙනවා. ඒ නිසා අපි දක්ෂ වෙන්න ඕන, එවැනි දේට අපි අකමැතිනම්, අපි එවැනි දේවල් වලින් මිදිලා, නිවැරදි දේ තුළ ජීවත්වෙන්න.

ඒ නිසා, අපි මේ ජීවිතයේ අම්මා තාත්තාට පීඩාකරමින්, පීඩා කරමින් අම්මා තාත්තාට අකීකරු කමින් ජීවත්වෙනවා නම්, ඊළඟ ජීවිතයේ අපි පුංචි කාලයේදීම, අපේ අම්මා තාත්තා මැරිලා යනවා. ඊට පස්සේ අම්මා තාත්තාගේ රැකවරණයකින් තොරව තමයි, අපි ළමා නිවාසයක හරි, කොහේ හරි හැදෙන්නේ. ඇයි මොකද එතන ළමා නිවාසයේ ඉන්න දරුවෙක් දැකලා, අනේ අපොයි' කියලා, අපි කම්මුලේ අත තියාගෙන වැඩක් නැහැ. ඒ ළමා නිවාසයේ ඉන්න දරුවා පෙර ජීවිතයේ අම්මා තාත්තාට දැඩි ආකාරයෙන් අකීකරු වෙච්ච දරුවෙක්. එහි ඵලය දරුවා විඳිනවා. ඒ නිසා කොතැනකවත් මෙතන වැරැද්දක් නැහැ.

ඉතින්, සමාජය මේ අකුසල් කරා යන්න, යන්න, අකුසල් වලට විපාක දෙන්න සුදුසු ලෝකයක් තමයි, අප ඉදිරියේ ගොඩ නැගෙන්නේ. ඒ නිසා බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා, කිසිම අම්මා කෙනෙකුට දරුවා ගැන හිතලා සතුටුවෙන්න පුළුවන් සමාජයක් නොවෙයි අනාගතයේ බිහිවෙන්නේ කියලා. ඒ වගේම කිසිම දරුවෙකුට අම්මා ගැන හිතලා සතුටු වෙන්න පුළුවන් සමාජයක් නෙවෙයි බිහිවෙන්නේ.

ඒ තරමටම මනුෂ්‍යයාගේ දුශ්ශීල භාවය නිසා, විකෘති අදහස් සිතුම් පැතුම් නිසා, මේ සමාජ සම්බන්ධතා දෙදරලා යනවා, කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. මේකට තියෙන

එකම ගැලවීම, මේ ව්‍යසනය අපි දැනගෙන, ලෝකයට ලෝකයේ ස්වභාවයෙන් යන්න ඇරලා, අපි නැවතිලා ඉන්න එක තමයි, අපිට තියෙන එකම දේ.

**අපි නැවතිලා ඉන්නවා කියන්නේ මොකක්ද? ලෝකය කුසල් අකුසල් සංස්කාර රැස්කරමින්, ලෝකය ගලාගෙන යනවා. අපි මේ කුසල් අකුසල් සංස්කාරයන්ගේ අනිත්‍ය භාවය දකිමින්, අපි ලෝකය තුළ නැවතිලා ඉන්නවා. ඉතින් ඔතෙන්ට තමයි අපිට එන්න තියෙන්නේ. ඉන් මෙහා විසඳුමක් නැහැ.**

## ඊළඟ තත්පරයේදී විනාශයක් වෙන්න පුලුවන්. දැන්ම ධර්මය තුළ ශක්තිමත් වෙන්න

**හතලිස් හත්වන ප්‍රශ්නය :**

**ගෞරවණීය ස්වාමින්වහන්ස, ඔබ වහන්සේගෙන් දැන් අපි විමසන්නේ, ඉතාමත් ගුණ සම්පන්න, නැණ සම්පන්න දරුවෙක්, තමන්ගේ හිතවත් ම යහළුවෙක් සමග ගඟකට නාන්නට යනවා. ගිහින් ඒ ගඟට වැටිලා අනතුරකට ලක්වෙලා මිය යනවා. එදා මේ දරුවා ඒ අවස්ථාවට නොගියානම් ඔහු මිය යන්නේ නැද්ද? ඒ නොගියත් මොනයම් හෝ ක්‍රමයකින් හෝ ඔහුට මිය යන්නට අවස්ථාවක් සැලසෙනවාද ?**

**පිළිතුර :**

මෙහෙමයි, වෙන මොනයම් ම ක්‍රමයකින් හෝ මරුමුවට පත්වෙනවාය, කියලා කියන්න මම දන්නේ නැහැ. නමුත් එයාට ඒ වෙලාවේ විපාක දෙන්නේ, අකුසල් විපාකයක්. නමුත් එයාට එතනට යන්න හිත සකස් වෙන්නේ. ඒ අකුසල් විපාකය නිසාමයි.

දැන් සමහර දරුවෝ ඉන්නවා, තුන්දෙනා නාන්න යනවා. නමුත් හතරවෙනියෙක් ඉඳලා තියෙනවා, එදා එයාට යන්න හිත දීලා නැහැ. ඉතින් අර තුන් දෙනා ගහගෙන යනවා. අර දරුවා ගෙදර හිටිය නිසා බේරෙනවා. ඒ නිසා, අපට එවැනි අනතුරක් කරා යන්න හිත දෙන්නේ කුමක් නිසාද? ඊට අදාළ සංස්කාරය අප පිටුපසින් තියෙන නිසා.

ඒකයි කියන්නේ, කොයි වෙලාවේ අපේ ජීවිතයේ අනතුරක් වෙයිද කියලා, අපිට කියන්න බැහැ, මොකද අපේ වර්තමාන සමාජයේ තියෙන ලොකුම දුර්වලකම තමයි, අනතුරක්, ප්‍රශ්නයක් වුණාට පස්සෙ තමයි, ධර්මය තුළට යන්නේ. ලෙඩක් හැදෙන කම් බෝධින් වහන්සේ ළඟට යන්නේ නැහැ. කවුරු හරි අමනුෂ්‍යයෙක් රෑට හීනෙන් දකින කම් දානයක් දෙන්නේ නැහැ. තේරුණාද? ප්‍රශ්නයක් වුණේ නැත්නම්, ගෙදර කෙනෙක් මැරිලා පාංශකුල දෙන්න ඕන වුණේ නැත්නම්, පන්සලකට යන්නේ නැහැ.

මේ ධර්මය වැරදියි. අපි හිතන්න ඕන හැම වෙලාවේම මේ ධර්මානුකූලව හිතද්දී, ඊළඟ නිමේෂයේදී අපිට ප්‍රශ්නයක් එන්න පුළුවන් කියලා, දැන් සමහර දරුවෝ එනවා, අවුරුදු දහයයි, දොළහයි වයස. ඒ දරුවා ජීවිතයේට ඒ අම්මලා තාත්තලා, පන්සලකට එක්කන් ගිහිල්ල නැහැ. බෝධි පූජාවක් තියලා නැහැ. දානයකට අත ගස්සලා නැහැ. ස්වාමින් වහන්සේ කෙනෙකුට වන්දනා කරන්න කිව්වොත්, ඒ දරුවා වන්දනා කරන්න දන්නේ නැහැ. නමුත් දැන් ඔන්න බරපතල ලෙඩක් ඇවිල්ලා, අපි කියමු පිළිකාවක් කියල. දැන් ඒ දරුවාව අරගෙන හාමුදුරුවන්ට වන්දන්න එනවා, පන්සල් එනවා, බෝධිපූජා තියන්න එනවා, දැන් වැඩක් තියෙනවද? වැඩක් නැහැ.

නමුත්, අර අවුරුදු හතර, පහ වයසේදීම ඒ දරුවා මේවට හුරුකරලා, බෝධිපූජා තියලා, මේවාට යොමු කළා නම්, ඒ කුසල් ශක්තිය විසින් අර අකුසලය යටපත් වෙන්න තිබ්බා. නමුත් ඒක කරන්න හිත දුන්නේ නැත්තේ ඇයි? අර අකුසලය පිටිපස්සේ ශක්තිමත්ව තිබුණ නිසා.

ඒ නිසා අපි දක්ෂ වෙන්න ඕන, ඊළඟ තත්පරයේදී අපිට මොකක් වෙයිද කියන්න බැහැ. ලංකාවේ සමහර ඉහලම ඉස්කෝල වල, ඉහලම ජාත්‍යන්තර පාසල් වල ඉගෙන ගන්න

දරුවෝ ඉන්නවා. ඒ අම්මල ඒ දරුවන්ව දකින්නේ, නිකම් දිව්‍යාංගනාවෝ, දිව්‍යපුතුන් වගේ, 'මගේ දරුවාට කවදාවත් අසනීපයක්, හැදෙන්නේ නැහැ. ලෙඩක් හැදෙන්නේ නැහැ', එහෙම කියල තමයි හිතාගෙන ඉන්නේ. අනේ හිටපු ගමන් ලෙඩක් හැදුනහම ඒගොල්ලන්ට හිතා ගන්නවත් බැහැ, මේ මොකක්ද වුණේ කියල.

ඒ නිසා නිරතුරුව ම, ඔබ කොච්චර මේ මොහොතේ, සශ්‍රික භාවයෙන්, නිරෝගීව ජීවත් වුණත්, ඔබ දකින්න, ඊළඟ තත්පරයේදී මේක වෙනස් වෙන්න පුළුවන් කියලා. තේරුණාද? මේක වෙනස් වෙන්න පුළුවන් නිසා, වෙනස් වුණාට පස්සේ නිවැරදි කරගන්න නම් පුළුවන් කමක් නැහැ. ඒ නිසා ලෙඩක් හැදෙන්න ඉස්සෙල්ලා, රෝගයක් හැදෙන්න ඉස්සෙල්ලා, ප්‍රශ්නයක් මතු වෙන්න ඉස්සෙල්ලා, ඔබ මේ ධර්මයන් තුල ජීවත්වෙන්න.

දැන් මට කව්රුහරි දරුවෙක් වඳින මොහොතේම, මම ඒ පුංචි දරුවාට කියන්නේ 'දීර්ඝායුෂ සැලසේවා' කියලයි. මොකද ඇත්තටම මට බයක් තියෙනවා, තව පැයකින් මේ දරුවට යමක් වෙන්න පුළුවන් කියලා. මොකද ඒක තමයි ලෝකය. නමුත් අපේ සමාජය එහෙම දකින්නේ නැහැ.

තව පැයකින් යමක් වෙන්න පුළුවන්, කියන දේ අපි දැක්කනම්, අපි මේ පැයේදී මොකද කරන්නේ? අපි ධර්මය තුළ ශක්තිමත්ව ඉන්නවා. එතකොට අපි ධර්මය තුළ ශක්තිමත්ව මේ ගමන යද්දී, අපිට වෙන්න තියෙන අනතුරක්, වෙන්න තියෙන අපලයක්, දුර්වලතාවයක් තියෙනවා නම්, අර කුසල් ශක්තිය විසින්, අරක යටපත් කරනවා.

ඒ නිසා විශේෂයෙන්ම දරුවන් සම්බන්ධ ප්‍රශ්න වලදී දෙමව්පියන් දක්ෂ වෙන්න ඕන, ඒ දරුවන් කොච්චර සනීපෙන්, හොඳින් සුඛෝපභෝගීව ජීවත් වුණත්, ඊළඟ තත්පරයේ විනාශයක්

වෙන්න පුළුවන් කියන කාරණය දකින්න. දැකලා නිරතුරුවම ඒ දරුවෝ, තේරෙන වයසේ ඉඳන්ම ධර්මය තුළ ශක්තිමත් කරලා, ඉස්සරහට අරින්න දක්ෂවෙන්න ඕන.

එහෙම නැතුව, විනාශයක් වුණාට පස්සේ කළා කියලා, ප්‍රතිඵලයක් නම් ලැබෙන්නේ නැහැ. වෙන්න ඉස්සෙල්ලා අපි දක්ෂවෙන්න ඕන, නිවැරදි මාර්ගයට ඒක සකස් කරගන්න.

# ගන්ධබ්බ අවධිය සහ අන්තර්භවය පිළිබඳව

**හතලිස් අටවන ප්‍රශ්නය :**

**ගරුෘ ස්වාමින්වහන්ස, කෙනෙක් මියගියාම ඒ පුද්ගලයාට ගන්ධබ්බ අවධියක් කියලා දෙයක් තියෙනවද ?**

**පිළිතුර :**

නැහැ, ගන්ධබ්බ අවධියක් කියන කාරණය බුදුරජාණන් වහන්සේගේ ධර්මය තුළ සම්පූර්ණයෙන්ම නැති දෙයක්. ඕකට අන්තර්භවය කියලත් සමහරු කියනවා. අන්තර්භවය කියලා දෙයක්. බුදුදහමේ සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප වෙන දෙයක්. තේරුණාද?

මෙතනින් පිටවෙන විඤ්ඤාණය, චුතිසිත, ප්‍රතිසන්ධි චිත්තයකට සකස් වෙන්නේ නැතුව, එහෙ මෙහෙ පාවී පාවී ඉන්න ක්‍රමයක් බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ නැහැ. 'විඤ්ඤාණය මෙතනින් බැහැරට යද්දීම, තවත් රූපයක බැස ගන්නවා' කියලයි උන්වහන්සේ දේශනා කරන්නේ.

රූපයක බැස ගැනීමෙන් තොරව විඤ්ඤාණයක පැවැත්මක් නැහැ කියල, බුදුරජාණන් වහන්සේ දේශනාකරනවා. ඒ නිසා කොතැනකවත්, මේ ඊළඟ මව් කුසක් හොයා හොයා මේ විඤ්ඤාණය කැරකි කැරකි ඉන්නවා, මේක ගන්ධබ්බ අවස්ථාවක්, මේක අන්තර්භවයක්, කියලා ධර්මයක් බුදුරජාණන් වහන්සේ

කොතැනක වත් දේශනා කරලා නැහැ. ඒක සම්පූර්ණයෙන්ම බුදු දහමෙන් ප්‍රතික්ෂේප වෙනවා.

නමුත් මෙතැනදී මෙන්න මෙහෙම දෙයක් වෙනවා, දැන් කෙනෙක් ක්ෂණිකව මැරෙද්දි, ඒ කියන්නේ අපි හිතමු, 'කෙනෙක් තද නින්දේ දී මැරෙනවා', 'එහෙම නැත්නම් කෙනෙක් එක පාරටම බෝම්බයක් පිපිරිලා මැරෙනවා', 'එහෙම නැත්නම් කෙනෙක් දියේ පිහිනන්න ගිහින්, එක පාරට මුහුදුරැළ ඇවිල්ලා මැරිල යනවා', එහෙම 'නැත්නම් පුංචි දරුවෙක් මැරෙනවා'. මෙහෙම අය මැරෙන වෙලාවේදී ඒ ගොල්ලන්ට ශක්තිමත් කුසල් අකුසල් චිත්තයක් සකස් වෙන්නේ නැහැ.

ඒ නිසාම ඒ ගොල්ලෝ අර භූත ස්වභාවයේ සත්ත්වයන් හැටියට උත්පත්තිය ලබනවා. භූත ස්වභාවයේ සත්ත්වයා කියන්නේ, මෙයා මේ වෙලාවේ පාවී පාවී ඉන්නේ. දැන් ප්‍රේතයා ඉන්නේ කකුල් දෙක බිම තියාගෙන. එතකොට යක්ෂයා වගේ අය ඉන්නෙත් කකුල් දෙක බිම තියාගෙන. නමුත් මේ භූත ස්වභාවයේ සත්ත්වයා, පාවී පාවී ඉන්න සත්ත්වයෙක්.

දැන් එක අම්මා කෙනෙක්, අවුරුදු හැත්තෑපහක වගේ වයසක අම්මා කෙනෙක් මැරෙනවා - ඒ අම්මා තද නින්දේදී මැරෙන්නේ. මැරිලා ඒ අම්මා, ඒ අම්මාගේ ශරීරයේ ප්‍රමාණයෙන් ම පාවී පාවී ඉන්න භූත ස්වභාවයේ සත්ත්වයෙක් බවටයි පත්වෙලා තියෙන්නේ. ඒක ජාතියක්; ඒක භවයක්; එයාට මේ ඇස, කණ, දිව, නාසය, ශරීරය, මනස, ආයතන හය තියෙනවා. ඒ ආයතන හය, බාහිර රූප එක්ක එස්සය වෙලා, පංච උපාදාන ස්කන්ධය සකස් වෙනවා, ඒක භවයේ උපතක්. ඒක අන්තර් භවයක් නෙවෙයි. භවයේ උපතක් සත්ත්වයෙක්, ජාතියක්.

මෙන්න මේ පාවී පාවී ඉන්න භූත සත්ත්වයාට තමයි, මේ හත් දවසේ පින්කම, පාංශුකූල පින්කම වටින්නේ. තේරුණාද?

දැන් එක පුංචි දරුවෙක් මිය පරලොව යනවා. ඒ පුංචි දරුවා මැරිලා බෝනික්කෙක් වගේම පාවී පාවී ඉන්නවා. එයාට මැරෙන වෙලාවේ, ඒ පුංචි ළමයින්ට ශක්තිමත් කුසල් අකුසල් චිත්තයන් සකස් වෙන්නේ නැහැ. එතකොට අර හත් දවසේ පින්කමේදී, පාංශුකූල පින්කමේ දී, අර නිදාගෙන ඉන්න දරුවෙකුට, වතුර ටිකක් ගැහැව්වාම එකපාරටම ඇහැරෙනවා වගේ, අර පාංශුකූල පින්කම වටින්නේ, ඒ අයට ඒ පින වටිනවා. මොකද, ඒ ගොල්ලෝ මැරිලා පාවී පාවී ඉන්නේ. ඒ ගොල්ලන්ගේ නිවස ආශ්‍රිතවම, ගෙවල් ආශ්‍රිතවම, ප්‍රදේශ තුළයි.

ඉතින් ඒ පාංශුකූල පින, හත් දවසේ පින, ඒ ගොල්ලන්ට අර නිදාගෙන ඇහැරිච්ච දරුවෙකුට, වතුර ටිකක් වදිනවා වගේ, ඒ පින, එකපාරටම එයා උපාදාන කරගෙන ශක්තිමත් චිත්තයකට, ශක්තිමත් ජාතියකට, උපතකට යනවා. ඉතින් ඔතන තමයි, ඔය අන්තර් භවයක් කියල වරද්දාගෙන ඉන්නේ. ඔතන අන්තර් භවයක් නෙවෙයි, එතන භවයේ උපතක්. එතන ජාතියක්. එතන ඇස, කණ, නාසය, දිව, ශරීරය, මනස තියෙනවා. ඒ සත්ත්වයාට, එයා පංච උපාදානස්කන්ධය සකස් කරගන්න, භවයේ උපතක්, ඒක.

ඒ උපතේ එයා හුඟාක් කල් එවැනි ස්වභාවයෙන් ඉන්නේ නැහැ. නමුත් මාස හයක් වගේ, එවැනි ස්වභාවයක හිටපු කෙනෙක් ඉඳලා තියෙනවා. ඉඳලා අර ශක්තිමත් පින් නිසා, ඊළඟ ප්‍රතිසන්ධියට එයා යනවා. එහෙම නැතුව කොතැනකවත් බුදුදහමේ අන්තර්භවයක් කියලා දෙයක් සඳහන් වෙන්නේ නැහැ.

විශේෂයෙන්ම පුංචි දරුවන්ට ඔයදේ සිද්ධ වෙන්න ඉඩ තියෙනවා. මොකද ඒ ගොල්ලන් මැරෙන වෙලාවේ, ශක්තිමත් කුසල් අකුසල් චිත්තයන් සකස් වෙන්නේ නැහැ. ඉතින් සාමාන්‍ය ලෙඩක් හැදිලා, සාමාන්‍යයෙන් ඔය රෝගීභාවයට පත්වෙන දරුවන්ට, එවැනි දේවල් වෙන්න පුළුවන්.

**අතුරු ප්‍රශ්නය :**

**ගරු ස්වාමීන් වහන්ස, ඒ කියන්නේ ඔබවහන්සේ පැහැදිලි කරන ආකාරයට විඤ්ඤාණය අනිවාර්යයෙන් ම රූපයකට බැසගත යුතුයි ද ?**

**පිළිතුර :**

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, විඤ්ඤාණය අනිවාර්යයෙන්ම රූපයකට බැස ගන්නම ඕන කියලා. නැත්නම් විඤ්ඤාණයේ පැවැත්මක් නැහැ කියලා. ඒ කියන්නේ, ඒ තරමටම කොතැන හරි ලෝකය සුදානම්. තේරුණාද? අර සුදානම් නැති තැන තමයි, අර භූත රූපය හැටියට ඉපදෙන්නේ.

එහෙම නැත්නම්, ඕනෑ තරම් ඕපපාතිකව උපදින්න පුළුවන්, ප්‍රේතයෙක් වෙලා, නිරිසතෙක් වෙලා. ඒ වගේ ඕපපාතිකව උපදින සතෙක් වෙලා. එහෙම නැත්නම් තිරිසන් ලෝකයේ භූත සත්ත්වයෙක් වෙලා, දෙවියෙක් වෙලා, ඔය ඕන තැනකට යන්න පුළුවන්.

කොහෙවත් පාවී පාවී, තව මව් කුසක් හොයාගෙන, පාවී පාවී, ඉන්නවා. කැරකි කැරකි ඉන්නවා කියලා. එහෙම ධර්මයක් බුදුරජාණන් වහන්සේ කොතැනකවත් දේශනාකරලා නැහැ.

බුදුරජාණන් වහන්සේ පිරිනිවන් මංචකයේ සැතපිලා අවසාන වචන හැටියට අපිට දේශනා කරන්නේ, “මහණෙනි මේ සියලු සංස්කාරයෝ අනිත්‍යයි” කියලා. සියලු සංස්කාරයෝ කියන්නේ, කුසල් සහ අකුසල් වර්ග දෙක ම. කුසල් සංස්කාරයනුත් විපාක දීලා අනිත්‍ය වෙනවා, අකුසල් සංස්කාරයනුත් විපාක දීලා අනිත්‍ය වෙනවා කියන කාරණයයි, බුදුරජාණන් වහන්සේ අපිට දේශනා කරන්නේ. ඒ නිසා “හිස ගිනිගත්තෙක් ඒ ගිනි නිවන්නේ යම් සේ ද, මේ භව ගින්දර නිවාගන්න” කියලයි බුදුරජාණන් වහන්සේ අපිට දේශනා කරන්නේ.

එහෙනම්, යමෙක් තෙරුවන් සරණ යාම තුළින් එයාගේ මූලික ම අරමුණ විය යුත්තේ, මේ භවයේ තියෙන භයංකාර බව දැකලා, භව නිරෝධය කරා යනවා කියන කාරණය. එතනින් මුලින් ම අපි සකස් කරගන්න ඕන, ශ්‍රද්ධාව කියන කාරණය. මොකද, ශ්‍රද්ධාව සකස් වුණේ නැත්නම් අපට මේ ගමනේ එක දශමයක්වත් ඉස්සරහට යන්න බැහැ. ශ්‍රද්ධාවයි මූලික වෙන්නේ.

එතකොට, ශ්‍රද්ධාව සකස් වෙන්නේ කොහොමද කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. ශ්‍රද්ධාව සකස් වෙන්න නම් මුලින් ම කල්‍යාණ මිත්‍ර ආශ්‍රය ලබන්න ඕන. කල්‍යාණ මිත්‍ර ආශ්‍රය ලැබුණහම අනිවාර්යයෙන්ම අපිට ඇහෙන්නේ මොකක්ද? සද්ධර්මය. එතකොට, කල්‍යාණ මිත්‍ර ආශ්‍රය ලබනවා, සද්ධර්මය ශ්‍රවණය කරනවා, ශ්‍රවණය කළා වූ සද්ධර්මය නුවණින් මෙනෙහි කරනවා. එහෙම කරද්දි තමයි, ශ්‍රද්ධාව කියන කාරණය සකස් වෙන්නේ.

මිල රු. 200/-

ISBN 978 - 955-7887-19-7